# ඥෙයාර්ථ දීපනිය.

හෙවත්

අපභාග්‍යවත් සර්වඥයන් වහන්සේගේ ගුණ මේ
මේයයි දැන හැඳින යහපත්ව පිළිපැද දෙලෝ
වැඩසාදා ගැණීම විස්තරව නොදැනෙන අයට
පහසුවෙන් තේරුම් ගැණීම පිණිස උගතමනා
ධර්ම සංක්ෂේපයෙන් ගෙණහැර දක්වීමයි.



ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2425 වෙනි වර්ෂයෙහි
දෙඩන්දුවේ ශෛලබිම්බාරාමාන්තර්ගත
ලොකාර්ථසාධක සමාගමේ අවසරයපිට

ජේම්ස් ඇලැක්සැණ්ඩර් ශ්‍රීවර්ධන නොතාරිස්වන
මා විසින්

මෙහිකර්තෘවූ ගෞරවනීය සාමින් වහන්සේලවා
ශුද්ධකරවා දෙවෙනි වර අච්චුගසවන ලදී.

කොළඹ

ශාස්ත්‍රාලොක යන්ත්‍ර ශාලාවෙහිදී
අච්චුගසනලදී.

1881

# පටුන.

පිටෙ


| | |
|---|---|
| 1 | මූලාරම්භය. |
| 3 | සුමෙධ කථාව. |
| 11 | සුවිසි විවරණ කථාව. |
| 15 | සිද්ධාර්ථ කුමාර කථාව. |
| 39 | අභිනිෂ්ක්‍රමණ කථාව. |
| 42 | මාරවිජය කථාව. |
| 45 | බුද්ධඥාන කථාව. |
| 48 | බුද්ධගුණ කථාව. |
| 60 | සත් සතිය. |
| 63 | මධුපිණ්ඩික දානය. |
| 64 | අජපාල කථාව. |
| 66 | දම්සක් පැවතුන් කථාව. |
| 70 | ශ්‍රාවක සන්නිපාත කථාව. |
| 80 | ප්‍රාපතකම් සූත්‍රය. |
| 97 | පාපමිත්‍ර සෙවනය. |
| 105 | ස්ත්‍රී ලක්ෂණය. |
| 110 | පසුතැවිලි ධර්මය. |

# ශ්‍රෙයාර්ථදීපනී.

ජහිත්වා සබන්ධූ ධනංචාපිරජ්ජං
පහත්වා නරානං සුලද්ධංසුබොධිං,
ජනානං තාරයන්තං තිලොකෙසදෙවා
ජිනංතංනමෙහං මුනිංධම්මරාජං

## මූලාරම්භයෙහි-1-කාණ්ඩය.

ලක්දිව්වැසි සම්‍යක්දෘෂ්ටි සංඛ්‍යාත උභයාර්ථ සිද්ධිකාමී බුද්ධ භක්තික සියලු පින්වත් සාධුජනයන් විසින් යහපත් නුවනින් සිහිපත්කර එකිනෙක විමසා සමවබැලියුතු-මූලභාෂානම් මාගධ භාෂාවෙන් ලියනලද ස්කන්ධවශයෙන් සුවාසූදහසක් ධර්මස්කන්ධයෙන්යුත්. ජිනදෙසිතපෙළ පොත්වහන්සේලා මෙකල්හි මෙම ලක්දිව තිබියදීත් කුසලකාමීහු එහි විභාග නොදත්බැවින් බොහෝසෙයින්ම ධර්මාධර්මනිර්ණයට අසමර්ථව වෙසෙති—එසේ හෙයින්, ඔවුන්ගේ ධර්මය දැන්ම කිසිසේත් මදින් මදවත්විනම්, ඒ ඒ පමණට ඔහු නුවනැස් ලබති—නුවනැස්ලැබුවෝ සද්ධර්මය දකිත්, සද්ධර්මය දක්නෝ සර්වඥයන්වහන්සේගේ රූපකාය ධර්මකාය දෙක දැනහැඳිනගණිති, එය හඳුනන්නෝ නිර්වාණදෙන්නේ මුන්වහන්සේයයි සර්වඥයන්වහන්සේ සියලු ලෝවැසි දෙවිබඹුන් කෙරෙන් උත්තරිතර ගැලවුන්කාර ස්වාමින්වහන්සේ කෙනෙක් බව නිර්ණයකර දැනගණිති-එසේ නිර්ණයකලෝ සම්‍යක්දෘෂ්ටිසහගතයුක්තියෙන් පිළිපදිති-එලෙස පිළිපන්නවුන්ට දෙලෝ වැඩසිද්ධවන්නේමය—එබැවින්, ඔවුන් සඳහා උගතමනාදෙය ප්‍රකාශිත— "ශ්‍රෙයාර්ථදීපනී" නම් පවුරුණක් පහසුවෙන් තේරුම්ගැණීම සඳහා, ගාම්භීරවචන හැර සිථිලවූ ලිහිල් වචනයෙණ ඉතා සංක්ෂෙපවශයෙන් ප්‍රාරම්භකෙරෙමි.

## 2 -කාණ්ඩය.

සැපකාමී සියලුලෝවැසියන් විසින්ම උභයලොකයෙහි තමතමන්ට පැමිණෙන භය සන්ත්‍රාසාදි අපමණදුක් නිදුක් වීම සඳහා නිතර අනුස්මරණය කටයුතු—ත්‍රිවිධරත්නයෙන් බුද්ධරත්නයෙහි ගුණමහත්වය පමණක්, මුඛ මාත්‍රයක් මෙහිගෙණහැරදක්වීමද-ගිහීජනයන්ට දෙලොව වැඩ පිණිස වදාළ

ප්‍රාපාතකර්මසූත්‍රයද, ලෝවැසියන් දඬුභය, දුර්ගතිභය, ආදියට පැමිණවීමට, හෙතුවූ පාපමිත්‍රසෙවනයද, සපන භායභීවන් ගේ ලකුණුද, පසුතැවිල්ලියට පමුණුවන දසකාරණයෝද, මෙහි මදක් දක්වනුලැබේ—එසිනුදු කෙළවරක්කොට නොසිතියහැකි ගුණයෝබැවින් චින්තා විෂයාතික්‍රාන්ත වූද, අවසන්කොට නොකියහැකි ගුණයෝබැවින් වාක්විෂයාතික්‍රාන්තවූද, උපමාකර කියන්ටත් සමවූ පුද්ගලයක් හෝ වස්තුවක්හෝ ලොව නැතිබැවින් උපමා විෂයාතික්‍රාන්තවූද, නැණවතුන් විසින්ද, නොසිඳියහැකි බැවින් ප්‍රශ්න විෂයාතික්‍රාන්තවූද, මෙවැනි බුදුගුණ සමූහය අපවැන්නන් විසින් කියම්හසී සිනිම මුදුරුදළින් විදුරුගිරි විදිනට තැත්කරන්නාක්මෙන්ද, වටු තුඩින් මහපොළොව පලන්ට තැත්කරන්නාක්මෙන්ද, නොහැකිවන්නේමය—එසේදවුවත් සැදැහැනැත්තෝ ශ්‍රද්ධාවන්තයෝ වීමපිණිසද, සැදැහැඇත්තෝ සැදැහැයෙන් දියුණුවීමපිණිසද—පුණ්‍යකාමීන් සඳහා නවඅරහාදී බුද්ධගුණයෝ ස්වල්ප මාත්‍රයක් මෙහි ගෙණහැර දක්වනුලැබේ—යේකෙසේදයත්:

3-කාණ්ඩය.

"බුජ්ඣිතාසච්චානීති බුද්ධො, බොධෙතාපජායාතිබුද්ධො, සබ්බඤ්ඤුතායබුද්ධො, සබ්බදස්සාවිතායබුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො, විසවිතායබුද්ධො, එකන්තවීතරාගොතිබුද්ධො, එකන්ත වීතදොසොති බුද්ධො, එකන්ත වීතමොහොතිබුද්ධො, එකන්ත නික්කිලෙසොති බුද්ධො, එකායනමග්ගං ගතොති බුද්ධො, එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො, නෙතං නාමං මාතරා කතං—පෙ—නදෙවතාහි කතං විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියාමූලෙ සබ්බඤ්ඤුතඤාණස්ස පටිලාභායසච්ඡිකා පඤ්ඤත්ති. යදිදං බුද්ධොති".

යනුහෙයින් තමන්වහන්සේ චතුස්සත්‍යව බොධයකළ හෙයින්ද බුද්ධනම්වේ, දෙවිමිනිස් ආදීන්ට ධර්මාවබොධය කරවන හෙයින්ද බුද්ධනම්වේ, සියලුදෙය දැනගත් හෙයින්ද බුද්ධනම්වේ, සියලුදෙය දුටුබැවින්ද බුද්ධනම්වේ, ගුරුපදෙශයක්නැතිව තමන්ගේම ඥාණයෙන් දැනගත්හෙයින්ද බුද්ධනම්වේ, නොයෙක් ගුණයෝ විකාශනායකාරණ හෙයින්ද බුද්ධනම්වේ. එකාන්තයෙන් රාගය පහකළ හෙයින්ද බුද්ධනම්වේ, ද්වෙෂය පහකළ හෙයින්ද බුද්ධනම්වේ, මොහය පහකළහෙයින්ද බුද්ධනම්වේ සියලු ක්ලේශයන් නැතිකළ හෙයින්ද බුද්ධනම්වේ එකම්වූ නිර්වාණගාමී ආර්ය අෂ්ටාංගික

මාගීයට පැමිණිහෙයින්ද බුඩනම්වූව, ශුද්ධකළාවූ නිරන්තර සම්‍යක්සම්බොධිය අවබොධකළහෙයින්ද බුඩනම්වේ, බුඩයයියනා මේ නාමයමැනිවූ මහාමායා දේවීන් විසින්හෝ, පියවූ සුඬොදන මහරජතුමන් විසින්හෝ, සහොදර කෙනෙක් විසින්හෝ සහෝදරිකෙනෙක් විසින්හෝ, මිත්‍රාමාත්‍යයන් විසින්හෝ, අසූදහසක් නෑකුලවාසීන් විසින්හෝ, ශ්‍රමණබ්‍රාහ්මණයන් විසින්හෝ, ශක්‍රාදි දෙවියන්විසින්හෝ, කරණලද නාමයක්නොවෙයි, වැලිදු, බොධිද්‍රැමමූලයෙහිද සර්වඥතාඥනයාගේ ලැබීම හෙතුකොටගෙණ භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට යම්මේ බුඩයයි යන විමොක්ෂාන්තික නාමයෙක් ඇද්ද—ඒනාමය-ප්‍රත්‍යක්ෂයෙන් සිඬවූ ප්‍රඥප්තිනාමයෙක් වන්නේමය—

එසේහෙයින් උත්තමවූ බුඩයයි යනමේ නාමය අපභාග්‍යවතුන්වහන්සේ විසින් ලැබූ ක්‍රමය භගවත්තු පිණිස සුමෙධකථානම්වූ බුඩවංස පාළියපටන් එනි නිදානය මදක් මෙනිගෙණහැර දක්වනු ලැබේ—

---

## සුමෙධ කථාවේ-1-කාණ්ඩය.

එක්සමයෙක්හි දසබලධාරිවූ අප භාග්‍යවත් සර්වඥරාජොත්තමයන් වහන්සේ විසිදහසක් මහ රහතන්විසින් පිරිවරණලද්දුව රජගහනුවරින් කිඹුල්වත් පුරයට වැඩමවා, පරම දක්ෂිණීයවූ නිග්‍රොධාරාමනම් මහ විහාරයෙහි වැඩවාසය කරමින් ඥාතීන්උදෙසා කරවදළාවූ යමකප්‍රාතිහාර්‍ය්‍ය දිනයෙහිදී-අහස රුවන් සක්මණෙහි වැඩසිට, ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ විචාරීමෙන් මේ මතු ප්‍රකාශවන්නාවූ බුඩවංස දෙසනානම් සුමෙධකථාව ගෙණහැරදක්වා වදාළසේක.

කප්පෙසතසහස්සෙච චතුරොච අසංඛියෙ
අමරංනාම නගරං දස්සනෙය්‍යං මනොරමං

යන්නුහෙයින් අශරණසරණවූ කාරුණිකනිධානවූ-කකුසද, කොනාගම, කාශ්‍යප, ගෞතම, මෛත්‍රෙය, යන බුඬදිවාකරයන් පස්දෙනකුන් වහන්සේලාගෙන් සොභන හෙයින් මහාභද්‍ර කල්පයයි නම්ලත් මෙමකල්පයට සාරාසංඛ්‍ය කප්ලක්ෂයකින් මතු සාරමණ්ඩනම් කල්පයෙහි ගම් නියම්ගම් රාජධානි ආදීන් සොභමානවූ දඹදිව්තෙලෙහි ප්‍රාකාර ගොපුරාදීන් පරික්ෂිප්තවූ උත්තම රමණීය භූමිභාගයෙන්හා සියලු නග

රාගයෙන්ද සම්පූර්ණවූ ස්වර්ණරජතාදි සප්තවිධ රත්නයෙන්
පිරුණාවූ නොයෙක් වෙශධාරී දෙශභාෂාදත් ජනයන්ගෙ
න්ද ආකුලවූ දෙවියන්ගේ අමරවතිනම් රාජධානියසේ සියල්
ලෙත්සමෘඬවූ පෙර කුසල් කළවුන්ගේ උත්පත්තියට ආවාස
යක්ද වැනිවූ අමරවතිනම් රාජධානියෙක් වී— දෙව දිව්‍යඟ
නාවන්සමාන නරනාරි සමූහයාගෙන් ගැවසුනු හෙයින් අම
රවතියයි නම්ලත් එනුවරෙහි අපබෝසතාණෝ සත්කුල ප
රම්පරාව දක්වාම කිසිවක්හු විසිනිදු ජාතිඝටා බිණීමෙන්
නොදැමිය හැකිවූ අනින්දිතවූ උභයකුල පරිසුඬවූ රැස්කරණ
ලද නොයෙක් කෙළගණන් මුක්තාමාණික්‍යාදි බොහෝ
ධනධාන්‍යයන් ඇත්තාවූ අසූකෙළක් නිධාන්ගත වස්තුවෙ
න්හා කාර්ෂාපණ දසවුණක් දවසකට වියදම්වන්නාවූ බමුණු
මහසල් කුලයෙක්හි ජලපොළොවසේ ගැඹුරුවූ පස්පො
ළොවසේ විපුලවූ මහමෙරසේ ස්ථිරවූ වජ්‍රායුධයසේ තීක්ෂ
ණ ප්‍රඥාවඇතිහෙයින් අන්වර්ථනාමයෙන් යුක්තව අමරවතී
නම් රාජධානියට පැමිණි දිව්‍ය කුමාරයෙක් මෙන් සුමෙධ
නම් බ්‍රාහ්මණකුමාරව ඉපිද, හදෑරණලද වෙදත්‍රයෙහි පාර
ගතව මහාපුරුෂලක්ෂණ දැනීමෙන් යුක්තවූ ලක්ෂණ ශාස්ත්‍ර
යෙහිද ප්‍රත්‍යුත්තර සංයුක්තවූ පූරාණසංඛ්‍යාත ග්‍රන්ථවිශෙෂ
යෙහිද, බ්‍රාහ්මණධර්මයෙහිද, කල්පය, ව්‍යාකරණය, ජ්‍යොති
ෂාස්ත්‍රය, ශික්ෂාය, නිරුක්තිය, ඡන්දොවිචිතිය, යනමේ ෂට්වි
ධ වෙදාඞ්ගයහා වෙනත් ලොවපැවති යම්යම් ශාස්ත්‍රයක්ඇද්ද
ඒ ශාස්ත්‍රනැමැති සාගරයෙහි පාරප්‍රාප්තදිසා පාමොක් ආචාර්ය්‍ය
වූයේය— ඉක්බිති ඒ සුමෙධ පණ්ඩිතයන්ගේ මව්පියන් පර
ලොකප්‍රාප්තවූ කල රාසිවඩ්ඪකනම් අමාත්‍යයා අවුත් ස්වා
මිනි ඔබවහන්සේගේ උභයකුල පරම්පරාවෙන් පැවත ආ
මේ ධන රාශියබලා වදාළමැනවැයි නොයෙක් රත්නයෙන්
පිරුණාවූ දහස්ගණන් ගබඩාවල දොරවල්හැර පෙන්වූකල්හි
මාගේ මාතෘ පිතෘ ආදිහු මෙපමණක් ධනරැස්කොට තබා
යන්නාහු මෙයින් කිසිවක් නොගෙණම ගියාහුය—මාවිසින්
වනාහි මේ ධනසම්පත් දන්දම්වශයෙන් කැටුව ගෙණයන්ට
වටිනේයයි සිතා ධනයෙන් ප්‍රයොජන කැමති කෙනෙක්
සුමෙධපණ්ඩිතයන්ගේ ගෙදොරට එත්වයි සියලු නුවර බෙර
හසුරුවා හෙවිනාද නැමැති සුගන්ධය ආඝ්‍රාණයෙන් යාචක
ජන නැමැති භෘංගසමූහයා අවුත් රැස්වූවිට රුවන් නැමැති
මුවරදයෙන් ඔවුන් සන්තර්පණයකොට හෙවත් යාචකයන්
සිත්ලෙස සත්දවසක් රුවන්පිරූ ගබඩාවල හැරිණලද දොර
වල් නොවසාම දන්දුන්සේක.

මෙසේ දත්දී ඉක්බිති සුමෙධපණ්ඩිතයන් වහන්සේ දිව විමානක් වත් උතුම් මතු මහල්තෙලෙහි හුදකලාව පළක්බැ ඳ හිඳ මෙසේ සිතූයේය, කෙසේදයත්? සුමෙධපණ්ඩිතයෙනි නැවත නැවතත් භවයෙහි ඉපදීමනම් මහත් දුක්වන්නේය, ඒ උප උපන් ස්ථානයෙහි ශරීරභෙදයද හෙවත් මැරීමද දුක්වන්නේය, මමද ඉපදීම ස්වභාවකොට ඇත්තෙමි, ජරාවද ස්වභාවකොට ඇත්තෙමි, ව්‍යාධියද ස්වභාවකොට ඇත් තෙමි, මරණයදස්වභාවකොට ඇත්තෙමි, මෙසේ ජාති ජරා ව්‍යාධි මරණ ඇති සසරෙහි දුක්විඳිනා මම ජාතිනැත්තාවූ ජරා නැත්තාවූව්‍යාධි නැත්තාවූ මරණනැත්තාවූ ඒකාන්තසැපඇති රාගාදිත්තැවීමක් නැතිහෙයින් සිසිල්වූ අමෘතමහානිර්වාණය සොයම්යි සිතුසේක—යම්හෙයකින් අශුචි මලමූත්‍ර ලේ සැර ව සෙම්සොටු ආදි නොයෙක්කුණපයෙන් භරිතව පිරුණු මේ කුණුවූ ශරීරය කිසිසේත් නොබලා අනාලයෙන් හැරපියා උත්තම නිර්වාණයට යන්නෙමි, එසේදවූවත්, ඒ නිර්වාණමාර්ගය කැමත්තවුන් විසින් ඊට හෙතුවක්නැතුව පැමිණිය නොහැ කිය—එහෙයින් භවදුක්ඛයෙන් මිදීම සඳහා නිවණ් පැමිණි යයුතු ඒ මාර්ගය සොයම්—යේකෙසේදයත්?

යථාපිදුක්ඛෙවිජ්ජනෙත සුඛංනාමපිවිජ්ජති
එවං භවෙවිජ්ජමානෙ විභවොපි ඉච්ඡිතබ්බකො.

යම්සේ මේලොකයෙහි කායචිත්ත පීඩාකරන්නාවූ සැප තට ප්‍රතිවිරුඩ දුකෙක්ද, දුකට ප්‍රතිවිරුඩවූ සුවපහස්දෙනා සැපතෙක්ද විද්‍යමානවේද—එපරිද්දෙන් භවය හෙවත් උත්පත්තිස්ථානයන් ඇතිකල්හි ඒ භවය විනාසයට හෙතුවූ විභවස්ථානයෙක්ද හෙවත් නූපදවනා ස්ථානයෙක්ද ඇතිවිය යුතුය—තවද යම්සේ ලෝකයෙහි අව් ගිනි ආදි නොඉවසියහැකි උෂ්ණයක් ඇතිකල්හි ඒ නැසියයුතු ජලපවන් ආදි සිහිලස දෙයකුත් ඇද්ද—එපරිද්දෙන් සන්තානගත රාගගිනි ද්වෙෂගිනි මොහගිනී සංඛ්‍යාත ත්‍රිවිධගින්න නිවනා එයට ප්‍රතිවිරුඩවූ ජරාමරණාදීන් වෙන්වූ නිර්වාණය කුදු ඇතිවියයුතුය—තවද යම්සේ ලොකයෙහි ලාමක ප්‍රාණඝාතාදි පාපධම්මයන් ඇතිකල්හි එය නැසිය යුතු යහපත් නිවරද කුශලධම් සංඛ්‍යාත කල්‍යාණධම්යකුත් ඇද්ද—හෙවත්, අකුසල් නසනා කුසල්නම් දෙයෙක් ඇත්තේවේද එපරිද්දෙන් ඒ ඒ තන්හි උපදවනා පච්චුවූ ජාතිය ඇතිකල්හි ඒය නසන්නාවූ අජාතිමත් නිර්වාණයකුත් ඇතිවියයුත්තේමයයි නිවණ්ඇති

බැව් නිශ්චයකොට සිතූසේක—බුඩාදි උතුම්තන්හැර හුරුප
දෙශයක් නැතිව සෙස්සන් විසිනුදු නොසිතියහැකි උත්තම
නිවණ්පුරය ඇතිබව නොයෙක් උපමාවලින් ඒ සුමෙධ
පණ්ඩිතයන් වහන්සේ නිශ්චයකොටසොයා දැන පළකාම
සැපතින්නික්ම ඒ නිවණ්සැප ලැබියයුතුබවට නොයෙක්
උපමාවෝ නැවතත් සිතතසේක්.

### 3.-කාණ්ඩය.

යථා ගූථගතො පුරිසො තළාකං දිස්වානපූරිතං
නගවෙසති තංතලාකං නදොසො තලා කස්සසො.
එවං කිලෙසමලධොවෙ විජ්ජන්තෙ අමතං තලෙ
නගවෙසතිතං තලාකං නදොසො අමතංතලෙ.

යත්නෙහෙයින් එඹාසුමෙධ පණ්ඩිතයෙනි, යම්සේ පුරුෂයෙක්
මහත් අශුචි වලෙක්හි ගැලී කිළුටුගාත්‍රා ඇතිවීද—එකල්හි
පස්පියුමෙන් ගැවසී සිහිල්පැනින් පිරීතිබෙණ විලක්දැක ඒ
විලට බස්නාව මාර්ගය ඔහුවිසින් නොසයානම්, මේ විලට
බැස මාගේ සැරීරයෙහි අශුචි මලසොධා සුඩවෙමිසිතා ඒ
විලට බස්නට උත්සාහ නොකරේනම්, ඒ අඥනයාගේ
දොෂයෙක්මිස, තලාකයාගේ දොෂයෙක් නොවේද—එප
රිද්දෙන්ම, ගඟා යමුනා අචිරවතී ආදි ගඟොදක යෙනුදු
සොධාසුඩකොට ගතනොහැකි, රාගාදි කෙලෙස්නැමැති
අශුචිමල පිරිසිදුකිරීමට හැකිවූ, නිවණ් නැමැති විලටබැස
කෙලෙස්නැමැති අශුචිමල සෝදීමට උත්සාහ නොකෙරේ
නම් තොපගේම දොෂයමිස නිවණ්නැමැති විලෙහි දොෂ
යෙක් නොවේමය—

තවද යම්සේ සොරුන්විසින් පිරිවරණලද, පුරුෂයෙක් ගැ
ලවියන්ට සුදුසුමාර්ගයක් ඇතිවතිබියදිත් ඉදින් ගැලවී ඒ මගි
න්නොයේනම් මාර්ගයෙහි දොෂයෙක් නොවෙයි ඒ අඥනයා
ගේම දොෂයක, එපරිද්දෙත් කෙලෙස් නැමැති සොරුන්
විසින් වටකොට සිසාරගත්තා ලදුයේ, නිවණ් නැමැතික්ෂෙ
මමාර්ගය ඇතුව තිබියදිත් එහි නොයානම් ඒ නිවණ්මගනෝ
සයානම්, ඒ පුද්ගලයාගේම දොෂය මිස ඒ නිවණ්නැමැති
නිර්භය මාර්ගයෙහි දොෂයෙක් නොවේමය—

තවද යම්සේ ව්‍යාධින් පීඩිත පුරුෂයෙක් ව්‍යාධිව්‍යපසමණය
කිරීමෙහි දක්ෂ වෛද්‍යාචාර්යකෙනෙක් සමීපයෙහි ඇතුවසි
ටියදිත් ඔහුකරා පැමිණ ව්‍යාධි ව්‍යපසමණයට පිළියම්කාරවා
නොගණිත්නම් ඔහුගේ දොෂයමිස වෛද්‍යාචාර්යයාගේ දො
ෂයෙක් නොවේද, එපරිද්දෙත් සර්ව වෛද්‍යශාස්ත්‍රයෙහි දක්ෂ

ජීවකාදීන් විසිනුදු උපසමණයකොට ගතනොහැකි කෙලෙස් නැමැති ව්‍යාධින් පීඩිතවූයේ, ඒ කෙලෙස් සංසිදවන්ට සමර්ථ නිවණ්මාර්ගනැමැති වෛද්‍යාචාර්යයකු නොසෙව්ම ඔහුගේ දෝෂයමිස නිවණ්නැමති වෛද්‍යාචාර්යයාගේ දෝෂයෙක් නොවේමය — යම්සේ සැරසීම්කැමති මණ්ඩනක පුරුෂයෙක් තමන්ග්‍රීවයෙහි බඳනාලද කුණපය දැක ඊට පිළිකුල්ව ඒ කුණපය හැරපියා ගියේනම් සැපවූ පරිද්දෙන් ඔහුගේ විසීමවන්නේද, එපරිද්දෙන් මමද නොයෙක් කුණපයෙන් පිරුණාවූ මේ කුණුශරීරය නොබලා එහි ඇලුම්නැතිව හැරදමා නිවණ්නැමැති පවිත්‍ර නුවරට යන්නෙමි — තවද යම්සේ වර්ච්ස් භූමියෙහි කරණලද මලමූත්‍රයෙහි ස්ත්‍රී පුරුෂයෝ කිසි ආලයක්නොකොට ඒ දිසාවද නොබලා වස්ත්‍ර කොණින්හෝ ගිනිත්හෝ, මලමූත්‍ර නොගෙණයෙද්ද, එපරිද්දෙන් මමද, නොයෙක්කුණපයෙන් පිරුණු මේ කුණුශරීරය මලපැහැර යම්සේ වර්ච්ස්කුටිය හැරයෙද්ද එමෙන් මේ ශරීරයෙහි අනාලයව නිවණ්පුර යන්නෙමි — තවද යම්සේ නාවිකපුරුෂයෝ උදකොද්ගතවන නොහොත් වතුර උණන දිරු ගියනැව අනාලයෙන් නොබලා හැරදමායෙද්ද එපරිද්දෙන් මමද, ඇස්කණ් නාසා ආදී නවදෙරින් නිතර අශුචි වැහෙන කුණපභරිත මේදෙහය, දිරුණු නැවගරිණ නැව්ස්වාමීහුමෙන් හැරපියා නිවණ්පුරයන්නෙමි — තවද යම්සේ පුරුෂයෙක් රන් රුවන් ආදී නොයෙක් රත්නභාණ්ඩයන් ගෙණ සොරුන් සමගයන්නේද, ඒ රත්නභාණ්ඩයන් සොරුන් කෙරෙන් නසිද්දෝ යන භයින් ඔවුන් සමග නොගොස් නිරුපද්‍රමාර්ගයකින්යේද-එපරිද්දෙන් මමද, මහසොරෙක් සමාන මේ කයහැර නිවණ්පුරයායුතුය — ඉදින් මේ ශරීරයෙහි ආලයකෙරේනම් කුසල්නැමැති රුවන්නස්නේය — එසේ හෙයින් මමද කුසල්සමාන රුවන්නැසීමට භයින් මේ ශරීරය හැරපියායෙමි යයි සිතූසේක —

## 4–කාණ්ඩය.

මෙසේ ඒ සුමෙධ පණ්ඩිතයන්වහන්සේ නොයෙක් උපමාවලින් ගිහිගෙන් නික්මෙන්ට සුදුසුවූ මේඅර්ථයසිතින් සලකා ප්‍රමාණාතික්‍රාන්ත භෝග සැපයටකි පිළිවෙලින් කෘපණසංඛ්‍යාත දිලිඳුන්හා, අඬිකාසංඛ්‍යාත මඟීන්හා යාචකාදීන්ටද දන්දී වස්තුකාමකෙලශකාමහැර අමරනම් නුවරින් නික්ම හුදකලාව හිමවත ධම්මිකනම් පර්වතයනිසා සක්දෙව් රජහුසින් නිර්මාණකරවනලද පණ්සලට පැමිණ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව-

කාමච්ඡන්දාදි පඤ්චනීවරණයෙන් වෙන්ව,

ඉද්ධිපරචිත්ත ඤාණංච පුරිමං ජාතිඅනුස්සතිං
දිබ්බංච චක්ඛුසොතංච පඤ්චාභිඤ්ඤා ඉමාමතා සි.

දක්වනලද, ඍද්ධිය, පරසිත්දන්නා ඥානය, පෙරඋපන් කඳ පිළිවෙළ දන්නා පූර්වේනිවාසානුස්මෘතිය, දිවඇසය, දිවකණ ය, යනමේ පඤ්චාභිඥාවහා රූපාදි අෂ්ටසමාපත්තියද සත්දිනක් තුළදීම උපදවාගෙණ ඒ සුමෙධ තාපසයෝ ධ්‍යානසැපතින් හිමාලයෙහි වාසයකරණ සමයෙහි, දීපඞ්කරනම් බුදුරජානන් වහන්සේ බුද්ධත්වයට පැමිණ පිළිවෙළින් ලොකානුකම්පා පිණිස වැඩමවමින් රම්‍යනම් නුවරට වැඩවදාරා කෙලෙස්ගින්නෙන් තැවුණු මහජනයන්ගේ සිත් ධර්‍මකථානැමැති අමෘත ජල ධාරාවෙන් සිසිල්බවට පමුණුවමින් සුදර්ශන මහාවිහාරයෙහි වැඩවාසයකර වදාරණබව ඇසූ රම්‍යනම් නුවරවාසී මහජන සමූහයා ඒබුදුන්කරා එළඹ සෙටදවසට දන් ඉවසා වදාරණ සේක්වයි ආරාධනාකොට දෙවනදින මහදන් සරහා නුවර අලඞ්කෘතකොට නැවත බුදුන්වඩනාමාර්‍ගය සරසමින් මහජනසමූහයාසිටියාහුය—එසමයෙහි යටකී සුමෙධ තාපසයෝ තමන්ගේ ආශ්‍රම පදයෙන් අහසටනැගී මාර්‍ගය සරසමින් සිටි මනුෂ්‍යයන්ගේ උපරිමභාගයෙන් යනසේක් බුදුන්ට වැඩමවීමට මාර්‍ගයසරසම්හයි යනු ඔවුන්අතින් අසා, තාපසයෝ සිතන්නාහු කල්ප සතසහස්‍රයකිනුත් බුද්ධයයි යන ශබ්දමාත්‍රයක් ඇසීම ඉතා දුර්ලභය උන්වහන්සේ නොබෝවේලාවකින් දක්නට ලබම්සි ප්‍රීතින් පිනාගිය සිත්ඇතිව මේමාර්‍ගයෙන් එක් ප්‍රදෙශයෙක් මාවිසිනුත් සැරසියයුතුයයි සිතා මටත් මෙයින් එක් ප්‍රදෙශයක්දෙවයි ඉල්ලූසේක, ඔහුද සුමෙධතාපසයෝ ඍද්ධි ඇතිසේකැයි දැන තමන්විසින් වහා සරසාගත නොහැකිවූ සිනිල්දියෙන් පිරුණු ගැඹුරුකඳුරැළියක් ඔබවිසින් සැරසුව මැනවැයි කියා තාපසයින්ට දුන්නාහුය, එකල්හි ඒතාපසයෝද බුද්ධාලම්බණ ප්‍රීතිඋපදවා සිතනසේක් මම මේස්ථානය ඍද්ධියෙන් සරසන්ට සමර්ථයෙම් එසේ සැරසීම වනාහි මාගේ සිත සතුටුවන්නේ නොවෙයි අද මාවිසින් ඒ සර්‍වඥයන්වහන්සේඋදෙසා කය වෙහෙසවා වත්කටයුතුයයි සිතා උන්වහන්සේකෙරෙහි ගෞරව උපදවා මෘදුවූ කොමල හෘදයෙන් පස්ගෙණවුත් ඒ කඳුරැළිය පුරවන්ට පටන්ගත්තේය, එය නොනිමිකල්හිම, දීපඞ්කරනම් සර්‍වඥයන්වහන්සේ මහානුභාවසම්පන්න ෂඩ්අභිඥලාභී සාරලක්‍ෂයක් පමණ මහරහත් භික්‍ෂු සංඝයාවිසින් පිරිවරණලදුව අසමානවූ බුද්ධලීලාවෙන් වැඩි

සේක—එකල්හි සුමේධතාපසයෝ අක්ෂිඋන්මීලනයකොට අලඞ්කෘතමාර්ගයෙන්වඩනාවූ දසබලධාරී දීපඞ්කරසර්වඥයන්වහන්සේගේ සුප්‍රතිෂ්ඨිතපාදාදී දෙතිස්මහා පුරුෂලක්ෂණයෙන් සැදුම්ලත් අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් රඤ්ජිතවූ ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් සම්පූර්ණවූ අහස්තෙලෙහි දසදික් දිවන නොයෙක් දහස්ගණන් විදුලිය සෙයින් යුගලයුගලවූ නීල පීත ලොහිතාවදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වරය යන ෂට්වර්ණ ඝණ බුද්ධරශ්මිමාලාවන් විහිදුවමින් කණ්ණමැදිරීන් නිෂ්ප්‍රභාකොට දිලිහෙන ලහිරුමඩලමෙන් දිව්‍යබ්‍රහ්මාදීන්ගේ ශරීරප්‍රභාවන් නිෂ්ප්‍රභාකොට දිලිහෙන රූපයෙන් අගතැන් පත් අනුභාව යදූත, අද මාවිසින් දසබලධාරීවූ මේ උතුමන්වහන්සේට දිවි පුදන්ට වටිනේයයි සිතා, උන්වහන්සේගේ දෙසියසොළසක් මඞ්ගල්‍ය ලක්ෂණයෙන් විසිතුරුවූ ශ්‍රීපාදයුගමය කලල් මතුයෙහි නොතිබා මිණිපෝරුවෙන් කළ හෙයක්මැඩ වඩනා කලක්මෙන් සාරලක්ෂයක් මහරහතන්වහන්සේලා සමග මාගේ පිටමැඩගෙණ වඩනාසේක්වයි එසේ වැඩමවීම මට බොහෝ කාලයකට හිතසැපපිණිස වන්නේයයි මණිඵලක හෙයක් මෙන් මඩමතුයෙහි වැදහොත්සේක—මෙසේ කලල් මතුයෙහි වැදහොත් ඒ සුමේධතාපසයෝ නිලුපුල්පෙති වැනි නෙත්‍රයුගමය දල්වා, දීපඞ්කර දසබලධාරීන් වහන්සේගේ අප්‍රමාණ බුද්ධශ්‍රී බලනසේක් සතුටුව මෙසේ සිතුයේය.

කෙසේදයත්? ඉදින් මට අභිප්‍රායවීනම් මුන්වහන්සේකෙරෙහි පැවිදිව ලොභාදී සකලකෙලශයන් නසා අග්‍රදක්ෂිණෙය්‍යබවට්පැමිණ සාරලක්ෂයක් මහරහතන්වහන්සේලාට සංඝනවකව මුන්වහන්සේ පිරිවරා රම්‍යගම් නුවරට වදනට සමර්ථවෙමි—එසේකිරීම අපවැනි වියඞ්ගිකයිත්ට ප්‍රයොජනනැත, මමද මේ දීපඞ්කර සර්වඥයන්වහන්සේ මෙන් සම්‍යක්සම්බුද්ධත්වයට පැමිණ ලොකවාසීන් සද්ධර්මනැමැති නැවට නන්වා සංසාර නැමැති සාගරයෙන් එතරකොට නිවණ් නැමැති අමාරසයෙන් සන්තර්පණය කොට, නැවත පිරිනිවණ්පෑම, මට සුදුසුයයි සිතා අෂ්ටධර්මසමොධානයෙන් යුක්තව බුද්ධත්වය ප්‍රාර්ථනාකොට වැදහොත්සේක.

---

එකල්හි දීපඞ්කරනම් සර්වඥරාජොත්තමයන් වහන්සේද වැඩමවා, සුමේධතාපසයන්ගේ සිරොභාගයෙහි සුවර්ණමෙරුරාජයාසේ දිලිහිදිලිහී, වැඩසිට තමන් නෙත්සඟල දල්වා, කලල්පිට වැදහොත් සුමේධතාපසයන් බලාවදාරා මේඋග්‍රතාපසයා බුද්ධත්වය කැමතිව වැදහොත්තේය, මොහුගේ ප්‍රාර්ථනා

ව සිඛචේද්‍යෝ නොවේද්‍යෝහොයි අනාගතඥානයෙන් බලන
සේක්, මෙසිත් කප්ලක්‍ෂයක් අධිකකොටඇති කප්අසංඛ්‍ය
සතරක් ඉකුත්කොට ගෞතමනම් බුදුවෙයි යනුදැන, භික්‍ෂූ
න්ට ආමන්ත්‍රණයකොට, මහණෙනි, උග්‍රතපස්ඇති මේ සු
මෙධ තාපසයන් බලව්, මේතෙම අවශෙෂයෙන් නොවෙයි,
මෙසිත් සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයකින් මත්තෙහි දඹදිව සකල
වස්තූන් විපුලවූ කපිලවස්තුනම් පුරයෙහි සිද්ධාර්ථකුමාරව ඉපි
ද අශ්වත්ථනම් බොධිවෘක්‍ෂමූලයෙහිදී බුදුවන්නේයයි, මේ බුදු
වූ කාලයෙහි පැවති සියලු ප්‍රවෘත්තියම එහි සිව්වනක් පිරිස්
මැද ප්‍රකාශකොට වදාරාබුඬත්වයපිණිස විවරණදී දීපඞ්කර සර්ව
ඥයන්වහන්සේ මගුල්වඩා රඹගම්නුවරට වැඩිසේක— තම
න්වහන්සේ විසින් දසමන්මල් අටමිටකින් පුදා ප්‍රදක්‍ෂිණාකො
ට වැඩිකල්හි, සාරලක්‍ෂයක් පමණ මහරහතන් වහන්සේලා
දගඳමල්ආදීන්පුදා ප්‍රදක්‍ෂිණාකොට වැඩිසේක— දසදහසක්
සක්වල දෙවියන්හා එතැන්හි රැස්වූ මනුෂ්‍යයෝද, සුවඳමල්
වස්ත්‍රාභරණාදීන් පුදා බෝසතුන්වැඳ ප්‍රදක්‍ෂිණාකොට ස්වාමිනි
යම්පුරුෂයෙක් සෘජුවූ තොටින් එතරවෙන්ට උත්සාහකොට
වැරදුනහොත් යටිතොටින් එතරවේද, එපරිද්දෙන් අපිද
මේ දීපඞ්කර බුදුරජානන්වහන්සේගේ සස්නෙහි නිවන්නො
ගියහොත් ඔබවහන්සේ බුදුවූකාලයෙහි ඔබකරා පැමිණ නි
වන්අමා බොම්හයි ප්‍රාර්ථනාකොට නික්මගියෝය— එකල්
හි සුමෙධතාපසයෝද වැදහොත්තැනින් නැගිට බුඬත්වය
පිණිස පාරමීධර්මයන් සොයම්යි මල්ගොඩමතුයෙහි පලක්
බැඳ වැඩහිද දිව්‍යබ්‍රහ්මාදීන්ලවා සාධුකාරදෙවමින් දශපාරමී
ධර්මයන් සිහිකර වදාළසේක— කෙසේදයත්?

ඇස්-ලේ-මස්-ආදී අඞ්ගපරිත්‍යාගය දානපාරමිතානම්වෙයි-
අඞ්ගපරිත්‍යාගයට ආසන්නවූ පුත්‍රදාර ගාමක්ෂෙත්‍ර මුතුමැණික්
ආදී බාහිරවස්තු පරිත්‍යාගය දාන උපපාරමිතානාම් වෙයි-අඞ්ග
පරිත්‍යාගයට අධිකවූහෙයින් දිවිපිදීම දාන පරමාර්ථ පාරමිතා
නම්වෙයි-මෙසේ ත්‍රිවිධාකාරයෙන් දානපාරමිතාවද-මෙසේම
තුන් තුන් ආකාරයෙන් පූරණලද, සීලපාරමිතාවද-නෛෂ්ක්‍ර
ම්‍ය පාරමිතාවද, ප්‍රඥාපාරමිතාවද, වීර්‍ය්‍යපාරමිතාවද, ක්‍ෂාන්ති
පාරමිතාවද, සත්‍යපාරමිතාවද, අධිෂ්ඨානපාරමිතාවද, මෛ
ත්‍රී පාරමිතාවද, උපෙක්‍ෂා පාරමිතාවද-යන මේ සමතිස්පාර
මී ධර්මයන්ම සමාදන්වීමෙන් සිහිකොට වීර්‍ය්‍යඋපදවා හුනාස්
නෙන් නැගී සිටිකල්හි දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මාදීහු
උන්වහන්සේකරා එළඹ දිව්‍යමල් දිව්‍යසුවඳ ආදීන්පුදා, සුමෙධ

තාපසයන් වහන්ස ඔබවිසින් දීපඞ්කර සර්වඥයන්වහන්සේ
ගේ ශ්‍රීපාදමූලයෙහිදී මහත් ප්‍රාර්ථනාවක් කරණලද්දේය-ඒ
ප්‍රාර්ථනාව අනතුරුවක්නොව සමෘද්ධවේවයි, භයක්හෝ තැති
ගැණිමක්හෝ ශරීරයෙහි ස්වල්පවූද රොගයක්හො ඔබටනො
වේවයි, වහාම පාරමිධර්මයන් පුරා සම්‍යක්සම්බොධිය අවබො
ධ කරණසේක්වයි—යම්සේ මල් ඵලගන්නා වෘක්ෂයෝ ඒ ඒ
කාලයනොයික්මවා මල් ඵලගනිද්ද, එමෙන් ඔබවහන්සේද
කාලය නොඉක්මවා බුද්ධත්වයට පැමිණෙනසේක්වයි නොයෙ
ක් ප්‍රකාරයෙන් ස්තුතිකොට දහස්ගණන් මගල්‍යවචනයෙ
න් සතුටුකොට තම තමන්ගේ දෙව්ලෝ කරා ගියකල්හි,
බොධිසත්වයන් වහන්සේද, දශපාරමිධර්මයන්පුරා සාරාසංඛ්‍ය
කප්ලක්ෂයක්හුගේ ඇවෑමෙන් බුද්ධත්වයට පැමිණෙම්යි දෘඪ
තර වීර්‍ය්‍යාධිෂ්ඨානකොට අහසට නැගී හිමාලවනයට වැඩිසේ
ක—එදවස් තම න්අතට පත් නිවණ්සැප සසරදුකක් මෙන්
කල්පනාකර අත්හැර සියලු ලෝවැසියන් සංසාරබන්ධනයෙ
න් මුදා ඔවුන්ට නිවණ්සැප බෙදාදෙම්යි සිතුපරිදී, ඉතාමත්
මිහිරි රසවත් භොජනයක්ලැබ බොහෝකලක් ක්ෂුධාවෙන්
පීඩිතවූ මහාජනයාබලා සිටියදී, අඳුරුගේකටවැදී තනිව අනු
භවනොකොට කතුකැමැත්තන්ට ඒ මිහිරි රස බෙදාදී වැල
ඳිමක්වැත්න-සාපිපාසයෙන් පෙළෙන දරුවන්ට අමාරසබෙදා
දී වලඳන මවෙක්වැත්න-ගිනිගෙණ දිලිහෙනගෙයි අඬමින්
සිටින දරුවන්දැක ඔවුන් ඇකයට වඩාගෙණ ඒගෙයින් ගැල
වී දුවන ප්‍රියතර පියකෙනෙක්ද වැත්න, මෙසේ සියලු ලො
කවාසී අප සමූහයා කෙරෙහි මහාකරුණාව උපදවා-අපභා
ග්‍යවත් සර්වඥයන්වහන්සේ දීපඞ්කර පාදමූලයෙහිදී ලොවු
තුරු බුද්ධරාජ්‍යය පිණිස නියත විවරණශ්‍රී ලැබූබව දතයුතු—

---

සූම්සිවිවරණකථාව.

**2** තවද මෙම දීපඞ්කරනම් බුදුරජානන්වහන්සේට ඉක්බිති
කප්අසංඛ්‍යයක් බුද්ධශූන්‍යව ගියකල්හි, කොණ්ඩඤ්ඤනම් බුදු
රජානන් වහන්සේ ලොවපහළුව අපමහබෝසත් විජිතා
විනම් සක්විතිරජව චක්‍රවෘත්තිරාජ්‍යය බුදුන්ටපුදා ලොවුතුරු
බුද්ධත්වය පිණිස විවරණශ්‍රී ලැබූසේක—

**3** කොණ්ඩඤ්ඤනම් බුදුරජානන්වහන්සේට මෑතභාගයෙ
හි කප් අසංඛ්‍යයක් බුද්ධශූන්‍යව ගියකල්හි මඞ්ගලනම් බුදු
රජානන්වහන්සේ ලොව පහළුව අපමහබෝසත් සුරුචිනම්
බ්‍රාහ්මණව ඉපද කෙළලක්ෂයක් බුදුපාමොක් මහසඟණට
දන්දී විවරණශ්‍රී ලැබූසේක.

4 මඞ්ගලනම් බුදුරජානන්වහන්සේට මෑතභාගයෙහි එම කල්පයෙහි දෙවනා අතුරුකප සුමනනාම් බුදුරජානන් වහන්සේ ලොවපහළව අපමහබෝසත් අතුලනම් නාගරජව ඉපද කෙළලක්‍ෂයක් බුදුපාමොක් මහසඟණට දන්දී විවරණශ්‍රී ලැබූසේක.

5 සුමනනම් බුදුරජානන්වහන්සේට මෑතභාගයෙහි එම කල්පයෙහි තුන්වන අතුරුකප රේවතනාම් සර්වඥයන්වහන්සේ ලොවපහළව අපමහබෝසත් ඉතා උදාර ගුණඇති අතිදේවනම් බ්‍රාහ්මණව ඉපද, උතුරුසළුව පුදා විවරණශ්‍රී ලැබූසේක.

6 රේවතනාම් බුදුරජානන්වහන්සේට මෑතභාගයෙහි එම කල්පයෙහි සතරවන අතුරුකප සෝභිතනාම් සර්වඥයන්වහන්සේ ලොව පහළව අපමහබෝසත් අජිතනාම් බ්‍රාහ්මණව ඉපද බුදුපාමොක් මහසඟණට මහදන්දී විවරණශ්‍රී ලැබූසේක.

7 සෝභිතනාම් බුදුරජානන් වහන්සේට මෑතභාගයෙහි, කප්අසංඛ්‍යයක් බුද්ධශූන්‍යවගියකල අනෝමදස්සී සර්වඥයන් වහන්සේ ලොවපහළව අපමහබෝසත් මහානුභාඇති යක්‍ෂසේනාධිපතියෙක්ව-බුදුපාමොක් මහසඟණට මහදන්දී විවරණශ්‍රී ලැබූසේක.

8 අනෝමදස්සීනාම් බුදුරජානන් වහන්සේට මෑත එම කල්පයෙහි දෙවන අතුරුකප පදුමනම් සර්වඥයන්වහන්සේ ලොව පහළව අපමහබෝසත් කිසිසේත් සිංහරාජව ඉපද බුද්ධාලම්බනප්‍රීතීන් එම උත්තමයන්වහන්සේට දිවිපුදා විවරණශ්‍රී ලැබූසේක.

9 පදුමනම් බුදුරජානන්වහන්සේට මෑත එම කල්පයෙහි තුන්වන අතුරුකප නාරදනම් සර්වඥයන්වහන්සේ ලොවපහළව අපමහබෝසත් අෂ්ටසමාපත්තිලාභී උග්‍රතාපසයෙක්ව බුදුපාමොක් මහසඟණට මහදන්දී විවරණශ්‍රීලැබූසේක.

10 නාරදනම් බුදුරජානන් වහන්සේට මෑතකප්අසංඛ්‍යයක් බුද්ධශූන්‍යව ගියකල්හි මේ මහාභද්‍රකල්පයට ලක්‍ෂයක්වන කල්පයෙහි පදුමුත්තරනම් සර්වඥයන්වහන්සේ ලොවපහළව අපමහබෝසත් ජටිලනම් මහාරට්ඨිකව, බුදුපාමොක් මහසඟණට මහදන්දී විවරණශ්‍රී ලැබූසේක.

11 පියුම තුරානම් බුදුරජානන් වහන්සේට මෑත තිස්දහසක් කප් බුද්ධශූන්‍යව ගියකල්හි මෙකපට හැත්තෑදහස්වන කල්පයෙහි සුමේධනම් සර්වඥයන්වහන්සේ ලොව පහළව

අපමහ බෝසත් උත්තරනම් මාණවකව බුදුපාමොක් මහ සඟණට මහදන්දී විවරණශ්‍රී ලැබූසේක.

12 සුමෙධනම් බුදුරජාණන් වහන්සේට මෑත එමකල්පයෙහි දෙවන අතුරුකප සුජාතනම් සර්වඥයන්වහන්සේ ලොවපහළව, අපමහ බෝසත් සක්විතිරජව, බුදුපාමොක් මහ සඟණට සප්තරත්න සහිත සතරමහත් දිවයින රාජ්‍යයපුද විවරණශ්‍රී ලැබූසේක.

13 සුජාතනම් බුදුරජාණන් වහන්සේට මෑත කප් හැටඅටදාස් දෙසියයක් බුද්ධශූන්‍යව ගියකල්හි මෙකපට කල්ප එක්දාස් අටසියයකට මතු මණ්ඩනම් කල්පයෙහි පියදස්සිනම් සර්වඥයන්වහන්සේ ලොවපහළව අපමහබෝසත් කාශ්‍යපනම් මාණවකව කෙළලක්ෂයක් ධන වියදමින් සංඝාරාමයක්කරවා උන්වහන්සේට පිළිගන්වා විවරණශ්‍රී ලැබූසේක.

14 පියදස්සීනම් බුදුරජාණන් වහන්සේට මෑත එමකල්පයෙහි දෙවන අතුරුකප අත්ථදස්සීනම් සර්වඥයන්වහන්සේ ලොවපහළව අපමහබෝසතාණෝ මහත් සෘද්ධිඇති සුසිමනම් තාපසව මදාරාමල් ඡත්‍රයක්පුද විවරණශ්‍රී ලැබූසේක.

15 අත්ථදස්සීනම් බුදුරජාණන් වහන්සේට මෑත එමකප තුන්වන අතුරුකල්පයෙහි ධම්මදස්සීනම් සර්වඥයන්වහන්සේ ලොවපහළව අපමහබෝසත් සක්දෙව්රජව ඉපිද දිවසුවඳ ආදිත්පුද විවරණශ්‍රී ලැබූසේක.

16 ධම්මදස්සීනම් බුදුරජාණන් වහන්සේට මෑත කප්එක්දාස් හත්සිය හයක් බුද්ධශූන්‍යව ගියකල්හි මෙම කපට අනූහතරවන කල්පයෙහි සිද්ධාර්ථනම් සර්වඥයන් වහන්සේ ලොව් පහළව් අපමහ බෝසත් උග්‍රතෙජස් ඇති මඞ්ගල නම් තාපසව මහා දඹපලපුද විවරණශ්‍රී ලැබූසේක.

17 සිද්ධාර්ථනම් බුදුරජාණන් වහන්සේට මෑත කප්දෙකක්බුද්ධශූන්‍යවගියකල මෙකපට අනූදෙවන කල්පයෙහි තිස්සනම් සර්වඥයන්වහන්සේ ලොවපහළව අපමහා බෝසතාණෝ සුජාතනම් තාපසව දිවමදාරමල් ආදිය පුද විවරණශ්‍රීලැබූසේක.

18 තිස්සනම් බුදුරජාණන් වහන්සේට මෑත එමමණ්ඩනම් කල්පයෙහි දෙවන අතුරුකප ඵුස්සනම් සර්වඥයන්වහන්සේ ලොවපහළව අපමහ බෝසත් විජිතාවීනම් රජව ඉපද රාජ්‍යශ්‍රීහැර මහණව පිටකත්‍රධාරීව විවරණශ්‍රී ලැබූසේක.

19 ඵුස්සනම් සර්වඥයන් වහන්සේට මෑත මෙකපට අනූඑක්වනකල්පයෙහි විපස්සීනම් සර්වඥයන් වහන්සේ ලොවපහළව අපමහබෝසතාණෝ මහත් අනුභාඇති අතුලනම්

නාගරාජත්ව සපතරත්නයෙන් විසිතුරු රත්නපීඨයක් පුද විවරණශ්‍රී ලැබූසේක.

20 විපස්සීනම් බුදුරජානන් වහන්සේට මෑත කප් එකුන් සැටක් බුඩශූන්‍යව ගියකල්හි මෙකපට තිස්එක්වන කල්ප යෙහි සිඛීනම් සර්වඥයන් වහන්සේ ලොවපහළව අපමහ බෝසතාණෝ අරින්දමනම් රජව බුදුපාමොක් මහසඟණට මහදන්දී විවරණශ්‍රී ලැබූසේක.

21 සිඛීනම් බුදුරජානන්වහන්සේට මෑත එමකල්පයෙහි දෙවන අතුරුකප වෙස්සභූනම් සර්වඥයන්වහන්සේ ලොව පහළව අපබෝසතාණෝ සුදර්ශනනම් මහරජව බුදුපාමො ක් මහසඟණට මහදන්දී විවරණශ්‍රී ලැබූසේක.

22 වෙස්සභූනම් බුදුරජානන් වහන්සේට මෑත එක්තිස් කල්පයක් බුඩශූන්‍යව ගියකල්හි මේ කල්පයෙහි පළමුවන අතුරුකප කකුසඳනම් සර්වඥයන් වහන්සේ ලොවපහළව අපමහ බෝසතාණෝ ඛෙමනම් මහරජව බුදුපාමොක් මහ සඟණට මහදන්දී විවරණශ්‍රී ලැබූසේක.

23 කකුසඳනම් බුදුරජානන් වහන්සේට මෑත මෙමකල්ප යෙහි දෙවන අතුරුකප කොනාගමනම් සර්වඥයන්වහන් සේ ලොවපහළව අපමහබෝසත් පර්වතනම් මහරජව බුදුපා මොක් මහසඟණට මහදන්දී විවරණශ්‍රී ලැබූසේක.

24 කොනාගමනම් බුදුරජානන් වහන්සේට මෑත මෙම කල්පයෙහි තුන්වන අතුරුකප කාශ්‍යපනම් සර්වඥයන්වහන් සේ ලොවපහළව අපමහ බෝසතාණෝ ජෝතිපාලනම් මා ණවකව ත්‍රිවෙදයෙහි පරතෙරට පැමිණ කල්‍යාණමිත්‍ර සෙ වනයනිසා මහණව පිටකත්‍රධාරීව බුදුසසුන් හොබවා ලො වුතුරා බුඩත්වයපිණිස අන්තිම විවරණශ්‍රී ලැබූසේක.

තවද දීපඞ්කරනම් බුදුරජානන් වහන්සේලොව පහළවූ මෙමකල්පයෙහිම උන්වහන්සේට ප්‍රථමයෙන් තණ්හඞ්කරය මෙධඞ්කරය සරණඞ්කරය යන බුදුවරයන් වහන්සේලා තුන් නමක්ද ලොවපහළවූසේක, එසේදවුවත් උන්වහන්සේලා කෙරෙන් අපභාග්‍යවතුන් වහන්සේ නියත විවරණය නො ලත්සෙයින් මෙම දූරෙ නිදානයෙහි නොදක්වූයේය, එසේ නමුත් අට්ඨකථාවෙහි ඒ කල්පයපටන් බුදුවරයන් වහන්සේ ලාගේ නාමයෝ දක්වනලදී. කෙසේදයත්?

තණ්හඞ්කරො මෙධඞ්කරො අථොපි සරණඞ්කරො,
දීපඞ්කරොප්සම්බුඩො කොණ්ඩඤ්ඤො දිපදුත්තමො.

මඞ්ගලොච සුමනොච රෙවතො සොභිතොමුනි,
අනොමදස්සී පදුමො නාරදො, පදුමුත්තරො.
සුමෙධොච සුජාතොච පියදස්සී මහායසො,
අත්ථදස්සී ධම්මදස්සී සිද්ධත්ථො ලොකනායකො.
තිස්සොඵුස්සොච සම්බුද්ධො විපස්සී සිඛී වෙස්සභූ,
කකුසන්ධො කොණාගමනො කස්සපොචාපි නායකො.

තණ්හංකරය, මෙධංකරය, සරණංකරය, දීපංකරය, කොණ්ඩඤ්ඤය, මඞ්ගලය, සුමනය, රෙවතය, සොභිතය, අනොමදස්සීය, පදුමය, නාරදය, පදුමුත්තරය, සුමෙධය, සුජාතය, පියදස්සීය, අත්ථදස්සීය, ධම්මදස්සීය, සිද්ධාර්ථය, තිස්සය, ඵුස්සය, විපස්සීය, සිඛීය, වෙස්සභූය, කකුසඳය, කොණාගමය, කාශ්‍යපය, මෙසත්විසිදෙනා වහන්සේලායි.

---

## සිද්ධාර්ථකුමාරකථාවේ—1 කාණ්ඩය.

මෙසේ දීපංකරාදි සර්වඥයන්වහන්සේලා සමීපයෙන් ලත් සූවිසිවිවරණඇති අපමහ බෝසතානන්වහන්සේ සමතිස් පාරමී ධර්මයන් සම්පූර්ණකොට වෙස්සන්තර මහරජව පොළොව ගුගුරුවා සත්සතක මහදන්දී එම වෙස්සන්තරාත්ම භාවයෙන් චුතව තුසිපුර පැමිණ මහත් දිව්‍යසැපවිඳිමින් සිටියදී බුද්ධහලාහලනම් කොලාහලයෙක් ලොව පහළවිය-කෙසේද? මෙයින් අවුරුදු දහසක්හුගේ ඇවෑමෙන් සර්වඥයන්වහන්සේ නමක් ලොකයෙහි උපදනාසේකැයි ලොකපාලදෙවියෝ හඬනාකියමින් මනුෂ්‍ය පථයෙහි ඇවිදිති, මේ ශබ්දය අසා දසදහසක් සක්වල ශක්‍රබ්‍රහ්මාදි දෙවියෝ මේ මගුල්සක්වළට රැස්ව තුසීපුර වසන බෝධිසත්වයන්වහන්සේ කරා එළඹ.

කාලොයංතෙ මහාවීර උප්පජ්ජමාතුකුච්ඡියං,
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සුඅමතංපදංයි.

නිදුකානන්වහන්ස දසපෙරුම්පුරන්නාවූ නුඹවහන්සේ ශක්‍රබ්‍රහ්මාදි සම්පත්කැමතිකරමින් පිරුසේක්නොවෙයි, වැලිදු ලොකවාසීන් සසරදුකින්මුදවා නිර්වාණපුර පමුණුවන පිණිස දසපෙරුම් පුරණලද්දේය, එසේහෙයින් නිදුකානන්වහන්ස, ඔබටබුදුවීමට කල්වන්නේයයි ආරාධනාකළාහුය-ඉක්බිතිඅප මහ බෝසතානෝ දෙවියන්ගේ ආරාධනාවට ප්‍රතිඥානොදීම.

කාලං දීපංච දෙසංච කුලංමාතර මෙවච,
එතෙපංචවිලොකෙත්වා උප්පජ්ජන්ති තථාගතා යි.

කාල, දීප, දෙස, කුල, ජනෙත්ති, ආයුපරිච්ඡේදවසයෙන් පඤ්ච මහාවිලොකණයකොට බුදුවීමට කල්බවදැන දෙවියන්ට ප්‍රතිඥාදී දෙවියන්යවා, තුසිපුරදෙවියන්විසින් පිරිවරණලදුව නන්දනොද්‍යානයෙහි ඇවිදිමින්සිට දෙව්ලොවින්චුතව, ඇසළමස මැදිපොහොලද උතුරසළ්‍ෂනකතින් අළුයම්රාත්‍රියෙහි මහාමායාදෙවින්ගේකුස ප්‍රතිසන්ධිග්‍රහණයකළසේක — එහි විස්තර මෙසේදතයුතු — එසමයෙහි වනාහි කපිලවස්තු පුරයෙහි ඇසළකෙළිනම්වූ මහත් උත්සවක්‍රීඩාවක් වූයේය, මහජනයෝ ඉස්සෝදූනාහා හැඳ පැලඳ නකත් කෙළි කෙළිති සුඬොදන මහරජතුමාද සොලොස් කළයක් සුවඳපැනින් නාහා ලක්‍ෂයක් අගණා සළුවක් හැඳ සූසැටක් ආභරණයෙන් සැරසී ශක්‍රදෙවෙන්ද්‍රලීලාවෙන් සිංහාසන නැගීහිඳ ඇමතිගණයා පිරිවරා සැණකෙළි සිරිදිඳි, එකල මහාමායාදෙවිද දිව්‍යස්ත්‍රියකසේ සැරසී පන්සියයක් ස්ත්‍රීන් පිරිවරා මගුල් පොකුණට වැද නඳුන්පොකුණුවන් නානාදූනම් දිවගණමෙන් ජලක්‍රීඩාකොට ලක්‍ෂයක් අගණා කසිසළුවක් හැඳ සර්වාභරණයෙන් සැරසී රජගෙටගොස් රත්පායෙහි මතුමාලට නැගී ශ්‍රියගන් ගබඩාවෙහි මල් අතුරවනලද යානක් මතුයෙහි නිද්‍රොපගතවිය, අපමහ බෝසතානන්ගේ ප්‍රතිසන්ධි වෙලාවෙහි මහාමායාදෙවි මෙබඳුසව්ප්නයක් දුටහ — ධ්‍රතරාෂ්ට්‍රාදිවරන් මහරජුන් සතරදෙන බිසව් යානාවසමග ඔසවා හිමවතට ගෙණගොස් සැටයොදුන් සිරියෙල් ගල්තෙලෙහි සත්යොදුන් මගසල් රුක් මුලතබා එකත්පසෙක සිටියාහුය, ඉක්බිත්තෙන් ඒ වරම් රජදරුවන්ගේ අගමෙහෙසිවරු අවුත් දෙවිය, අනොතත්තවිලට ගෙණගොස් මිනිස්ගඳ හරණපිණිස නහවා දිවපිළි හඳවා දිවගඳ විලවුන් ගල්වා දිවමල් පලඳවා එයින් නුදුරුතැන රිදීපර්වතයක පිහිටි රත්පහයෙක් ඇත එහි පශ්චිමදිගට සිරසලා සැතපෙන ලෙසට දිවයානක් පණවා දෙවින් එහි සැතැප්පවූවාහුය, ඉක්බිති සෙවතහස්තියෙක් රිදිපර්වතයට නැගී උතුරුදිගින් අවුත් රිදීදමක්වන් සොඬින්, සෙවතපද්මයක් ගෙණ කුඤ්චනාදකොට රත්විමනට ප්‍රවිෂ්ටව බිසව් හොත් යහන තුන්විටක් ප්‍රදක්‍ෂිණකොට දකුණු පාර්ශවයෙන් කුක්‍ෂියට පැමිණියාක් මෙන්විය, ඉක්බිති පිබිදියාවූ දෙවී, දෙවනදවස් ඒ ස්වප්නය සුඬොදන රජහට දැන්වූයේය, එකල්හි රජතෙම වෙදයෙහි දක්‍ෂ සූසැටක් පමණ බ්‍රාහ්මණ පණ්ඩිතයන් ගෙන්වා විලඳ ඉයිම් වසයෙන්

කාරණලද මගල්‍ය සත්කාර ඇති භූමියෙහි මාහැඟි අසූන්
පණවා බමුණන් එහි හිඳුවා ගිතෙල් මී සකුරුඳින් යුක්ත පැ
න්නුමුසු කිරිබත්පිරූ රන්තලි සූසැටක් බමුණන්ට දන්දී
ඔවුන් සතුටුකරවා බිසවුන් දුටු ස්වප්නය කියා එහි විපාක
විචාළාහුය, බ්‍රාහ්මණයෝ කියන්නාහු මහ රජ්ජුරුවන්වහ
න්ස, ඔබගේ දෙවීන් කුස දරුගර්භයෙක් පිහිටියේය, හේද
පුරුෂගර්භයක, ඔබවහන්සේට ඇතිවූයේ පුත්රුවනක, හේ
තෙම ඉදින් ගිහිගෙයි විසුවහොත්, සක්විතිරජවෙයි, ගිහි
ගෙන් නික්ම පැවිදිවූවහොත් ලොවුතුරා බුදුවෙයි කිවාහු
ය, මෙසේ අපමහබොධිසත්වයන් වහන්සේ මව්කුසපිළිසිඳ
ගැණීම සමග එකපැහර සියලුම දසදහසක් සක්වළ ක
ම්පාවූවාය, කුඹල්සකක්මෙන් භ්‍රමනයදවූවාය, වෙවුළුවාය,
දෙතිස්මහා පූර්විනිමිතිද පහළවිය, දසදහසක් සක්වළ සිය
ලු ප්‍රදීපයන්ගේද, රත්නජාතීන්ගේද, දිව්‍ය විමානයන්ගේද,
තාරකාවන්ගේද, චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේද, ශක්‍රාදි සියලු දෙවියන්
ගේද, මහාබ්‍රහ්මාදි සියලුබ්‍රහ්මයන්ගේද, යනමේ සියල්ල
න්ගේම අලොකයෝ හිරුඋදයෙහි කණාමැදිරි අලොකය
මෙන් මැඩපවත්වා අප්‍රමාණවූ ආලොකයෙක් එදවස් ලොව
පහළවූසේක — මෙසේ බොධිසත්වයන් මව්කුස පිළිසිඳිමේ
පටන්. බොධිසත්වයන්ටද, බොධිසත්ව මාතාවුන්ටද, උපද්‍රව
වළකනුපිණිස, සතරවරම් දෙව්මහරජදරුවෝ, සතරදිග ශ්‍රී
යහන් ගබඩාවෙහි කඩුගත් අත්ඇතිව රැකවල් ගත්තාහුය,
හුදෙක් ඔවුන් සතරදෙනපමණක් නොවෙයි, දසදහසක්
සක්වළින් එකි එකී සක්වළක වරම් රජදරුවෝ, සතර ස
තරදෙන බැගින් සතළිස් දහසක් වරම් රජදරුවෝ ගෘහ
ද්වාර ප්‍රාසාදද්වාර නගරද්වාරයෙහි පටන්, සක්වළ ගලදක්වා
හාත්පසින් කඩුගත් අත්ඇතිව රැකවල් ගත්තාහුය, තවද
ඇතුල් කුසහොත් බොධිසත්වයන් වහන්සේ විශෙෂයෙන්
ප්‍රසන්නවූ ජෝතිරස මාණික්‍යයක අමුනනලද රත් පලස්
හුයක් මෙන් බොධිසත්ව මාතාවෝ දක්නාහ, තවද උන්
වහන්සේ තුසීපුර විසූවාක්මෙන් සිහියෙන්ද යුක්ත වන්
නේමය — යම්හෙයකින් බොධිසත්වයන් විසූ මව්කුස ධාතු
කරඬුවක් සමානවේද, එබැවින් අන්කිසිවෙක්විසින් වස
න්ටත් ප්‍රයොජන විඳින්ටත් නොපිළිවන්වේද, ඒ කාරණ
යෙන් බොධිසත්වමාතාවෝ, බෝධිසත්වයන් උපන් සත්දව
සින්ම කාලක්‍රියාකොට මාතෘනාම් දිව්‍යරාජන්ව තුසිතපුර
යෙහි උපදින්නාහ —

තවද යම්සේ අන්‍යස්ත්‍රීහු දසමසක් නොපැමිණත් වදද්ද, දසමස ඉක්මවාත් වදද්ද, හිඳිමින්හෝ සැතපෙමින්හෝ වදද්ද, බොධිසත්ව මාතාවෝ වූකලි එසේ නොව දසමස්හුගේ ඇවෑමෙන් වැඩසිටම වදන්නාහ.

## සිද්ධාර්ථකුමාර කථාවේ-2-කාණ්ඩය.

මහාමායාදෙවිද දසමස් ඉක්මීමෙන් පිරුණු ගැප්ඇතිව, තමන්ජාතවූ දෙව්දහනුවරට යනුකැමතිව සුද්ධොදන මහරජානන්ට එපවත් දැන්වූකල්හි, ඒ ඇසූ රජතෙම යහපතැයි සතුටුව, කපිලවස්තු පුරයෙහි පටන් දෙව්දහනුවර දක්වා පූර්ණකලස් ධජපතාකාදීන් මාර්ගය අලංකාරකොට සරසවා, දෙවිය රන්සිවිගෙයක හිඳුවාගෙණ ඇමතියන් දහසක්සමග මහත් පිරිවරින් නික්මුනාහුය—ඒ කිඹුල්වත් පුරයටද දෙව්දහනුවරටද අතරෙහි සඳුන්ආදි නොයෙක් වෘක්ෂපංක්තීන් සැදුම්ලත් ලුම්බිනීනම් මගුල්සල් උයනෙක්ඇත එසමයෙහි නොයෙක් මත් මොණර කොවුල්ආදී සියගණන් පක්ෂිසමූහයා විසින් රාවදෙන ලද්දාවූද, දෙව්ලොවින් ගිලිහී බිම්වැටිගිය දිව්‍යඋයනක් වැනිවූද, මහානුභාව සම්පන්න රජකෙනෙකුට මනාකොට පිළියෙලකරණලද ආපානමණ්ඩලයක් වැනිවූද, ඒ උයනදුටු මහාමායාදෙවී තොමෝ එම සල්උයනෙහි උයන්ක්‍රීඩාකරණු කැමතිවිය—එබවදත් අමාත්‍යයෝද අදහස්ලෙස මගුල්උයනට දෙවීන් වඩාලූසේක—එකල්හි මහාමායාදෙවී සුපුෂ්පිත සල්රුකක්මුලට පැමිණී අත්තක්අල්වනු කැමතිවිය—එකණෙහි සිත්ලෙස ශාඛාවනැමී දෙවීන්ගේ හස්තයට උපගතවිය—ඒ සල්අත්ත දකුණතින් ගෙණ නැගෙනහිර දිශාවබලා සිටියදීම බොධිසත්වයෝ මව්ගැබින් ප්‍රසූතවූසේක—යම්සේ අන්‍යයෝ මව්කුසින් ප්‍රසූතවන්නාහු, පිළිකුල්වූ මලමූත්‍රාදීන් ගැවසීගත් ශරීර ඇතිව ප්‍රසූතවෙද්ද—මහබෝසතානො එසේ ප්‍රසූතවූයේනොවෙයි, කෙසේද-ධර්මාසනයකින් බස්නා මහාධර්මකථික කෙනෙකුන්මෙන් දිගුකරණලද අත්පාඇතිව කසීවස්ත්‍රයෙක්හි වසාතබනලද ජාතිරත්නමාණික්‍ය යක්මෙන් පිරිසිදු ශරීර ඇතිව, වෙසග මැදිපොහොලද කුජදින විසා නකතින් ප්‍රසූතවූසේක—එකල්හි ප්‍රහීණකරණලද කාමරාගයන් ඇති සුද්ධාවාස බ්‍රහ්මයෝ සතරදෙනෙක් රන්දැලින් බොධිසත්වයන් පිළිගෙණ මහාමායා දෙවී ඉදිරියෙහිසිට, දෙවීනි සතුටුවූ සිත් ඇතිවෙව මහානුභාව සම්පන්න පුත්‍රරුවනෙක් තොපට උපන්නේයයි කීවිය—ඒ සුද්ධාවාස බ්‍රහ්මයන්අතින්

වරම්රජදරුවෝ උතුම් සුවපහස්ඇති අඳුම්දිවිසමින් පිළිගත්තාහුය—වරම් රජදරුවන්අතින් අමාත්‍යයෝ දුහුල් සුඹුලකින් පිළිගත්තාහුය—ඉක්බිති බොධිසත්වයන් වහන්සේ ඔවුන් අතින් බැසසමපත්ලෙන් භූමියෙහි පිහිටා නැගෙනහිරදිශ බලමින් මහපියුමක් මතුපිට වැඩසිටිනසඳ මහබොධිසත්වයන්හා මහාමායාදේවීන්ට සත්කාරපිණිස, අහසින් සඵටිකමාණික්‍යවන් ජලධාරාවෝ දෙදෙනෙක් අවුත් දෙදෙනාවහන්සේගේ ශරීරයෙහි සෘතු ග්‍රහණයකරමින් සතුටුකළාහුය—මෙපමණක්ම නොවෙයි සියලු ලොකයෙහිම දෙතිස් පූර්වනිමිත්ද පහළවෙමින් සිටියදී උතුරුදිසාභාගයට වැඩිසේක—පිළිසිඳුම් බිහිවීම් ආදියෙහි ලොවපහළවූ ආශ්චර්ය අද්භූතවූ දෙතිස්පූර්වනිමිති නම් කිමයත්?

1 එදවස් දසදහසක් සක්වළ මහපොළෝ එකනිත් නාද පැවැත්වූ මහීකම්පනාවය.

2 දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මාදී සියල්ලන්ගේම ආලොක මැඩපවත්වා එදවස් එකාලොකවීමය.

3 සියලු ජාත්‍යන්ධයෝම එදවස් නොයෙක් රූපදැකීමෙන් අහොසාධු අහොසාධුයි මිහිරිබස් බෙණෙමින් සතුටුවීමය.

4 සියලුම ජාති ගොළුවන් එදවස් එකහෙලා ලීලොපෙනව එකනිත් ගී නාද පැවැත්වීමය.

5 සියලු ජාති බිහිරන්ම එදවස් භෙරි වීණා ගීතිකාආදී ශබ්දඇසීමෙන් එකනිත් සතුටුවීමය.

6 දෙපයෙන් යානොහී උපන්තැන්පටන් පිලුවච්චූඅය සතුටුව අත්පොළසන්දෙමින් එදවස් අදහස්ලෙස ගමන්යාමය.

7 උපන්තැන්පටන් කුදුවළුන් අය විශේෂවූ ගාත්‍රාලදින් උස්තැන්වලතිබූ එලාඑලබිඳකමින් එදවස් මහත් සතොෂයට පැමිණීමය.

8 ඒ ඒ තැන බැඳුම්ලත් ඇත් අස් මොණර පරවි ආදින් එදවස් තමතමන්ගේ බැඳුම් මිදීමෙන් සතුටුලෙස ගමන්යාමය.

9 දසදහසක් සක්වළ තෙළෙස් ලක්‍ෂසැටදහසක් නරකවල ගිනි එකපැහැර නිවීයාමෙන් නිරිසතුන්ට එදවස් මනොහර සිසිල්ගුණ ලැබීමය.

10 කල්පයක් මුළුල්ලේ බත් පැන් නොලත් ප්‍රේතයින්ට එදවස් බත්පැන් ලැබීමෙන් සාපිපාස සන්සිඳී සතුටුවීමය.

11 උපත් තැන්පටන් මරණභයින් ඇවිදින තිරිසන් අපායික සත්වයෝ එදවස් නිර්භිතව ඇවිදීමය.

12 දසදහසක් සක්වළ සියලු සතුන්ගේ අසාධ්‍ය රොගයන් එදවස් සන්සිඳී, අහොසුඛං අහොසුඛං යි සන්තොෂ වචන කීමය.

13 කාලාවකාදි දසකුලයෙහිම ඇතුන් එදවස් සන්තොෂයෙන් කුචනාදකිරීමය.

14 සියලු සතුන්ම ඔවුනොවුන් අප්‍රිය වචන නොකියා එදවස් ප්‍රියවචනම කීමය.

15 සියලුම අශ්වරාජයන් එදවස් මධුරවූ හෙසාරව නාදයෙන් ඝොෂා කිරීමය.

16 එදවස් හැමසිංහරාජයන් ගල්මුදුනට නැගී බුදුහු මව් කුසපිළිසිඳිසේකැයි ලොවට හඬගසන්නාසේ කළාවූ සිංහ ගජ්නාවය.

17 මීමුන් ගවරුන් සෙමරුන් ආදී සියලු සිව්පාවෝම එදවස් තමතමන්ගේ නාදයෙන් ඝොෂාකිරීමය.

18 දස දහසක් සක්වළ දෙව් මිනිසුන් පැළඳි කනක කටකාදි සියලු ආභරණම එදවස් බැබළීමය.

19 එදවස් දසදහසක් සක්වළ දසදිග එකහෙළා බුඩරශ්මියමෙන් රැස්විහිදි දිවීමය.

20 සියලුම වාත වලාහකයන් සැඩපවන් දුරුකොට වන මල්සුවඳින් යෙදුනු මදපවන් පැවැත්වීමය.

21 වස්සවලාහකයන් අකාල මෙඝ නගා දසදහසක් සක්වළ එකනින් වැසිවැස්වීමය.

22 මහපොළොව පලා නාඹ තල්කඳසා ජලධාරාවන් රිදී කඳන්සේ ඒ ඒ දිග දිවීමය.

23 සියලු පක්ෂීන් එදවස් අහසින් නොගොස් තුරුඅග නොහිඳ මිහිමඬලට බැස තමතමන්ගේ ධ්වනියෙන් මධුරනාද කිරීමය.

24 නොයෙක් දහස් ගඟාවන් යටිගංබලා යන ගමන්හැර බුදුහු උපන්හයි සතුටුවබලා සිටිනාසේ නොගොස් රඳාපීමය.

25 දසදහසක් සක්වළ සතළිස්දහසක් සමුද්‍රයන්ගේ රළසංසිඳී ලුණුදිය අනතඩ්ානව එදවස් මිහිරිජලයෙන් පිරී පැහැදී සිටීමය.

26 එදවස් සතළිස්දහසක් සාගරයෙහි පස්වණක් මල්පිපීමෙන් සජීන වීමය.

27 දිය ගොඩ පිපෙන හැමමල් සමූහයම එකවිට ප්‍රබුඩව දසදිග එදවස් සුවඳ පැතිරීමය.

28 තවද දසදහසක් සක්වළ ගල්මුල්වල එදවස් අගදක්වා මල් පිපීමය.

29 එදවස් දසදහසක් සක්වළ පොළොවපලා සත්බුමුදඬු පියුම් පිපීමය.

30 එදවස් සියලු අහසතල මුලුල්ලෙහිම පියුමෙන් අතුරු නැතිව උඩුබලා නවූතිබීමය.

31 එදවස් දසදහසක් සක්වළ මුලුල්ලෙහි මල්වැසි වැස පියා එක මල්අස්නක්මෙන් වීමය.

32 අභිඛවජයට නිමිත්තපානාසේ එදවස් ලොවපහළවූ ධජමාලාවෙන් බඹලෝ වසාගැන්මය—

මේ දෙතිස් පූර්වනිමිත්ත "අනඩසසපබ්බතාරොහං වියත්වචං නහොතීති අච්ඡරියං" සී-අනඩයාගේ පර්වත නැගීම නිත රනොවීමමෙත් ආශ්චය්ය-"පුබ්බෙනහොතීති අබ්භුතං" සී පෙර නොවූ දෙයක් හෙයින් අද්භූතවේ.

1 ආශ්චය්ය අද්භූතකාරණය, සර්වඥතාඥනයාගේ ලැබීමට පූර්වනිමිත්තය.
2 ආශ්චය්ය අද්භූත කාරණය, දෙව්මිනිස් සහිත බොහෝ ජනයන්ගේ සිත් පිතවනබවට පූර්වනිමිත්තය.
3 දිවැස්ලැබීමට පූර්වනිමිත්තය.
4 ධම්මචක්‍රය පවත්වන කාලයෙහි එකහෙලා සාධුනාද පැවතීමට පූර්වනිමිත්තය.
5 දිව්‍යශොත්‍ර ධාතුවගේ ලැබීමට පූර්වනිමිත්තය.
6 චතුර්විධ ඍද්ධි පාදයන්ගේ ලැබීමට පූර්වනිමිත්තය.
7 බොහෝදෙන අධිගමලාභීව නිවන්දක්නා බවට පූර්වනිමිත්තය.
8 අසම් මාන්‍යයාගේ සිඳිමට පූර්වනිමිත්තය.
9 රාගාදි එකොළොස් ගිනි නිවීමට පූර්වනිමිත්තය.
10 කායගතාසති අමෘත ප්‍රතිලාභයට පූර්වනිමිත්තය.
11 ආය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයෙන් සත්වයන් නිර්භය කරණ බවට පූර්වනිමිත්තය.
12 චතුස්සත්‍ය ධම්මප්‍රතිලාභයෙන් අහොසුඛංසී. ප්‍රිතිවචන කීමට පූර්වනිමිත්තය.
13 ධම්මය පිළිගෙණ සතුටුව ප්‍රිතිවචන කීමට පූර්වනිමිත්තය.
14 සතරබ්‍රහ්මවිහාරභාවනාවගේ ප්‍රතිලාභයට පූර්වනිමිත්තය.
15 අනුපූර්ව විහාරභාවනා ප්‍රතිලාභයට පූර්වනිමිත්තය.
16 මහත්වූ සද්ධම්ම නැමැති භෙරිනාදය ඇස්වීමට පූර්වනිමිත්තය.
17 ආය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගනැමැති දෛරහැරීමට පූර්වනිමිත්තය.

18 සියලු ලොකයාහට දහම්නැමැති ආලොකය දක්වනබවට පූර්වනිමිත්තය.

19 අවිද්‍යානැමැති අඳුරුවිදහා විද්‍යානැමැති ආලොක දැක්වීමට පූර්වනිමිත්තය.

20 දෙසැට දෘෂ්ටිගතිය බිඳහෙලීමට පූර්වනිමිත්තය.

21 මහත්වූ සඞර්ම නැමැති වර්ෂාව වැස්වීමට පූර්වනිමිත්තය.

22 කායික චෛතසිකවූ සෘතුසැප ඉපදවීමට පූර්වනිමිත්තය.

23 මහජන සමූහයා අවවාද පිළිගෙණ ජීවිතාන්තය දක්වා සරණයන බවට පූර්වනිමිත්තය.

24 චතුර්විධ වෛසාරද්‍ය ඥානයාගේ ලැබීමට පූර්වනිමිත්තය.

25 නිර්වාණරසයෙන් එකරසභාවය ලැබීමට පූර්වනිමිත්තය.

26 බුඞත්වයට පැමිණ උදාන වාක්‍ය පවත්වන බවට පූර්වනිමිත්තය.

27 විමුක්ති සැපනැමැති පුෂ්පයෙන්හා ශ්‍රාමාණ්‍ය ඵලභාරයෙන් හරිතවීමට පූර්වනිමිත්තය.

28 විමුක්ති සැපහිත් සැපතට පැමිණෙනබවට පූර්වනිමිත්තය.

29 සතර සතිපට්ඨාන ධර්මයාගේ ලැබීමට පූර්වනිමිත්තය.

30 සිව්පිළිසිඹියාවගේ අධිගමනයට පූර්වනිමිත්තය.

31 දසදහසක් සක්වළ දහම් නැමැති මල්වැසි වැස්වීමට පූර්වනිමිත්තය.

32 අභිධ්වජමාලාවෙන් සියලුලොවමාලිතබවටපූර්වනිමිත්තය

## 3 කාණ්ඩය.

මෙම දෙතිස් පූර්වනිමිති පහළුවෙමින් සිටියදී මව්කුසින් බිහිවූ බොධිසත්වයන් වහන්සේ පිළිවෙළින් පෘථිවියට වැඩ සම්පාදයෙන් වැඩසිට සහම්පතිනම් මහාබ්‍රහ්මයාවිසින් ධවලච්ඡත්‍රධරණලදුව, සුයාමනම් දිව්‍යරාජයාවිසින් වල්විදුනා සලනලදුව, ඒ ඒ දිව්‍යරාජයන් විසින් රත්නකර්මාන්තයෙන් සොභනවූ මගුල්කඩුවහා, රත්මිරිවැඩිසඟල නලල්පට ගත් අත්ඇතිව දිව බඹුන් විසින් පිරිවරණලදුව උතුරුදිගට අභිමුඛව පියුම් මතුයෙන් සත්තපදවීති හාරවසානකොට සත්වනවූ සත්බුමුමහ පියුම්මතුයෙහි වැඩසිට කෙළලක්‍ෂයක් සක්වළ බලනුයේ, බැලූබැලූ දිශාවෙහි දිව්‍යබ්‍රහ්මයන් විසින් ස්වාමිනි මේ දිශාවෙහි ඔබවහන්සේහා සමානකෙනෙකුත් නැත, ඔබවහන්සේට වැඩිකෙනෙකුත් නැත, එබැවින් මේ දිශාව බැලීමෙන් ප්‍රයොජන නැතැයිකීකල මනොඥවූ මුඛ සුගන්ධයෙන් භුවනතලය සුවඳකොට මහත්වූ බ්‍රහ්මඝොෂාවෙන් දෙව්මිනිසුන්සහිත සියලු ලොකයාට මම දැන් අ

ගුවූයෙමි, ප්‍රධානවූයෙමි, ශ්‍රෙෂ්ඨවූයෙමි, මෙමාගේ කෙළවර උත්පත්තිය වන්නේය—නැවත උත්පත්තියෙක් නම් නැතැයි—මේ උත්තම සිංහනාදය උපන් ඇසිල්ලෙහිදීම වදාළසේක—පූර්ව, දක්ෂිණ, පශ්චිම, යන තුන්දිශාවටද මෙසේම සප්තපද වීතිහාරය කොට—"අග්ගොහමස්මි ලොකස්ස ජෙට්ඨොහමස්මි ලොකස්ස සෙට්ඨොහමස්මි ලොකස්සඅයමන්තිමාජාති නත්ථිදානි පුනබ්භවො"යි-යනමේ අභීතවචනය වදාළසේක-මෙසේ සිංහනාදකළ ඉක්බිති දෙනුවරවාසීහු අපමණ පූජා පෙළහරපවත්වමින් ප්‍රමාණාතික්‍රාන්ත ශ්‍රීසම්පත් බෝධිසත්ත්වයන්වහන්සේ කිඹුල්වත්පුරයට වැඩමවාගෙණ ගියාහ. එදවස්දඹදිව කිඹුල්වත්පුරනුවර සුද්ධෝදනමහරජහට පුත්‍රරුවනෙක් උපන උන්වහන්සේ බෝමැඩ වජ්‍රාසනාරූඪව වැඩහිඳ ලොවුතුරා බුදුවෙති යි, තව්තිසාවැසි දෙවියෝ එහි මහත් උත්සවයක් කරත්ටවත්හ, එසමයෙහි සුද්ධෝදන රජහුගේ කුලූපගවූ කාල දෙවලනම් තපස්වීනෙමේ බත්කිස නිමවා දිවාවිහාර පිණිස තව්තිසා භවනයටගොස් එහි දහවල් විහරණය පිණිස හුන් තේ උත්සවකරණ දෙවියන් දැක, එඹා දෙවතාවෙනි, මෙසේ සතුටු සිත්ඇතිව කුමක් නිසා ක්‍රීඩාකරව්ද, මටත් මේකාරණය කියවයි විචාළේය, දෙවියෝ කියනනාහු පින්වත්වූ තාපසයෙනි සුද්ධෝදන මහරජහට පුත්‍රරුවනෙක් උපන, උන්වහන්සේ බෝමැඩ වැඩහිඳ, ලොවුතුරාබුදුව ධම්මචක්‍රය පවත්වයි උන්වහන්සේගේ අප්‍රමාණ බුද්ධලීලාව දක්නටද ධම්මශ්‍රවණය කරන්ටද ලබම්හ, මේකාරණයෙන් සතුටුව උත්සවකරම්හයි කිවාහුය.

කාලදෙවල තාපසයෝ එපවත්අසා වහාදෙව්ලොවින්බැස රජගෙට පැමිණ පණවනලද අස්නෙහි හුන්නේ, මහරජ පුත්‍රරුවනෙක් නුඹට උපන්නේද ඔහු දකිනු කැමැත්තෙමියි කීහ—එකල්හි පියමහරජහුද සර්වාභරණයෙන් සරසනලද පුත්‍රරුවන ගෙන්වා ඇකයෙහි හිඳුවාගෙණ, පුත තපස්වීන්වැඳ පින්රැස්කරගණුවයි කියා තපස්වීන් වඳනාලෙස යොමු කෙළේය, එකල අපමහ බෝධිසත්ත්වයන්ගේ පාදයෝ පෙරළී තාපසයන්ගේ ජටාමතුයෙහි පිහිටිසේක මුන්වහන්සේගේ මේ ආත්මභාවයෙන් වැඳුන්ගතයුතු කිසිවෙක් නැත, ඉදින්වනාහි නොදැනවත් බෝධිසත්ත්වයන්ගේ සිරස පාමුල තැබුවානම් තාපසයන්ගේ හිස සත්කඩක්ව පැලෙන්නේය, එහෙයින් තාපසයෝද මා නොනැසූව මැනවැයි හුනස්නෙන් නැගී දෑහොත්මුදුන්දී, බෝධිසත්ත්වයන් වහන්සේට නමස්කාර කෙළේය—ඒ ආශ්චර්යදුටු සුදසුන් මහරජ

නෝද තමන්ගේ පුත්‍රරත්නයට වැන්දෑහ, මේ කාලදේවල
තාපසයන්වද අතීතයෙහි සතළිස් කපෙක, අනාගතයෙහි
සතළිස් කපෙකැයි අසූකපක් පෙනෙණ ඤාණයඇත-එහෙ
යින් බෝධිසත්ත්වයන්ගේ ලක්‍ෂණ සම්පත්දැක බුද්ධත්වය සිද්ධවේ
දෝ නොවේදෝහෝයි බලන්නේ සැකනැතිවම බුදුවෙති
යි දැන මූන්වහන්සේ ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍ය පුද්ගලයෙ
කැයිසිතා සිනාසී, නැවත, මට මේ උතුමන් බුදුවූකල දක්
නට ලැබේද නොලැබේදෝ හෝයි පරීක්‍ෂා කරන්නේ
නොලැබෙයි බුදුවෙන්ට ප්‍රථමයෙන් කාලක්‍රියාකොට බුදුව
රයන් සියදහසක් විසිනුදු නිවණ් අවබොධයකරවන්ට නො
හැකිවූ අරූපභවයෙහි උපදින්නෙම්යි දැක මෙබඳු ආශ්චර්‍ය්‍ය
පුරුෂයා බුදුවූකල දක්නට නොලැබෙම්යි මහත් ශොකයෙ
න් හැඬූය—එහි රැස්වූ මනුෂ්‍යයෝ ඒ දැක තාපසයෝ දැන්
ම සිනාසී නැවත හඬන්ට වන්හ, මේ කාරණය කිමෙක්
දැයිසිතා ස්වාමීනි අපගේ මේ උතුමන් වහන්සේට කිසි
අන්තරායෙක් වන්නේදැයි විචාළෝය, ඒ අසා තාපසයෝ
මේ උත්තම කුමාරයාහට අන්තරායෙක් නැත සැකනැතිව
ම බුදුවන්නේය, ඒ ගැණ සතුටුව සිනාවූයෙම්—මේ උතුම
න්වහන්සේ බුදුවූකල දක්නට නොලැබී මා මහලුහෙයින්
අතරෙහි කාලක්‍රියාකෙරෙමි, එහෙයින් හැඬිමියි කීහ-තවද
බෝධිසත්ත්වයන් උපන් පස්වනදිනයෙහි රජගෙය සිව්දැ ග
ඳින් පිරිබඩගෙණ—ලද පස්මල්ඹුස ත්‍රිවෙදයෙහි පරතෙර පැ
මිණි බ්‍රාහ්මණයන් ගෙන්වා පණවනලද අසුන්වල හිඳුවා
මනාබොජුන් වළඳවා සත්කාරකොට බ්‍රාහ්මණයෙනි මේ
කුමාරයන්ගේ පුණ්‍යලක්‍ෂණබලා නිසි නාමයක් තැබීම සහ
මතු සිදුවනලෙසද කියවයි විචාළකල, ඔවුන් අතුරෙන්

රාමොධජො ලක්ඛණොචාපි මන්ති
කොණ්ඩඤ්ඤො භොජො සුයාමො සුදත්තො යි.

දක්වනලද රාමය, ධජය, ලක්‍ෂණය, මන්තිය, කොණ්ඩඤ්ඤ
ය, භොජය, සුයාමය, සුදත්තය, යනමේ බ්‍රාහ්මණයන් අටදෙ
නා අතුරෙන් සත්දෙනෙක් ඇඟිලි දෙක දෙක ඔසවා කියත්
නාහු දෙවයන්වහන්ස සතුටුවූව මැනව, මේ කුමාරතෙම ම
හෙශාක්‍ය කෙනෙක, යමෙකුගේ කුලයක මෙවැනි පුත්රුව
නෙක් උපන්නේනම් ඔවුන්ට වූයේ මහත් ලාභයෙක, දෙව
යන්වහන්ස මේකුමාරතෙම දෙතිස්මහා පුරුෂලක්‍ෂණයෙන්
සමන්විතය මේ මහා පුරුෂයානන්ට දෙගතියෙක් වන්නේය,
ඉඳින් මූන්වහන්සේ ගිහිගෙයි විසූයේනම් කොදෙව් දෙදග

සක් පිරිවරකොටඇති සතර මහත් දිවයිනට එකාත ඡත්‍රව සප්තරත්නයෙන් සමන්විතව චක්‍රවර්තිරාජ්‍යයට පැමිණ ධර්ම රාජත්ව චක්‍රරත්නයෙන් ආකාශචාරිව ඇවිදිනසේක—ඉඳින් විනාශී ගිහිගෙය හැර පැවිදිවූයේනම්, රාග, ද්වේෂ, මෝහ මාන්‍ය, දෘෂ්ටි, ක්ලේශ, තෘෂ්ණා, සංඛ්‍යාත ලෝකයෙහි ආවරණයන් අනාවරණකොට, සර්වඥතාඥානයෙන් යුක්තව බුද්ධත්වයට පැමිණෙනසේකැයි ඔවුන්විසින් මෙසේ දෙගතියෙක් ප්‍රකාශකරණ ලද්දේය, ඒ හැමට වයසින්බාල ගෝත්‍රයෙන් කොණ්ඩඤ්ඤනම්වූ මාණවකතෙම බෝධිසත්වයන්ගේ පින් ලකුණු යහපත් ශාස්ත්‍රඥානයෙන් බලා මෙවැනි උත්තමයෝ ගිහිගෙයි විසීමෙක්නම් නැත එකාන්තයෙන්ම මූන්වහන්සේ බුදුවන්නේමයයි නියමකොට එක ඇඟිල්ලක් ඔසවා එකක්මකියා බුදුවීමට හෙතුවූ ලක්ෂණයන් ගෙණහැර දක්වූත්තේ මෙසේ කීහ.

1 "අයංහි දෙවකුමාරො සුප්පතිට්ඨිත පාදො, ඉදම්පිඅස්ස මහාපුරිසස්ස මහාපුරිස ලක්ඛණං භවති".

යනුහෙයින් අනුන්ගේ පාදතලයෙහි අගහෝ, විලුඹහෝ එක්පාශ්වයක්හෝ පළමුකොට භූමිය, ස්පර්ශකෙරෙයි, පාදතල මධ්‍යයෙහි සිදුරක්හෝ පෙණෙයි—පතුල් නගණකල්හිදු අග්‍රපාදතලාදිය කෙරෙන් එකතරතැනක් පළමුවනැගෙයි, මෙසේ නොව මූන්වහන්සේගේ පතුල්තලයෝ ස්වර්ණ පාදුකාවක් සෙයින් එකපැහැරම බිම ස්පර්ශකෙරෙයි—එකපැහැරම නැගෙයි, එසේ හෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම සුප්‍රතිෂ්ඨිත පාදඇත්තේය, මේද මහා පුරුෂයන්වහන්සේගේ මහා පුරුෂලක්ෂණය වන්නේය.

2 "ඉමස්සදෙව කුමාරස්ස හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි ඉදම්පිඅස්ස මහාපුරිසස්ස මහා පුරිසලක්ඛණං භවති".

දෙවයන්වහන්ස මේ කුමාරයන් වහන්සේගේ දෙපතුල් මධ්‍යයෙහි සර්වාකාරයෙන් සම්පූර්ණවූ දහසක්දැව්හා නිම්සහිතවූ නාභිසහිතවූ චක්‍රයන් දෙදෙනෙක් ඇතිවූවාහුය, ඒ චක්‍රයතුල නොහොත් දෙපත්ල මධ්‍යයෙහි නාභිපෙණෙයි, නාභියවටාසිටි වටරේඛාපෙණෙයි, නාභිය මුවවිටද වටරෙඛාපෙණෙයි, ඊංමැද දත්පෙණෙයි, දත්පිටිනූ වටරෙඛාපෙණෙයි, ඒ දත්වෙට්ට, නිම්වළලුපෙණෙයි, ඒ නිම්වළයවට ස්වස්තිකය, ශ්‍රීවත්සය, නන්දාවර්තය, සෞවස්තිකය, අවතං

සඛය, උෂ්ණීසපට්ටය, මාණික්‍යරත්නය, සුමනදාමය, වර්ධ
මානය, භද්‍රපීඨකය, ප්‍රවාලසාගරය, මඟුල්තොරණය, ප්‍රාසා
දය, සේවතච්ඡත්‍රය, ඛඩ්ගය, තාලවෘන්තිකය, මයූර හ
ස්තකය, වාලවීජනිය, නීලොත්පලය, රක්තපද්මය, සේව
තපද්මය, නීලපද්මය, පූර්ණඝටය, පූර්ණපාත්‍රය, සවර්ණසාග
රය, චක්‍රවාට පර්වතය, හිමාල පර්වතය, සවර්ණමෙරු පර්වතය,
සූර්‍ය්‍යමණ්ඩලය; චන්ද්‍රමණ්ඩලය, සපිරිවරින් සිටිනා සතරම
හද්වීපය, සපිරිවරින් සිටිනා චක්‍රවෘත්තිය, දක්ෂිණ සේවත
සංඛය, සවර්ණමත්ස්‍ය යුගලය, චක්‍රායුධය, සප්තමහා ගඞ්ගා
වෝය, සප්තකූටපර්වතය, සුංසුමාරරාජය, ධජය, පතාකය,
සවර්ණසිවිකාය, කෛලාසකූටය, සිංහරාජය, ව්‍යාඝ්‍රරාජය, ව
ලාහක අස්වරාජය, උපොසථ හස්තිරාජය, වාසුකී නම් නාග
රාජය, සවර්ණහංසරාජය, වාසහරාජය, ඓරාවණ හස්තිරාජය,
සවර්ණමකරරාජය, කිම්පුරුෂය, කුරවීකය, සවර්ණ මයූරරාජය,
ක්‍රෞඤ්චරාජය, චක්‍රවාකය, ජීවංජීවකරාජය, ෂට්විධ දිව්‍යලො
කය, ෂොඩෂවිධ බ්‍රහ්මලොකය, යනමෙතෙක් මංගල්‍ය
ලක්ෂණයෝ මූත්වහන්සේගේ පතුල් සුත්දෙකෙත් පෙ
ණෙති, මේද මහා පුරුෂයත්වහන්සේගේ මහා පුරුෂලක්ෂ
ණය වන්නේය.

3 “අයංහි දෙවකුමාරෙ ආයතපණ්හි”—යම්සේ සෙසසත්
ගේ පාදාග්‍රය දික්වෙයි, විලුම්මුදුනෙහි සිඳුම්කාකුලවෙයි, විලු
ඹ සැසතැබූවාක්මෙන් පැතැලිවෙයි, මේ කුමාරතෙම වනා
හි එසේනොවෙයි, මූත්වහන්සේගේ පාදයෙහි, සතරභාග
යෙන් දෙභාගයක් පාදාග්‍රයවෙයි, තුන්වන භාගයෙහි, ජං
ඝාසංඛ්‍යාත පාදයපිහිටියේය, සතරවනභාගයෙහි අගින්වට්
ට තිබූ රතන කම්බිලියක ගොණ්ඩුකයක් වැනී දික් විලුඹ
වෙයි, එසේහෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම ආය
තපණ්හි නම්වෙයි.

4 “අයංහි දෙවකුමාරෙ දීඝංගුලි”—යම්සේ අන්‍යයන්ගේ
ඇතැම් ඇඟිලි දික්වෙයි, ඇතැම් ඇඟිලි ලුහුඬුවෙයි, මේ
කුමාරතෙම එබඳු නොවේ, මූත්වහන්සේගේ හස්තපාදාඞ්ගු
ලිහු; මකුළුවන්ගේ ඇඟිලි මෙන් දික්ව, මුලින්දළව, ක්‍රම
යෙන් අගින් සිහින්ව, නියසිාස තෛලයෙන් හණාවැටි කා
රණලද; සිරියෙල් වැටිමෙන්, සොභනාවූ දික්ඇඟිලි ඇති
හෙවත්, එසේහෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම දී
ඝංගුලිනම් වෙයි.

5 “අයංහි දෙවකුමාරෙ මුදුතළුණ හත්ථපාදෙ”—ප්‍රසන්න

ගිණෙහිලා ගලාහණිනලද සියස්වර පෙළූ පුලුන් රෙදක්සෙයින් අතුල්පතුල් මොලොක්වෙයි ජාතමාත්‍ර කුමාරයන්නුගේ අතුල්පතුල්මෙන් හැමකල්හිම තරුණවෙයි, එසේහෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම මුදුතළුණ හත්පාදනම් වෙයි.

6 "අයංහි දෙව කුමාරෙ ජාලහත්පාදො,'

අත සතර ඇඟිලෙලෝද, පය සතර ඇඟිලෙලෝද, එකප්‍රමාණව ඔවුනොවුන් විනිවිද සිටිනබැවින් දක්ෂ වඩුවෙකු විසින් යොදනලද ජනෙල් කවුළුවක්මෙන් සොභනවෙයි, එසේ, හෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම ජාලහත්පාදනම් වේ.

7 "අයංහි දෙවකුමාරෙ උස්සංඛපාදො"

අන්‍යයන්ගේ ගොප් ඇටය, පාද පිටිපාෂ්ඨයෙහි වෙයි, මුන්වහන්සේට වූකලී "උද්ධං පතිට්ඨිත ගොප්ඵකත්තා උස්සංඛපාදො"—යනුවෙන් පා අභිමුඛයෙහි උසව පිහිටි ගොප් ඇටය ඇතිවෙයි, එසේ හෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම උස්සංඛපාදනම් වෙයි.

8 "අයංහි දෙවකුමාරො එණිජංඝො"—මුන් වහන්සේගේ ජංඝාව හාත්පසින් සමව මසින්වැසී මනාකොට වැඩෙනා ලද හැල්නැබක් සෙයින් සම්පූර්ණබැවින් එණිමෘගයන්ගේ ජංඝාව වැනිනුයි, එසේ හෙයින් දෙවයන්වහන්ස, මේකුමාරතෙම එණිජංඝනම් වෙයි.

9 "අයංහි දෙවකුමාරෙ ඨිතකො අනොනමන්තො උභොහි පාණිතලෙහි ජන්නුකානි පරිමසති පරිමජ්ජති"—සෙසසත්ගේ ඌර්ධකාය, අධොකාය දෙක අසම්පූර්ණබැවින් සිට නොනැම්, දෙදන පිරිමදින්ට අසමර්ථවෙති—මේ කුමාරතෙම වනාහි සම්පූර්ණ උභයකායඇති බැවින් සිට නොනැම් දෙඅත්ලෙන් දෙදන පිරිමදියි, එසේ හෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම, "ඨිතකො අනො නමනො" යනු වෙයි

10 "අයංහි දෙවකුමාරෙ කොසොහිතවත්ථ ගුය්හො"—වෘෂභවර වාරණාදීන්ගේ අඞ්ගජාතය සෙයින් පුරුෂව්‍යඤ්ජනය ස්වර්ණපද්ම කර්ණිකාවක්බඳු, කොෂ ගර්භයෙහි අවහිතව සැඟවී තිබෙනබැවිනුද, හෙම වස්ත්‍රයෙන් සැඟවිය යුතුබැවිනුද, දෙවයන්වහන්ස, මේ කුමාරතෙම කොසොහිත වත්ථ ගුය්හනම් වෙයි.

11 "අයං හි දෙවකුමාරො සුවණ්ණවණ්ණො කඤ්චනසන්නිභත්තචො"—ජාති හිඟුලකයෙන් මැද දිවිදළින් ඔප්නගා ගෛරුක පරිකර්මයකොට නිමවනලද සණරණ් පිළිමයක් මෙන් ස්වර්ණවර්ණවූ රණ්පතඩැනි ඡවිවර්ණයද ඇතිවෙයි, එසේ හෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම සුවණ්ණවණ්ණනම් වනසේක.

12 "අයං හි දෙවකුමාරො සුඛුමච්ඡවි සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිම්පති"—සියුම්වූ ඡවිය ඇතිවන බැවින් ධූලිහෝ දූලිහෝ ශරීරයෙහි නොම ඇලෙයි, නෙළුම්පත්‍රයෙහි පැන්බිඳු සෙයින් පෙරළාවැටෙයි, එසේහෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම සුඛුමච්ඡවිනම් වෙයි.

13 "අයං හි දෙවකුමාරො එකෙකලොමො එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි"—එකී එකී රෝමකූපයෙහි දෙකතුණ නැතිව එකී එකී ලොමයෝ උපදිනාහුය, එසේහෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම එකෙකලොමනම් වෙයි.

14 "අයං හි දෙවකුමාරො උද්ධග්ගලොමො උද්ධග්ගානි ලොමානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි පදක්ඛිණාවත්තකජාතානි"-නිල්වූ අඳුන්වර්ණවූ රෝමයෝ දක්ෂිණාවෘත්තව උඩුබලා නැමී මුඛ සොභාව බලන්නාක්මෙන් ජාතව සිටිති, එසේ හෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම උද්ධග්ග ලොමනම්වෙයි.

15 "අයං හි දෙවකුමාරො බ්‍රහ්මුජ්ජුගත්තො"—සෙසසත් බොහෝ සෙයින්ම ග්‍රීවයෙන්හෝ කටියෙන්හෝ දනමඩලින්හෝ නැමෙති, දික්ශරීර ඇතිවෙති ඇතැම්කෙනෙක් එක්පාර්ශ්වයකින් වක්වෙති, සමහරෙක් නකත් තරුගණනුවක් මෙන් උඩුබලා ඇවිදිති, සමහරෙක් ලේ මස් ස්වල්පබැවින් දික් හුල්මෙන් වෙව්ලමින් ඇවිදිති, මුත්වහන්සේවූකලි සෘජුවූ උස්වූ ශරීරඇතිසෙයින් දෙව්නුවර නැගූ රුවන් තොරණක්මෙන් සොභනහෙයිනුද; බ්‍රහ්ම සමාන සෘජුවූ දෙහයෙන් යුක්තහෙයිනුද, දෙවයන්වහන්ස මේ කුමාරතෙම බ්‍රහ්මුජ්ජුගත්තනම් වෙයි.

16 "අයං හි දෙවකුමාරො සත්තුස්සදො"—දෙඅත්පිටය, දෙපාපිටය, දෙඅංසකූටය, ග්‍රීවය, යනමේ සත්ස්ථානයෙහි සම්පූර්ණ මාංසයෙන් උත්සන්නව ග්‍රීවය ස්වර්ණභෙරියක් සමානවෙයි, එසේ හෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම සත්තුස්සදනම් වෙයි.

17 "අයංහි දෙවකුමාරො සීහපුබ්බද්ධකායො"—සිංහයාගේ පූර්වාර්ධකයම සම්පූර්ණවෙයි, පශ්චිමකය අසම්පූර්ණවෙයි, මූන්වහන්සේගේවූ කලී සිංහයාගේ පූර්වකයමෙන් සියලුම කය සම්පූර්ණය, ගේද සිංහයාගේමෙන් සමහරතැන් කුඩාමහත්ව පිහිටියේ නොවෙති, දිඝීවියයුතුතැන් දිඝීවෙත්, ලුහුඩුවිය යුතුතැන් ලුහුඩුවෙත්, දැඩිවිය යුතුතැන් දැඩිවෙත්, සිනින්විය යුතුතැන් සිනින්වෙත්, යනාදින් මූන්වහන්සේගේ ආතමයට සමාන රූපයක් ලොව සියලු ශිල්පීන් විසින්හෝ සියලුම සෘඩිමතුන් විසින්හෝ කරන්ට අසමර්ථය, එසේහෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම සීහපුබ්බද්ධ කාය නම් වෙයි·

18 "අයංහි දෙවකුමාරො චිතන්තරංසො"—අන්තරංසය නම් දෙඅංසයන්ගේ අතරපිට මධ්‍යය, සෙසසත්ගේ මෙන් පිට දෙපාශ්වය වෙන්නොව එතැන්හි මාංසය එකතුව පරිපූර්ණව නොහොත් කටිය පටන් ග්‍රීවය දක්වා රණ්පෝරුවක්සෙයින් මාංස පටලයෙන් පිරී සොභාමානවෙයි, එසේහෙයින් දෙවයත්වහන්ස මේ කුමාරතෙම චිතන්තරංසනම් වෙයි.

19 "අයංහි දෙවකුමාරො නිග්‍රොධ පරිමණ්ඩලො යාවතක්වස්සකායො තාවතස්වස්සව්‍යාමො යාවතක්වස්ස ව්‍යාමො තාවතස්වස්ස කායො"-යම්තුගරුකක් දිගින් පුලුලින් එකසමාන වේද, එමෙන් යම් පමණක් කයද එපමණක් බඹයද, යම් පමණක් බඹයදඑපමණක් කයද ඇතිවනබැවින්, දෙවයත් වහන්ස මේ කුමාරතෙම නිග්‍රොධ පරිමණ්ඩලනම් වෙයි.

20 "අයංහි දෙවකුමාරො සමවත්තක්ඛන්ධො"—යහපත්ව වටවූ රණ්බෙර කඳක්සෙයින් සමවූ වටවූ ග්‍රීවයක් ඇතිවෙයි එසේ හෙයින්, දෙවයත්වහන්ස මේ කුමාරතෙම සමවත්තක්ඛන්ධනම් වෙයි.

21 "අයංහි දෙවකුමාරො රසග්ගසග්ගී"—යම් රසයක් අනුභවකරණකල්හි සත්සියක් රස නහර අක්උඩුව ග්‍රීවයෙහි දුවටී සිටිති, එහෙයින් තිල බීජයක් පමණකුදු ආහරයක් දිවග තිබූකල සියලුම කයෙහි ඔජස් සපයිව නිරොගිබව දෙන්නේමය, එසේ හෙයින් දෙවයත් වහන්ස මේ කුමාරතෙම රසග්ගසග්ගිනම් වෙයි.

22 "අයංහි දෙවකුමරෙ සීහහනු"—සිංහයාගේ යට හනුවම සම්පූර්ණය උපරිම හනුව අසම්පූර්ණය සිංහයාගේ යට

හනුවමෙන් මුන්වහන්සේගේ දෙහනුවම සම්පූර්ණවෙති, පුර දෙලොස්වක් සඳවැන්න, එසේ හෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම සිහහනුනම් වෙයි—තවද ඒ කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයා උන්වහන්සේගේ හනු කෙළවර බලමින්ම යටහනුවෙහි විස්සෙක්ද, උඩහනුවෙහි විස්සෙක්දැයි සතළිස් දන්තයෝ සමව අතර සිදුරක්නැතිව පිහිටන්නාහු යයි ශාස්ත්‍රඥානයෙන් දැන මෙසේද කියේය.

23 "අයංහි දෙවකුමාරෙ චත්තාළීසදන්තො"—සෙස්සන්ට දත් සම්පූර්ණව පිරිපියාහුනම් දෙතිසෙක්වෙති මුන්වහන්සේට වූකලී සම සතළිසෙක් වෙති, එසේහෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම චත්තාළීස දන්තනම් වේ.

24 "අයංහි දෙවකුමාරෙ සමදන්තො,,—සෙස්සත්ගේ ඇතැම් දත් උස්වෙති සමහරක් මිටිවෙති විසම දන්තයෝ වෙතියි, මුන්වහන්සේට වූකලී අයපතකින් සිඳිනාලද සංඛ පටලයක් සෙයින් සමදත් වෙති, එසේහෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම සමදන්තනම් වෙයි.

25 "අයංහි දෙවකුමාරෙ අවිවරදන්තො"—සෙස්සත්ගේ දත් කිඹුල්දත්මෙන් තුනීවෙති, මත්ස්‍යමාංසාදිය කන කල දත් අතර පිරෙති, මුන්වහන්සේගේ වනාහි රන්ලතාවක බඳිනාලද විදුරුපෙළක්මෙන් අවිවරය තෙලි තුඩකින් අඳින ලද රේඛාවෙක්මෙන් දත්සමවෙති, එසේ හෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම අවිවර දන්තනම් වෙයි.

26 "අයංහි දෙවකුමාරෙ සුසුක්කදාඨො"—අන්‍යයන්ට පූති දන්තයෝ ඇතිවෙත් එහෙයින් සමහරදත් කෘෂ්ණවර්ණාදි නොයෙක් වර්ණවෙති, මුන්වහන්සේටවූ කලි යහපත්සේවත දන්තයෝවෙත් ඔසධිතාරකාව මැඩපවත්වා දිලිහෙන ප්‍රභාව ඇතිවෙයි, එසේ හෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම සුසුක්ක දාඨනම් වෙයි.

27 "අයංහි දෙවකුමාරෙ පහූතජිව්හො"—අන්‍යයන්ගේ දිව ස්ථූලදවෙයි, සිහිඳු වෙයි, ලුහුඬුද වෙයි, දික්ද වෙයි, විසමද වෙයි, එසේ නොව මුන්වහන්සේගේ ජිව්හාධාතුව මෘදුය, දික්ය, පුළුල්ය, වර්ණයෙන් සම්පූර්ණය එහෙයින් ලක්ෂණ සොයන්ට ආවුන්ගේ කාංක්ෂා විනෝදනය පිණිස ජිව්හාධාතුව මොලොක්බැවින් කඨිනසූචියක් මෙන් වටකොටගෙණ දෙනාසිකා සිදුර පිරිමදියි දික්වූබැවින් දෙකන් සිදුර පිරිමදියි, පුළුල්බැවින් සියලුම නලල්තලය ප්‍රතිච්ඡන්න කෙරෙයි.

එසේහෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම පහූත ජිව්හානම් වෙයි.

28 "අයංහි දෙවකුමාරෙ බ්‍රහ්මස්සරෙ කරවීකභාණී"—අන්‍යයෝ සිඳුනු ස්වර ඇත්තෝය, බිඳුනු ස්වර ඇත්තෝය, කවුඩු ස්වර ඇත්තෝය, එසේනොව මුත්වහන්සේ මහාබ්‍රහ්මයාගේ ස්වරය සමාන ස්වරයෙන් යුක්තවෙයි, වාපිත් සෙම් ආදීන් නොදූවුටුනුබැවින් මහාබ්‍රහ්මයාගේ ස්වරය පවිත්‍රවෙයි, එසේම මුත්වහන්සේගේ හෘදවස්තුව ශුඬබැවින් නාභියපටන් හටගන්නා ස්වරය, අෂ්ටාඞ්ග සමන්විත බ්‍රහ්මස්වරය වෙයි, පුරව් කොවුලන්ගේ හඬමෙන් මිහිරිද වෙයි, එසේහෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම බ්‍රහ්මස්වරනම්වෙයි.

29 "අයංහි දෙවකුමාරෙ අභිනීලනෙත්තො"—සියලුනෙත්‍රයම නිල්වණ්නොවෙයි, නිල්වියයුතු තැන් දියබෙරලියමල් සමාන ඉතා පිරිසිදුවූ නීල වර්ණය ඇතිවෙත් රත්වණ් වියයුතුතැන් කිණිහිරිමල්සමාන පැහැඇතිවෙත්, රක්තවර්ණවිය යුතුතැන් බඳුවදමල්වැනි පැහැඇතිවෙත්, සුදුවියයුතුතැන් ඖෂධිතාරකාව සමාන පැහැඇතිවෙත්, කලුවියයුතු තැන් රුක්පෙනෙල ඇටමෙන් පැහැඇතිවෙත්, මුත්වහන්සේගේ නෙත්සගල රන්විමනක නගනලද මැණික්මය සිව්මැදිරියක්මෙන් වැටහෙයි, එහෙයින් දෙවයන්වහන්ස මේ කුමාරතෙම අභිනීල නෙත්තනම් වෙයි.

30 "අයංහි දෙවකුමාරෙ ගොපඛුමො"—මෙහි පඛුමනම් සියලු ඇස්ගුළියවෙයි, එබැවින් එම්වනස උපන් රතු වස්සෙකුගේ අක්ෂිගුළිය සමානවෙයි, සෙස්සත්ගේ අක්ෂිගුළයෝ අසම්පූර්ණවෙති, ගැඹුරුද වෙති, මුත්වහන්සේට වනාහි සෝදාමට්ටත් කොට තබනලද මැණික් ගුළියක්සෙයින් මොලොක්වූ සිනිඳුවූ නිල්පිප්පුම් වැනිවූ අක්ෂිගුළයෝවෙත්, එසේ හෙයින් දෙවයන්වහන්ස, මේ කුමාරතෙම ගොපඛුමනම්වෙයි.

31 "ඉමස්ස දෙවකුමාරස්ස උණ්ණා භමුඛන්තරෙජාතා ඔදාතා මුදුතූලසන්නිභා ඉදම්පිස්ස මහාපුරිසස්ස මහාපුරිස ලක්ඛණං භවති"—දෙවයන් වහන්ස මේ කුමාරයාගේ දෙබැමතුර නාසිකාග්‍රයෙහි හටගෙණ නලල්තල මධ්‍යයෙන් කෙළවරව දවගත් තරුවමෙන් සුදුපැහැවූ පහන් ගිනෙල ගලාංතුබූ සියක්වරපෙළු පුලුත්රෙදක්මෙන් මොලොක්වූ ඌර්ණ රෝමයවෙයි, කෙළවරගෙණ අදනාලද්දෑහු අඩබාහුවක් පමණ දික්වෙයි, එම රෝමය රන්පෝරුවක් මැදතැබූ රිදීබුබු

ලක් මෙන්ද, රණ්කලසකින් නික්මෙන ක්ෂීරධාරාවක්මෙන්ද, අරුණුවණ්වූ ගගණතෙලෙහි බබලන ඖෂධී තාරකාවමෙන්ද, දක්ෂිණාවෘතාව නැමී අති මනොහරව උඩුබලාසිටියි, මේද මහා පුරුෂයන්වහන්සේගේ මහාපුරුෂලක්ෂණය වන්නේය.

32 "අයංහි දෙවකුමාරො උණ්හීස සීසො ඉදම්පිස්ස මහා පුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති"—සම්පූර්ණ ලලාටයද, සම්පූර්ණශීර්ෂයද, ඇතිබව වෙයි, දකුණුකණ් හිසපටන් මාංසපටලයක් සියලු නලල්තලය වසමින් පුරාගෙණ වම්කණ් සිලුව දක්වා පිහිටා මහ රජකෙනෙකුගේ, නලල බඳින රණ්පටක් මෙන්සොභාමානව දිලිහෙයි, එසේ හෙයින් දෙවයන්වහස මේ කුමාරතෙම උණ්හීස සීසනම්වෙයි, මේද මහාපුරුෂයන් වහන්සේගේ මහා පුරුෂලක්ෂණය වන්නේය—මෙසේද කියා උන්වහන්සේට නම් තබන්නාහු ලොකයෙහි සියලු අර්ථසිද්ධ කරණාර්ථයෙන් සිද්ධාර්ථකුමාරයයි නම්කළාහුය.

## 4. කාණ්ඩය.

ඉක්බිති සුද්ධොදන මහරජානෝ මාගේපුතනුවෝ කුමක් දැක පැවිදිවෙද්දැයි විචාළේය—එකල සතර පූර්වනිමිත්ත දැක පැවිදිවෙතියි කීහ—ඒ සතර නිමිත්තනම් ජරා, ව්‍යාධි, මෘත, ප්‍රව්‍රජිත, යන නිමිති සතරයයි කීහ, එසේනම් මෙතැන් පටන් මෙවැනි රූපයන් මපුතනුවන්ට දක්නට නොදෙව බුදුවීමෙන් කම්නැත මම මපුතනුවන් දෙදහසක් කොදෙව් පිරිවරකොටඇති සතරමහ ද්වීපයට අධිපතිව සක්විතිරජව සතිස්යොත්නෙක පැතිරසිටිනා පිරිවරින් පිරිවරණ ලදුව අහස්තලෙහි ඇවිදිනානු දක්නා කැමැත්තෙම්හයි කියා ජරා, ව්‍යාධි, මෘත, ප්‍රව්‍රජිත, යනමොවුන්ගේ මෙනුවරට ඊම වලක්වනු පිණිස සතරදිගින් ගව්වෙන් ගව්ව නුවර ආරක්ෂා කරවූය—

එදවස් වනාහි නම්තබන මගුල්පිණිස එතැන්හි රැස්වූ අසූදහසක් ක්ෂත්‍රියදරුවෝ මූන්වහන්සේට අපහැමගෙන් එක එක කුමරුවා බැගින් දෙම්හ, මේ තෙම බුදුවූවහොත් ක්ෂත්‍රිය මහණුන්ම පිරිවරා ඇවිද්දමැනව රජවූවහොත් රජ කුමරුවන්ම පිරිවරා ඇවිද්දමැනවැයි කියා හැමරජුන්ගෙන් එක එක කුමරුවා බැගින් අසූදහසක් රාජකුමාරවරු පිරිවරපිණිස දුන්හ—පියමහ රජ්ජුරුවෝද බොධිසත්වයන් වහන්සේට රූපසම්පත්ඇති විගතදොෂීවූ කිරිමවුන් සැලැස්වූහ, මෙලෙසින් උන්වහන්සේ මහත් ශ්‍රී සෞභාග්‍යයෙන් වැඩෙන්ට වන්සේක—නැවත එක්තරා දවසක් රජහට වප්

මඟුල් දිනයෙක්විය, එදවස් රජතෙම මහත් පිරිවරින් නික්
මෙත්තේ සිද්ධාර්ථකුමාරයන් වහන්සේද ගෙණගොස් සිසෑ
නාක්ෂෙත්‍රාසනනයෙහි ඉතාරම්‍යවූ ඝණවූ ඡායාවඇති එක්
දඹවෘක්ෂයෙක්ඇත ඒදඹතුරයට කුමාරයන්වහන්සේට අස්න
ක්පණවා කිණිගිරි මලින් අලඞ්කාරවූ සුදුවියනක්ද බදවාවට
තිර ජවනිකාදිය බඳුවා කුමාරයන් එහි සතප්පවා කිරිමවූ
න් දහසම කුමාරයන්ට රැකවල්පිණිස සිටුවා සුදසුන්මහරජ
තෝද ක්‍රීඩාපිණිස මඞ්ගල්‍යසම්මතවූ රණ්නගුලක්ද දහසක්
ඇමතියෝ රිදීනගුල් දහසක්ද, ගෙණ සීසාන්ටපටන්ගත්හ.

එසමයෙහි බොධිසත්වයන් පිරිවරාඋන් කිරිමව්ද රජහුගේ
ශ්‍රීසම්පත් බලම්හයි තිරතුළින් පිටත අවුත් බලමින් සිටියෝය,
එකල බොධිසත්වයන් වහන්සේ ඔබ්මොබ්බලා කිසිවක්හු
නොදැක වහ වහා නැගිට බද්ධපර්‍ය්‍යඞ්කයෙන් උපන් සත්වන
දිනා වැඩනිද ආණාපාණ සතියෙන් ප්‍රථමධ්‍යානය ඉපදවූසේ
ක --- එසමයෙහි සෙසු වෘක්ෂජායාවෝද, ඒ දඹවෘක්ෂයෙන්
ජායාව පිරිවරා මණ්ඩලාකාරව සිටගත්හ, නැවත කිරිම
විද ආර්‍ය්‍යපුත්‍රයන් වහන්සේ හුදකලාව නොවේදැයි වහා
තිරවලින් ඇතුල්වූකල ශ්‍රීයහන් මතුයෙහි බද්ධපර්‍ය්‍යඞ්කයෙ
න් වැඩහුන් බව දැක වහාගොස් පියමහ රජහට එබව දැන්
වූවාහුය, රජතෙමේද දිවඅවුත් ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දැක සතුටුව,
පුත්‍රයානන් වහන්ස, මේ මාගේ දෙවන වැඳීමයයිකියා
පියමහ රජතෙම උත්වහන්සේට වැන්දේය --- මෙසේ කුම
යෙන් බොධිසත්වයන් වහන්සේ සොළොස් හැවිරිදි වයසට
පැමිණිකල්හි, සුදසුන් මහරජානෝ බොධිසත්වයන් වහන්
සේට වස්සාන, හෙමන්ත, ගිම්හාන, යන තුණ්ඍතුවට සු
දුසු තුණ්පහයක් කලෝය, එකක් නවභූමකය, එකක්සත
භූමකය එකක් පඤ්චභූමකය, නැවතද පියමහ රජතෙමේ
මෙසේසිතුයේය, මපුතනුවන් රාජාභිෂෙකයට පත්කොට රා
ජ්‍යශ්‍රී දකිම්යි ශාක්‍යයින්ට හසුන් යවන්නේ මාගේ පුත්‍රයා
වයස් ප්‍රාප්තය එහෙයින් මපුතනුවන්ට රාජ්‍යයදෙමි, සියල්
ලෝම තමතමන්ගේ ගෘහවල්හි වයස්සම්පූර්ණ කුමාරිකාවරු
අපගේ රජගෙට එවත්වයි හසුන්යව්යේය, ඔවුන් හැම මහ
රජහුගේ හසුන් අසා, සිද්ධාර්ථකුමාරයෝ රූපමදයෙන් මත්ව
ක්‍රීඩා ප්‍රසූතව ඇවිදිනේය, කිසිශිල්පයක් නොදන්නේය, යු
ද්ධයක් පැමිණිකල්හි කුමක්කරන්නේද? එහෙයින් අපගේ
දියනිවරු ඔහුට පිරිවරකොට නොදෙම්හයි කීහ, පියමහ
රජ එබව තමන් පුත්‍රවූ සිද්ධාර්ථකුමාරයන්ට සැළකළේය.

උත්වහන්සේද එසේනම් ශිල්ප දක්වන්ට වටනේය, මෙයින් සත්වන දවස්හි නැයන්ට ශිල්ප දක්වන්නේයයි, නුවර බෙර හසුරුවා වදාළමැනවැයි කීසේක—බොධිසත්වයන්වහන්සේද, දහසක් පුරුෂයන් විසින් වරඇද්දයුතුවූ, සනයි දහසකින්ද යුක්තවූ, සහස්‍රථාම නම් මැඩහඟු දුනුගෙණ නුවරමැද පයඞ්ඩකයෙහි වැඩහිද, අක්ෂණවෙදී, වාලවෙදී, ශබ්දවෙදී, ශරවෙදී, ධනුර්ධරයන් රැස්කරවා මහජනයා මධ්‍යයෙහි, ලොකයෙහි ඇතිතාක් සියලුම සිල්පයන් දැක්වූසේක—එහි විස්තර "සරභඞ්ගජාතක" යෙහි ආක්‍රමයෙන් අසාබලා දතයුතු—ඒ ආශ්චර්‍ය්‍යවූ ඥාති සමූහයා බොධිසත්වයන් කෙරෙහි සැකදුරුව තම තමන්ගේ දියනිවරු සර්වාලඞ්කාරයෙන් සරහා එව්වාහුය, එකල්හි ත්‍රිභුවන තිලක වූ අපමහ බෝසතානෝ, දහසක් රුවන්දෙරටුවෙන් හා සප්තරත්නමය ප්‍රාකාරයෙන්ද, කනකරජතාදී විමන්වලින්ද සමලඞ්කෘතවූ රුවන් මෙරමුදුනෙහි පිහිටි ත්‍රයත්‍රිංශත් දෙව්නුවර අඩුනුත්කෙළක් දිවගණන් විසින් පිරිවරණලදුව රජපැමිණි සක්දෙව් රජහුසෙයින් සතළිස් දහසක්පමණ දෙවඟනන් වැනි වරඟනන් විසින් පිරිවරණලදුව, ඒ ඒ සෘතුවට සැපවූපරිද්දෙන් තුණ්පායෙහි යසොධරාදේවිය අග්‍රමෙහෙසිකොට වැඩවසනසේක—ඉක්බිත්තෙන් එක්දවසක් උයන්කෙළියට යනු කැමැත්තාවූ මහබෝසතානෝ රථාචාරීන් කැඳවා රථය යොදවයිකියා ඔහු විසින් මැනවැයි පිළිගෙණ, මහත් අනඝවූ උතුම්රථයක් සර්වාලඞ්කාරයෙන් අලඞ්කාරකොට, කුමුද පත්‍රවණිවූ මගුලස්සුන් සතරදෙනකු යොදා, බොධිසත්වයන්ට දැන්වූහ—එකල උත්වහන්සේද දෙව්විමනක්වැනි රථයට නැගී උයනට අභිමුඛව නික්මුණුකල්හි දෙවියෝ සිද්ධාර්ථකුමාරයන්ට බුදුවීමට කල්ආසන්නවිය, පූර්වනිමිති දක්වම්හයි, එක් දිව්‍යපුත්‍රයකු දත්වැටුනාවූ හිසනර පැසුනාවූ වක්වූ ශරීරඇතිව සැරයටියක්ගෙණ වෙව්ලමින් ජරාවෙන් දිරුණු වෙසක්ගන්වා දැක්වූහ; ඒ ජරාරූපය බොධිසත්වයන් හා රථාචාරිහුද දුටුකල්හි කිමෙක්ද යහළු රථාචාරීනි, මේ පුරුෂතෙම අනික් පුරුෂයන්ගේ කෙසයන් පරිද්දෙන් හිසකෙස්ද ඇත්තේ නොවෙයි, ශරීරයද අන්‍යයන්ගේ මෙන් පැහැපත් නොවෙයි, යනාදීන් විචාරා, රථාචාරිහුවිසින් ස්වාමීනි යෞවන අවස්ථාව ඉක්ම දිර්ඝසංඛ්‍යාත ජරාවටපත්වූ මහලුපුරුෂයෙකැයි කීකල්හි ඒ වචනය ඇසූ මහබොධිසත්වයෝ, "ධිරත්ථුවත භොජාති යා යත්‍රහිනාම ජාතස්ස ජරාපඤ්ඤායිස්සති"—යි න්වත එකාන්තයෙන් යම් ගෙහය

කීත් ඉපදීම් ඇත්තාහට් ජරාව පෙණේයි එ හෙයින් උත්පත්තියට නිනාදුවේවයි යනාදීත්කියා කලකිරුණු හෘදයෙන්ත්පූකතාව උයන්කෙළියට නොගොස් පෙරළා තමන් ප්‍රාසාදයටම වැඩිසේක— ඉක්බිති පියමහරජානෝ කවරහෙයකින් මපුතනුවෝ උයන්කෙළිපිණිස නොගොස් පෙරළා ආයේදැයි විචාළවිට, දෙවයන්වහන්ස, ජරාමහලු පුරුෂයෙකු දැකයයි යනු අසා, කම්පමානවූ හෘදයෙන්ත්පූකතාව, පියමහරජහුවිසින් මෙවැනි ශරීර ඇත්තෙක් මෙනුවරට නොපැමිණෙත්වයිකියා එකිඑකී පාශ්වයෙන් අඩයොදුන් පමණතැන් ආරක්ෂාතැබබවූහ— නැවතත් එක්තරා දවසක් උයන්කෙළියට යනානුහු එසේම දෙවියන් විසින් නිර්මිතකොට පෙණ්වනලද, ව්‍යාධිත්පෙළෙන පුරුෂයක්හුදැක; මේ කිමෙක්දැයි රථාචාරීන්ගෙන් විචාරා රෝගී පුරුෂයෙක්බව දැන කලකිරී ආරෝග්‍යමදය දුරුකොට නැවතත් පසු පෙරළා නුවරටම වැඩිසේක. එකල පියමහරජහු පළමුවෙන් මෙන්ම කාරණා විචාරා දැන එකි එකී දිගින් තුන්ගව් පමණතැන් ආරක්ෂාතැබ්බවූහ— නැවතත් එක්තරා දවසක් උයන්කෙළියට වඩිනානුහු දෙවනිර්මිතවූ මෘතශරීරයක් දැක පළමුපරිද්දෙන් විචාරා කලකිරී ජීවිත මදයහැර පසුපෙරළා නුවරටම වැඩියබව පියමහරජානෝ අසා එකි එකී දිශාවෙන් දැඩිකොට සතරගව් පමණතැන ආරක්ෂාතැබ්බවූහ, නැවතත් එක්තරා දවසක් උයන්කෙළියට වඩිනානුහු දෙවනිර්මිතවූ යහපත්ව හැඳ පොරවනලද පැවිදිරූපයක්දැක යහලු සාරථිය මේ කිමෙක්දැයි විචාළේය, රථාචාරිහු කිසිසේත් බුද්ධොත්පාදයක්නැතිසෙයින් ප්‍රව්‍රජිත රූපයහෝ, ප්‍රව්‍රජ්‍යාගුණයන් හෝ නොදත්තේවීනමුත් දෙවියන්ගේ අනුභාවයෙන්, දෙවයන්වහන්ස, මේ පැවිදිරූපයක, ප්‍රව්‍රජ්‍යාවේ ගුණමේයයි ප්‍රකාශකොට රථාචාරීන් විසින් කීහ, ඊට ප්‍රසන්නවූ බෝධිසත්වයන් වහන්සේ පැවිදිවීමෙහි ආලය උපදවා උයන්ක්‍රීඩා පිණිස උයනට වැඩමවා එහි දහවල් උයන්ක්‍රීඩා කරමින් දිවසභාගය ඉක්මවා මගුල්පොකුණෙන් ජලස්නානය කොට හිරු අස්තංගතකල්හි මගුල් ගල්තලාවපිට වැඩහිඳ තමන්වහන්සේ සර්වාලඞ්කාරයෙන් සැරහෙනු කැමතිවූසේක, ඉක්බිත්තෙත් පිරිවර ජනයෝ නොයෙක් වර්ණවත් නානාප්‍රකාර පිළිහා නොයෙක් රණ්රිදී ආදී ආභරණයන්ද, මල්ගඳ විලවුන්ගෙණ හාත්පසින් පිරිවරා සිටියානුය.

ඒ දැක සක්දෙව්රජතෙම විශ්වකර්මයා කැඳවා, එබෝධිසත්ව

කරීය, සිද්ධාර්ථකුමාරයන් වහන්සේ අද මධ්‍යමරාත්‍රියෙහි මහාභිනිෂ්ක්‍රමණ නික්මෙණසේක, මේ උන්වහන්සේගේ අන්තිම අලඞ්කාරය වන්නේය, එහෙයින් තොපි උයනට ගොස් ඒ මහතානන් වහන්සේ දිව්‍යාලඞ්කාරයෙන් සරහවයි කීසේක— ඒ අසා විශ්වකර්ම දිව්‍යපුත්‍රතෙම මැනවැයි පිළිගෙණ එකෙණෙහිම කප්පක වෙශයෙන් මඟුල්සල කරාඅවුත් මඟුල්කපුවා අතතුබූ සළුගෙණ දහසක් දිවසළුවලින් හිසවෙළා මිණිඔබ්බූ පළඳවා සක්දෙව් රජහු පරිද්දෙන් සරසා පිළියෙළකළේය, මෙසේ විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් සරහනලදුව, ගුරුළුන්ගේ ජවබලබඳු ගමන්ඇති ශෛවත සෛන්ධවයන් සතරදෙනකු යොදනලද උතුම්වූ රණ්රිදී මිණිරුවනින් සැදුම්ලද්දාවූ එල්වනලද නොයෙක් මල්දම්ඇති උත්තමරථයට බොධිසත්වයන් වහන්සේ පැණනැගිසේක— එසමයෙහි යශොධරාදෙවිය පුත්රුවනක් ප්‍රසූතකළේයයි යශූ සුද්ධොදන මහරජහු අසා, පුත්‍රයාට එබව දන්වම්යිකියා අපමග බෝසතානන් වහන්සේට පුත්රුවනක් ලැබුනුබව කියා හස්නක් එවූය, ඒ හස්න බොධිසත්වයන් වහන්සේ වැඩමවන මාගීයෙහිදීම අසා—"රාහුලො ජාතො බන්ධනං ජාතන්ති"—යනමේ වචන වදාළසේක, එබව පියමහරජහු අසා ඒ වචනය ගෙණ මෙතැන්පටන් මාගේ මුනුබුරා රාහුලකුමාරයයි නම්කළාහ— බොධිසත්වයන් වහන්සේද ඒ උත්තමරථයට නැගී අතිමනොරම්‍යවූ මහත් ශ්‍රීසෞභාග්‍යයෙන් නුවරට වඩිනකල්හි ප්‍රාසාදමත්‍රයෙහි හුන්නාවූ කිසාගොතමී නම් රාජකන්‍යාතොමෝ, බොධිසත්වයන් වහන්සේගේ රූපශ්‍රී දැක ප්‍රීතිසෞමනස්‍ය ඉපදී—

නිබ්බුතා නූන සාමාතා නිබ්බුතො නූන සොපිතා,
නිබ්බුතා නූන සානාරී යස්සායං ඊදිසොපති සි.

ප්‍රීතිවාක්‍ය පිණිස කියනලද, මේ නිබ්බුතිපදයෙන් යුක්ත ගාථාව බොධිසත්වයන් වහන්සේ අසා, මෑ තොමෝ යහපත් වචනයක් ඇස්වීය, මම වනාහි නිවණ් සොයමින් ඇවිදිමි, අදම මට ගෘහවාසය හැර පැවිදිව නිවණ්සොයන්ට වටින්නේය, මැට මේ ආචාර්‍ය්‍ය භාගය වේවයි ලක්‍ෂයක්අගණා මුත්හරය කිසාගොතමියටයවා, මහබොධිසත්වයන් වහන්සේ මහත් ශ්‍රීසමෘද්ධීන් ඉතා රම්‍යවූ ප්‍රාසාදයටනැගී ශ්‍රීයහන්මස්තකයෙහි සැතපුනුසේක— එකල්හි සර්වාලඞ්කාරයෙන් සැරසූනාවූ, නෘත්‍යගීතාදියෙහි මනාව හික්මියාවූ දෙවගණන් වැනි රූපශ්‍රීප්‍රාප්ත ස්ත්‍රීහු නොයෙක් තූර්‍ය්‍යභාණ්ඩයන්ගෙණ

පිරිවරා අභිරම්මණයකරත්තෝ නැටීම් ගිකීම් ආදියකළාහුය, බොධිසත්වයන්වහන්සේ කෙලශරතියෙහි නොඇලුනුබැවින් සයනයකළසේක, ඉක්බිති පුරගණවෝ එබව දැක යමක්හු පිණිස අපි නැටීම් ගීකීම් ආදියෙහි යෙදෙමුද ඔහු නිදනකල කුමක්පිණිස අපි වෙහෙසෙමුදැයි තමතමන් ගත් තූර්‍යභාණ්ඩයන් දමා ඔවුහුත් සයනය කරත්ටවත්තෝය.

එකල සුගන්ධ තෛලයෙන් දල්වනලද පහන්ඇති ප්‍රාසාදයෙහි සයනයකළ බොධිසත්වයන්වහන්සේ පිබිද අසුන්මතුයෙහි බද්ධපර්‍යඞ්කයෙන් වැඩහිඳ තූර්‍යභාණ්ඩයන් දමා නිදන ස්ත්‍රීහුදුටුසේක, එසිත් සමහරෙක් කෙලවැගිරුණු කිලුටුදෙහයෙනු, සමහරෙක් දත්කමිනු, සමහරෙක් නම්දෙඩමිනු, සමහරෙක් විවෘත මුඛයෙනු, සමහරෙක් වස්ත්‍ර ඉවත්වීමෙනු, සයනයකරණ ඔවුන්ගේ විප්‍රකාර දැක දිවවිමනක් වැනිවූ ඒ ප්‍රාසාදය එදවස් අමුසොහොනක් මෙන්වැටහි, අදම මාවිසින් මහාභිනිෂ්ක්‍රමණය කරන්ට වටනේයයි සිතා ශ්‍රීයහනින් නැගීසිට ඡන්නනම් අමාත්‍යයා කැඳවා ඔහුලවා කන්ථකනම් අශ්වරාජයාසරහවා ඡන්නයාලවා අශ්වරාජයාගේ වාලධිය අල්වා තමන්වහන්සේ අසුපිටට පැණනැගී දෙවියන් විසින් හළ දොරින් මධ්‍යම රාත්‍රියෙහි මහාභිනික්මණ් නික්මෙන්ට වත්සේක

---

සිද්ධාර්ථකුමාර කථාවෙ-2-කාණ්ඩෙ

මෙමකාණ්ඩය 18 වෙනිපිටේ 26 වෙනි පෙළහා සම්බන්ධයි.

බොධිසත්වයන් වහන්සේගේ ප්‍රසූත ක්‍රමය මෙසේය.

සම්ප්‍රසාදනීය සූත්‍රයෙහි, චතස්සො ඉමාභන්තෙ ගබ්භාවක්කන්තියො —පෙ— සම්පජානො චෙව මාතුකුච්ඡිස්මිං ඔක්කමති, සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාතිසම්පජානො මාතුකුච්ඡිස්මා නික්ඛමති අයංචතුත්ථා ගබ්භාවක්කන්ති එතදනුත්තරියං භන්තෙ ගබ්භාවක්කන්තිසු —

ස්වාමීන්වහන්ස මව් ගැබට පැමිණීම මෙසේ සතරවැදෑරුම්වෙත්—ස්වාමිනි මෙලොව සමහරෙක් සිහිමුළාව පිළිසිඳීම් වශයෙන් මව්ගැබට පැමිණේ, සිහිමුළාවම මව්ගැබවෙසේ, සිහිමුළාවම, මව්ගැබින් නික්මේ මේ පළමුවන ගබ්භාවක්‍රාන්තියයි, මේ ගබ්භාවක්‍රාන්තිය ලෞකිකවූ ප්‍රකෘති මනුෂ්‍යයින්ටය — නැවතද ස්වාමිනි, මෙලොව සමහරෙක්, සිහිමුළානොවී, පිළිසිඳීම වශයෙන් මව්ගැබට පැමිණේ—සිහිමුළාවම මව්ගැබ වෙසෙත්, සිහිමුළාවම මව්ගැබින් නික් මේ

මේ දෙවෙනි ගබ්භා වක්‍රාන්තියයි, මේ ගබ්භාවක්‍රාන්තිය මහාකාශ්‍යපස්ථවිරාදි අශීති මහාශ්‍රාවකයන් වහන්සේලාටය—

නැවතද ස්වාමීනි මෙලොවසමහරෙක් සිහිමුලානොවී පිළිසිඳීම් වශයෙන් මව්ගැබට පැමිණේ සිහිමුලානොවී මව්ගැබවෙසේ සිහිමුලාවම මව්ගැබින් නික්මේ, මේ තුන්වැනි ගබ්භා වක්‍රාන්තියයි මේ ගබ්භා වක්‍රාන්තිය, දෙඅග සවුවන් වහන්සේලාටද, පසේ බුදුවරයන් වහන්සේලාටද ඇතිවේ, උන්වහන්සේලාද වනාහි කර්මජ වාතයෙන් හිසයටිව පා උඩුව ප්‍රපාතයකින් හෙලන්නාක්මෙන් යොනි මුඛයකරා ගෙව කෙසි සිදුරෙන් අදින හස්තියෙක් මෙන් පීඩාසහිතවූ යොනි මුඛයෙන් නික්මෙමින් නොයෙක් දුකට පැමිණෙත් එය කරණකොටගෙණ උන්වහන්සේලා පවා අපි මව් ගැබින් නික්මෙන්නෙමුයි කියා නොදන්නාහුය, එසේහෙයින් සිහිමුලාව මව්ගැබින් නික්මෙති—

නැවතද ස්වාමීනි මෙලොව සමහරෙක් සිහිමුලානොවී පිළිසිඳීම්වසයෙන් මව්ගැබට පැමිණේ, සිහිමුලානොවී මව්ගැබවෙසේ, සිහිමුලා නොවීම මව්ගැබින් නික්මේ, මේ සතරවන ගබ්භා වක්‍රාන්තියයි—ස්වාමීනි ගබ්භා වක්‍රාන්ති අතුරෙන් මේ නිරුත්තරවූ උතුම් ගබ්භා වක්‍රාන්තියනම්වේ— මේ ගබ්භා වක්‍රාන්තිය සර්වඥ බොධිසත්වයන් වහසේලාටය.

සබ්බඤ්ඤූ බොධිසත්තාහි මාතුකුච්ඡිස්මිං පටිසන්ධිං ගණ්හන්තාපි පජානන්ති තත්ථ වසන්තාපි පජානන්ති, නික්ඛමනකාලෙපිච කම්මජවාතා උද්ධපාදෙ අධොසිරෙකත්වා ඛිපිතුං න සක්කොන්ති, වෙහත්ථෙ පසාරෙත්වා අක්ඛීනි උම්මීලෙත්වා සිතකොව නික්ඛමන්ති භවග්ගං උපාදාය අවීචි අන්තරෙ අඤ්ඤෙසු තිස්සු කාලෙසු සම්පජානො නාම නත්ථි ඨපෙත්වා සබ්බඤ්ඤූ බොධිසත්ත තෙනෙව තෙසං මාතුකුච්ඡිං ඔක්කමනකාලෙච නික්ඛමනකාලෙච දසසහස්සී ලොකධාතු කම්පති.

සර්වඥ බොධිසත්වයින් වහන්සේලා වනාහි මව්කුස පිළිසිඳීමින් මේ පිළිසිඳගන්නේමුයි දනිත්, එහි වසම්හද මේමව්ගැබ වසත්නෙමුයි දනිත්, නික්මෙන කල්හිද කර්මජවාතයෙන් පා උඩුව හිස යටිකුරුකොට හෙලන්ට නොහැකිවෙත්, දෙඅත දිගුකොට ඇස් උන්මීලනයකොට වැඩසිටම මව්කුසින් නික්මෙත්, භවාග්‍රයපටන් අවීචියදක්වා සර්වඥ බොධිසත්වයන් වහන්සේලාහැර මව්කුසදී අතීතාදී තුන්කල් දන්නා අනිකෙක්නම් නැත එසේහෙයින් උන්වහන්සේලා මව්

කුසට පැමිණෙනකල්හිද නික්මෙන කල්හිද දසදහසක්ලෝකධාතුව කම්පාවේ.

යථාහ් අඤ්ඤෙ අඤ්ඤො කුච්ඡිගතං—පෙ—එවං බොධිසත්තාපන පිට්ඨිකණ්ටකං පිට්ඨිතොකත්වා ධම්මාසනෙ ධම්මකථිකොවිය පල්ලඞ්කං ආභුජිත්වා පුරත්ථිමාභි මුඛො නිසීදති.

යම්සේ වනාහි සෙස්සෝ මව්කුසට පැමිණ ආමාශයෙන් යට පක්වාශයෙන් මතු උදරපටලයටත් පිටකටුවටත් දෙමැද පිටකටුව දිසාවබලා උක්කුටිකව දෙමිටහනුවෙහි තබා වර්ෂාකාලයෙහි රුක්බිලයෙහි ඉන්නා වඳුරන්මෙන් මව්ගැබහිඳිත්, බොධිසත්වයන්වහන්සේ වනාහි පිටකටුවට පිටදී ධර්මාසනයෙහි ධර්මකථිකයෙක් මෙන් බද්ධපර්‍යඞ්කයෙන් පූර්වදිගට මුහුණලා වැඩහිඳිනේය—

සාපනෙසා බොධිසත්තානං—පෙ—අයං ධම්ම නියමො නාම.—

යම්මේ බොධිසත්වයින් වහන්සේලාගේ මව්කුසටපැමිණීම් බිහිවීම්, ආදිකාලවල්හි දසදහසක්ලොකධාතු කම්පනාදිවූ දෙතිස් පූර්වනිමිති පහළවීමද, මව්ගැබ සිහියෙන් යුක්තව වැඩහිඳීමද, බිහිවූ ඇසිල්ලකින් සත්සත් පියවර වැඩමවමින් අග්‍රිතනාද පැවැත්වීම් ආදී මේ සියල්ලම පඤ්චවිධ නියමයෙන් ධර්මනියමය නම්වේ.

එසේහෙයින් මුත්වහන්සේට වනාහි මව්ගැබින් බිහිවූ සත්වන දිනයෙහි දඹරුක්මුලදී, ආණාපාණසතියට සමවත් තැන් දක්වාම තුසිත භවනයෙහි දෙව්රජව වැඩහින්දදී තිබීහිය දිව්‍යඥානය බවම දතයුතු.

---

## අභිනිෂ්ක්‍රමණ කථාවේ-1-කාණ්ඩය.

එකණෙහි මාරදිව්‍යරාජතෙම බොධිසත්වයන් යානොදී නවත්වමිසිඝ්‍රතා අහසසිට, යහළු සිද්ධාර්ථකුමාරයෙනි, නොනික්මෙව මෙයින් සත්වනදවසෙහි, තුබවහන්සේට චක්‍රරත්නාදී සප්තරත්නය පහළවීමෙන් දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇතිසතර මහත්දිවයින රාජ්‍යයලැබෙහි, මහණවීම පිණිස නොයවයි කීයේය, ඒ අසා බොධිසත්වයෝ තෝ කවරෙක්දැයි විචාළහ, ඒ අසා මාරයා මම මාර දෙව්රජ යයිකීය, බොධිසත්වයෝ කියන්නාහු මාරය, රජවනබව මමත් දනිමි, රාජ්‍යයෙන් මට කම්නැත, දසදහසක් ලොකධාතුව කම්පාකරවා බුද්ධත්වයට පැමිණෙමියි වදාළසේක, ඒ අසා මාරයා අතුරුදන්ව ගියේය—මෙසේ ඇසළමස මැදි

පොහොද උතුරුසළේනකතින් මධ්‍යමරාත්‍රියෙහි මහාභිනිෂ්ක්‍රමණ නික්මෙණසේක්, සැටදහසක් මිණිදඬුවැට පහන්ගෙණ පෙරටුව නික්මුණු දෙවියන් විසිනුද, දකුණැලයෙන් සැටදහසක් මිණිදඬුවැට පහන්ගෙණ නික්මුණු දෙවියන්විසිනුද, වම්ඇලයෙනුද එසේම සැටදහසක් දෙවියන්විසිනුද, පිටිපසිනුද එසේම සැටදහසක් දෙවියන් විසිනුද, සක්වළගලදක්වා උරෙන් උරපැහැර මිණිදඬුවැට පහන්ගෙණ සිටි අවශෙෂ දෙවියන් විසිනුද, පිරිවරණලදුව, අසුරනාගාදීන් විසින් ඉසිනාලද, පරසතු, කඩුපුල්, මල්ආදීන් පූජාලබනලදුව දසදහසක් සක්වළ දෙවියන්විසින් පවත්වනලද පසඟතුරු ආදී අපමණ පූජාලබමින් තුබූ පසළොස්පැය ඇතුළත තිස් යොදුන් මාගියගෙවා අලුයම්වේලෙහි අනොමානම් ගඟාතීරයට පැමිණ, විලුඹෙන් අශ්වයාට සන්කර අටසියයක් රියන් පුළුලඇති ගඟ එතරට ඡන්නයාත් සමග අසුපත්නා, අශ්වයාපිටින් බැස වැලිතලාමතුයෙහි වැඩසිට ඡන්නයිනි මම පැවිදිවෙමිසි ආභරණහා අශ්වයාත්ගෙණ නුවරටගොස් පියමහ රජහට පැවිදිවූබව කියවයි ආභරණහා අශ්වයාද ඔහුට පාවාදී, මේ මාගේ හිසකෙස් ශ්‍රමණසාරූප්‍ය නොවන්නේයයි සිතා—

අභිනිෂ්ක්‍රමණ කථාවේ-2-කාණ්ඩය.

ජෙට්ඨානමොලිං වරගන්ධවාසිතං
වෙහාසයං උක්ඛිපිඅග්ගපුග්ගලො
සහස්සනෙත්තො සිරසාපටිග්ගහි
සුවණ්ණචඞ්ගොට වරෙනවාසවො.

ශ්‍රෙෂ්ඨපුද්ගලවූ බොධිසත්වයන්වහන්සේ, උත්තමසුගන්ධවාසිතවූ මුහුළස සමග කෙශකලාපය වම්හස්තයෙන් අල්වා රණ්කඩුව දකුණතින්ගෙණ කෙශකලාපය සිඳ හස්තයට ගෙණ ඉදින් මම බුදුවෙම්නම්, කෙශකලාපය අහසරැඳේවයි නැතහොත් භූමියෙහි පත්තවේවයි අහසට දැමූසේක, ඒ සිඛාමාණික්‍යය සමග බඳිමිලල කලාපය යොදනක් පමණ තැන්ගොස් අහසරැඳී සිටියේය, දහසක් නෙත්ඇති සක්දෙව්රජතෙම, යොදනක් පමණ උසඇති රණ් කරඬුවකින් කෙශධාතුව සිරසින් පිළිගෙණ ගොස් තව්තිසාදිව්‍යලොකයෙහි, සිලුමිණිසෑයනම් චෛත්‍යයක් කොට අද දක්වාත් දෙවියන් විසින් වන්දනමානාදිය කරණලද්දේය—
නැවතද, ත්‍රිභුවනතිලකවූ බොධිසත්වයන් වහන්සේ, මේ කාසිසළු අනඝය ශ්‍රමණ සාරූප්‍ය නොවන්නේයයි සිතූසේක,

එබවදුටු පූර්වයෙහි, කාශ්‍යප බුදුන් දවස විශ්වාසීවූ ඝටීකාර නම් මහාබ්‍රහ්මතෙම.

තිචීවරඤ්ච පත්තඤ්ච වාසිසූචිඤ්ච බන්ධනං
පරිස්සාවණේන අට්ඨේතෙ යුත්තයොගස්ස භික්ඛුනො.

මෙසේ දක්වනලද මේ අටපිරිකර ගෙණවුත් පිළිගැන්වීය, අපමහ බෝසතානෝ ඒ අභිත්ධ්වජය ගෙණ පොරවා ඉනතිබූ සාටකයුගමය අහිත්ගෙණ පෙරසේම ඉටා ආකාසයට දැමූදැය, ඒද සතරගව්වක් අහසට නැගී ශ්වේතහංස යුගමයක්සේ ලීලොපෙතව සිටිකල මහාබ්‍රහ්මයා දෙලොස් යොදුන් රුවන්කරඬුවකින් සළුපිළිගෙණ සළුම්ණිසෑ නම් දාගැබක්කොට, දැන්දක්වා බ්‍රහ්මලොකයෙහි මහත් පූජාකෙරෙති—ත්‍රිභුවනජනශෙඛරවූ මහබෝසතානන් වහන්සේ මෙසේ පැවිදිව, සාවුරුද්දක් මුලුල්ලෙහි, අප්‍රමාණවූ දුෂ්කරක්‍රියා පුරා, වෙසක්මස මැදි පොහොදිනයෙහි අජපාල නම් න්‍යග්‍රොධවෘක්ෂමූලයෙහි වැඩඋන්සේක—එසමයෙහි, සෙනානීනම් කෙළෙඹිපුත්‍රයාගේ දූවූ කප්ලක්ෂයක් පිරූපෙරුම් ඇති සුජාතානම් සිටුදියනියන් විසින්, දසදහසක් සක්වළ දෙවියන් විසින් දිව්‍යඔජස් බහනලදුව, මිහුරු රසයෙන් පිසනලද ක්ෂීරපායාසය ලක්ෂයක්වටනා ඝණරණ් තලියක බහා ලක්ෂයක්වටිනා තලියකින් වසා තමාමහිසින් ගෙණවුත් තලියත්සමග, රුක්මුල වැඩහුන් බොධිසත්ත්වයන්වහන්සේට, දෙවතාසංඥවෙන් පුද සතුටුව ගිය ඉක්බිති රණ්තලිය සමග කිරිබත පිළිගෙණ හුනස්නෙන් නැගීසිට නෙරඤ්ජරානම් ගංතෙරට ගොස්, බුදුවන සියලු බොධිසත්ත්වවරයෝම බුදුවන දිනයෙහි බැස නහන, සුප්‍රතිෂ්ඨිතනම්තොට සමීපයෙහි රණ්තලිය තබා ස්නානයකොට ගොඩනැගී අභිත්ධ්වජයහැඳ පොරවා පූර්විදිගබලා වැඩහිඳ එකුන්පණස් පිඬක්කොට නිරුදක ක්ෂීරපායාසය වළඳා රණ්තලිය ගෙණ උඩුගංබලා යවා ඒ ගඟාතීරය සමීපයෙහි සුවඳමලින් සැදුම්ලද නිල් පැහැයෙන් සිත්කලුවූ සල්වනයෙහි දහවල් විහරණයකොට එදවස් සවස්වේලෙහි දිව්‍යබ්‍රහ්මාදීන් විසින් මදාරාදී පුෂ්පයෙන් පුදනලදුව, මහිකාන්තාවට තිලකාභරණයක් වැනිවූ තමන්වහන්සේ උපදිනා දවස්ම උපන්නාවූ හැම බුදුවරයන්ම බුදුවන ජයභූමියෙහි හටගත්තාවූ, අශ්වත්ථනම් බොධිවෘක්ෂරාජයාකරා එලඹ තුණ්වරක් ප්‍රදක්ෂිණකොට, සියලු සර්වඥවරයන් විසින් අවිජහිතස්ථානයෙහි, කුසතෘණයන් අත් උඩුකුරුකොට සලා වගුරුවා තෙලි අගින් පිරිසින්දක්මෙන්

පැණනැගාවූ තුදුස්රියන් පමණවූ වජ්‍රාසනාරූඪව වැඩහිඳ මෙසේ සිතූසේක.

---

## මාරවිජය කථාවේ-1-කාඩය.

මේ මහාපෘථිවිය යම්කාරණයකින් පෙරළෙනකල්හිදු, සියදහස් ගණන්සෙන හෙනකල්හිදු, අහස ශූන්‍යතජිනාවෙන් පැලෙනකල්හිඳු, ගිනිගෙණ දිලිහෙන කිනිරඟුරු වස්නටවන්කල්හිදු, මාගේ මේ ශරීරයෙහි, මස්, ලේ, ඇට, නහර, වියලී සුණුවිසුණු වනකල්හිදු, සම්‍යක්සම්බෝධියට පැමිණමිස මාගේ වීර්‍ය්‍යනොහරිමි, යි සිතා වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් බඩපයඞ්කය බැඳ, මට්සිලුටුවූ බෝකඳට පිටලා නැගෙනහිරට මුහුණලා වැඩහුන්සේක — එකල්හි මහාපුරුෂයානන්වහන්සේට දහසක් නෙත්ඇති ශක්‍රදෙවේන්‍ද්‍රතෙම එක්සිය විසිරියනක්පමණ දිගඇති භුවනොදරයෙහි පැතිරෙණ නාදඇති විජයුත්තරනම් සංඛය පිඹිමින් සිටියේය, පඤ්චසිඛනම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රතෙම තුණ්ගව්පමණ දිගඇති, බෙලුවපාණ්ඩු, වීණාවගෙණ ගායනාකරමින් සිටියේය, සුයාමනම් දිව්‍යරාජතෙම තුණ්ගව්පමණ දිගඇති සඳරැස් සමූහයක්සේ සශ්‍රිකවූ, දිව්‍යචාමරය ගෙණ මඳින්මඳ සලමින් සිටියේය, සන්තුසිතනම් දිව්‍යපුත්‍රතෙම, මැණික්තල්වැටක් ගෙණ සැපවූ පවන්සලමින් සිටියේය, සහම්පති මහාබ්‍රහ්මතෙමේද තුණ්යොදුන් වටවූ දෙවන පූන්සඳ මඬලක්වැනි, ශ්වේතච්ඡත්‍රය, සිරසදරමින් සිටියේය, කාලනම් නාගරාජතෙම, අසූදහසක් පමණ නාගකන්‍යාවන් විසින් පිරිවරණලදුව, සතුතිවචන සහශ්‍රයන් ගායනාකරමින් සිටියේය, දෙතිස්දිව්‍යපුත්‍රයන්ගේදෙතිස් දිව්‍යකුමාරිකාවෝ දිව්‍යමලින්සම්පූර්ණ නොයෙක් රණ්කරඬුගෙණ පුදමින්සිටියාහුය, දසදහසක් සක්වළ සියලු දෙව්බඹයෝම, මඞ්ගල්‍යවෙස්ගෙණ ධජපතාකාදිය ගත් අත්ඇතිව පෘථිවිතලයෙහි පටන් අකනිට්ඨා බ්‍රහ්මලොකය දක්වා අතුරක්නැතිව ගැවසී, පූජාකරමින්, බෝමැඩ වැඩඋන් උතුමන්වහන්සේ පිරිවරා සිටගත්තාහුය — එසමයෙහි මාරදෙව්පුත්තෙම, සිද්ධාර්ථකුමාරයා මාගේ විෂය ඉක්මවනු කැමැත්තේය, ඔහුට මාගේ විෂය ඉක්මවන්ට නොදෙමි යි, මරසෙනඟ සව්ම්පයට්ගොස්, එබවකියා, දිව්‍යබ්‍රහ්මයන් වෙවුල්වන මාරඝොෂානම් ඝොෂාවක්කොට ඒ ඝොෂාව අසා නොයෙක් ආයුධගෙණවුත් ඔහු පිරිවැරූ මරසෙනඟ ගෙණ සිද්ධාර්ථකුමාරයන් වහන්සේ දිසාවට නික්මුණේය, ඒ මාරසෙනඟ මරහුට ඉදිරියෙන් අටසාළිස් ගව්වක් තැන්ද, දකු

ණැලයෙන් අටසාළිස් ගව්වක්ද, වම්ඇලයෙන් අටසාළිස්
ගව්වක්ද, පසුභාගයෙන් චක්‍රවාට පර්වතය දක්වාද දිවඑනි,
උඩින් සතිස් ගව්වක් පමණතැන් ගැවසී දිවඑනි, ඒ සෙ
නාවගේ ඝොෂාව ගව් සාරදහසක් පමණතැන පොළොව
පැළීයන හඬක්සේ ඇසෙයි, ඉක්බිත්තෙන් මාරදෙව්පුත් නිර්
තකරණලද යෙළසියයක් යොදුන් ගිරිමෙඛලානම් ඇත්රජ
පිටනැගී ඇත්දහසක්මවා නොයෙක් ආයුධගත්අත්ඇතිව, අව
ශෙෂ මාරපිරිසද, එකෙක්ගත් වෙසක් එකෙක්නොගෙණ
ගුරුළුරජයකු අල්වන්ට නික්මෙණ දියබරනත්සේ, බෝසි
සත්වයන් වහන්සේ මැඩපවත්වන අදහසින් සමීපයට දිවආ
වාහුය—මෙසේ මරසෙන් බෝමැඩට පැමිණෙන්,පැමිණෙත්
බොධිසත්වයන් පිරිවරා සිටිදෙවියන් අතුරෙහි එකෙකුදු සිටින්
ට අසමර්ථව පැමිණි පැමිණි දිසාවෙන් පලාගියාහුය.

## මාරවිජය කථාවේ-2-කාණ්ඩය.

ඉක්බිති හුදකලාවූ මහපුරුෂයානන් වහන්සේ තමන්ක
රා දිවඑන මරසෙනග දැක මෙතැන්හි මාගේ දෙමව්පිය
නෑ සහෝදරාදී කිසිවෙක් නැත, මාගේ දසපාරමිතාවෝම
මාවිසින් බොහෝකාලයක් මුලුල්ලෙහි පොෂ්‍යකළ පිරි
සක්වැන්නා, එසේහෙයින් පාරමි ධර්මනැමැති ශස්ත්‍රයෙන්ම
පැහැර මේ මරසෙනග අඹවන්ට වටනේයයි දසපාරමී ධ
ර්මයන් සිහිකරමින් දෙවියන්විසින් පිරිවරණලදුව අසුර සෙ
නගට භයනොවෙන සක්දෙව් රජහුමෙන්, සිංහයන්විසින්
පිරිවරණ ලදුව හිවල් සෙනගට භයනොවෙන උත්තම
කෙශර සිංහ රාජයෙකුමෙන්, තමන්වහන්සේගේ තේජස්නැ
මැති ගිනෙහි මරසෙන්නැමැති පළගැටියෝ වැදීවැටෙති
යි සිතා නිර්භීතවම විදුරසුන්පිට වැඩහුන් සේක—එකල්හි
පාපි මාරතෙම වාත, වර්ෂා, පාසාණ, ආයුධ, අඞගාර, අළු, වැ
ලි මඩ, අන්ධකාර, යන මේ නවවිධ වර්ෂාව කළකල්හි,
ඒ සියල්ලම බොධිසත්වයන් වහන්සේට පූජාකළදෙයක්
මෙන් වැටීමෙන් ස්වල්පයකුදු පැකිළීමක් නැතිව වැඩහි
දිනාබව දුටු පාපිමාරයා, ක්‍රොධයෙන් කිපි තමන්ගේ පිරි
සට කථාකොට මේ සිද්ධාර්ථකුමාරයා වහාගණුව, විදුව, බ
දුව, ගෙණව, යා නොදෙවයි, යනාදීන් කිය කියා තමා
ද, ගිරිමෙඛලානම් ඇත්රජපිට හිඳ චක්‍රායුධය ගෙණ සි
ද්ධාර්ථය, මේ පය්‍යඞ්කය තොපිසතු නොවෙයි, මාසතුය,
එහෙයින් මෙහිනොසිට නැගිසිටුවයි කියා, සක්විති වත්
පිරූ චක්‍රවර්ත්ති -රජක්විසින්ලද චක්‍රරත්නයට සැඩොලෙක්

අවුත්, ශාක්‍යවංශයෙහි උපත්තොපට මේ, චක්‍රරත්නය අයති නොවෙයි, අපිවැනි සැඩොලුන්ට අයතියයි කියන්නාසේ කිසිභයක්නැතිව මාරයාවිසින් කීයේය— එපවත්ඇසූ මහබොධිසත්වයන් වහන්සේ, පාපිමවූ මාරය, තාවිසිත්පිරූ දසපාරමිතාවකුත් නැත, දසඋපපාරමිතාවකුත් නැත, දසපරමාර්ථ පාරමිතාවකුත්නැත, කරණලද පඤ්චමහා පරිත්‍යාගයකුත් නැත, පිරූ ඥාතාර්ථචය්‍යාවකුත් නැත, ලොකාර්ථ චය්‍යාවකුත් නැත, බුද්ධිචය්‍යාවකුත් නැත, එහෙයින් තටමේ පය්‍යඞ්කය නොපැමිණෙයි මටම මේ පය්‍යඞ්කය පැමිණේයයි වදාළසේක—

එපවත් ඇසූමාරතෙම කිපී තමාගේ මහානුභා සම්පන්න වූ චක්‍රායුධය බොධිසත්වයන් වහන්සේට දමාගැසීය, ඒ චක්‍රායුධය දසපාරමිධම්මයන් සිහිකරනනාවූ මහබොධිසත්වයන් වහන්සේගේ මස්තකයෙහි මල්වියනක්මෙන් සැදීසිට ගත, එකල්හි අවශෙෂ මාරසෙනග ගිණිගෙණ දිලිහෙන මහත් මහත් පර්වතකූටයන් දමාගැසූහ, ඒද මහාපුරුෂයානන් වහන්සේට මල්වැටබවට පැමිණ භූමියෙහි වැටුනාහුය—

එකණෙහි සෙසුදෙවතාවෝද සක්වළගල මුවවිටසිට කර ඔසව ඔසවා බලා පින්වත්නි අද සිද්ධාර්ථ කුමාරයන්ගේ රූපයෙන් අගපත් ආත්මභාවය නැසේය, කුමක් කරත්දැයි කියා බලත්මය, එකල්හි බොධිසත්වසත් වහන්සේ මාරයාහට ආමන්ත්‍රණයකොට මාරය මේ පය්‍යඞ්කය තෝ තටපැමිණෙයි කියයි, තෝ මේපය්‍යඞ්කය නිසා පෙරුම් පුරම්න්දන්දෙනාකල්හි කවරෙක් සාක්ෂිදැයි විචාළසේක—එපවත්ඇසූ මාරතෙම මගේ මේ මාරපිරිස සාක්ෂියයිකියා සෙනගදිසාවට අත දිගුකළේය, එකණෙහි මාරසෙනග මමසාක්ෂියෙමි මමසාක්ෂියෙමියි කියා පැවැත්වූ ශබ්දය මහත්ව බඹලොව දක්වා නැගී දෙව්බඹුන් භයපත්කරවීය, ඉක්බිත්තෙන් මාරදෙව්පුත්තෙම, සිද්ධාර්ථයෙනි තොපගේ පාරමිතාවෙහි කවරෙක් සාක්ෂිදැයි විචාළේය, එපවත්ඇසූ මහපුරුෂයානන් වහන්සේ පාපිමය තාගේදානයෙහි සාක්ෂිවූයේ සචෙතනිකවූ තාගේපිරිසමය, මටමේ ස්ථානයෙහි සාක්ෂි කියන්ට සචෙතනික කිසිවෙක්නැත සාරාසංඛ්‍ය කප්ලක්ෂයක් මුලුල්ලෙහි දුන්දන්හැර එකම වෙස්සන්තරාත්ම භාවයෙහිසිට දුන්දනට මේ අචෙතනික පෘථිවිය සාක්ෂිවූයේයයි, චීවරගර්භයෙන් දකුණු ශ්‍රීහස්තය දිගුකොට වෙස්සන්තරාත්ම භාවයෙහි සිට දෙනලද මාගේ සත්සතක දානයෙහි, තී සාක්ෂි ඇද්ද නැද්දැයි

වදාරා ශ්‍රීහස්තය දිගුකළසේක, එකල මහපෘථිවිය මම එකල්හි නුඹවහන්සේට සාක්ෂිවූයෙමි යි, කියා සතසහස්‍රවාරයක් කියමින් මරසෙනග ඉක්මවනනාක්මෙන් පෘථිවිය දෙස්කිය — මෙසේ උත්වහන්සේගේ දසපාරමිතා බලයෙන් පෘථිවිය දෙස්කීකල්හි, යෙළසියයක් යොදුන් උසඇති ගිරිමෙඛලානම් ඇත්රජ සිද්ධාර්ථකුමාරයන් දිශාවට දනබිමඇනගෙණ වැටිගියේය, මාරපිරිසද භයින් තැතිගෙණ ඒ ඒ අත පලාගියාහ, මෙසේ පැරද දිවනනාවූ පිරිස සහිත මාරයා දුටු දිව්‍යසමූහයෝ, වසවත්මරහට පරාජයවිය, සිද්ධාර්ථකුමාරයන්ට ජයවිය, එහෙයින් මේ උත්තමයන් වහන්සේට ජයපූජා කරම්හයි සුගන්ධ පුෂ්පාදියගත් අත්ඇතිව දිව්‍යබ්‍රහ්මාදීහු බොමැඩ සමීපයෙහි බෝධිසත්වයන් වහන්සේ කරා අවුත්සිට—

ජයොහිබුද්ධස්ස සිරීමතොඅයං
මාරස්සචපාපිමතොපරාජයො,
උඝොසයුං බොධිමණ්ඩප මොදිතා
ජයංතදා නාග ගණාමහෙසිනො සී.

දක්වනලද ක්‍රමයෙන් නාගයෝද—

ජයොහිබුද්ධස්ස සිරිමතො අයං
මාරස්සච පාපිමතොපරාජයො,
උග්ඝොසයුං බොධිමණ්ඩපමොදිතා
ජයංතදා, දෙවගණා මහෙසිනො සී.

දක්වනලද ක්‍රමයෙන් දිව්‍යසමූහයෝද — මෙසේම දස දහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මාදීහු මල්සුවඳ ආදීන් පූජාකරමින්, නොයෙක් ස්තුතිවචන සහස්‍රයන්ද, පැවැත්වීමෙන් උත්වහන්සේ සමීපයෙහි සිටගත්තාහුය.

---

බුද්ධඥාන කථාවේ 1. කාඩය.

මෙසේ එදවස් හිරුඅස්තයට යන්ට පළමුකොටම සපරිවාර මාරපරාජයකොට ප්‍රථමයාමයෙහි පූර්වේනිවාසානුස්මෘතිඥානය ඉපදවූසේක, මධ්‍යමයාමයෙහි දිව්‍යචක්ෂුරභිඥානය ඉපදවූසේක, පශ්චිමයාමයෙහි ආශ්‍රවක්ෂයඥානය උපදවා පෘථිවිය කම්පාකරවමින් දිව්‍යබ්‍රහ්මාදීන්ලවා කෙළදහස්ගණන් සාධුකාර දෙවමින් සකලකෙලශයන් නසා ලොවුතුරාබුද්ධත්වයට පැමිණ වදාළසේක —

මූත්වහන්සේගේ මේ ත්‍රිවිධ ඥානය මෙහි මදක් ප්‍රකාශ කෙරෙමි — එහි පූර්වේනිවාසානුස්මෘතිඥානය කවරහයත් —

පෙරවිසූ කඳපිළිවෙළදක්නා ඥානයයි, ඒ ඥානය ප්‍රභෙද
වශයෙන් පුද්ගලයන් සදෙනෙකුට ඇතිවෙත්, එම කීහ,
විසුඞ්මාර්ගයෙහි—"ඉමංහි පුබ්බෙනිවාසංජජනා අනුස්සරන්ති'
තිත්ථියා, පකතිසාවකා, මහාසාවකා, අග්ගසාවකා, පච්චෙක
බුඩා, සබ්බඤ්ඤුබුඩා"—

යනුහෙයින් කාලදෙවලාදී ඇතැම් තීර්ථකයෝය, ප්‍රකෘති
ශ්‍රාවකයෝය, මහාශ්‍රාවකයෝය, අග්‍රශ්‍රාවකයෝය, පසේබුදු
වරයෝය, සර්වඥබුදුවරයෝය, මොවුන් කෙරෙන් බාහිරක
තාපසවූ ඇතැම් තීර්ථකයෝ සතළිස් කපක්ම සිහිකෙරෙති,
එසිත්මතු අසමර්ථවෙති, කුමක්හෙයින්ද දුර්වලප්‍රඥාව ඇතිහෙ
යිනි, ප්‍රකෘතිශ්‍රාවකවූ රහතන්වහන්සේලා කල්ප සියයකුදු
දහසකුදු සිහිකෙරෙත්මය, කුමක්හෙයින්ද බලවත් ප්‍රඥාවඇ
තිහෙයිනි, අසීතිමහා ශ්‍රාවකයෝ කල්පලක්ෂයක් සිහිකෙරෙ
ත්, දෙඅගසව්වන් වහන්සේලා දෙනම ඒකාසංඛ්‍ය කල්පලක්ෂ
යක් සිහිකෙරෙත්, පසේබුදුවරයින් වහන්සේලා දෙයාසංඛ්‍ය
කල්පලක්ෂයක් සිහිකෙරෙත්, දසපාරමීධර්මයන් පුරා සර්වඥපද
ප්‍රාප්ත ලොව්තුරා බුදුවරයින්වහන්සේලාට පෙණෙන්නාවූ
පූර්වේනිවාසය කෙළවරක් නැත්තේමය—මෙහි තීර්ථකයින්
ට සතළිස් කල්පයක් තැන්පෙණීම යම්සේ අන්ධයෝ යෂ්ටි
කොටිය අත්හැර යන්ට අසමර්ථවෙද්ද, එපරිද්දෙන්ම උත්පන්
නනි පිළිවෙළ හැර අතරතුර පිළිසිඳීම්වශයෙන් කළක්දෙය
සිහිකරන්ට නොහැකිවෙත්, කඳපිළිවෙළින්ම සිහිකෙරෙත්ම
ය, ප්‍රකෘතිශ්‍රාවකාදී සෙස්සෝ කඳපිළිවෙළින්ද චුතිප්‍රතිසන්ධි
වශයෙන්ද සිහිකෙරෙත්මය, සර්වඥ බුදුවරයින්වහන්සේලාට
වනාහි, යම්පමණක් දැනගතයුතුනම් එපමණ ඥානය එකල
ට පහළවෙයි, යම්පමණක් ප්‍රඥාවවීනම් එපමණ දැනෙයි, එ
හෙයින් කඳපිළිවෙළින්ද, චුති ප්‍රතිසන්ධි වශයෙන්ද, ඥානය
යැවීමෙන් කම්නැත උන්වහන්සේලාට වනාහී නොයෙක්
කල්පකොටි සහස්‍රයෙහී, යටගියකල්හිහෝ මතු එනකල්හි
හෝ යම්කපෙක යම් භවයෙක යම් යම් කාරණයක් බලන්ට
කැමතිවෙද්ද, ඒඒ කැමති කැමති කාරණයෝම ප්‍රකාශව පෙ
ණෙති, එහෙයින් නොයෙක් කල්පකොටිහු, පෙය්‍යාලපාළි
යක්මෙන් හකුළුවා යමක් යමක් කැමතිවෙත්නම්, ඒඒ තන්
හිම ඥානය බැස සිංහයන්ගේ පැමිණීම්වශයෙන්, නොහො
ත් නොසිඳයන ගමන්වශයෙන්, සර්වඥයන් වහන්සේලාගේ
පෙරවිසූ කඳපිළිවෙළ පේණ ඥානය, යන්නාහුවෙත්, සෙසු
ඥානවනානසින්ට මෙබඳු ඥානයෙක් නැත්තේමය—මෙසේ
දක්වනලද පෙර කඳපිළිවෙළ සිහිකරන්නාවූන් අතුරෙන්,

තීර්ථකයන්ගේ පූර්වේනිවාස ඥානය කණමැදිරියන්ගේ ආලෝකයෙක්මෙන්ද, ප්‍රකෘතිශ්‍රාවකයන්ගේ පූර්වේනිවාසඥානය ප්‍රදීපාලෝකයෙක් මෙන්ද, අග්‍රශ්‍රාවකයන්ගේ පූර්වේනිවාස ඥානය, චන්ද්‍රයාඅනුවයන ඖෂධීතාරකාවගේ ප්‍රභාවමෙන්ද, පසේබුදුවරයන්ගේ පූර්වේනිවාස ඥානය චන්ද්‍රාලෝකයෙක් මෙන්ද, සර්වඥපදප්‍රාප්ත උත්තමයන්ගේ පූර්වේනිවාස ඥානය දහසක් රශ්මින්ප්‍රතිමණ්ඩිතවූ සරත්සූර්‍ය්‍යයාගේ ප්‍රභාවමෙන්ද වන්නේමය.

මෙහි තීර්ථකයන්ටත් ස්වල්පවශයෙන් නමුත්, පූර්වේනිවාසය සිහිවෙයි කීපමණකින්, පූර්ණකාශ්‍යප මක්ඛලිගොසාලාදි පාපිෂ්ඨ ගිහිකෙරෙතියි නොසිතාවා, ත්‍රිවිධබොධියහා පච්සුද්ධාවාසයද නොලබන, සෙසු බ්‍රහ්මලෝකවල උපදනා ධ්‍යානලාභිවූ ප්‍රාණඝාතාදි අකුසල් යටපත්කළාවූ කාලදෙවලාදි ඍෂිවරයෝයයි දතයුතු— මෙසේ අසංඛ්‍යගණන් කල්පයෙහි පැවති සියලු මොහනැමැති අඳුරුදුරුකොට, ඒ ඒතැන පැවති සියලුම ප්‍රවෘත්තිය හස්තාමලකයයි කියනලද අතීත්ගත මාණික්‍යයක් පරිද්දෙන් සර්වප්‍රකාරයෙන් දක්නා ඥානය, ඒ මහපුරුෂයානන්වහන්සේ විසින් බෝමැඩ විදුරසුන් අරා වැඩහිඳ, රාත්‍රිප්‍රථමයාම දසපැයතුළදීම උපදවා ගත්සේක—

බුද්ධඥානකථාවේ-2-කාණ්ඩය.

"යෙනඤාණෙන සත්තානං චුතිච උප්පාදෙච ඤායති තදත්‍ථා දිබ්බචක්ඛු ඤාණන්තිවුත්තං හොති"—යම් ඥානයකින් සත්වයන්ගේ, චුති, උත්පත්ති, දෙක දත්නාලැබේද, ඒ අර්ථය, නොහොත් ඒ දැනීම දිව්‍යංචක්ෂුරභිඥානයයි කියනලදී, හේ වනාහි, "දිබ්බෙනචක්ඛුනා විසුද්ධෙන" යනාදින් මාංසමය ඇස ඉක්ම පවත්නාවූ අති පිරිසිදුවූදිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, අමොඝබැවින් ප්‍රණීතවූද, මොඝබැවින් අප්‍රණීතවූද, අවෙෂිබැවින් සුවර්ණවර්ණවූද, වෙෂිබැවින් දුර්වර්ණවූද, අලොභීබැවින් සුගතිගතිවූද, ලොභීබැවින් දුගතිගතිවූද, මෙසේ කර්මවූපිරිද්දෙන් චුති උත්පත්තියට පැමිණෙනලද දෙව්මිනිස්ආදි සියලුසත්වයෝම, මේමේ කර්මයෙන් මෙසේ මෙසේ උපන්නෝයයි අතීත්ගත මිණිරුවනක් පරිද්දෙන්, දිවැසින් පෙණීමයයි කීයනලද, දිව්‍යංචක්ෂුරභිඥානය, ඒ මහා පුරුෂොත්තමයන් වහන්සේ විසින් මධ්‍යම දසපැය ඇතුළතදී උපදවා ගත්සේක.

බුද්ධඥාන කථාවේ-3-කාණ්ඩය.

"පච්ඡිමයාමෙ පටිච්චසමුප්පාදෙ ඤාණං" යනාදින් පශ්චිමයාමනම් අලුයම් දසපැයෙහි, ද්වාදසාකාරවූ ප්‍රතීත්‍ය සමුත්පාද

ධර්මය, අනුලොම ප්‍රතිලොම වශයෙන් සිහිකර වදාරමින් කාමාදී ආශ්‍රවයන් නැවත නූපදනා කාරයෙන් මුල්සිඳ අරුණෝදයෙහි සවාසනා සකලකෙලශයන්නසා, ආශ්‍රවක්ෂය ඥානය උපදවාගෙණ, මහාපෘථිවි කම්පනාදි දෙතිස් පූර්වනිමිත්ත ද පහළකරවමින්, දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මාදීන් ලවා කෙළදහස්ගණන් සාධුකාර දෙවමින් නවඅරහාදී බුද්ධගුණයෙන් සමන්විතවූ ලොව්තුරු බුද්ධත්වයට පැමිණවදාළ සේක.

---

## බුද්ධගුණකථාවේ-1-කාණ්ඩය.

තවද මෙම උතුමානන්වහන්සේ, මෙසේ, බුද්ධත්වයටපැමිණවදාළපසු, ශක්‍ර, බ්‍රහ්ම, විෂ්ණු, මහෙශ්වරාදී කොයිම සත්ව කෙනෙකුටවත් නැතතාවූ තුන්ලෝවාසීන් කෙරෙහි පතළාවූ, තමන්වහන්සේගේ නවඅරහාදී බුද්ධගුණයෝ ස්වල්පලෙශ මාත්‍රයක් මෙහි ගෙණහැර දක්වනෙනම්, ඒ සාවදානව ඇසියුතු—'ඉතිපිසොභගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා—(සොභගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපි, මේ කාරණයෙන්ද; අරහං, රහත්ය; සො භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපි, මේ කාරණයෙන්ද, සම්මාසම්බුද්ධො, මනාව සියල්ල අවබොධකළසේක; විජ්ජාචරණසම්පන්නො, අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයෙන් සම්පූර්ණසේක; සුගතො, සොභන ගමන්ඇතිහෙයින් සුගතනම් වනසේක, ලොකවිදූ, තුන්ලෝදත්හෙයින් ලොකවිදූනම් වනසේක; අනුත්තරො, උත්තරිතරහෙයින් නිරුත්තරසේක; පුරිසදම්මසාරථි, බකබ්‍රහ්මාදීන් හික්මවූහෙයින් පුරිසදම්මසාරථිසේක, දෙවමනුස්සානං, දෙවිමිනිසුන්ට අනුශාසනා කරණහෙයින්; සත්ථා, ශාස්තෘවනසේක; බුද්ධො, චතුස්සත්‍යය අවබොධ කළහෙයින් බුද්ධය; භගවා, රාගාදීන් මුල්සිඳ නැතිකළහෙයින් භාග්‍යවත්නම් වනසේක—)මෙහි මදක් අභිප්‍රාය මෙසේ දතයුතු—චතුස්සත්‍යය නොදනීම් සංඛ්‍යාත අවිද්‍යානැමැති නාභියෙහි, කුසලාකුසල සංඛ්‍යාත සංස්කාරාදී දශවිධ ධර්මයන් නැමැති දැව්පිනිටුවා, ඒ දනාපඩකානිය, ජරාමරණ තණ්හානැමැති නිම්වලලලකින්ද සවිකොට, නෙවවිමපිණිස, මිථ්‍යාදෘෂ්ටිනැමැති ඇණියක්ද හෙලා, භවනැමැති රථයෙහි යොදා, අප්‍රමාණකාලයක් මුලුලෙලෙහි පැවතආ, මේ සංසාරචක්‍රය, නොහොත් ජාති ඉපදීම, බුදුවීම සඳහා බෝමැඩ විදුරසුන් මතුයෙහි වැඩහුන්කල්හි අවිද්‍යාවෙන් සංස්කාර

යද, සංස්කාරයෙන් විඥානයද, විඥානයෙන් නාමරූපයද,
නාමරූපයෙන් ෂඩායතනයද, යනාදි ඒ ඒ ප්‍රත්‍යයන් ඇතිවීම්
හෙතුකොටගෙණ, තමන්වහන්සේ ඇතුළු සියලු ලෝකයාම
දෙව්, මිනිස්, නරක, තිරිසන්, ප්‍රෙත,අසුරකායාදි, නොයෙක්
තැන ගෙණයන ස්වභාව, ප්‍රත්‍යපරිග්‍රහිත ඥානයෙන් දැකවද,
රා, මෙම සංසාරචක්‍රය සිඳිමැයිසිතා, එය සිඳිනනාවූ තමන්ව
හන්සේ විසින්, වීර්‍ය්‍යනැමැති පාදය සීලනැමැති පෘථිවියෙහි
තබා වැඩසිට,ලෝකොත්තර ශ්‍රද්ධානැමැති ශ්‍රීහස්තයෙන් කර්ම
ක්ෂයකරනනාවූ මාර්ගඥාන නැමැතිකඩුපතගෙණ,සමාධි නැමැ
ති ගලෙහිගා මුවහත්තබා, මෙහි ඉහතින් දැක්වූ සංසාර
චක්‍රයෙහි ප්‍රධානව තිබූ අවිද්‍යා නැමැති නාභිය පලමුකො
ට පලා අවශෙෂ අකුසල් නැමැති සියලු අරයන්ගේ මුල්සි
ඳ, නැවත නූපදිනා කාරයෙන් අකුසල් නැතිකළ බැවින්
ඒ භාග්‍යවත් බුදුරජතෙම අරහායන මේ උත්තම නාමය
ලත්සේක —

'අග්ගදක්ඛිණෙය්‍යත්තාච චීවරාදිපච්චයෙ අරහතිති අරහං'.

තථාගතයන් වහන්සේ උතුම් දක්ෂිණාර්හබැවින්ද, උන්ව
හන්සේ ලොවපහළවූ පසු මහාබ්‍රහ්මයා ආදී මහෙශාක්‍ය
දිව්‍යමනුෂ්‍යාදීහු, බොහොසෙයිත්ම, නිවණ් සදහා කරණ
පූජාපිණ්ස, අනිකෙක් කරා නොගොස්, උන්වහන්සේටම
නොයෙක් දෑ පූජාකලනිසාද, සිව් පණස් කෙළක්ධන වියද
මෙන් කරවනලද ජෙතවනය ආදී මහවිහාර පිළිගත් බැ
වින්ද, පිරිනිවී පසුත් උන්වහන්සේ උදෙසාම අනූ හකෙ
ළක් ධන වියදම්කොට ධර්මාශොක මහරජතුමා සර්වඥධාතු
පිහිටුවා දඹදිව අසූසාර දහසක් දාගැප් කරවූ නිසාද, අව
ශෙෂ ලොකයා විසින්ද සර්වඥයන් වහන්සේ ජීවමාන කා
ලයෙහිද පිරිනිවියාසින් පසුද උන්වහන්සේටම කළ පූ
ජාදිය අප්‍රමාණනිසාද, මෙසේ නොයෙක් ලෙසින් චීවරාදි
සිව්පස ප්‍රත්‍යය පිළිගැණීමට නිසිබැවින්ද, අග්‍රදක්ෂිණාර්හබැ
වින්ද, ඒ භාග්‍යවත් බුදුරජතෙම, අරහං, යනමේ උත්තමනා
මය ලත්සේක —

"පාපකරණෙරහා භාවතොපි අරහං"

යම්සේ ලොකයෙහි සමහර පණ්ඩිත මානී බාලජනයෝ
අපකීර්තියටභයින් කිසිවෙක් නොදනිවයිසිතා සැඟවී පව්
කරත්නෝය, භාග්‍යවතුන් වහන්සේ වනාහි, සියලු අකු
සල් පහකළබැවින් කිසිකලෙකත් එසේ රහසිගතවවත් කිසි
ම පාපයක් නොකරත්තේමය, එබැවින්ද ඒ භාග්‍යවත් බුදු

රජතෙම, අරහං යනමේ උත්තම නාමය ලත්සේක—

තවද—"ආරකාති අරහං"පි—යනුහෙයින් කයින්හෝ, වචනයෙන්හෝ, සිතින්හෝ, පව්කරමින්, දැඩිලොභයෙන්ද, වස්තුකාමකෙලශ කාමයෙන්ද, වහ වහා ක්‍රොධය ඉපදිමෙන්ද, අන්හට අනතුරුඋපදවමි, අන්සතුදෑ පැහැරගණිමි, යන පවිටු කල්පනාවෙන්ද, තෘෂ්ණාවට දැසවූ සිහියෙන් නොයෙක් විෂම ක්‍රියාකිරිමෙන්ද, නොසංසිඳුනු යම් අසත් පුරුෂයෙක් සර්වඥයන් වහන්සේගේ චිවරධාතුව අල්වාගෙණ, පියෙන් පිය අනුව හැසිරෙමින් විසුයේනමුත් ඔහු අවවාද නොපිළිගත්හෙයින් උන්වහන්සේ කෙරෙන් ඒ අසත්පුරුෂයා තුරන්බැවින්ද. උන්වහන්සේත් ඔහුකෙරෙන් අතිසයින්ම තුරන්බැවින්ද, ඒ භාග්‍යවත් බුදුරජතෙම, අරහං යන මේ උත්තම නාමයලත්සේක—

"තථා ආරකාතිඅරහං ආසන්නභාවතොතිඅඤ්ඤො"

එමෙන්ම තුන්දොරින් කටයුතු කුසල් කිරීමෙන්ද, රාගවෙෂාදි අකුසල් සන්සිඳවීමෙන්ද යුක්තව, බුද්ධදෙසිත ධර්මය ඇසීම් බැලීම් දෙකෙන් යහපත් පිළිවෙත්පූරණ සත්පුරුෂතෙම උන්වහන්සේ කෙරෙන් යොදුන් ලක්ෂයක් ඈත විසුනමුත් අවවාදයෙහි හික්මී බුද්ධගුණයන් සොයමින් වසන හෙයින් ඔහු සර්වඥයන් වහන්සේට ආසන්නය, සර්වඥයන් වහන්සේත් ඔහුට ආසන්නය, එහෙයින්ද, ඒබුදුරජතෙම අරහං යනමේ උත්තම නාමය ලත්සේක—

"සාධුහි දූරතො රහිතබ්බා පටිච්ඡජි තබ්බාති අරහං"

යහපත් පිළිවෙත් පූරණ සාධුජනයන් විසින්, රාග වෙෂ මොහ මදමාන මාත්සර්‍යාදි අකුශලධර්මයෝ දුරින්ම හැරිය යුතුබැවින්ද, තමන්වහන්සේද එම අකුශලධර්මයන් බෝමැඩදීම මුල්සිඳ නැතිකළබැවින්ද, ඒ බුදුරජතෙම අරහං යන මේ උත්තමනාමය ලත්සේක—

"සතතුධම්ම සරීරෙන අවිරහිතාච අරහං"

ශාස්තෘන්වහන්සේ ධර්මකායෙන් වෙන්නොවූ බැවින්ද, ධර්මය දැනගත් පවිත්‍ර හැසිරීම්ඇති කල්‍යාණ පෘථක්ජනයෝ නවඅරහාදි බුද්ධගුණයන් සිහිකිරිමෙන් වෙන්නොවූ බැවින්ද, ඒ බුදුරජතෙම අරහංයනමේ උත්තමනාමය ලත්සේක—

"සංසාරෙගමනංනත්ථිති අරහංරහොතිවගමනං වුච්චති"

දිව්‍යමනුෂ්‍ය ගරුඩගාන්ධර්ව සිද්ධ විද්‍යාධරාදි සංසාරගත සත්ත්වසමූහයා විෂයෙහි ඉපදීමද, මැරීමද, කිසිකලෙකත් නො

ලබනපරිද්දෙන් නැතිකළ හෙයින්ද, ඒබුදුරජතෙම අරහං යන මේ උත්තමනාමය ලත්සේක—

“පාසංසත්තාවා භගවා අරහං”—නිරුත්තර ශීලස්කන්ධයෙන්ද, නිරුත්තර සමාධිස්කන්ධයෙන්ද, නිරුත්තර ප්‍රඥාස්කන්ධයෙන්ද නිරුත්තර විමුක්තිස්කන්ධයෙන්ද, නිරුත්තර විමුක්තිඥාන දර්ශනස්කන්ධයෙන්ද යුක්තයයි කියාද, අසමවූ බුදුවරයින්ට සමානයයි කියාද, උන්වහන්සේගේ ඒඒ බුද්ධගුණ සමූහය දෙව් මිනිසුන්විසින් තමතමන් උගතවනාපමණින් කියකියා තුන්ලෙව්හිම ප්‍රශංසාකරණහෙයින්ද, ඒ බුදුරජතෙම අරහං යනමේ උත්තම නාමයලත්සේක—තවද මෙහි දක්වූ සියලු අර්ථ ගුණයන්ම එකතුකොට මෙසේද දක්වනලදී—

ගේ කෙසේද?

ආරකාමන්ද බුද්ධීනං ආරකාච විජානතං
රහානංසුප්ප හීණත්තා විද්දනමර හෙය්‍යතො
භවෙසුච රහාභාවා පාසංසා අරහංජිනොති.

යනුහෙයින් මන්දබුද්ධිවූ පාපීන්ගෙන් දුරත්බැවින්ද, සත්පුරුෂ පණ්ඩිතයින්ගේ සෙවනයෙන් යුක්තබැවින්ද, අකුසල් මනාව පහකළබැවින්ද, පණ්ඩිතයන් විසින් නිතර ගුණසිහිකටයුතුබැවින්ද, භවයෙහි ඉපදීමක් නැතිබැවින්ද, තුන්ලෝවාසීන් විසින්ම ප්‍රශංසා කටයුතුබැවින්ද, ජිනේන්ද්‍රයන් වහන්සේ, මේ මේ, අර්ථයෙන් අර්හත්නම් වනසේකි.

“සම්මාසාමංච සබ්බධම්මානං බුද්ධත්තාපන සම්මාසම්බුද්ධො”

අනිත්‍යාදිවසයෙන් දැන ගතයුතු දුක්ඛසත්‍යයද ආදී නව වසයෙන් පහකටයුතු, දුක්ඛ සමුදය සත්‍යයද, සිහිකටයුතු දුක්ඛ නිරොධසත්‍යයද, භාවිතාකටයුතු මාර්ගසත්‍යයද, යන මෙකී චතුස්සත්‍යධර්මයන් තමන්වහන්සේවිසින් බොධිමූලයෙහිදීම ස්වයම්භූඥානයෙන් මනාවදැන අවබොධකළබැවින්, ඒ බුදුරජතෙම සම්‍යක් සම්බුද්ධයයි යන මේ උත්තම නාමය ලත්සේක—එහෙයින් කියනලදී.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බංච භාවිතං
පහාතබ්බං පහීණංමෙ තස්මාබුද්ධොස්මි බ්‍රාහ්මණ.

“විජ්ජාහිපන චරණෙනච සම්පන්නත්තා විජ්ජාචරණසම්පන්නො”

යනුහෙයින් විශේෂයෙන් දක්නා විදර්ශනාඥානයද, තමන්වහන්සේ වැනි බුදුකෙනෙක් මවා පෑමයයන මනොමය ඍද්ධියද, පෘථිවිය කිමිදයාමය හිතැති පර්වතාදිය විනිවිද

සාමිය, අහසටනැඟී ඉර සඳ හස්තයෙන් පිරිමැදීමය, යනා
දී ඍද්ධි ප්‍රභෙදයද, එකම ස්ථානයක වැඩහිඳ තිරිසනුන්
පටන් දෙව්බඹුන්දක්වා සියලු ලෝවැසියන් විසින්ම කරණ
කථාව ඇසෙනනාවූ දිව්‍යකණ්ණද, අප්‍රමාණ ලොකවල අනන්ත
සත්වයන්ගේ සිත්හඳුනනනාවූ පරසිත්දැනීමද, මිට දෙවෙනි
ජාතියේ අසවල්තැන උපන්නෙමි, එහිදී මෙනම් නාමයක්
වූයෙමි, මෙවැනි ගොත්‍රයක් ඇතිවූයෙමි, මෙබඳු ශරීර
වර්ණයක්වූයෙමි යනාදීන් අපමණ කල්පවල තමන් වහන්
සේගේද අවශෙෂ සියල්ලන්ගේද උත්පත්ති පිළිවෙළ පෙ
ණෙනනාවූ පූර්වේනිවාසානුස්මෘතිඥානයද, මේ මේ සත්වයෝ
කායාදී වාරත්‍රයෙන් අකුසල්කළෝය ආර්‍ය්‍යොපවාදකළෝය
මිසදිටුගත්තෝය සෙසසතුන්ද මිසදිටුගැත්වූවෝය ඒ ඒ අකු
සලහෙතුවෙන් මරණින්මතු මෙසේ අපායෙහි උපන්නෝ
ය මේ මේ සත්වයෝ කාය සුචරිතාදීන් සමන්විතව සම්‍යක්
දෘෂ්ටිගෙණ සෙසසතුද සම්‍යක්දෘෂ්ටිගත්වා මරණින්මතු ඒ
ඒ කුශලකර්ම හෙතුවෙන් ස්වර්ගයෙහි උපන්නෝය මේ මේ
අය ඒ ඒ තැනින් චුතව මේ මේ තැන්හි උපදින්නාහුයයි සි
යලුලොකයාගේ චුති උත්පත්ති දෙක පෙණෙනනාවූ දිව්‍යං
චක්ෂුරභිඥානයද, කාමාදී සතර ආශ්‍රවයන්ගේ සිඳීමෙන් අ
හීත්ඵලයට පැමිණීම දන්නා ආශ්‍රවක්ෂයඥානයද; යනමේ සි
යල්ලදක්නා සර්වඥතාඥානයෙන් යුක්තවූ අෂ්ටවිද්‍යාවද—
චූල්ල සීලය, මධ්‍යමසීලය, මහාසීලය, යනත්‍රිවිධ සීලයට
ඇතුලත්වූ නවකෙළදගස් එක්සිය අසූකෙළ පණස්ලක්ෂ ස
තිස් සංවරයකින් යුක්තවූ ප්‍රාතිමොක්ෂ සංවරසීලයද, ඉෂ්ටා
නිෂ්ට රූපාදියපෙණීම් වසයෙන් ඇස්ආදී ඉඳුරන්ට උපදනා
සවැදෑරුම් අරමුණෙහිම ලොභාදී අකුසල සිතක් නූපදීනනා
වූ ඉන්ද්‍රිය සංවරසීලයද, අනුභවකරණ ආහරයෙහි ලො
කොත්තරවසයෙන් පමණ දැනීමද, නිදිවර්ජිතකිරීමද, ලො
කොත්තර ශ්‍රද්ධාව ඇතිබවද, පාපයට පිළිකුල්වීම් වසයෙන්
උපදනා ලොකොත්තර ලජ්ජාවද, එසේම පාපයට භයවී
ම්වසයෙන් උපදනා ලොකොත්තර භයඇතිබවද, ලොව
ඇත්තාමවූ සියලු ශාස්ත්‍රයන්හා සියලුම ධර්ම ධර්මයන්ද, අන
ශ්ලක්සේ දන්නා බහුශ්‍රැතබවද, ලොව කොයිමකෙනෙකු
ටවත් නැත්තාමවූ ලොකොත්තර වීර්‍ය්‍ය ඇතිබවද, දෙව්බ
ඹුන්ආදී නුවණැති සියල්ලන්විසින් විචාරණලද සියලුම ප්‍ර
ශ්නයන් සිහුම් ශස්ත්‍රයකින් මහනෙල්දඬු කලඹක් කපන්
නාසේ විසඳනනාවූ ප්‍රවුප්‍රඥාආදී මහත් ප්‍රඥාවඇතිබවද, ප්‍රථ
මධ්‍යාන ද්විතියධ්‍යාන තෘතියධ්‍යාන චතුර්ථධ්‍යානය, යන සතර

ඥානයද, යනමේ මහාකරුණාඥානයයි කියනලද පසළොස්චරණ ධර්මයෝද, මෙසේ දක්වූ අෂ්ටවිද්‍යාවෙන්හා පසළොස්චරණ ධර්මයෙන්ද, යුක්තබැවින් ඒ බුදුරජතෙම විද්‍යාචරණ සම්පන්නය යනමේ උත්තමනාමය ලත්සේක.
එහෙයින් කියනලදී.

විපස්සනාඤාණ මනොමයිද්ධි
ඉද්ධිප්පභෙදො පිච දිබ්බසොතං,
පරස්සචෙතො පරියායඤාණා
පුබ්බෙනිවාසානු ගතංච ඤාණං.

දිබ්බංච චක්ඛාසවසංඛයොච
එතානි ඤාණානි ඉධට්ඨවිජ්ජා,
සීලං වරං ඉන්ද්‍රිය සංවරොච
මත්තඤ්ඤතා ජාගරියානුයොගො.

සද්ධාහිරොත්තප්ප බහුස්සුතත්තං
පරක්කමොචෙ වසතිම්මතිච,
චත්තාරිඣානානිච තානිමානි
තිපඤ්චධම්මා චරණානිජඤ්ඤ.

"සොභනගමනත්තා සුන්දරංඨානංගතත්තා වාසුගතො
සම්මාච ගතත්තාවාසුගතො"

යනුහෙයින් ඒ භාග්‍යවත් සර්වඥයන්වහන්සේ යහපත් නිර්වාණපුර පැමිණ වදාළ බැවිනුද, ඒ ඒ මාර්ගයෙන් කෙලෙසුන් නසමින් වැඩියබැවිනුද, නොහොත්, දීපඞ්කර පාදමූලයෙහි පටන් බෝමැඩදක්වාම ශාස්වතොච්ඡෙදාදී අන්තයට නොපැමිණ දසපාරමිධර්මයන් පුරමින් ලොකවාසීන්ට අර්ථයෙන් ධර්මයෙන් මනාව අවවාදකරමින් වැඩිය බැවිනුද, චතුස්සත්‍යාදී සත්තිස් බොධිපාක්ෂික ධර්මයන් ලොකයාහට මනාව වදාරණබැවිනුද.,

"සොභනං ගතිං ගමනං එතස්සාති සුගතො"

යනුහෙයිනුත් ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණ අශීත්‍යනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා මණ්ඩලාදී රූපකාය සම්පත්තින් සොභනවූ ගමන් විලාසයක් ඇතිබැවිනුද, ඒ බුදුරජතෙම සුගත යනමේ උත්තමනාමය ලත්සේක.

"සබ්බථාවිදිත ලොකත්තා ලොකවිදූ"

සංස්කාරලොකය, සත්වලොකය, අවකාසලොකය, යන ත්‍රිවිධලොකයම එහි ඇතිස්වභාව වශයෙනුද, ඒ ලොකත්‍රයාගේ ඉපදීම් වශයෙනුද, නැතිවීම් වශයෙනුද, නැතිවීමට පැමි

ණෙන කාරණා වසයෙනුදු, හස්තාමලකයක්මෙන් දිව්‍යඥානයෙන් ඒ සියල්ල දැන වදාළ බැවිනුදු, ඒ බුදුරජතෙම ලොකවිදූ යන මේ උත්තම නාමය ලත්සේක.

"අත්තනොපනාගුණෙහි විසිට්ඨතරස්ස කස්සචි අභාවංනත්‍ථි එතස්ස උත්තරොති අනුත්තරො"—තමන්වහන්සේට වඩා සීලයෙන්හෝ, සමාධියෙන්හෝ, ප්‍රඥාවෙන්හෝ, විමුක්තියෙන්හෝ, විමුක්ති ඥානදර්ශනයෙන්හෝ, උත්තමයෙක්වත් සමානයෙක්වත්, දෙව්බඹුන් සහිත සියලු ලොකයා කෙරෙහිම කිසිවෙක් නැතිබැවිනුදු, හෙවත්, මහමෙරටවඩා උස් පර්වතයක්ද, මහ පොළවටවැඩි පලල් වස්තුවක්ද, ජලපොළවටවැඩි ගැඹුරු ජලයක්ද, වාපොළවට වැඩි පවණක්ද, අහසට වඩා නිස් ප්‍රදෙශයක්ද, සූර්‍ය්‍යමණ්ඩලයට වැඩි ආලොකයක්ද, ගින්නට වැඩි දවනදෙයක්ද, ලොකයෙහි නැත්තාසේ, තමන්වහන්සේට වැඩි සත්වයෙක් තුන්ලෙව්හිම නැතිබැවින් ඒ බුදුරජතෙම අනුත්තර යන මේ උත්තමනාමය ලත්සේක—

"පුරිසදම්මෙසාරෙතීති පුරිසදම්මසාරථි දමෙතිවිනෙතීති වුත්තං හොති"

තුන්ලෙව්හිම කිසිවෙක් විසිනුදු හික්මිය නොහැකිවූ, අපලාලය, චූලොදරය, මහොදරය, අග්ගිසිඛය, ධූමසිඛය, යනාදී ආනුභා සම්පන්න තද රෞද්‍ර දිව්‍ය නාගයෝද, චණ්ඩපරුෂවූ ධනපාලක නම් හස්තියාද, යනාදිතිරශ්චීන පුරුෂයෝද, සච්චකය, අම්බට්ඨමාණවකය, පොක්ඛරසාතිය, සොනදණ්ඩය, කූටදන්තය, යනාදී තද මිථ්‍යා දෘෂ්ටිගතිකවූ, සකවාද පරවාදදී වාදයන් ඉගෙණ නොහික්මෙන ස්වභාවෙන් දඹදිව ප්‍රසිද්ධව විසූ මනුෂ්‍ය පුරුෂයෝද, ආලවක, සූචිලොම ඛරරොමාදී චණ්ඩ පරුෂවූ යක්ෂයෝද, ශක්‍රාදී දෙව්යෝද, බකබ්‍රහ්මාදී බ්‍රහ්මයෝද, මේආදී හික්මියනොහැකි නොයෙක් මිසදිටු ගත් අමනුෂ්‍ය පුරුෂයෝද, යනමේ ත්‍රිවිධ පුරුෂයන්ම තමන්වහන්සේගේ දහම්නැමැති අඞ්කුසාදීන් හික්මවා සරණසීලාදී සීලයෙහිද සොවාන් ආදී අධිගමයෙහිද පිහිටවා වදාළබැවින්ද, ඒ බුදුරජතෙම පුරිසදම්මසාරථි යනමේ උත්තමනාමය ලත්සේක, "දිට්ඨධම්මික සම්පරායික පරමත්‍ථෙහි යථාරහං අනුසාසතීති සත්‍ථා" දෘෂ්ටධාර්මික සාම්පරායිකවූ පරමාර්ථ ධර්මයෙන් ලොකවාසී දිව්‍ය මනුෂ්‍යාදීන් හික්මවිය යුතුලෙස අනුශාසනා කරණ හෙයිනුදු නොහොත් ගැල් ශාසතෘනායකතෙම තමන් අනුව

යන මිනුෂ්‍යයන් චෞර කාන්තාරාදීන් එතරකර සුභික්ෂවූ නුවරකට පමුණුවාද, එමෙන් සර්‍වඥයන්වහන්සේද දහම් නැමැති ගැලින් පිරිවර ජනයන්නැමැති දෙව්මිනිස් සමූහයා ජාතිකාන්තාරාදී සසරකතරින් එතරකරවා, රාග, ද්වෙෂ, මොහාදී, සතුරන් නැතිහෙයින් ක්ෂෙමවූභූමිවූ අමෘතමහා නිර්‍වාණ පුරප්‍රවරයට පමුණුවන හෙයිනුද, ඒ බුදුරජතෙම සත්ථායන මේ උත්තමනාමය ලත්සේක—

"බුජ්ඣිතා සච්චානීති බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො, සබ්බඤ්ඤුතායබුද්ධො, සබ්බදස්සාවිතාය බුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො, විසවිතාය බුද්ධො, එකන්ත වීතරාගොති බුද්ධො, එකන්ත වීතදොසොති බුද්ධො, එකන්ත වීතමොහොති බුද්ධො, එකන්ත නික්කිලෙසොති බුද්ධො, එකායනමග්ගං ගතොති බුද්ධො, එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣීති බුද්ධො"

යනුහෙයින් තමන්විසින්ම චතුස්සත්‍යය දැනගත්හෙයිනුද, දිව්‍යමනුෂ්‍යාදීන්ට එමධර්‍මය අවබොධකරවන හෙයිනුද, සියලුදෙය දැනගත්හෙයිනුද, සියලුදෙය දිවසින් දුටුබැවිනුද, සියලුමදෙය ගුරුපදෙසයක් නැතිව තමන්ගේම ඥාණයෙන් දැනගත්හෙයිනුද, නොයෙක් ගුණයන් ලොවට විකාශනය කාරණහෙයිනුද, එකාන්තයෙන් රාගය පහකළහෙයිනුද, ද්වෙෂය පහකළ හෙයිනුද, මොහය පහකළ හෙයිනුද, සියලුම ක්ලෙශයන් නැතිකළ හෙයිනුද, එකමවූ නිර්‍වාණගාමී ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්‍ගයට පැමිණි හෙයිනුද, ශුද්ධකලාව නිරුත්තර සම්‍යක් සම්බොධිය අවබොධ කළහෙයිනුද, ඒ බුදුරජතෙම බුද්ධ යන මේ උත්තම නාමය ලත්සේක—

"එත්ථ භගවාති ගාරවාධිවචනමෙතං අපිච භග්ගරාගොති භගවා භග්ගදොසොති භගවා භග්ගමොහොති භගවාකන පෙ— "චතුන්නං පටිසම්භිදානං ජනනං අභිඤ්ඤානං ජනනා බුද්ධධම්මානන්ති භගවා"

මෙහි භගවායනු ගරු කටයුත්තන්ගේ ගරුභාවය ප්‍රකාශිත වචනයෙක, එසේද වූවත්, රාගය භග්නකළ හෙයිනුද, නොහොත් මුල්සිඳ නැතිකළ හෙයිනුද, ද්වෙෂය නැතිකළ හෙයිනුද, මොහය නැතිකළ හෙයිනුද, දෘෂ්ටිය නැතිකළ හෙයිනුද, අවශෙෂ අකුශලධර්‍මයන් නැතිකළ හෙයිනුද, මාර්‍ගඵලාදී ප්‍රතිවෙධ ධර්‍මයන් කොටස් වසයෙන් වෙන් වෙන්ව බෙදා වදාරණ හෙයිනුද, සසරදුක් කෙළවර කළහෙයිනුද, වඩනලද කායානුස්මෘති ආදී ප්‍රඥාව ඇති හෙයිනුද,

චීවරාදි සිව්පස ප්‍රත්‍යය භජනය කරණහෙයිනුද, අර්ථරස, ධර්මරස, විමුක්තිරස, අධිසීල, අධිප්‍රඥ, ආදිය භාවිතාකරණ හෙයිනුද, සතරසතිපට්ඨානය, සතරඍද්ධිපාදය, සතරසම්‍යක්ප්‍රධානය, පඤ්චෙන්ද්‍රියය, පඤ්චබලය, සප්ත බොධ්‍යඞ්ගය, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය, දසවිධ තථාගත බලය, චතුර්වෛශාරද්‍යඥානය, සිව්පිළිසිඹියාවය ෂට්අභිඥය, ෂට්විධ අසාධාරණඥානය, යනමෙකී ධර්මයන් සෙවන භජන පර්‍ය්‍යුපාසනයකර වදාරණහෙයිනුද, ඒ බුද්ධරජතෙම භගවා යනමේ උත්තමනාමය ලත්සේක—එහෙයින් කියනලදී.

භගවාති වචනං සෙට්ඨං භගවාති වචනමුත්තමං
ගරුගාරවයුත්තොසො භගවා තෙන වුච්චති.

භගීභජී භාගිවිභත්තවා ඉති
අකාසි භග්ගන්ති ගරූති භාග්‍යවා
බහූහිඤායෙහි සුභාවිතත්තනො
භවන්තගොසො භගවාති වුච්චති.

භාග්‍යවා භගවායුත්තො භගෙහිච විභත්තවා
භත්තවාවන්ත ගමනො භවෙසු භගවාතතො.

භග්ගරාගො භග්ගදොසො භග්ගමොහො අනාසවො
භග්ගස්ස පාපකාධම්මා භගවා තෙන වුච්චති.

තවද මෙහි විස්තර අර්ථහැර ටීකාවෙහි ප්‍රකාශිත පාළිවාසනම්වල අභිප්‍රායාර්ථය පමණක් ඉතාමත්ලුහුඬින් එළිදරව්කළබව දතයුතු—මේ ධර්මකායනම් ලත් බුද්ධගුණයෝයි.

තවද මාවිසින් දක්වූ මේ බුද්ධගුණයෝ නම් බඹලෝ විචාළවුන්ට අහසට අතදිගුකොට මේ දිසාවේ බඹලෝයයි කියන්නාක්මෙන් බුදුගුණපිහිටා තිබෙන නව පදය නැමැති දිශාමාත්‍රය පමණක් මෙහි ගෙණහැර පෙන්වූබැවින් එහි විස්තර කැමැති සැදැහැ ඇත්තන් විසින් පණ්ඩිත ගිහි පැවිදි අයකරා පැමිණ මෙහි විස්තර අසා දැන ඉගෙණ සර්වඥයන්වහන්සේ නම් තුන්ලෝ වැසි සියලුම දෙව්බඹුන් කෙරෙන් අති උත්තම ගැලවුන්කාර ස්වාමීන්වහන්සේයයි නිසැකවම දැන අන් දෙවියන් පිහිටකොට නොගෙණ මුන්වහන්සේ කෙරෙහි භක්තිය ඇදනැතිව පිහිටුවාගෙණ ප්‍රසන්නසිත් රත්නත්‍රයකරා පැමිණ වන්දනමානාදීන් මූන්වහන්සේගේ සරණගෙණ දවසතුන් විට බුදුන් සිහිකරමින් ස්වර්ගමොක්ෂ සම්පත් සිදුකරගන්ට උත්සාහ වැඩියයුතු—

මෙහි දක්වූ සුගත ශබ්දයෙත්හා භගවන්ත ශබ්දයෙන්ද

ප්‍රකාශවන්නාවූ උත්වහන්සේගේ රූපකාය සම්පත්තිනම්වූ දෙතිස්මහා පුරුෂලක්ෂණාදිය ඒ ඒ තැනදී ප්‍රකාශනොකලේ නම්තබන දිනයෙහි නිමිත්තපාඨකයන් විසින් දක්වනලද පූර්ණ ලක්ෂණාදිය දක්වීමෙහිදී ස්වල්පදෙශමාත්‍රයක් ප්‍රකාශ කළනීසායයි දතයුතු—

## බුද්ධගුණකථාවේ-2-කාණ්ඩය.

තවද අපභාග්‍යවත් සර්වඥයන්වහන්සේ මේ උතුම්වූ නවවිධ ගුණනාමයන් බොධිමූලයෙහිදීම ප්‍රඥප්තිනාම වශයෙන් ලැබූබැවිනුද, රූපකාය සංඛ්‍යාත සුප්‍රතිෂ්ඨිත පාදාදි දෙතිස්මහා පුරුෂලක්ෂණයෙන්හා අශීත්‍යනුව්‍යඤ්ජන බ්‍යාමප්‍රභා මණ්ඩලයෙන් සමන්විත බැවිනුද, මුන්වහන්සේ ලොකයෙහි අසදෘශ රත්නය වූසේක—ගේ කෙසේදයත්?

"රතනංනාම සවිඤ්ඤාණකං අවිඤ්ඤාණකන්ති දුවිධංතත්‍ථ අවිඤ්ඤාණකං සුවණ්ණරජතාදි දසවිධං සවිඤ්ඤාණකං ඉන්ද්‍රියපටිබද්ධං අවිඤ්ඤාණකං සවිඤ්ඤාණකසෙසව අලඞ්කාරාදිවසෙන පරිභොගංහොති—පෙ—සදෙවකෙ ලොකෙ බුද්ධරතන සමංරතනං නාමනත්‍ථි තස්මා අසදිසමෙවරතනං"

යනුහෙයින් රත්නයනම් සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වශයෙන් ද්විප්‍රකාරවේ, එහි අනින්ද්‍රිය ප්‍රතිබද්ධ රන් රිදීආදි දසවිධරත්නය අවිඤ්ඤාණකය, ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ හස්තිරත්නාදිය සවිඤ්ඤාණකය, රන් රිදීආදි අවිඤ්ඤාණක රත්නය හස්තිරත්නාදි සවිඤ්ඤාණක රත්නයට සැරසීම්ආදි වශයෙන් පරිභොග වන්නේය, එබැවින් මේ රත්නයන් අතරෙන් හස්තිරත්නාදි සවිඤ්ඤාණක රත්නයම ශ්‍රෙෂ්ඨය, සවිඤ්ඤාණක රත්නයද ද්විවිධවේ, තිර්‍ය්‍යග්ගත රත්නය, මනුෂ්‍යරත්නයයි, එහි හස්ති රත්නාදි තිර්‍ය්‍යග්ගත රත්නය, මනුෂ්‍යරත්නයට වාහනවනබැවින් මනුෂ්‍ය රත්නයම ශ්‍රෙෂ්ඨය, මනුෂ්‍ය රත්නයද ද්විවිධවේ, ස්ත්‍රීරත්නය පුරුෂ රත්නයයි, එහිසක්විතිරජුන්ට ඇතිවන ස්ත්‍රී රත්නයම පුරුෂ රත්නයට පරිචාරික වනබැවින් පුරුෂ රත්නයම ශ්‍රෙෂ්ඨය, පුරුෂ රත්නයද ද්විවිධවේ, අගාරික රත්නය අනගාරික රත්නයයි, එහි ගෘහස්ථයන් කෙරෙන් අග්‍රවූ සක්විති රජපවා එදවස් පැවිදි සීලාදි ගුණ යුක්ත අනගාරික ශ්‍රමණයන්ට පසඟපිහිටුවා වැද උපස්ථාන කොට දෙව්මිනිස් සැපතට පැමිණෙනබැවින් අනගාරික ශ්‍රමණරත්නයම ශ්‍රෙෂ්ඨය, ශ්‍රමණරත්නයද ද්විවිධවේ, පෘථග්ජන රත්නයආර්‍ය්‍යරත්නයයි, එහි සොවාන්ආදි ආර්‍ය්‍ය ශ්‍රමණයන් වහන්සේලා අපාය භයින් වෙන් බැවින්

පෘථග්ජන ශ්‍රමණරත්නයට වඩා ආර්‍ය්‍ය ශ්‍රමණරත්නයම ශ්‍රෙෂ්ඨය, ආර්‍ය්‍ය ශ්‍රමණරත්නයද විවිධවේ, ශෛක්‍ෂ රත්නය අශෛක්‍ෂ රත්නයයි, එහි රහත්වූ අශෛක්‍ෂ රත්නය සසර උත්පත්තියෙන් වෙන් බැවින් සොවාන් ආදී ශෛක්‍ෂ රත්නයට වඩා රහත්වූ අශෛක්‍ෂ රත්නයම ශ්‍රෙෂ්ඨය—

ඒ අශෛක්‍ෂ රත්නයද විවිධවේ, ශුෂ්කවිදර්ශක රත්නය සමථයානික රත්නයයි, එහි තීක්‍ෂ්ණවූ සූනිසිත ඛඩ්ගයකින් කදලිස්කන්ධයක් සිඳින්නාක්මෙන් කෙලෙස් මුල්සිඳ රහත්වූබැවින් සමථයානික රත්නය ශුෂ්කවිදර්ශක රත්නට වඩා ශ්‍රෙෂ්ඨය, සමථයානික රත්නයද විවිධවේ, ශ්‍රාවකරත්නය බුඩරත්නයයි, එහි අග්‍ර ශ්‍රාවකාදී ශ්‍රාවක රත්නයට වඩා පරෝපදෙසරහිතව චතුස්සත්‍යය ප්‍රතිවෙධකළ හෙයින් ප්‍රත්‍යෙකබුඩරත්නයම ශ්‍රෙෂ්ඨය, බුඩරත්නයද විවිධවේ, ප්‍රත්‍යෙකබුඩරත්නය සබ්බඤ්ඤු බුඩරත්නයයි, එහි ලක්‍ෂයක් පමණ පසේ බුදුවරයන්වහන්සේ වූවත් සර්වධර්මයන් සර්වාකාරයෙන් දැන වදාළාවූ සර්වඥ බුඩරත්නයාගේ ප්‍රදෙශයෙහි ස්වල්පයකුදු සම ව නොපැමිණෙයි, එහෙයින් සර්වඥ බුඩරත්නයම ශ්‍රෙෂ්ඨය, දෙවියන් සහිත සියලුලොකයා කෙරෙහි බුඩරත්නය සමාන අනර්ඝ රත්නයක්නම් නැත, එබැවින් මෙහි දැක්වූ නවඅරහාදි ගුණොපෙත සර්වඥ බුඩරත්නයම අසදෘශ රත්න වන්නේමය.

එ හෙයින් කියනලදී.

ලොකෙසබ්බ සවන්තීනං ආධාරො සාගරො යථා,
සබ්බෙසං ගුණරාසීනං ආධාරොව තථාගතො.

යනුහෙයින් යම්සේ ලොකයෙහි සියලු ගඞ්ගාවන්ට මහා සාගරය ආධාරද, එපරිද්දෙන් සියලුම ගුණසමූහයන්ට තථාගතයන් වහන්සේ ආධාරවන්නේමය.

චරාචරානං සබ්බෙසං ආධාරොව ධරා අයං
තථාගුණානං සබ්බෙසං ආධාරොව තථාගතො.

යම්සේ යන නොයන සියල්ලන්ට සියලුම ක්‍රියාපිණ්ඩිස මේ පෘථිවි තොමෝ ආධාරද එපරිද්දෙන් තථාගතයන් වහන්සේද ලොව ඇතිතාක් සියලුම ගුණයන්ට ආධාර වන්නේමය.

සොණ්ණානනො ජිනවරො සමණීව සිලුච්චයො
කාරුණ්ණපුණ්ණහදයො විවට්ටො වියසාගරො.

රන්වන්වූ මුඛපද්මයක්ඇති ශ්‍රමණීවූ ජිනෙන්ද්‍රයන්වහන්සේ ලාභාදි අෂ්ටලොක ධර්මයට ගල්පර්වතයක් මෙන් අකම්ප්‍යස්වභාවයෙන් යුක්තය, විවෘත සාගරයමෙන් සියලු ලොකයාකෙ

රෙහී කරුණාවෙන් පිරුණු හෘදයක්ද ඇත්තේ වන්නේය.

ලොකවිස්සුත කිත්තිච සිණේරුචනගුත්තමො
යසසාවිතතොධිරෙ ආකාස සදිසො මුනි.

මුනීන්ද්‍රයන්වහන්සේ ලොව පතළ කීර්තියෙන් පර්වතො ත්තමවූ මහමෙරමෙන්ද පැතුරුණාවූ යසසින් ආකාසය සමා නද වන්නේය.

අගදෙව්‍ය සබ්බසී කිලෙස විස නාසනො
ගන්ධමාදන සෙලොව ගුණගන්ධවිභූසිතො

ගන්ධමාදන පර්වතයමෙන් ගුණසුගන්ධයෙන් සැරසුනාවූ සර්වඥයන්වහන්සේ ලොකවාසීන්ගේ කෙලෙස් නැමැති විස නැසීමට හැමකල්හිම දිව්‍ය ඖෂධයෙක්වැන්න.

මහාභිසක්ක සංකාසො දෙසවෑධ්ති කිච්ජකො
සල්ලකත්තොායථාවෙජ්ජො දිට්ඨිගණ්ඩවිපාලකො.

යම්සේ රාගාදි අකුසල්නැමැති ව්‍යාධියට පිළියත්කරන්නා වූ මහත් වෛද්‍යචාරියෙක් වැන්න ලොකයාගේ මිථ්‍යාදෘෂ්ටි නැමැති ගඩ පැලීමට සල්ලකර්තෘ වෛද්‍යචාරී කෙනෙක්ද වැනිසේක.

බුධොපි සකොකාති නයසස වණ්ණං
කප්පම්පි වෙත්‍වා ඛයතං ගමෙතුං,
පගෙව නබ්‍රහ්ම සුරා සුරෙහි
වත්තුංනභානන්ත ගුණස්ස වණ්ණනති.

මෙහි දක්වනලද මෙබඳු ගුණසමූහයෙන් යුක්තවූ සර්වඥයන් වහන්සේනමක් ඇඳද උන්වහන්සේගේ ගුණ එසේම බුදුවූ උත්තමයන්වහන්සේ නමක් විසිනුදු ආයුෂ්කාලපය මුලුල්ලේ කියාත් කෙළවරට පමුණුවන්ට නොහැකිය එසේම අහස්ත ලයමෙන් පැතුරුණාවූ අනන්ත ගුණ සමූහයාගේ වර්ණනාව දිව්‍යබ්‍රහ්මාදි බොහෝ මුඛඇතියන් විසිනුදු කියාත් නිමක රණ්ට නොහැකිය.

එසේහෙයින් මාවිසින් සවල්පදෙසයකින් මෙහි සඳහම්කළ බුඩගුණ නැමැති නීල පීතාදි රූපසණ්ඨානයන් සම්‍යක්දෘෂ්ටි නැමැති ප්‍රදීපාලොකයෙන් සෘජුව බලා මේ මේ ගුණයෝයයි දැන හැඳිනගෙණ දෙවාතිදෙවවූ ශක්‍රාති ශක්‍රවූ මාරාතිමාර වූ බ්‍රහ්මාති බ්‍රහ්මවූ සමන්තභද්‍රවූ ෂඩභිඥවූ සර්වඥයන්වහ න්සේ හැර ලොකයාගේ දුක්නසා එකාන්ත සැප උපදවාදෙ න්ට අන්කිසි දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ නැත්තේමය සි කියාද මුන්වහන්සේම සියලලන්ගෙන්ම වන්‍දනමානාදිය

ලැබීමට නිසිවන්නේමයයි පරලෝකාමීන් ඒසිත් හූවණින්
කල්පනාකර වෙනයම් දෙවිකෙනෙක් නොඅදහා මෙම
අභීත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේම උත්තරීතර වශයෙන්
අදහා ස්වර්ගමොක්‍ෂ සම්පත් ලබන්ට සියල්ලන් විසින්ම උත්
සාහකටයුතු——බුද්ධගුණ කථාව නිමි——

---

## ස ත් ස ති යෙ-1-කා ණ්ඩ ය.

තවද මෙහි දක්වනලද නවඅරහාදී බුදුගුණ සමූහයෙන්
යුක්තව ලොව්තුරාබුද්ධත්වය ලැබීමෙන් වජ්‍රාසනාරූඪව වැඩ
හිඳ වදාලාවූ අපභාග්‍යවත් සර්වඥයන්වහන්සේ මෙසේ සිතා
වදාරණසේක්——සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලේ දසපෙ
රුම්පුරා මේ වජ්‍රාසනයහා ශ්‍රීමහ බොධිය ලදිමි— මේ පය්‍යඞ්කා
යනම් මාගේ ජයපය්‍යඞ්කයය, බොධියනම් ජයමහබොධියය,
මෙම ආසනයෙහි මෙම බෝකඳට පිටලා වැඩහිඳ කෙලෙසු
න්ගෙවා බුදුව මුලුලොව මුදුන්පත්විමි මේ මේ කාරණයෙන්
මෙම විදුරස්න මට මහත් වැඩවූයේය, එහෙයින් මෙයින්
නැගී නොසිටිමි සිතා කෙලලක්‍ෂයක් සමවත් සමවැද සත්දි
නක් මුලුල්ලේම විදුරසුන්පිට වැඩහුන් සේක.

### විදුරසුන් වැඩහුන් පළමුවන සතිය.

මෙසේ වැඩහුන්කල සමහර දෙවියෝ සිතන්නාහු මුන්ව
හන්සේ වජ්‍රාසනය හැර තවදක්වාම නොනැගිට හිඳියි තව
ම බුද්ධකෘත්‍ය නොනිම්යේවනැයි සිතුවාහුය, ඉක්බිත්තෙන්
මුන්වහන්සේ මෙසේ පළමුවන සතියෙහි ඵලසමාපත්ති
සැපතින් වජ්‍රාසනයෙහි වැඩහිඳ දෙවියන්ටවන් සැක දුරු
කෙරෙමියි, දෙවන සතියෙහි වජ්‍රාසනයෙන් අහසට පැණ
නැගි මොහොතක් කල්යවා මහත් ප්‍රාතිහාය්‍ය්‍යදක්වා දෙවි
යන් සැක දුරුකොට ශ්‍රීමහබොධියට ඊසානකොණ අහසින්
බැස මට උපකාරිවූ මේ ශ්‍රීමහබොධියට ප්‍රියවයතුවක් පුදමියි
සිතා ඇස්පිය නොසොල්වා පස්පැහැයෙන් දිලිහෙනලද ඇ
ස්සගලින් අනිමිසලොචනනම් පූජාවක් කොට සත්දවසක්
ධ්‍යාන සුවයෙන් වැඩසිටිසේක——

### අනිමිසලොචනනම් දෙවන සතිය.

මෙසේ වැඩසිටි තෙනටහා වජ්‍රාසනයටත් අතරෙහි පූර්ව
ඝචල මුවවිට පටන් පශ්චිම සඝචල මුවවිටදක්වා දෙවියෝ ඊසා
න දිගින් රුවන් සක්මණක් මවාඋහ, මෙසේ අපගේ ස්වාමීන්
වහන්සේ දෙවන සතියෙහි අනිමිසලොචන පූජාවෙන්

දවස්යවා තුන්වන සතියෙහි දෙවියන්විසින් මැවූ රුවන් සක්මණෙහි සත්දිනක් සක්මණ් කළසේක.

## රුවන් සක්මණනම් තුන්වන සතිය.

ඉක්බිත්තෙන් දෙවියෝ ශ්‍රීමහබොධියට වයඹදිගින් රුවන් ගෙයක් මවාඋහ, එකල්හි අපගේ ස්වාමීන්වහන්සේ තුන්වන සතියෙහි රුවන්සක්මණින් බැස රුවන්ගෙට වැඩමවා පලක්බැද වැඩහිඳ සඬම් නැමැති රත්නසමූහය සත්දවසක් මුලුල්ලේ විශෙෂයෙන් වෙන වෙනම බලා වදාළසේක, මිට අභිධර්‍මික තෙරුන්වහන්සේලා මෙසේත් කීහු, රුවන්ගෙයන සතනප්‍රකරණය සිහිකර වදාළ ස්ථානයයි.

## රතනඝර චෙතියනම් සතරවන සතිය.

මෙසේ අපගේ ස්වාමීන්වහන්සේ සතරවන සතියෙන් නැගිට පස්වන සතිය නම්වූ අජපාල නිග්‍රොධ මූලයට වැඩමවා පෙරදිගබලා වැඩහිඳ විමුක්ති සුවවිඳ දවස් යවනසේක—

එකල්හි මාරදෙව්පුත් තෙම පැරදගොස් යහන් මතුයෙහි මුහුණින්හෙව බොහො දෙවියන් කරණ නින්ද ඉවසාගත නොහී තමන් දිවවිමනින් සැඟවීගොස් දඹදිව මාවතක් මැද මගීවෙසක්ගෙණ දෙපා දිගුකොටලා එක්අතක් නිකටෙහි තබා කරබාගෙණ ඉඳ සිතනුයේ සිඬාර්ථකුමාරයා මානොකමැතිකරවා මහාභිනික්මන්කළේය, මට මේසා පරිභවයක් කොට බුදුවූයේය, මා ඉක්මිය, මාගේ සතුරා බුදුව සතර සතියක් ඉකුත්විය, නොබෝදවසකින් බණකියා හියලු සතුන් නිවණ්පුර පියයි කලක් අඩුවක්නැතුවතිබූ මාගේ නරකවල් අවකාසකරවයි, මේහැර මොහු මව්කුසඋපන් වේලෙහිද බිහිවූ වේලෙහිද මහාභිනික්මන්කළ වේලෙහිද බුදුවූ වේලෙහිද මාගේනරකවල ඇව්ලෙන ගිනිකඳුනිවා සියල්කරවා මාමුහුණ දැලිගාපිය, මේ මාගේ සතුරා කෙසේ පිටුදකිම්දැයි සොකකරමින් සොළොස් කාරණයක් සිත සිතා සොළොස් ඉරක් මගඅඟුරා ඇඟිලෙලන් ඇන්දේය, කෙසේදයත්? මම සිඬාර්ථයාට දානපාරමිතා, සීලපාරමිතා, නෛෂ්ක්‍රම්‍යපාරමිතා, ප්‍රඥපාරමිතා, වීර්‍ය්‍යපාරමිතා, ක්‍ෂාන්තිපාරමිතා, සත්‍යපාරමිතා, අධිෂ්ඨානපාරමිතා, මෛත්‍රීපාරමිතා, උපෙක්‍ෂාපාරමිතා, යනමේ දසපාරමිතාවෙන් අඩුවෙම් කියාද, දිව්‍යංචක්‍ෂුරභිඥනයෙනුදු, ආස්‍රවක්‍ෂය කරඥනයෙනුදු මහාකරුණා සමාපත්ති ඥනයෙනුදු, යමකප්‍රාතිහාර්‍ය්‍ය ඥනයෙනුදු, අනාවරණඥනයෙනුදු, සර්‍වඥතාඥනයෙනුදු, යනමේ ෂට්විධ

ෂණයෙන් අඩුවෙම්දැයි කියාද මේ සොළොස් කාරණයෙන් ඒ
සිඬාණීයා මට සතසහස්‍ර ගුණයෙන් වැඩිමය සතසහස්‍රගුණ
යෙන් මම්ම ඔහට අඩුවෙමියයි සිත සිතා සොළොස් ඉ
රක් ඇඳ ඒ බල බලා සුසුත්ලලා කරබාගෙණ හුන්නේය—
එකල මාරයාගේ තණ්හාය-රතිය-රගාය-යන දූත් තුන්දෙ
නෙක් දිව විමන්හි පියානොදක මපියානෝ කොයි ගියේ
දොහොයි දිවසින්බලා බිම ඉරිඇඳිමින් සුසුන්ලලා උනන
වූන් දක එතනට අවුත්, පියානෙනි, තුබ සුසුත්ලත්තේ
කුමන සොකයකින්දැයි විචාළහ, වසවත් මරකියනුයේ, ද
රුවෙනි, ශ්‍රමණභවත් ගෞතමයෝ දසදහසක් සක්වළ දෙ
වියත්බලා සිටියදී, මා ලුහුබඳවා මාමුහුණ දැලිගාපියා බුදු
වූයේය, මාගේ ආත්මරක්ෂාවට තිබූ චක්‍රායුධයපවා නැත්තේ
වේදැයි කිය,—එබස්ඇසූ දූත් තුන්දෙන කියන්නාහු, ස්වාමී
නි, අපටනොකියා ඒ සා පිරිසක් ගෙණගොස් කුමට විඩාවූ
සේක්ද, එකම බලපිරිසකුත් නැතුව අපි තුන්දෙනගොස් ඔ
හු කාමනැමැති මලෙත් බැඳගෙණ මුවපොලලකුසේ ගෙණ
එම්හ, දැනුදු සොකනොකරව ඇසිල්ලකින් අපි ඔහු තුබ පා
පිටටගෙණ එනලෙස බලාහුනමැනවැයි කීහ—එකල්හි
මාරතෙම කියනුයේ, දරුවෙනි, කුමන බසක් කියාද සිඬා
ණීකුමාරයෝ මහත් ආනුභාව හා මහත් තෙජස් ඇතියෝය,
ඔහු කාවිසිනුත් ජයගතනොහැක්කා, සොල්වාලිය හැකිකෙ
නෙක්ද නොවෙති යි මහාධෛර්ය සම්පන්න පුරුෂයෙකැ
යි කීහ, එබසට දූත් කියන්නාහු ස්වාමීනි අපගේ වසවර්ති
දිව්‍යලොකයට වඩා කාමභූමියෙක් නැතිබව නොදන්නා
සේක්ද, ජීවිතයක් ඇති පුරුෂයකු ඉදිරියෙහි ඇසිල්ලකින් පෙ
ණීගිය මෝනාම් ඔහු කාමයෙන් පොළඹාගැත්මෙහි අපට
වඩා දක්ෂවූ කාමාඩගණවෝ කාමලොකයෙහි නැතමැයි
මෙසේ පියානන් ඉදිරියෙහි වාසී බැණ පියානන් දෙව්ලො
වට යවා තුමූ එතනින් අන්තර්ධානව ඇසිල්ලකින් අපබුදුන්
වැඩඋන් අජපල් මුලට ආසන්නව දුටුදුටුවන් ඇසූඇසූවන්
සිත්සොලවා පියන සසියයක් වෙස්මවාගෙණ අද අපට එක්
පුරුෂයෙක්නම් ගරුකිත්දැයි වාසිකියා අපගේ ස්වාමිදරුවන්
වහන්සේගේ අභිමුඛයට අහසින් වගුළ සදුමල් පෙළක්සේ
රත්ලිය සමූහයක් සේ විදුලිය සමූහයක් සේ දෙදෙනෙක්
එක්වණ්සළු නොහැඳ වෙනවෙන නොයෙක් සත්ලීලා
වෙන් බුදුන් පෙරටුව සිට කාම පාසයෙන් බැඳියයුතු නො
යෙක්බස්බිණීය—මෙසේ නොයෙක් ප්‍රකාරයෙන් පොළඹ

වනගාහු අප ස්වාමීන්වහන්සේගේ නුවන්කොණින් බැලුම් පමණකුත් ඔවුන් නොලද්දාහුය, එකල්හි කළකිරුණුමාරදූත් අපටවූ පරිභව ඉතා මහතැයි යම්හ නනනියනිකියා එතනින් අනනධානව පැරද පලාගියාහ.

මෙසේ අපගේ ස්වාමිදරුවන්වහන්සේ ඒ මාර සත්‍රීන්ජයගෙණ අජපාල නිග්‍රොධ මූලයෙහි පස්වන සතිය පසුකළසේක.

අජපාල රුක්මුල වැඩහුන් පස්වන සතිය.

සවනසතියෙහි මුචලින්දනම් විලටවැඩ ඒ විල්තෙර මිහාමිදෙල්ල ගසමුල වැඩහුන්සේක — එකල්හි සත්දවසක් වස්නා මහාමෙඝයක් නගා සත්දවසක් ධාරානිපාතයෙන් විය ඒ විලවසන මුචලින්දනම් දිව්‍යනාගරාජයා විලින්නැගී දසදෙස වැසසිටි මහත්වූ වැසි අඳුරු චතුරුද්ධක බුදුන්ගේ ශරීරයට වැසි සුලං සීතල මැසි මදුරුවන් වලකා, මෙසා පින්රැස් කෙරෙමියිසිතා බුදුන්වටලා සත්දරණ පටක්කොට ඒ මහත්වූ පෙණගබින් මුදුනවසා බුදුන් පුදා සිටගත, එකල අපගේ ස්වාමීන්වහන්සේ දැවානාකරඬු වෙක වඩාඌ පිළිමයක්සේ මුචලින්දනම් නාගරාජයාගේ දරණ ගබවසන සතියෙහි ධ්‍යානසුවයෙන් වැඩහුන්සේක.

මුචලින්දනම් නාගභොගයෙහි වැඩහුන්සවනසතිය.

මේ සවන සතියෙන් නැගිට සත්වන සතියෙහි කිරිපලුවනයට වැඩ කිරිපලු ගසක්මුල ගල්අස්නක්පිට නිල්වලා ගැබක්යට දිලිහෙන පූර්ණසඳක්සේ දිලිහි දිලිහී ධ්‍යානසුවයෙන් සත්දිනක් වැඩහුන්සේක.

කිරිපලු රුක්මුල වැඩහුන් සත්වන සතිය.

මධුපිණ්ඩික දානයෙහි-1-කාඬය.

මෙසේ එකුන් පණස් දවසක් ආහර කෘත්‍යයක් නැතිව නිවණ්සැප වලඳා දවස්යවා පණස්වනදා උදෑසන සක්දෙව්රජවිසින් දෙනලද අමෘත අරලුසහිත මෑදුවූ සිනිඳුවූ නාලියදැහැටිය වලඳා අනොතත්ත විලට වැඩමවා මූඛධොවනය කොට නැවත කිරිපලු රුක්මුලටවැඩමවා වැඩඋන්සේක — එකල්හි තපස්සු භල්ලූකනම් වෙළඳ දෙබෑකෙනෙක් උත්තර පථයෙහි සිට පන්සියයක් ගැල්නි බඩුපුරවගෙණ මධ්‍යමණ්ඩලයට යන්නාහු ඒ කිරිපලුවනයට පැමිණියාහුය — පෙර ඔවුන්ට නෑවූ දෙවතාදුවක් ඒ වෙනෙහි වසන්නී, මේ වෙළඳ දෙබෑයන්ලවා අප බුදුන්ට දන්දෙවා උන්ට වැඩ

සිදුකෙරෙම්යි සිතා උන්ගේ ගැල්පන්සියය නාභියදක්වා
පොළොව ගල්වාපුව, අඳනාගොඬ දනාගසා රැඳුනෝය, වෙ
ළඳ දෙබෑයෝ ඊට භයපත්ව මේ වෙනෙහි දෙව් කෙනෙ
කුන්කල, දෙයකැයි ගඳදුම්මල් පහන් පූද, දෙවියන්ට ආරා
ධනාකළාහ එකල දෙවුදුනොමෝ ආකාසයෙහි සිට ඔවුන්
ට පෙණී භයහරවා අප උතුමානන්වහන්සේ එකුන් පණස්
දිනක් මූලුලෙලහි තවදක්වා නිරාහාරයෙන් සත්සති යවා
දූන් මාගේ මේ වෙනෙනි පින්කෙත්ව වැඩහුන්සේක, තො
ප අපට පරලෝ වැඩපිණිස උන්වහන්සේට අද පණස්ව
න දිනයෙහි අග්‍රභොජනයක් දෙවනු කැමැතෙනම්යි දත්
දෙනසේ ඔවුන් යොදවා ඒ පත්සියයක් ගැල්හැරපීය.—
එකණෙහි ඔහු දෙදෙන පැහැදී මීපිඩු ගෙණගොස් බුදුන්
පෙරටුව සිට පිළිගන්ට ආරාධනා කළහ එකල උන්වහන්
සේ කුමකින් පිළිගණිද්දෝ හොයි සිතා වදාළසේක.

## මධුපිණ්ඩික දෘනයෙහි-2-කාණ්ඩය.

එකණෙහි අපගේ සවාමිදරුවන් වහන්සේ සසර ජාති ජා
තියෙහි දන්දුන් චතුමධුර පූණ්පාත්‍රයන්ගේ කුසලානුභාව
යෙන් වරණ් රජදරුවෝ සතරදෙන ඉන්‍ද්‍රනීල මාණික්‍යමය
පාත්‍රා සතරක් ගෙණවාහ.— පූර්ව බුද්ධවරයින්ගේ චාරිත්‍රබ
ලා ඒ පාත්‍රා නොඉවසා වදාළසේක, නැවත මුත්වණ් පැ
හැඇති ශෛලමය පාත්‍රා සතරක් ගෙණවුත් මාගේ පාත්‍ර
යම ගනමැනව, මාගේ පාත්‍රයම ගනමැනවැයි කියා උන්
වහන්සේගේ ශ්‍රීහස්තනැමැති පියුමට බස්නා නීලභෘඩග රා
ජයන් සතරදෙනෙකුසේ මතුමතෙහි තබාපීහ, උන්වහ
න්සේ ඔවුන්ට අනුග්‍රහ සඳහා පාත්‍රාසතරම එකස් වේවයි
අධිෂ්ඨානකර වදාළකල්හි එකම පාත්‍රයෙක් විය, ඒ පාත්‍රයෙන්
මීපිඩු පිළිගෙණ එය වලඳා වෙළඳ දෙබෑයන්ට අනුමෙවෙ
නිබණ වදාළකල්හි ඒ වෙළඳදෙබෑයන් දෙදෙන මේ ශාසන
යෙහි වෙචාවික උපාසකයෝව වැඳපුද, ගැණීමපිණිස අප
ට වස්තුවක් දුනමැනවැයි කීහ.— එකල්හි අපගේ සවාමීන්
වහන්සේ ශ්‍රීහස්තයෙන් සිරස පිරිමැද කෙසධාතු මිටක් දුන්
සේක, ඔවුන් රණ්කරඬුවකින් ඒ කෙසධාතුපිළිගෙණ රටයෙ
හිතබා සියරටට ගෙණගොස් පූද සත්කාර පැවැත්වූහ.

## අජපාල කථාවේ-1-කාණ්ඩය.

ඉක්බිති අප භාග්‍යවතුන් වහන්සේ කිරිපලු ගසමුලින්නැ
ගිට බුදුවූ පණස්දෙවනදින සවස් භාගයෙහි අජපාලනම්

නුග ගසමුල වැඩහිඳ මා අවබොධකළ ධර්මය ගාම්භීර්ය සත්වයන්ගේ නුවණ ලාමකය කෙලශයෝ ඉතා උත්සන්නයෝයයි යනාදීන් ධර්ම ගාම්භීරත්වය සලකමින් ධර්මමන්දොත්සාහයට පැමිණිසේක, මෙම ධර්ම මන්දොත්සාහය නම්.

බ්‍රහ්මුනා යාචිතෙ දෙසෙතු කාමතාය එවං චින්තංනහි
ජානාතිහි භගවා මම අප්පොස්සුක්කතාය චිත්තනමමා
නෙ මහාබ්‍රහ්මා ධම්මදෙසනං යාචිස්සතීති.

යනාදීන් බ්‍රහ්මයාවිසින් ආරාධිත කල්හි දහම්දෙසනු කැමැත්තෙන් මෙසේ මන්දොත්සාහයට සිතනැවූයේය මම මන්දොත්සාහය පිණිස සිත නමන කල්හි මහාබ්‍රහ්මතෙම දහම්දෙසීමට යාඥාකරන්නේයයි භාග්‍යවතුන් වහන්සේ දන්නාසේක්මය, මේ සත්වයෝද බ්‍රහ්මයා ගරුකොට ඇත්තෝමය, එසේහෙයින් ඒ සත්වයෝ බුදුහුධර්මය නොදෙසනු කැමැත්තිවිය, ඉක්බිති උන්වහන්සේට මහාබ්‍රහ්මයා යාඥාකොට ධර්මය දෙශනා කරවිය, එහෙයින් පින්වත්නි එ කාන්තයෙන් මේ ධර්මය ශාන්තය ප්‍රණීතයයි හඟිමින් මනාව ධර්මයඅසත් මේ කාරණය හෙතුකොටගෙණ මන්දොත්සාහයපිණිස සිතපමුණුවා වදාළසේකැයි දතයුතු— එකණෙහි සහම්පති මහාබ්‍රහ්මතෙම දසදහසක් සක්වළ දෙවිබඹුන් විසින් පිරිවරණලදුව මේ මගුල්සක්වළ අපබුදුන් වැඩහිඳිනා අජපාල රුක්මුලට පැමිණ තමාගේ දකුණු දනමඩල නමා උක්කුටිකයෙන් හිඳ දෙඅත් හිස්මුදුනෙහි තබාගෙණ ස්වාමිනි නුඹවහන්සේගේ දෙසනා නැමැති රශ්මියෙන් ප්‍රබොධාකාරවහිඳිනා වෛනෙය ජනයෝ අසංඛ්‍ය ගණනන්ය, එසේ හෙයින් නුඹවහන්සේ ධර්මචක්‍රය වදාළමැනව, එහි නොහික්මී වසනනාවුන්, මම මාගේ ආඥාචක්‍රයෙන් හික්මවාදෙමියි ධර්මදෙශනාවට ආරාධනා කොළේය— කීයේ මැනෝ—

බ්‍රහ්මාච ලොකාධිපති සහම්පතී
කතඤ්ජලී අනධිවරං අයාචථ,
සන්තීධ සත්තා අප්පරජක්ඛ ජාතිකා
දෙසෙථ ධම්මං අනුකම්පිමං පජං.

ලොවට අධිපතිවූ සහම්පතිනම් බ්‍රහ්මතෙම අනධිවර උතුමානන්ට ඇඳිලිබැඳ යාඥාකොළේය, අල්පරජස්ක ජාතිසත්වයෝ මෙහි ඇත ඔවුන්කෙරෙහි අනුකම්පාවෙන් දහම් වදාළමැනවැයි—මෙසේ කරණලද මහාබ්‍රහ්මයාගේ ආරාධනාව අසා ධර්මදෙශනා කෙරෙමියි බ්‍රහ්මයාහට ප්‍රතිඥා දුන්සේක, එ

කෙණෙහි සහම්පති මහා බ්‍රහ්මයා සෙනොනාසව මුලුලොව ඇසෙනසේ තුන්සලක් සාධුකාරකෙළේය, ඔහුගේ සාධුනාදය සමග දසදහසක් සක්වළ දෙවිබඹුන් දෙහොත්මුදුන්දී සාධුනාද පවත්වා නික්ම ගියෝය.

## අජපාල කථාවේ-2-කාණ්ඩය.

මෙසේ අටවෙනි සතියෙහිදී ලබනලද බ්‍රහ්මාරාධනා ඇති අප භාග්‍යවත් සර්වඥයන්වහන්සේ කවුරුන් උදෙසා දහම් දෙසම්දෝ හොයි සිතා වදාරා, ආලාර, උද්දක, නම් තාපසවරු දෙදෙනා ඉතා නුවණ ඇතිසේකැයි ප්‍රකෘති ඥාණයෙන් කල්පනාකර වදාළපසු බුදුන් අදහස්සොයමින් සිටි එකතරා අතුරුදම් දෙවතාවෙක්, ස්වාමිනි ඔවුහු කාලක්‍රියාකළෝය යි සැළකලවිට තමන්වහන්සේ විසිනුත් සර්වඥතාඥානයෙන් බලා වදාරණසේක් ආලාරයන් එවකට සත්වෙනිදා මිය, උද්දකයන් ඉස්යේවෙනිදා මිය, ඔවුන් දෙදෙනාම අරුතල බ්‍රහ්මලොකයෙහි උපන්සේදැක, පස්වග මහණහු සාවුරුද්දක් මුලුලෙලහි මාවෙනුවෙන් දුක්ගත්තෝය, ඔවුන් දැන් කොයි වෙසෙද්දෝහොයි බලා වදාරා බරණැස නිසා ඉසිපතනයෙහි වෙසෙතියි දැක මාගේ පළමුවන ධර්මදෙශනාව ඔවුන් පස්දෙනා උදෙසා කරම්යි සිතා වදාරා අටවෙනි සතිය ගියකළ නොහොත් බුදුවී පණස් සවෙනිදිනයෙහි ඒ අජපාල රුක්මුලින් නැගිට බෝමැඩ දිසාවට වැඩිසේක.

---

## දම්සක් පැවැත්වීමේ-1-කාණ්ඩය.

මෙසේ වැඩමවා වදාළ උන්වහන්සේ, කිපදිනක් බෝමැඩ සම්පයෙහි පිඩුපිණිස හැසිරෙමින් වැඩසිට ඇසළමස පසළොස් වක්දිනයෙහි බරණැසට පැමිණෙමියි සිතා තුදුස්වක්දින උදය භාගයෙහි නොහොත් බුදුවූ එකුන් සැටවෙනි දිනයෙහි පා සිවුරු ගැඳ පොරව බෝමැඩසිට දෙසතතෑ ගව්වක් දුර මාර්ගයගෙවා ඉසිපතනයට යනු පිණිස එකචාරි සිංහරාජයෙක්සේ හුදකලාව වඩිනාසේක—එකල උපකනාම් ආජීවකයෙක් සත්සුත් ගමනින් වඩනා උන්වහන්සේ දැක සියලඟින් දිවන සවණක් රැස්හා දෙතිස් අසූ ලකුණු හා ශ්‍රී මුඛයෙන් දිවන සඳ කැලුම්වත් බුදුරැස් කඳහා පූර්ණසඳක්සේ දිලිහෙන ශ්‍රීමුඛ පදමයද දැක ප්‍රසන්නව, ''කංසිත්වං ආවුසො උද්දිසස පබබජිතො''—යනාදීන් ඇවැත්නි කා උදෙසා තොපි පැවිදිවූයෙහිද, කවරෙක් තොපගේ ශාස්තෘවන්නේද, කවරක්හුගේ ධර්මය තොපි කැමති

වන්නෙහිද, තොප දුටු වේලෙහි පටන් මාගේසිත ඉතා අමාපිරූ බඳනක්සේ සන්තොසයෙන් ඉතිර ඉතාමත් ප්‍රසන්නය, හිමි තොපි කවුරුදැයි විචාළේය— එකල ඔහු කළ සන්තොසයෙන් ඔහුට මතු බොහෝ වැඩවනසේ දැක තමන්වහන්සේද මදමද සිනා පහළකොට ඔහු මුහුණ බලා

නමෙ ආචරියො අත්ථි සදිසො මෙනවිජ්ජති
සදෙව කස්මිං ලොකස්මිං නත්ථිමෙ පටිපුග්ගලො
අහංහි අරහාලොකෙ අහංසත්ථා අනුත්තරො
එකොම්හි සම්මා සම්බුද්ධො සීතිභූතොස්මි නිබ්බුතො.

ආජීවකය මට ගුරුකෙනෙක්ද නැත, මාහා සමානයෙක්ද නැත, දෙවියන්සහිත ලොකයෙහි මටවැඩි පුද්ගලයෙක් නැත, මමවනාහි ලොකයෙහි අර්හත්ය, මම ශාස්තෘය, මම නිරුත්තරය, මම හුදකලා සම්මාසම්බුද්ධවූයෙමි, සිහිල් වූයෙමි, නිවුනේ වීමි, දුරු කටයුතු ධර්මයන් දුරින්ම දුරුකෙළෙමි, භාවිතා කටයුතු ධර්මයන් හැම අම්‍රපිඩක්සේ ඇරගතිමි, දෙවාතිදෙව්වූ යෙමි, බ්‍රහ්මාති බ්‍රහ්මවූ යෙමි, ශක්‍රාති ශක්‍රවූ යෙමි, වන්දනෙය්‍යහි වන්දනෙය්‍යවූ යෙමි, පූජනෙය්‍යහි පූජනෙය්‍යවූ යෙමි, සද්ධර්මවර චක්‍රවර්ත්තිවීමි, පස්මරුන් ජය ගතිමි, එසේජයගෙණ සිටිහෙයින් මටඅනන්ත ජිනයයි කියත්තේයයි වදාළසේක— එවේලෙහිආජීවකයා උත්වහන්සේ කෙරෙහි ඉතා ප්‍රසන්නව යහලුඅනන්ත ජිනයෙන් අද පටන් තෙපි මාගේ යහලුභූවෝය මතු මා ආ දවසක මා රක්ෂාකරව්දැයි විචාළේය, උත්වහන්සේද මතු තමන්නිසා ඔහට සිදුවෙන වැඩ දැක යහපතආවිටක තොප රක්ෂාකරම්හයි වදාරා ඉසිපතනා රාමයට වැඩිසේක.

---

## දම්සක් පැවැත්වීමේ-2-කාණ්ඩය.

නවද උත්වහන්සේ බරණැස ඉසිපතනා රාමයට ඇසළ මස පසළොස් වක්ලත් එදවස් සවසට වැඩමවා වදාළසේක, එකල පස්වග මහණහු දුරින් වඩනා උත්වහන්සේ දැක භවත් ගෞතමයෝ දුෂ්කරක්‍රියා හැරපියා තමන් රජ කුලෙන් මහණවූබැවින් ඉසුරු මතුත් විසිත් දෙතලද මිහිරි ආහර අනුභවකොට ඡවිපහස් ලදින් දැන් ප්‍රභාසම්පන්නව රණ්කඳක්සේව ගියාහුය, මුහුණ සොභාවද මනාවිය, නොයෙක් උත්සාහකොටත් බුදුවිය නොහී දැන් අපකරු. එන්නේය, ඔහු රජකුලයෙහි උපන් බැවින් ඉදිනා අසුන්

පමණක් දෙම්හ, හුනස්නෙන් නොනැගෙම්හ, පෙර ගමන්
නොකරම්හ, පෙරසේ අපි ඔහු නොවඳුම්හයි කතිකා කළෝ
ය—උත්වහන්සේ පස්වග භික්ෂූන්ගේ අදහස් දැන අන
න්‍තා පර්යන්‍ත සත්‍වලොකයෙහි පැතිර සිටිනා තමන්වහන්
සේගේ මෛත්‍රීනැමැති ජලප්‍රවාහය ඒ පස්දෙනා කරා මෙහෙ
යාඋසේක—එකල්හි පස්දෙනම හුනස්නෙහි හිඳතො
නී නැගිට බුඩතෙජසින් සිටගත නොහී උත්වහන්සේගේ
පෙරට අවුත් වැඳවැටී, පා සිවුරු අතින්ගෙණ වැඩහිඳිනා
අසුන් පණවා ආදරයෙන් බුදුන්ගේ ශ්‍රීපාදය සොඩා ඇඟට
පත්සලා පැන් පිපාස විචාරා බුදුවූ බැව් නොදැන සාමීචි
කථාකරන්නෝ ආවුසොවාදයෙන් සම සම්යන්සේ කථාකෙ
රෙති, එකල උත්වහන්සේ මේ භික්ෂූහු මා බුදුවූ බැව් නො
දනිති මා සම කෙනෙකුන් තුන්ලෝනැති නියා නොද
න්ති, මම, මා බුදුවූ බැව් මොවුන්ට හගවම් සිතා මහණෙ
නි සමානයන්හා කථාකරනාසේ කථානොකරව් සව්ණේ
ගෙවා බුදුව තුන්ලෝ මුදුන් පත්වීම්, තොප හැමදෙනා
ගේ සැකහැර අද රෑ දම්සක් දෙසුම් අසා බලවයි වදාළ
සේක—එබස් අසා පස්වග මහණහු බුඩතෙජසින් වෙවූ
ලා කෙශර සිංහයක්හු දුටු ඇත්පැටවුන්සේ අත්පා නො
සොල්වා එකත් පස්ව උන්හ.

## දම්සක් පැවැත්වීමේ-3-කාණ්ඩය.

එකල්හි අප භාග්‍යවත් සව්ඥයන්වහන්සේ අප්‍රමාණ.බුදු
වරයන් වහන්සේලා විසින් මගුල් දම්සක් දෙසන දින වැ
ඩහිඳ වදාළ ඩම්භූම්යෙහි පැන නැගුණු බුඩාසනමත්‍රයෙහි
වැඩහිඳ සූයඝී දිව්‍යරාජයා මෙන් බබලමින් සියොලඟින් බුදු
රැස් විහිදුවන්ට වන්සේක, මෙසේ දිව් බුදුරැස් බඹලෝ දක්
වා දිවන්ටවත්හ, මේ කාලයෙහි උදයගිරි මුදුනෙන් එකුන්
පණස්යොදුන් සඳමඩල උදාවී ප්‍රභාවිහිදුවමින් සිටගත, මෙ
සේ බුදුවූ සැටවෙනි දිනයලත් ඇසළමස පුර පසළොස්වක්
ලැබීමෙන් හිරු අස්තඩගතවූ කල්හි උත්වහන්සේගේ ඩම්
දෙශනා කාලය සම්ප්‍රාප්ත වීය—මේ කාලයෙහිද ඇශ්චය්‍යී
අද්භූතවූ දෙතිස් පූර්ව නිමිතිද ලොව පහළවූහ—එකණෙ
හි දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයෝ අපගේ ස්වාමීන්ව
හන්සේ දහම් අමා වතුරෙහි අප හැම ගලා සංසාර දුක්නැ
මැති මහ ගිම් නිවයි උත්වහන්වස්ගේ දහම් අමාරස බො
න්නට යම්හයි කියා පරසතු මල් ආදිය ගෙණ නික්මුනෝය,
මෙසේ දස දහසක් සක්වළ මුලුලෙලනි සැටදහසක් කාමා

වචර දිව්‍යලොකවල දෙවතා සමූහයාද, දසදහසක් සක්
වළ, අරූතල අසංඥ තලයත් හැර එක්ලක්‍ෂ පණස්දහසක්
රූපාවචර බ්‍රහ්මලොකවල බ්‍රහ්මසෙනාවද මෙම මඟුල්සක්
වළට පැමිණ සක්වළ ගැබ කෙළවරකොට අකනිට්‍ඨා බඹලො
දක්වා නාලයකපුරාළ රණ්සුණු සමූහයක්සේ අතුරුනොව
සිටගත්හ — තවද උන්වහන්සේ වැඩහිඳ වදාළ බුඬාසන
යෙහි පටන් අකනිට්‍ඨාබඹලොව දක්වාම උන්වහන්සේගේ
සිරසින් නිකුත්වන බුදුරුස්කඳටම අවකාශවිය, දෙවියෙක්
හෝ බ්‍රහ්මයෙක් හෝ ඒ බුදුරුස් කඳෙහි නොගැවෙන්නා
හුමය, තවද උත්වහන්සේ වැඩහුන්තැන සිරොභාගයෙහි
දෙව්බඹ කිසිවෙකුටත් බඹලොවදක්වාම සිටින්ට නොහැක්
කේමය, මෙසේ එදා රුස්වූ දෙව්බඹුන් අතුරෙන් උත්වහ
න්සේගේ සිරසට දස දහසක් මහාබ්‍රහ්මයෝ සඳ මඬුලුවත්
ධවලච්ඡත්‍ර දසදහසක් මතුමතුයෙහි තබා සිටගත්හ, දසදහ
සක් ශක්‍රයෝ දසදහසක් ජයසක් පිඹින්ට පටන්ගත්හ, දසද
හසක් සුයාමයෝ දසදහසක් චාමර සලති, දසදහසක් සන්තු
සිතදෙව්යෝ දසදහසක් මිණිතල්වැට සලති, සෙසුදෙව්යෝ
රණ් තොරණ් රිදී තොරණ්, රණ් සුණු, රිදී සුණුආදි නො
යෙක් පූජාභාණ්ඩගෙණ සිටගත්හ — එකල බ්‍රහ්මාණ්ඩය දක්
වාගැවසී ගත් දෙව්බඹුන්ගේ පූජා කොලාහලය සමුද්‍ර ඝොෂා
වක්මෙන් එකණින් නාදවීය, දෙව්බඹුන්ගේ මේ අරගල සත්
සිඳුවාලන්ට අත්කිසිවෙක් නැතිබැවින් එහි රුස්වූ දසදහසක්
ශක්‍රයෝ ඒ තමන් කළමනා ධුරයක්සෙසින් දසදහසක් දකු
ණුසක් පිඹ, සක්පිට වගුරුවා විසිදහසක් අත්ඹසවා බණපිරිස
සත් සිදෙවසිකියා තුන්ලෝ වෙවුල්වා බැණනැංගාහ, ඒ වේ
ලෙහි ශක්‍රඝොෂාව අසා තුන්ලෝ පුරා සිටි දෙව් බඹ පිරිස්රළ
නැති මුහුදක්සේ නිශබ්දවූහ — එකල්හි උත්වහන්සේගේ
ශ්‍රීමත්වූ මුඛපද්මය විදහා පස්වග මහණුන්ට ආ මන්ත්‍රණය
කොට "වෙමෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන නසෙවිතබ්බා"
යනාදීන් මඟුල්දම්සක් වදාළසේක — එකල්හි පූව් පශ්චිමාදි
දසදිග සිටි සැම දෙව්බඹුන්ම තමතමන් දිසාවට මුහුණලා වැ
ඩහිඳ දහම් දෙසනසේකැයි සිතසිතා පිනපිනා ධම්ය අසති,
මෙම මඟුල් සක්වළද සදෙව් ලෝවැසි දෙවියෝ තමතම
න්ගේ දිව්‍යලොකවල වැඩහිඳ බණ වදාරණසේකැයි සිතසි
තා පිනපිනා ධම්ය අසන්නාහුය, බ්‍රහ්මයෝද තමතමන්ගේ
බඹලොවම සිට බණවදාරණ සේකැයි සිතසිතා පිනපිනා ධ
ම්ය අසන්නාහුය.

මෙසේ අපගේ ශාක්‍යසිංහයන් වහන්සේ ඇසළමස මැදි පොහෝදින පතල සඳපානේ කරවදාළ පළමුවෙනි මේ ධර්ම දෙශනාවෙහිදී පස්වග මහණුන් අතරෙන් වැඩිමහලු වූ කොණ්ඩඤ්ඤනම් තෙරුන් වහන්සේ කෙළදහසක් පමණ කෙලෙසුන්නසා දහසක් නයින් සම්පූර්ණවූ සොවාන් මාර්ගයෙන් වැද නිවණ්පුර දුටුසේක, තුන්අසංඛ්‍යයක් දෙවියන් සොවාන්, සකෘදාගාමි, අනාගාමි යන ත්‍රිවිධ මාර්ගඵලය ලැබී මෙන්හා, අටළොස් කෙළක් බ්‍රහ්මයන් සියලු කෙලෙසුන් නසා රහත්වීමෙනු, නිවණ්පුර දක්වා බණසම්හර කොට, තොප තොපගේ විමන්වලට යවයි අවසරදුන්සේක, එකල දිව්‍ය බ්‍රහ්මයෝ පිනාපිනා සාධුකාර පවත්වා බුදුන් වැඳ ප්‍රදක්ෂිණකොට තම තමන්ගේ විමන්කරා ගියෝය.

---

ශ්‍රාවක සන්නිපාත යේ-1-කාණ්ඩය.

මෙසේ දෙව්බඹුන්යවා. ඉක්බිති අපභාග්‍යවත් ශාක්‍යසිංහයන් වහන්සේ පස්වග භික්ෂූන් සමග එම ඉසිපතනාරාමයෙහි පැළවියලත් දෙවෙනිදින පළමුවෙනි වසවැස වදාළසේක—තවද එම පක්ෂයෙහි පස්වෙනි දින, අනත්ත ලක්ඛණ සූත්‍රය දෙශනා කළ කල්හි දෙසනාව සානයෙහි අඤ්ඤාකොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි, යන පස්වග මහතෙරුන් වහන්සේලා සියලු කෙලෙසුන්නසා අර්හත්ඵලයෙහි පිහිටියාහුය—මෙසේ අප භාග්‍යවතුන් වහන්සේ ඒ රහත්වූ පස්වග භික්ෂූන් සමග එහි වස්වසන කල සුජාතානම් සිටුදුවගේ පුත්‍රවූ බරණැස යසනම් සිටුපුත්‍රයා තුන් ඍතුවටකළ තුන්පායෙහි නළුවන් පිරිවරා මහත්වූ ශ්‍රීසම්පත් විඳිනාහු එක්දිනක් නිදා පිබිදියාවූ තමන් නාටක ස්ත්‍රීන්ගේ විප්‍රකාර දැක සසර කලකිරී එව්ගස යහනින්නැගිට පෙරබුදුන් සමයෙහි කරණලද කුසල බලයෙන් මෙහෙයන ලදුව එදවස් රෑ මැදුම්යම් කාලයෙහි අපභාග්‍යවතුන් වහන්සේ වැඩවසන ඉසිපතනා රාමයට පැමිණ බුදුන්දැක සතුටුව පසගපිහිටුවා වැඳ එකපස්ව සිට බණඅසා සොවාන් ඵලයට පැමිණ එහි භික්ෂුභාවයෙන් මහණවූහ, දෙවෙනිදා උදෑසන යසනම් කුලපුත්‍රයා සොයාආපියවූ සිටානන්ට බණ වදාළ කල්හි සිටානෝ සෝවාන්වූහ—එවේලෙහි යසනම් තෙරුන්වහන්සේ රහත්වූ සේක—ඉක්බිතෙතන් මෙම යසනම් කුලපුත්‍රයාගේ යහලුවෝ සිව්පණස්දෙනෙක් බුදුන් සමීපයට පැමිණ තමන් යහලුවූ යසනාම් මහාසඵ විරයන්

දැක අපයගහලුවා ලදසිරි අපටත් වීනම් යෙහෙකැයි සිතයි
නා බුදුන්වැද එකත්පස්ව සිටිසඳ උන්වහන්සේත් ඔවුන්
ගේ චරිතලෙස බණවදාළ කල්හි ඒ සිව්පණස් දෙනම එහි
භික්ෂුභාවයෙන් මහණව රහත්වූසේක—මෙසේ අපගේ
ස්වාමීන් වහන්සේ සමන එක්සැටක් රහතන් ලොව පහළ
වූකල උන්වහන්සේ වප්මස මැදි පොහොදින විස් පවාර
ණකොට ඒ මහරහත් සැටනම ලගවකැඳවා.

පරත්ථමනන නොඅත්ථං කරොනතා පඨවිංඉමං
බ්‍යාහරනතා මනුස්සානං ධම්මංචරථ භික්ඛවෝ ති.

මහණෙනි අන්හටද තමහටද වැඩපිණිස මේ පෘථිවියෙ
හි මනුෂ්‍යයන්ට ධම්ය කියමින් හැසිරෙව්යයි, යනාදින් අව
වාදදී මහණෙනි මේලෝකයෙහි සත්වයෝ බුදුන් ලෙංවප
හළවූ බව නොදනිති නොපිහැමදෙන දෙදෙනෙක් එක
මග නොයව් සැටදෙනා වෙනවෙනම සැටමාගීයකින් ගො
ස් ගියගියදෙස දුටුදුටු සත්වයින්ට්මා උපන් පරිදි කියා ලො
කාර්ථචයණීව කරවයි වදාළසේක—මෙසේ ඒ සැටදෙනා
වහන්සේ සැටමාගීයකින් යවා තමන්වහන්සේ හුදකලාව
ම උරුවෙල් දනව්වට වඩනාසේක් අතුරුමග එක් රුකක්
මුල සවණක්රසින් දිලිනි දිලිහි වැඩහුන්සේක එකල්හි කො
සොල්රට හද්දවගගියනම් රජකුමරුවෝ තිස්දෙනෙනක් ක්‍රීඩා
පිණිස, කප්පාසිකනම් වනයටගොස් එහි ඇවිදිනනාහු ස
වණක්රසින් දිලිහෙන අපගේ සවාමීන්වහන්සේ දැක වැද
එකත්පස්ව සිටිකල්හි ඔවුන්ට අනුරූපවූ බණවදාරා ඒ තිස්
දෙනාම සතරමග සතරඵලයෙහි පිහිටුවා එහි භික්ෂුභාව
යෙන් මහණකර වදාළසේක—මෙසේ බුදුවී හමාසයක් ඇ
තුළත මේලොකයෙහි එකා නූවක් රහතන් වහන්සේලා
ඇතිවූකල්හි අපභාග්‍යවතුන් වහන්සේ උරුවෙල් දනව්වට
වැඩමවා, තුන්දාස් පන්සියයක් ප්‍රාතිහාර්‍ය දක්වා වදාරා උ
රුවෙල කාශ්‍යපයා ආදි දහසක් ජටිලයන් පිරිවරකොට ඇ
ති තෛභාතික ජටිලයන් ශික්මවා ඒ දහසක් ජටිලයන්ම
එහි භික්ෂුභාවයෙන් මහණකර වදාරා ගයා ශිර්ෂයෙහි හිඳුවා
ආදිත්ත පරියාය සූත්‍රය දෙශනා කොට ඒ දහසම අගිත් ඵ
ලයෙහි පිහිටවූසේක—මෙම රහතන් වගන්සේලා දහස
විසින් පිරිවරණලදුව බිම්සර රජහට දෙනලද ප්‍රතිඥාවෙ
න් මිදෙම්සි සිතා වදාරා, රජගහ නුවරසමීපයෙනිවූ වැල්මිව
නයට වැඩිසේක, බිඹිසාර රජතෙම උයන් පාලයාගෙන් ශා
ස්තෘත්වහන්සේ උයනට වැඩිබවඅසා දොලොස් නහුතයක්

බමුණුගෘහපතීන් විසින් පිරිවරණ ලදුව සතුටුසිතින් තථාගතයන් වහන්සේකරා පැමිණ උන්වහන්සේගේ පාංසගල් වැද එකත්පස්ව හුන්තේය, එකල්හි තථාගතයන් වහන්සේ එහි රැස්වූ පිරිසට චතුසසත්‍යයගෙණ හැරදක්වා වදාළසේක, ඒ දෙශනාවගේ කෙළවර බිම්බිසාර රජ එකොළොස් නහුතයක් ඇමතියන් සහිතව සොවාන් ඵලයෙහි පිහිටියාහ, නහුතයක් සරණසීලයෙහි පිහිටියාහ, මේ සියලු සමූහයා එක්ලක්ෂ විසිදහසක් බව දතයුතු—

ඉක්බිති රජවිසින් කරණලද ආරාධනාවෙන්, පසුවෙනි දින රජගෙට වැඩමවා වදාළාවූ බුද්ධපාමොක් මහසංඝයා වහන්සේට බිම්බිසාර රජවිසින් මහදන්දී, වලඳා අනතයෙහි එකත්පස්වහිඳ, ස්වාමීනි මෙතැන්පටන් ජීවිතාන්තයදක්වා තුනුරුවන්හැර වාසය කළ නොහෙමි, සිතූ යම්විටක වැඳපුදාගන්නා කැමැත්තෙමි, වේළුවනයද ඉතා රම්‍යය එය පිළිගෙණ එහි වැඩහුනමැනවැයි කියා ආරාධනාකොට ඒ ආරාමය දෙවියන්ගේ නඳුන්වනයසේ සරහා තථාගතයන් වහන්සේ එහි වැඩමවාගෙණ ගොස් රන්කෙණ්ඩියෙන් ශ්‍රීහස්තයට පැන්වත්කොට වේළුවනාරාමය පිළිගැන්වූහ—මෙසේ තථාගතයන් වහන්සේ රජගහනුවරට වැඩිය දෙවනදා වේළුවනාරාමය පිළිගෙණ එහි වැඩවසන සමයෙහි, මොක්ෂය සොයමින් විඩාවගිය උපතිස්සනම් පරිබ්‍රාජකයා අස්සජි මහතෙරුන් වහන්සේගෙන් බණඅසා සෝවාන්ව තමන් මිතුවූ කොලිත පරිබ්‍රාජකයාහටත් ඒ ඇසූබණ නොවරදවා කීකල්හි කොලිත පරිබ්‍රාජකයාද සෝවාන්ව දෙසිය පනසක් පරිබ්‍රාජකවරුන් සමග බුදුන් දක්නාපිණිස වේළුවනාරාමයට පැමිණ බුදුන් වැඳ එකත්පස්ව හිඳ ස්වාමීනි නුඹවහන්සේ සමීපයෙන් පැවිදිබව ලබමහයි කීහ—එකණෙහි තථාගතයන්වහන්සේ උන්හැම එහි භික්ෂුභාවයෙන් මහණකර වදාළසේක, ඉක්බිතෙතත් ධම්දෙශනාවගේ කෙළවර අගසව් දෙදෙනා හැර අවශෙෂවූ දෙසියපණස්දෙනාම රහත්වූ සේක.

මුගලන් මහ තෙරුන්වහන්සේද මහණවූ සද්දවසකින් තථාගතයන් වහන්සේ විසින් දෙනලද, ධාතුකම්සථානය අසා සියලු කෙලෙස්නසා රහත්ව ශ්‍රාවක පාරමී ඥානය මස්තක ප්‍රාප්තකළසේක—සැරියුත් මහතෙරුන් වහන්සේද මහණවූ පසළොස් දවසින් වෙදනාපරිග්‍රහනම් සූත්‍ර දෙශ

නාවඅසා, සියලු කෙලෙස් නසා රහත්ව අග්‍රශ්‍රාවක ඥාණය මස්තකප්‍රාප්ත කළසේක—

ඉක්බිත්තෙන් එදා සවස වෙළුවනාරාමයෙහිදී ශ්‍රාවකසමූහයා, රැස්කොට සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේට අග්‍රශ්‍රාවකස්ථානාන්තරදී, එදා දුරුතුමස මැදිපොහොයෙහි පුෂ්‍ය නම් යොගයෙන් එක්දහස් දෙසිය පණසක් මහ රහතන් වහන්සේ සමග අනන්ත රශ්මිජාලයෙන් පලඳනා ලද මුතුහරක් බඳුවූ අපමණ බුදුවරයින් වහන්සේලාගේ මුඛාලඞ්කාර කරණලද.

සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපණං එතං බුද්ධාන සාසනං, යි

යන මෙයින් පාමොක් දෙසා වදාළසේක.

මෙසේ ත්‍රිභුවන වන්දනීයවූ අප තථාගතයන් වහන්සේ බුද්ධත්වය ලැබීමෙන් නවවෙනි මාසය වන මෙම දුරුතුමස පසළොස්වක් දිනය දක්වා ලොව ඇතිවූ මහරහතන් වහන්සේලාගේ සංඛ්‍යා ප්‍රමාණය, අඤ්ඤකොණ්ඩඤ්ඤාදි පස්වග රහත් මහ තෙරුන්වහන්සේලා පස්දෙනා වහන්සේද, යසනම් මහා තෙරුන්වහන්සේ සමග පස්පණස් නමක් රහත් මහතෙරුන් වහන්සේලාද, භද්‍රවර්ගිය රහත් මහ තෙරුන්වහන්සේලා තිස්දෙනා වහන්සේද, උරුවෙලකාශ්‍යප, නදී කාශ්‍යප, ගයාකාශ්‍යප, යන තෙභාතික ජටිලයන් සහිත දහක් ජටිල සමූහයාද මහණව රහත්වීමෙන් එක් දහස් තුන්නමක් මහරහතන් වහන්සේලාද, කොලිත, උපතිස්ස, දෙදෙනා සහිත පරිබ්‍රාජකවරු දෙසිය පණසක් මහණව රහත්වීමෙන් ශාරිපුත්‍රාදි දෙසිය පනස් දෙනමක් මහ රහතන් වහන්සේලාද මේ හැම දෙනාවහන්සේම එහි භික්ෂුභාවයෙන් මහණවූහ, එහි භික්ෂූප සම්පන්නායෝය—දහ අටකෙළක් මහා බ්‍රහ්මයෝද රහත්වූසේක—බොහෝ දෙවිමිනිස් සමූහයාද සෝවාන් සෙදගැමි ආදි මාර්ගඵල ලැබීමෙන් නිර්වාණපුර දුටුසේක, අප්‍රමාණ සමූහයා බුද්ධාදි තුනුරුවන් සරණගත වූයේය—

ශ්‍රාවක සන්නිපාතයේ-2-කාණ්ඩය.

අප තථාගතයන් වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවසන කල සුද්ධොදන මහරජතෙම මාගේපුතනුවෝ සිද්ධාර්ථකුමාරයෝ ලොව්තුරා බුදුව දූත් රජගහනුවර වැඩවාසය කෙරෙති මේදක්වාත් මදනාහුවෝ නුදුටුයෙ

මියි කියා එක් අමාත්‍යයකු කැඳවා දහසක් ඇමතියන් ඕ
හට පාවාදී හැමදෙනාම සුදු පිළිහැඳ මඟුල්වෙස්ගෙණ මපු
තනුවන් කැර ගොස් නුඹවහන්සේගේ පියානන් වහන්සේ
නුඹවහන්සේ කැඳවාගෙණ ඒමපිණිස අප එව්බවකියවයි
කියා එකී අමාත්‍යයෝ දහසම බුදුන්කරා යැවීය —

ඒ දහසම සැටයොදුන් මගගෙවා රජගහ නුවරට ගොස්
වෙළුවනා රාමයෙහි මහපිරිස් පිරිවරා ගුවන් සඳක් සේ
වැඩහිඳ බණ්දෙශනාකර වදාරණ බුදුරජානන් වහන්සේ
දැක ඒ ඇමති දහසම පිරිස් කෙළවරසිට බණඅසා දහසක්
දෙනාම රහත්ව එහි භික්ෂුභාවයෙන් මහණවූහ — සුඬොද
න මහරජහට කිසිම හසුන්මාත්‍රයක් කියා යවනා කෙනෙ
කුත් නැතිව මෙඝය කැමතිව පතන මයූර රාජයෙක්සේ
සර්වඥනැමැති මහා මෙඝය කවර කලෙක දකිම්දෝහොයි
පතමින් පෙරමඟබලා සිඬාව. නැවත අනික් අමාත්‍යයකු
කැඳවා දහසක් අමාත්‍යයන් සමඟ මඟුල්වෙස් ගන්වා පෙර
සේම යැවීය, ඒ අමාත්‍යයාද සහ පිරිවරින්ම රහත්ව එහි
භික්ෂුභාවයෙන් මහණවීය — මෙසේ නව වාරයකම අමා
ත්‍යයන් නවදෙනෙක් දහස දහස පිරිවරකොට. යවා උන්
වහන්සේකරා ගිය ගිය අමාත්‍යයෝ සහ පිරිවරින්ම රහත්ව
එහි භික්ෂුභාවයෙන් මහණව සුඬොදන මහ රජහුගේ හසු
න්තබා සසුන්වැද නිවණ් සුවවිඳිති — එසේහෙයින් රජවිසි
න්කියා යවූ පවත් තථාගතයන් වහන්සේට දන්වනා එකකෙ
නෙකුත් නැත්තේමය, එබැවින් එක්දිනක් සුඬොදන මහ
රජතෙම බුදුරජානන් වහන්සේ හා සමඟ එකදා උපන් කා
ළුදායි නම් අගඇමතියා කැඳවා, පුත කාළුදායිනි, එකදා උ
පන් එකකෙළි මඩුලෙහි වැඩී නොපහා ඉතා යහළුවූ මපු
තනුවන් කැඳවා එනලෙස නවදහසක් සමඟනව මහා අ
මාත්‍යයනු නවවාරයෙක යැවූයෙමි, මේ නවදහසක් දූතයන්
අතරෙන් මපුතනුවන් ගෙණෙනා තබා හසුන් පමණවත්
කියා අ එක කෙනෙකුත්නැත තොපිද දහසක් දෙනාසම
ග මඟුල්වෙස් ගෙණගොස් මපුතනුවන් මා ඇසදක්වා ලිය
හැකිදැයි විචාළේය —

කාළුදායි කියන්නේ මම ගියේනම් නුඹ පුතනුවන් ඇස
දක්වාලම් උන්වහන්සේ දුටුවිටම මහණවනනට අවසර ලදී
නනම් දැන්ම යෙමියි කීවිය, රජ්පුරුවෝ කියනනාහු පුත තො
පි මහණවේවයි මහණනොවේවයි මපුතනුවන් ඇස දක්වා
පුනම මට නොකළ උපකාරයෙක්නම් නැතැයි කීහ —

ඉක්බිත්තෙන් කාලුදායිනම් අමාත්‍යයාද දහසක් ඇමතියන් ගෙණ සුදුපිළි සුදුමල් පැළඳ සූඩවූ බුදුන්කර මඟුල්වෙස් ගෙණ ගොස් පිරිස්කෙළවර සිට බණඅසා සහ පිරිවරින් රහත්ව ඒහි භික්ෂුභාවයෙන් මහණවිය— මොහුමහණවූ හත් අට දවසක් ගියකල මැදින්දින පසළොස්වක පොහොය ඉක්ම් වසන්තකාලය සම්ප්‍රාප්තවිය, එකල කාලුදායිනම් මහතෙරුන්වහන්සේ නැයන්කරා කිඹුල්වත් පුරයට තථාගතයන් වහන්සේට වැඩමවීමට කල් වත්නේයයි දැන උන්වහන්සේ අභිමුඛයෙහි ඇඳිලිබැඳ වැද ආදරයෙන් සිට ගාථා සැටක් කියා ස්වාමීන්වහන්ස වසන්තකාලය සම්ප්‍රාප්ත වීයයි ගමන් මාගීය නොයෙක් ලෙසින් වර්ණනාකොට පියවූ සුද්ධොදන මහරජතෙම නුඹවහන්සේගේ මේ බුද්ධ මහිමය අසා නුඹවහන්සේ දැක තුමූද නිර්වාණසිද්ධි විඳිනා ලොභයෙන් මා ඇතුළුවූ දසදහසක් අමාත්‍යයන් දසවාරයක දූතමෙහෙය පිණිස එවා තවදක්වාත් දැකගනොහී මඟබලා හිරු උදය ප්‍රාර්ථනාකරණ පියුම්විලක්සේ නුඹවහන්සේගේ දැක්ම ප්‍රාර්ථනාකොට හිඳියි, තවද නුඹවහන්සේගේ බන්ධු සමූහයෝ සඳරැස් පතන කෙකරව සමූහයක්සේ නුඹවහන්සේගේ මුඛචන්ද්‍රයාගෙන් දිවන දෙසනා නැමැති රශ්මිය ප්‍රාර්ථනා කොට හිඳිනාහුය, එසේහෙයින් නුඹවහන්සේගේ පියානන් ආදි බන්ධු සමූහයා කෙරෙහි අනුග්‍රහ කොට කිඹුල්වත් පුරයට වැඩමවා වදාළ මනාකල් වේදැයි කීහ—

ඒවේලෙහි අප තථාගතයන් වහන්සේ පෙර බුදුවරයින් බන්ධු සංග්‍රහ කළාවූකාලය මේයයි දැන මාගේ බුද්ධවංශ චාරිත්‍රය කෙරෙම්යි සිතා, මැනව උදායිතෙර, බන්ධුසංග්‍රහයට යෙමි භික්ෂුසංඝයා රැස්කරවයි වදාළ සේක— තෙරුන්වහන්සේද භික්ෂුසංඝයාහට එබව සැළකළ කල්හි අඞ්ග මගධ දෙරටින් මහණවූ දසදහසක් රහතන්වහන්සේද කිඹුල්වතසිට අවුත් මහණවූ දසදහසක් රහතන්වහන්සේ යයි විසිදහසක් මහරහතන් වහන්සේලා බුදුන් දෙසට වැඩමවා, මණිකවචයෙන් සන්නද්ධවූ ගදැත්පොව්වන්සේද සුපිපි රත්පියුම් වනයක්සේද ලීලොපෙතව බබලමින් බුදුරජානන්වහන්සේ පිරිවරා සිටගත්සේක— එකණෙහි අපස්වාමීදරුවන් වහන්සේ මැදින්දින මැදිපොහොදා විසිදහසක් රහතන් පිරිවරා සැටයොදුන් මාගීය සැටදවසකින් යෙම්සිතා දවසදවස යොදුනක් යොදුනක් පාසා වැඩමවන සේක— ඒ ඒ ගම්වලදී මහත්වූ ධර්මදෙශනාවන් පවත්වමින් බොහෝ සතුන්

නිවණ්දක්ව දක්වා වඩනාසේක් කාලුදායිනම් මහතෙරුන්
වහන්සේ බුදුරජාණන්වහන්සේ නික්මුණුපරිදි පිය මහරජ
හට කියා සතුටුකරවමින් උන්වහන්සේ නික්මුණු දෙව
නදා උදෑසන එම තෙරනු අහසින්වැඩ සුද්ධොදන මහරජහු
ගේ ප්‍රාසාදයට බැස සිටිකල්හි රජතු මහතෙරුන් දැක හැඳි
න බුදුරජානන්වහන්සේ දුටුවාසේ සතුටුව සිංහාසනයෙහි
වඩාහිඳුවා නොයෙක් රසයෙන් යුත් රාජභොජනය පාත්‍රය
පුරා පිළිගන්වා ස්වාමිනි මා දක්නාදී වලඳා වදාළ මැනවැයි
කීහ, එබසට තෙරුන්වහන්සේ බුදුරජානන්වහන්සේ කරා
ගොස් එතනදී වලඳමියි කීහ, එකල්හි, බුදුරජානන්වහන්
සේ දැන් කොයිද ස්වාමිනියි කාලුදායි තෙරඅතින් විචාළා
හුය, මහරජ විසිදහසක් රහතන් පිරිවරා තුඹ දක්නානිසා
මාගේ ආරාධනාවෙන් දැන් වඩිමින් සිටිසේක් වේදැයි කීකල්
හි එබස්ඇසූ රජහුගේ සියොලඟ නවානූදහසක් රෝමයෝ
නැඟී සිටගත, නුවන් සතුටු කඳුලෙන් පිරී සිටගත, මෙසේ
සතුටුසිත් ඇති පියමහරජ විසින් කියන්නේ එසේනම් ස්වා
මීනි මේ බත් මේ ගෙයිදීම වැලඳුවමැනව, යම් දවසක මා
ගේ පුත්‍රනුවන්වහන්සේ මෙතුවරට වඩනාසේක්ද ඒදක්වා
මාගේ ගෙඩිත්ම දත් ගෙණගිය මැනවැයි කියා කුමාරකාල
යෙහි අනුභවකොට පුරුදුවූ තුන්හවුරුදු සුවඳකවානුබූ සුව
ද හැල්සාලේ බත්හා නොයෙක් සූප ව්‍යඤ්ජනයෙන් පාත්‍රය
පුරා මපුත්‍රනුවන් වහන්සේ මාකෙරෙහි ප්‍රෙම ඇතිනම් අ
න්කිදනක් නොවලඳා මාගෙන්ම යවන බත් වලඳා වදාරන්
ට වදාළමැනවැයි කියා පාත්‍රය තෙරුන්වහන්සේ අතනුබූහ
තෙරුන්වහන්සේද මෙතන පටන් ආකාසයෙන් යනනියා
වත් පාත්‍රය බුදුරජානන් වහන්සේට පිළිගන්වන නියාවත්
උන්වහන්සේ ඒ බත වලඳන නියාවත් රජහට පෙණෙ
වයි අධිෂ්ඨානකොට හුනස්නෙන් නැගිට සියලු ජනයන් බ
ලමින් සිටියදී පාත්‍රය අහසට හැරපියා තමන්ද රාජහංස
ලීලාවෙන් ලීලොපෙතව අහසින් වැඩමවා පාත්‍රය ගෙණ
ගොස් බුදුරජානන් වහන්සේගේ ශ්‍රීහස්තයෙහි තබාඈසේ
ක—බුදුරජානන්වහන්සේද ඒ බත වලඳා වදාළසේක, මෙ
ම ක්‍රමයෙන් කාලුදායි, තෙරුන් වහන්සේ දවස දවස රජ
ගෙන් බත්පාත්‍රයක් බැගින් ගෙණ එන්නේය, අනික්බතක්
නොවලඳා බුදුරජානන්වහන්සේත් ඒ බතම වලඳා වදාර
ණසේක්මය, තෙරුන්වහන්සේත් හැමදිනම වලඳා අනා
යෙහි රජගෙට ගොස් අද බුදුරජානන්වහන්සේ මෙතෙක්

නැත් වැඩිසේකැයි රජහට හා සියලු රජකුලුඅටද බුද්ධගුණයෙන් යුක්තවූ ගාථා කියකියා රජකුලය පහදවනසේක.

මෙසේ සැටදවසක් ඉකුත්වීමෙන් වෙසග මැදි පොහෝදා බුදුරජානන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩමවා වදාළසේක—එකල්හි එක්ලක්ෂ සැටදහසක් කුල ගෙවල ශාක්‍ය රජදරුවෝ අපගේ නෑ උතුමන්වහන්සේට වැඩවසන්ට සුදුසුතැන් සොයන්නෝ නිග්‍රොධනම් ශාක්‍යරජහුගේ උයන, ඉතාරම්‍යය, සුදුසුයයි, සනිටුහන්කොට, එහි රාත්‍රිස්ථාන, දිවාස්ථාන, චංක්‍රමණාදි විහාර කර්මාන්ත නිමවා එක්ලක්ෂ සැටදහසක් රජදරුවෝ මහ පෙළහරින් බුදුරජානන්වහන්සේ වැඩමවන පෙරමගට ගොස් මහත්වූ පූජාවෙන් සුවඳින් මලින් පුදපුදා නිග්‍රොධාරාමයට වැඩමවා ගෙණ ගියාහුය.

මෙසේ අප භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයට පැමිණි දෙලොස්වෙනි මාසය වන වෙසග මැදි පොහෝදින විසි දහසක් මහ රහතන් වහන්සේ විසින් පිරිවරණලදුව කිඹුල්වත් පුර නිග්‍රොධාරාමයෙහි පණවනලද බුද්ධාසන මතුයෙහි බාලාර්ක මණ්ඩලයසේ සවණක් රැසින්දිලිහි දිලිනී වැඩහුන්සේක—එකල්හි එහි රැස්වූ ශාක්‍යසමූහයා ශාක්‍ය මාන්‍යයෙන් උසස්බැවින් තමන්වහන්සේ නොවැඳ උන්වේලෙහි උන්ගේ අදහස් දැන මාගේ නෑයෝ හැමදෙනම මොහුයෙන් මූලාබැවින් දැන් මා නොවඳනාහුය, පෙර සර්වඥවරයෝ නෑයන්ගෙන් කෙසේ වැඳුම් ලැබුවෝදැයි බලා වදාරා ලොවට අද්භූතවූ යමක ප්‍රාතිහාර්යයක් දක්වා මුලුලොව විස්මයපත්කොට නමස්කාර පූජාලද්දාහුමයයි දැන අද මමද එමෙන්ම වැඳුම්ගන්නෙමි සිතා පීතකසිනයට සමවැද ආකාසයට පැනනැගී ඤාතීන්ගේ හිස් මතුයෙහි ශ්‍රීපාද රේණු ඉසිනාක්මෙන් ගණ්ඩම්බ වෘක්ෂමූලයෙහි කර වදාළ යමක ප්‍රාතිහාර්ය සමානවූ අපමණ ප්‍රාතිහාර්යයන් දක්වා අහසරුවන්සක්මණින් බැස එහි පණවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ වදාළසේක—එහි විස්තර යමක ප්‍රාතිහාර්ය කථාවෙන් අසා බලා දතයුතු—පියමහ රජතෙම ඒ ආශ්චර්ය අද්භූතවූ ප්‍රාතිහාර්ය සමූහයදැක මෙසේ කීහ, පින්වත් භාග්‍යවතුන්වහන්ස නුඹවහන්සේ උපන්දිනයෙහි කාලදෙවල තපස්හුගේ සිරසමතුයෙහි නුඹවහන්සේගේ පාපිටුම් පිහිටි බව දැක මාගේ මේ ප්‍රථම වන්දනාවයයි කියා මම නුඹවහන්සේට වැන්දෙම් උපන් පස්වෙනි මස වප්මගුල්දා දඹ රුක්මුල ශ්‍රීයහනෙන් වැඩහුන් නුඹවහන්සේට දඹරුක්සෙවන නැමී

කළ පූජාව දැක මාගේ මේ දෙවෙනි වන්දනාවයයි කියා නුඹවහන්සේගේ පාපිසුම් වැන්දෙමි, දැන් මේ පෙරනුදුටු විරූ අපමණ ප්‍රාතිහාර්‍ය්‍යකද නුඹවහන්සේගේ පාපිසුම් වඳිමි, මේ මාගේ තුන්වෙනි වැඳීමයයි කියා පියමහ රජතෙම මුලින්සිඳ හෙළූ කනක රූපයක්සේ උන්වහන්සේගේ පාපිට වැදවැටුණේය — රජහු වැඳකල්හි භාග්‍යවතුන් වහන්සේට නොවැද සිටින්ට සමර්ථවූ එකම ශාක්‍යයෙක්වත් නූවූයේය, එසේහෙයින් ඒ එක්ලක්ෂ සැටදහසක් රජදරුවෝම සිටිපියේ සිටගතතොග් යුගාන්ත වාතයෙන් හුනූ මහ සල් වනයක්සේ වැඳ පෙරළුනෝය —

මෙසේ ශාක්‍යයින් හැම ප්‍රීතිවෙගයෙන් මත්ව කිසිවෙක් දන්පිණිස ආරාධනානොකොට වැඳ අවසරගෙණ ගියකල්හි විසිදහසක් රහතන් සමග පිඬුපිණිස නුවරට වැඩමෙව් උන්වහන්සේ ඇතුළු වීථියෙහි වැඩසිට.

> උත්තිට්ඨෙනප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ
> ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හිච.

යනමේ ගාථාව වදාළසේක, ගාථාවගේ අවසානයෙහි පියමහරජතෙම සොවාන් ඵලයෙහි පිහිටියේය.

> ධම්මංචරෙ සුචරිතං නතං දුච්චරිතං චරෙ
> ධම්මචාරි සුඛං සෙති අස්මිංලොකෙ පරම්හි චාති.

යනමේ ගාථාවඅසා පියමහ රජතෙම සකෘදාගාමි ඵලයෙහි පිහිටියේය —

ධම්පාල ජාතකය අසා අනාගාමි ඵලයෙහි පිහිටියේය, මරණාසන්න කාලයෙහි ධවලච්ඡත්‍රය යට ශ්‍රීයහනෙහිවැද හෙවම සියලූ කෙලෙස් නසා රහත්ව නිවණ්දුටු සේක — මේ ඥාතිසංග්‍රහයකර වදාළ දිනයෙහි, සොවාන් ආදී මාර්ග පිළිවෙළින් බොහොදෙන නිවණ්දුටු සේක — මෙම භාග්‍යවතුන්වහන්සේ පන්සාළිස් අවුරුද්දක් වස්වැස වදාළ ස්ථාන කෙසේදයත්? —

"පඨමක අනෙතාවස්සංහි බාරාණසිං උපනිස්සාය ඉසිපතනෙවසි-පෙ-එවං වීසතිවස්සානි අනිබද්ධවාසො හුත්වා යත්‍ය ඵාසුකං හොති තත්‍ථ තත්‍ථෙව වසි"

1 වෙනි වස බරණැසනිසා ඉසිපතනා රාමයෙහිද.
2 ... ... රජගහ නුවරනිසා වෙළුවනා රාමයෙහිද.
3 ... ... රජගහ නුවරනිසාම වෙළුවනා රාමයෙහිද.
4 ... ... රජගහ නුවරනිසාම වෙළුවනා රාමයෙහිද.

5 ... ... විසාලා මහනුවරනිසා මහවනයෙහිවූ කූටාගාර
... ... සාලාවෙහිද.
6 ... ... මකුලනම් පර්වතයෙහිද.
7 ... ... විජම්බර්මීය දෙසීම පිණිස තවුතිසා භවනයෙහිද.
8 ... ... භග්ගනම් නුවර සුංසුමාර ගිරියනිසා භෙසක
... ... ලා වනයෙහිද.
9 ... ... කොසඹෑනුවර නිසා ඝොසිකා රාමයෙහිද.
10 ... ... පාරලෙය්‍යකනම් වන රොදෙහිද.
11 ... ... නාලානම් බ්‍රාහ්මණ ග්‍රාමයෙහිද.
12 ... ... වෙරඡානම් නුවරෙහිද.
13 ... ... චාලියනම් පර්වතයෙහිද.
14 ... ... සැවැත්නුවරනිසා ජෙතවන මහවිහාරයෙහිද.
15 ... ... කිඹුල්වත්පුර නුවරනිසා නිග්‍රොධාරාමයෙහිද.
16 ... ... ආලවකයා හිස්මවා අලව්නුවරෙහිද.
17 ... ... රජගහනුවරනිසාම වෙළුවනාරාමයෙහිද.
18 ... ... චාලියනම් පර්වතයෙහිද.
19 ... ... චාලියනම් පර්වතයෙහිද.
20 ... ... රජගහ නුවරනිසාම වෙළුවනා රාමයෙහිද.

මෙසේ විසි අවුරුද්දක් අනිබද්ධවාසව යම් යම් තැනක ත
මන්වහන්සේට සැපවිහරණය වේද ඒ ඒ තැන්හී වස්වැස
වදාළසේක — ඉක්බිති අනේ පිඩුමහ සිටානුවිසින් සිව්පණස්
කෙළක් ධනවියදමෙන් කරවනලද සැවැත් නුවර ජෙතව
න මහ විහාරයෙහි එකුන් විසිඅවුරුද්දක්ද, විසාඛා මහ උ
පාසිකාවවිසින් සත්විසිකෙළක් ධන වියදමෙන් කරවනලද,
සැවත්නුවර පූර්වාරාමයෙහි සාවුරුද්දක්ද, මෙසේ දෙකුල වා
සීන්ගේ ගුණ මහාත්තත්වය නිසා සැවැත්නුවර ගොචර ග්‍රාම
කොට, ජෙතවන, පූර්වාරාම, විහාරදෙකේ පස්විසි අවුරුද්දක්
නිබද්ධ වාසවසයෙන් වස්වැස වදාළසේක — අනිබද්ධ නිබද්ධ
වසයෙන් මෙසේ පන්සාළිස් අවුරුද්ද ඉකුත්කොට වදාළ
බව දතයුතු, මෙසේ දක්වනලද මේ පන්සාළිස් අවුරුද්ද අ
තුරෙන් සර්වලොක ශිවංකර අපනාගතයන් වහන්සේ ස
ර්වඥපද ප්‍රාප්තවූ ප්‍රථම සංවත්සරයතුල කරවදාළාවූ අනන්ත
න්‍යා සම්මතවූ මේ බුද්ධකාරක ධර්මයන් මෙහි ගෙණහැර
දැක්වූ පරිදි මහා සාගරයෙන් ජලබිඳක්ගෙණ පෑවාක් මෙන්
න, එසේහෙයින් අප භාග්‍යවත් සර්වඥයන් වහන්සේ මේ
මේ ගුණයෙන් දෙව්බඹුන් ඇඳි තුන්ලෝවාසීන්ට අසහාය
පිහිටවූ ශෑලවූත්කාර උත්තමයානන් වහන්සේමයයි සියල්

ලත් විසින්ම සලකා යථොක්ත නව අරහාදි බුද්ධගුණයන් දවස තුන්වට සිහිකිරීමෙන් අන්දෙවියන් සරණකොට නොගෙණ මෙම සම්වාය රත්නවූ තුනුරුවන් සරණ පරායනව සගමොක් සිරිසැප අත්පත් කරන්ට උත්සහ කටයුතු.

ශ්‍රේයාසී දීපනීනම් පවුරුණෙහි මේ පළමුවන

## භා ග ය යි.

දෙලො වැඩපිණිස ගිහිජනයන් විසින් පිළිපැද්දයුතුවූ
ප්‍රාප්තකම් සූත්‍රය මෙසේයි.

"චත්තාරෙමෙ ගහපති ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, කතමෙ චත්තාරො, භොගාමෙ උප්පජ්ජන්තු සහධම්මෙනාති අයං පඨමො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං—පෙ—භොගෙ ලද්ධා සහ ධම්මෙන යසං ලද්ධා සහඤාතිහි සහ උපපජ්ඣායෙහි චිරං ජීවිත්වා දීඝමායුං පාලෙත්වා කායස්සභෙදා පරංමරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජාමීති අයං චතුත්ථො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං, ඉමෙඛො ගහපති චත්තාරො ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං"

යනුහෙයින් අපතිලොගුරු සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි එක්දවසක් අනේපිඩුමහ සිටානො බුදුන්කරා එළඹ නමස්කාරකොට එකත්පසව හුන්නේය, එකත්පස්වහුන් ඒ මහ සිටානන්ට සර්වඥයන් වහන්සේ වදාරණසේක් එඹා පින්වත් ගෘහපතිය, අනිෂ්ටනොවනහෙයින් ඉෂ්ටවූ, සිත්හි ප්‍රියවසයෙන් පැවතිය යුතුහෙයින් කාන්තවූ, සිත් පිනවීම්වසයෙන් වැඩෙනහෙයින් මනාපවූ කාරණ සතරක්හු ලැබීම සම්බයින්ව ඉතාදුලීභ වන්නාහුය, ඔහු කවුරුදයත්, .මට අනුභවයට යුතුවූ උපභොග පරිභොග වස්තූනු සෙනෙවිරත් සිවුතනතුරු ආදි කාරණ සහිතව උපදිත්වායි යන ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ලොකයෙහි දූලීභව ලැබියයුතුවූ මේ පළමුවෙනි කාරණය සත්වයෝ සිතන්නාහුය—මෙසේසිතූ යමෙක්විසින් එසේ දූලීභවූ රජ ඇමති තනතුරුසහිත භොගවස්තූත්ලැබ දෙවනු මව්පිය දෙපක්ෂයෙහි නෑයන්සමගද සුවදුක් දෙක්හි සමසිත් ඇතිහෙයින් උපාධ්‍ය සංඛ්‍යාත සංදෘෂ්ට, සම්භක්ත, මිත්‍රයන්

සමගද මාගේකීර්ති ප්‍රශංසාදිය ඉතාඋසව ඒ ඒ තැන පැතිරේවයි යන ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ලොකයෙහි දුලිභව ලැබියයුතුවූ මෙදෙවෙනි කාරණයද සිතන්නේය— මෙසේ සිතන යමෙක් දුලිභවූ රජ ඇමති තනතුරුසහිත භොග සැපද දෙකුලවාසි නෑයන්හා මිත්‍රයන් සමග කීර්ති ප්‍රශංසාදියද ලැබ, නැවත බොහෝ කලක් ජීවත්වෙම් දීඝ කාලයක් ආයුපාලනය කෙරෙම් යනමේ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ලොකයෙහි දුලිභව ලැබියයුතුවූ තුන්වෙනි කාරණය සිතන්නේය— මෙසේ සිතන යමෙක්එසේ දුලිභවූ රජ ඇමති තනතුරු සමග භොගසැපද මව්පිය ඤාති මිත්‍රාදීන් සමග කීර්ති ප්‍රශංසාදියද, බොහො කාලයක් මුලුලෙලෙහි දිවිරැක ආයුපාලනයද ලැබ කරජකාය භෙදයෙන් මරණින් මතු සුචරිතයෙන් යායුතු හෙයින් සුගතිනම්වූ පස්කම්සැපතින් අග්‍රහෙයින් ස්වර්ගනම්වූ දෙව්ලොව උපදිම්යි යනමෙ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ලොකයෙහි දුලිභව ලැබියයුතුවූ සතරවෙනි කාරණය සිතන්නේය— ගෘහපතිය මේ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ සතර කාරණයෝ වනාහි ලොකයෙහි ඉතාදුලිභ වනනාහුයයි වදාළසේක—

ප්‍රාපතකම් සූත්‍රයේ-2-කාණ්ඩය.

මෙසේ අතිසයින්ම දුලිභවූ මේ සතර කාරණය වදාරා මෙම කාරණයන් සුලභව ලැබීම පිණිස හෙතුවූ අනිකුදු සතරකාරණයක් වදාරනාහාවූ සර්වඥයන් වහන්සේ— "ඉමෙ සංඛො ගහපති" යනාදි පාළිය වදාළසේක— එඹා ගෘහපතිය, ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ මේ සතර කාරණයන්ගේ ලැබීමපිණිස අනිකුදු කාරණා සතරක් පැවැත්විය යුතුය, ඔහු කවුරුදයත් සද්ධාසම්පදාවය, සීලසම්පදාවය, චාගසම්පදාවය, පඤ්ඤාසම්පදාවය, යනමේ සම්පත් සතරය, එයින් සද්ධාසම්පදානොමෝ කවරේද? මේ ලොකයෙහි යම් ආය්‍යීශ්‍රාවකයෙක් තෙම බුද්ධාදි රතනත්‍රයෙහි ගුණඇදහීම ලක්ෂණවූ ශ්‍රද්ධාවෙන් යුක්තවන්නේද, නොහොත්, මෙහි මූලාරම්භයෙහි "ඉතිපි සොභගවා" යනාදීන් දැක්වූ තථාගතයන් වහන්සේගේ ධම්කාය රූපකාය සංඛ්‍යාත ගුණසමූහය ඇත්තවසයෙන් අදහන්නේද, එසේම, ධම්, සංඝ, රත්නයන් අදහන්නේද, ගෘහපතිය මේ සද්ධාසම්පදාවයයි කියනුලැබේ.

මෙහිදැක්වූ මේ සද්ධාසම්පදාවනම්—

සද්ධාබලං විරියබලං හිරිඔත්තප්පියං බලං
සතිබලං ච සමාධිච පඤ්ඤමෙ සත්තමංබලං, යි

වදාරණලද සප්තවිධ බලයන්කෙරෙන් පළමුවෙනි බල යදවේ—

සද්ධාධනං සිලධනං හිරිඔත්තප්පියංධනං
සුතධනං ච චාගොච පඤ්ඤ මෙසත්තමං ධනං, යි

වදාරණලද සප්තවිධ ධනයන් කෙරෙන් පළමුවෙනි ධන යදවේ—“යාවකීවංච භික්ඛවෙ භික්ඛූසද්ධා භවිස්සන්ති වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකංඛා නොපරිහානි”—යනාදීන් වදාරණලද සප්තඅපරිහානීය ධර්මයන්කෙරෙන් පළමුවෙනි නොපිරිහීම් ධර්මයදවේ—මේ ආදිවසයෙන් ශ්‍රද්ධා සම්පදාතොමෝ බොහෝධර්මයන්කෙරෙන් ප්‍රධාන ධර්මයෙක-මෙහි ආනිසංස කවරේදයත්?—යම් සේ හිමවත් පර්වතය නිසා මහාවෘක්ෂයෝ ශාඛා පතුරු, පත්‍ර, ත්වච, ඵලපු, හර, යනමේ පඤ්චප්‍රකාරයෙන් වැඩෙනාහු වෙද්ද, එමෙන්ම ශ්‍රද්ධාවනාත කුලපතියා නිසා ඇතුළු ජනයා ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා—යනමේ පඤ්චධර්මයෙන් වැඩෙන්නාහු වෙත්—තවද මේ ලොකයෙහි යමෙක් කුඩා මහත් පුත්‍රදාර ධනධාන්‍යාදි ලාභයන්හෝ ලබන්නේවේද, මිථ්‍යාදෘෂ්ටිවූ මිථ්‍යාපිළිවෙත් පූරණ මහණ බමුණන්කෙරහිපැහැදී ඔවුන්ඇදහීමෙන් ශ්‍රද්ධාව ලබන්නේහෝවේද, එකී ශ්‍රද්ධාලාභය හීනය, ග්‍රාම්‍යය, පෘථග්ජනයන් සන්තකය, උතුම්නොවන්නේය, මරණින්මතු අවඩට හෙතුවන්නේය, රාගයෙන්වෙන්වූ නිවණ්පිණිස හෙතුනොවන්නේය, යමෙක් වනාහි තථාගතයන් වහන්සේ කෙරෙහිහෝ ශ්‍රාවකසංඝයා කෙරෙහිහෝ පැහැදී ගුණඇදහීම් වසයෙන් ශ්‍රද්ධාලාභය ලබන්නේද ඒ ලාභය වනාහි දුක් දොම්නස් සොකපරිදෙවයන්ගේ ඉක්මීම පිණිසද නිවණ් සාක්කිරීම පිණිසද පවත්නා හෙයින් සියලුම ලාභයන්කෙරෙන් උත්තම ලාභයනම් වන්නේය—එබැවින් මෙහි ඉහතින් දක්වූ දූකසේ ලැබියයුතු සතර කාරණයම සුලභව ලැබීමෙන් මරණින් මතු සගමොක් සැපකැමති සත්පුරුෂ පණ්ඩිතයන්විසින් මෙම ශ්‍රද්ධා සම්පදාවෙහි පිහිටා සීල භාවනාදි කුසල් කටයුත්තෝම්ය—මේ පළමුවෙනි සද්ධාසම්පදාවයි—

එම්බා ගෘහපතිය සීලසම්පදා තොමෝ කවරේද? මේලොකයෙහි යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක්තෙම ප්‍රාණඝාතයෙහි ආදීනවදැකීම්වසයෙන් සතුන්මැරීමෙන් විශෙෂයෙන් වැළැක්කේ වේද—මෙකී ප්‍රාණඝාතයෙහි ආදීනවයෝනම්—

ප්‍රාණඝාතකළ සත්වතෙම මෙම ජන්මයෙහිම ශස්ත්‍ර හුල් ආදීන් ඇනුම්කෑමෙහද මරණින්මතු නරකයෙහිද ඉපදනොයෙක්

සියදහස් ගණන් අවුරුදු දුක්විඳ එයින්මිදී දෙවනු කුසල් සිඳුරකින් උපභෝග පරිභෝගාදී විශේෂ වස්තු ලාභීව මහත් සැපඇති කුලයෙක්හි රූපින් අනඟයා සම්ව උපන් නේවීනමුත් ඒ සම්පත් නොවලඳාම එකාන්තයෙන් ඔහු නොකමැතිවම නව යෞවනකාලයෙහිම මැරෙණු ලැබේ—

එයින් කීහ—

සබ්බූපභෝග ධනධඤ්ඤ විසෙස ලාභී
රූපෙන භොසම්කරධජ සන්නිභොපි,
යොයොබ්බනෙපි මරණං ලභතෙ අකාමං
කාමං සදාතු පරපාණ හරෙ නරොයි.

තවද යමෙක් ප්‍රාණඝාත කෙළේද ඔහු අහසෙහි ද සමුද්‍ර මධ්‍යයෙහිද විදුරුගුහාවක් මැදද සිටියේනමුත් පාප කර්මයෙන් මිදීමක් ඔහුට නැත්තේමය—ගේ කෙසේදයත්? පෙර කර්මාන්තයෙහි නොපවත්නා එක්ගොනකු බැඳ ගොවා පිදුරුගින්නෙන් දවා මැරූ මිනිසෙක් ඒ අකුසලයෙන් අපායෙහි ඉපද නොයෙක් දහස්ගණන් අවුරුදු අපායෙහි පැසී එයින්මිදී පක්ෂිආදී තිරිසන් ආත්මවල ඉපිද සියක් අත්බැව්ක ආකාසයෙහිදීම පිදුරුගින්නෙන් දද මෙළේය—

තවද එක්තරා සුණඛයකු කර වැලිකළයක් බැඳ දියෙහි ගලා මැරූ එක් ස්ත්‍රියෙක් ඒ අකුසලයෙන් අපායෙහි ඉපිද නොයෙක් සියදහස් ගණන් අවුරුදු එහිපැසී එයින් මිදී සියක් අත්බැව්ක සමුද්‍රයෙහිදීම කර වැලිකළ බැඳ දියෙහි ගලා මරණයට පත්වූයේය—

තවද එක්තුරා ගොයකු තුඹසකට ඇතුල්කොට පිටත යානොදී තුඹස්මුව වසා සත්දවසක් නිරාහාරයෙන් ගොයා උත්පසු තුඹස්මුව වැසූ බව සිහිලදින් දෙවනු ඒ ගොයා නොමරා හැරපී ගොපලූ දරුවන් සත්දෙනෙක් ඔහු නොමැරූ සෙවින් අපායට නොගොස් තුදුස් අත්බැව්කම පව්ත විවරවලට පැමිණි කල ගලින් වැසුනු ලෙන්දොර ඇතිව ඔවුන් සත්දෙන සත් සත් දවස නිරාහාරවූහ—තව්ද මෙම ප්‍රාණඝාතය ආසෙවිත භාවිත බහුලී කෘතකළාවූ සත්වයොම මරණින්මතු නරකයටද පැමිණෙන්නේය, තිරිසන් අපායටද පැමිණෙන්නේය, ප්‍රේත විසයටද පැමිණෙන්නේය, මිනිසත්බව ලත්කල්හිද මන්දායුෂ්කාව කාලක්‍රියාවද වන්නේය.

මෙසේ ප්‍රාණඝාත පාපයෙහි අඩගනම් කවරහයත්?—

සතෙතසතෙතාති සඤ්ඤාච වධකචිත්ත මුපක්කමො
තෙනජීවිත නාසොච සහත්ථා චතුරඞ්ගිකා.

යහුහෙයින් සත්වයකු කෙරෙහි සත්වයෙක යන සංඥාවද, නොහොත් ප්‍රාණිය ඇති සතෙකැයි දැනගැම්මද, ඔහු මරමි යන සිතද, ආයුධාදීන් ඇනීම් වසයෙන් කරණලද උපක්‍රමයද, එම උපක්‍රමයෙන් දිවිනැසීමදැයි යන, තමාඅතින් සිඩවන ප්‍රාණහිංසාතොමෝ සතර අඞ්ගයෙක් ඇත්තීය.

යථාධිප්පාය ආණත්ති තථා තං සම්පටිච්ඡනං
පටික්ඛිපං අච්නාසෙත්වා තථෙව කරණම්පිච.
පයොගෙහෙට්ඨා වුත්තෙහු ඡඞ්ගෙහිචා සහතෙහිපිච
ඡළඞ්ගාණත්තියාහොති පාණහිංසාති දීපයෙ.

යහුහෙයින් අදහස් පරිදෙදන් සත්වඝාතනාය පිණිස නියොග කිරීමය, එපරිද්දෙන්ම එය ගිවිසීමය, නොහොත් මරන්නහු විසින් ඔහුගේ නියොගය පිළිගැම්මය, ඔහු විසින් එලසිම්ම නැසීමය යනමේ තුන් අඞ්ගයහා යටකී සවහස්ත මරණයෙහි තමා අතින් කරණ ප්‍රයොගහැර සෙසු සත්ව සංඥාවය, මරමියන සිතය, ඊට කරණ උපක්‍රමය නොහොත් නියමකළ උපක්‍රමය යන තුන්අඞ්ගයහා එක්ව ආණත්තිකයා හට සිඩවන ප්‍රාණ හිංසාතොමො ෂට්විධාඞ්ගයයි ප්‍රකාශකරණලදී — මෙසේ ප්‍රාණඝාතයෙහි අඞ්ගහා ආදීනව යනු සැදැහැ ඇතියන්විසින් සලකා ප්‍රාණඝාතයහැර කුසල ධම්මයෙහි පිහිටා සගමොක් සිරිසැප අත්පත් කටයුත්තේය.

මේ ලොකයෙහි යම් ආයයී ශ්‍රාවකයෙක් තෙම වසතුසවාමීත්විසින් නුදුන් දූ ගැන්ම සවහාකොට ඇතනාවූ අදත්තාදානයෙහි ආදීනව දැනීම් වසයෙන් වැලැක්[illegible]ක් වේද — අදත්තා දානයෙහි ආදීනව මෙසේ දතයුතු — කෙසේද යත්?

"කසාහි පිතාලෙනති" යනාදීන් මෙම ජන්මයෙහිම කණ්ඩක තාලනාදී නොයෙක් ප්‍රකාර කෲරතර කම්කටුවලට රජුන් විසින් පමුණුවන හෙයින් සොරකමට වැඩි අනික් මරණපාසයෙක් නොම ඇත්තේමය, එයින් කීහ, නීතිශාස්ත්‍රයෙහි,
"නාචෞය්‍යාත් පරංමෘත්‍යුපාශඃ" — තවද සොරකම්කළ සත්වතෙම මරණින්මතු නරකයෙහි ඉපිද නොයෙක් වසීගණන් දුකින්පැසී එයින් මිදී ප්‍රෙතව ඉපිද බලවත් සාපිපාසයෙන් වියලී අනන්තඃ කල්පගණන් එහි දුක්විඳ නැවත මිනිස්පියක් ලදහුනම් ඇස්පිරුණු කඳුලුඇතිව ඹුවපිරුණු කෙලඇතිව කැද බත් නොලැබ මනුෂ්‍ය ප්‍රෙතව කබල්ගත් අත්

ඇතිව වෙවුලමින් ඇවිදිසි, යනාදීන් මෙසේ අදත්තාදාන යෙහි ආදීනව දතයුතු—මෙහිඅඞ්ගනම් කවරහයත්?

පරපරිග්ගහිතභණ්ඩංච පරපරිග්ගහිතසඤ්ඤිතා
ථෙය්‍යාදිසෙවකචිත්තංච ඨානාචාවනමෙවච
පයොගොචෙතිපඤ්චඞ්ග මදින්නංසාහත්ථිකංමතං.

අනුන් පිළිබඳ භාණ්ඩයක් බවය, අනුන් පිළිබඳයයි දැනීම ඇතිබවය, සොරකම්ත්ගනිමි යන එකම සිතක් ඇතිබවය, තුබූතැනින් පහ කිරීමය, තමන්ගේ අතින් ඊටකරණ ප්‍රයොගයයි කියා, සඞ්ඝහනයෙන් සිදුවන අදත්තාදානය පස් අඞ්ගයෙක් ඇත්තේයයි දන්නාලදී.

යථාධිප්පායආණත්ති තථාතංසම්පටිච්ඡනං
පටික්ඛෙපංඅවිනාසෙත්වා තථෙවකරණම්පිච.
ඨානාචාවම්පයොගංච අපනෙත්වානපඤ්චසු
ජළඞ්ගාණත්තියාහොති අදින්නංපරිදීපයෙ.

සොරකම්කිරීම පිණිස තමා අදහස් ලෙස නියොගකිරීමය, එපරිද්දෙන් ඒ නියොගය පිළිගැන්මය, ඒපිළිගැන්ම නොනසා එසේම කිරීමය, යන තුන්අඞ්ගයහා යටකී පස්අඞ්ගයන් අතුරෙන් තුබූ තැනින් පහකිරීමද, තමන් අතින් කරණ ප්‍රයොගද, යනමේ අඞ්ගදෙකහැර අන්සතුබඩුවක් බවද, අන්සතුයයි දැනීමද, සොරකම් කරවමි යන සිතද යනමෙකී තුන්අඞ්ගයහා එක්ව ආණත්තික අදත්තාදානය ෂට්විධ අඞ්ගයෙක් ඇත්තේයයි ප්‍රකාශ කරණලදී.

මෙසේ මෙහි ආදීනවසහිත අඞ්ගලක්ෂණය සැදූහැ ඇත්තන් විසින් දැන සොරකමින් වෙන්ව දානමානාදී පුණ්‍යකම්යෙහි යෙදී සගමොක් සිරිසැප අත්පත් කළයුතු—තවද, යම්කිසි ආර්‍යශ්‍රාවකයෙක් පරස්ත්‍රී සෙවනයයි කියනලද කාමමිථ්‍යාචාරයෙහි, ආදීනව් දැනිම්වසයෙන් වැලැක්සේවේද.

එහි ආදීනව මෙසේ දතයුතු—පරදාරාවන් සෙවනයක ලාභු මෙම ජම්මයෙහිම රජුන් විසින් කරණලද ධනදණ්ඩයෙනු වධ දණ්ඩයෙනු වෙහෙසී මියගොස් නරකයෙහි ඉපද අනේවාසුවහස් මුලුලෙලහි දුකින්පැසී එයින්මිදී මිනිස්පියක් ලදහුනම් නොයෙක් අත්බැව්හි ස්ත්‍රී පණ්ඩක නපුංසකාදී බවට පැමිණේත්.

තවද කප්ලක්ෂයක් පිරුපෙරුම්ඇති අනඳමහ තෙරහුපවා එක්ජම්මයෙක්හි කරණ ලද පරස්ත්‍රී සෙවනයෙන් නරකයෙහි ඉපිද නොයෙක් දුක්විඳ එයින් මිදීගියකල තුදුස්

අත්බැවක සත්‍රිවූහ, සත් අත්බැවක අණ්ඩවෙජදබවටද පැමිණි යාහුය— මෙම කාමමිථ්‍යා චාරයෙහි අඞ්ගනම්—

පරපරිග්ගහිතිත්ච පරපරිග්ගහසඤ්ඤිතා
අභික්කාමණුපිත්තාංච තථෙවාතික්කමොපිච
එවංපරසසදාරෙසු චතුරඞ්ගාඅතික්කමො.

අන්සතු සත්‍රියක්බවද, අන්සතුයයන සංඥවද, ව්‍යතික්‍රමණය කරමි යන සිතද, එසේම කිරීමද මෙසේ පරදාරවන් කෙරෙහි එක්වීම සතරඅඞ්ගයෙක් ඇත්තේය—මෙහි ආදීනව සහ මෙම අඞ්ගයෝද සැදැහැවතුන් විසින් දැන, මව්පියනෑ සහොදරාදීන් විසින් ප්‍රවෙශමෙන් පොෂ්‍යය කරනනාවූ සත්‍රින්සංඛ්‍යාත පරදාරවන් සෙවනයනොකොට සදාර බ්‍රහ්මචය්‍ය්‍යාව ආදී කුසලධම්යෙහි පිහිටා සඟමොක් සිරිසැප අත්පත් කටයුතු—තවද, යම්කිසි ආය්‍යශ්‍රාවකයෙක් තෙම මුසාවාදයයි නම්ලද අසත්තෙපුලෙහි, ආදීනව දැනීම්වසයෙන් විශෙෂයෙන් වැලැක්කේ වේද, මෙහි ආදීනව මෙසේ දතයුතු—

කෙසේද ? එකම සවභාවූ නොහොත් සැබෑකී මෙත් දුරුවූපරලොව විඥයුතු සැප අත්හැරියාවූ මුසාවාදී පුද්ගලයාහට මෙලොවදී නොකොටහැකි පාපයෙක්නම් නැත එහෙයින්වදාළහ,

එකංධම්මං අතීතසස මුසාවාදිස්සා ජනතුනො
විතිණ්ණපරලොකසස නත්‍ථිපාපං අකාරියං.

තවද සසුත්වත් පැවිදි තැනක් පවා මුසාවාදයෙහි ලජ්ජා නැත්නම් හිස්කෙණ්ඩ්කාවමෙන් ඔවුන් සතන්හි ශ්‍රමණගුණ නැතිබවද වදාළහ, මෙසේ මහදොස්වූ මුසාවාද සෙවනය කළ, නැනැත්තෙ "අභූතවාදී නිරයංඋපෙති"යි වදාළබැවින් නරකයෙහි ඉපිද අනෙක වර්‍ෂකොටි සහස්‍රයෙහි පැසී එයින් මිදී මිනිස් පියක්ලත් කල්හි තමන් නොකී නොකළ දෙය කී කළ දෙයයි ලොකයාවිසින් කියනු ලැබේ, දුප්පත්වෙයි, ජඩවෙයි, අඥානවෙයි, ගොළුවෙයි, අප්‍රියදර්‍ශනවෙයි, මනුෂ්‍යයන්ට මෙන් දිව නැතිවෙයි, සර්පයන් සේ දෙදිව්වෙයි, දුර්‍ගන්ධමුඛ ඇතිවෙයි, දරුවෝ නොසිපදිති, උපන්නෝ නමුදු සත්‍රිබූත්වෙති—එහෙයින් මෙකී මුසාවාදයෙන් වෙන්ව සුභාෂිතයක්ම බිණියයුතුය, දුර්භාෂිතයක් නොබිණියයුතුය, ධර්මයක්ම කියයුතුය, අධර්මයක් නොකියයුතුය, ප්‍රියදෙයක්ම කියයුතුය, අප්‍රියදෙයක් නොකියයුතුය, සත්‍යයක්ම කියයුතුය, අසත්‍යයක් නොකියයුතුය, මේ සතර අඞ්ගයෙ

ත් සමංඝිත වචනය සුභාෂිතවෙයි, දුබ්භාෂිත නොවෙයි— මෙසේ වූ සුභාෂිත වචනයත් මිස දුබ්භාෂිත වචනයත් නොබිණුව මනා බැවින් බොහෝකොට නොබිණිය යුතුවේ, බොහෝ බණින්නාහට ආදීනව පසෙක්වෙයි, හෙ කවරේද? මුසාවාද කියන්නේය, ඵරුෂවචනයද කියන්නේය, පෛශුන්‍යද කියන්නේය, සම්පප්‍රලාපද කියන්නේය, මරණින් මතු අපායෙහිද උපදින්නේය, එසේහෙයින් මෙවැනි අපරිමිතවූ දුබ්භාෂිත වචන නොබිණිය යුතුවේ—

මුසාවාදයෙහි අඞ්ගනම් කවරහයත්?

ලද්ධිගුහණ චිත්තංච වාචාතදනු ලොමිකා
වචනත්ථපටි වෙධොච මුසාවාදෙ තිවඞ්ගිකො.

දිට්ඨශ්‍රුතාදී වසයෙන් තමන් දැනගත් දෙය සඟවන සිතද, ඊට ඇතුළත් වචනද, ඒ වචනාර්ථය ප්‍රතිවෙධකිරීමද, මෙසේ මුසාවාදයට අඞ්ගත්‍රයෙක් ඇත්තේය—

මෙසේ දක්වනලද මුසාවාදයෙහි ආදීනව සහිත අඞ්ගද ශ්‍රද්ධා වන්ත සත්පුරුෂයන් විසින් දැන හැඳින මුසාවාදයෙන් දුරුව සත්‍යයෙහි පිහිටා සගමොක් සිරිසැප අත්පත් කටයුතු—

තවද යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක්තෙම ප්‍රමාදයට කාරණවූ සුරාපානයෙහි ආදී නව දැනීම් වසයෙන් විශෙෂයෙන් වැලැක්කේ වේද— එහි ආදීනව කවරහයත්?— යම් කෙනෙක් හලාහල විෂයක් සමාන සුරාව පානය කළාහුද ඔවුහු නරකයෙහිඉපිද අනේවාදහස් වරුසගණන් පැසී එසින්මිදී මිනිස්පියක් ලත්කල්හි සිහි මුළාවෙති, ලජ්ජා නැතිවෙති, ගුණහීනවෙති, දුප්පත්වෙති, හැමකල්හි ඥාතිව්‍යසනාදීන් යුත්තව සොක පරිදෙවාදී දුක් ඇත්තාහුවෙති, නොයෙක් ජාතිවල විරූප දෙහයෙන්ද යුක්තව උපදිති— තවද සුරාපානය කරණලද සත්‍වතෙම දෙව්ලෝ ගමන වලක්වන්නේය, රාගමල, වෙෂමල, මොහමල, යන මලත්‍රය උපදවන්නේය, කාමභව, රූපභව, අරූපභව, යන භවත්‍රයකරාගෙණයන්නේය බුදු පසේබුදු මහ රහත්යන තුන්මහ පුරුෂයන් විසින්ද බලුවමනයක්මෙන් නින්දාකරණලද්දේය, කායාදි ත්‍රිවිධ දුශ්චරිතයට හිතවන්නේය, ත්‍රිවිධ භවය උපුටන්නාවූ හෙවත් සසර දුක් නසන්නාවූ බුඬදෙසනාවද නසන්නේය නොහොත් නොපිළිගන්නේය.

තවද මෙම මද්‍යපානයෙන් අපාය භාක්වනපරිදිද මිනිස් පියක් ලත්කල උමතුවන පරිදිද දක්වනනට මෙසේද වදාළහ— "සුරාමෙරයපානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරය සංවත්තනිකං හොති—පෙ—මනුස්සභූතස්ස උම්මත්තක සංවත්තනිකංහොති".

තවද සකල ජම්බුද්වීපයෙහි තෙසැට දහසක් නුවර පිරිවරණලද වාරවති නුවර වාසුදෙව නාරේන්ද්‍රාදි දසබෑරජදරුවෝ රාබිමත්ව මහ මුගුරුගෙණ උනුනුම්තළා මිය අපාභාක්වූහ— තවද පූර්වදෙවයෝ සුරාපානයකළ හෙයින් ත්‍රිදශයන් විසින් මෙර මුදුනෙන් ගෙණ සාගරයෙහි නිමගනකළාහුය— තවද සුරාපානය සිල්කිලිටුකෙරෙයි, යසස් නසයි, ලජ්ජා නැතිකෙරෙයි, ප්‍රඥව හීන කෙරෙයි, ඒ ඒ ගුණ විධ්වංසනය කෙරෙයි— මෙහි අඩගනම්.

සුරාභවො පාතුකාමො අජෙඣාහරණං අයොගතා
තෙනෙව අජෙඣාහරණං සුරාපානස්ස වාතුරො.

සුරාවක්බව දැනීමද, බොනු කැමතිබවද, පානය පිණිස හස්තයට ගැනීමද, ගත්ලෙසින්ම පානයකිරීමද, සුරාපානයට මේ සිව් අඩගය වත්නේය— සුරාපානයෙහි මෙකී ආදීනවසහ අඩගයෝද දැනගතයුතු— එබැවින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් මෙහි ලුහුඬින් දක්වනලද ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුෂාවාදය, සුරාපානය, යනමේ පඤ්චපාපයෙහි ආදි නවයෝ නුවණින් සලකා මෙම පඤ්චදුස්සීල්‍යය දිවිහිම්කොට හැර අපමණ ආනිසංස ගෙණදෙන පඤ්චසීලය රක්‍ෂා කටයුතු— එසේකිරීම සිල සම්පදාවයයි කියනුලැබේ, මේ දෙවෙනි සීලසම්පදාවයි—

එබා ගෘහපතිය චාගසම්පදාතොමෝ කවරේද? ගෘහපතිය මේ ලෙව්හි යම් ආයර්‍ය ශ්‍රාවකයෙක් තෙම විශිෂටවූ තෘෂ්ණාගිවනනව බොත හස්තයෙන් යුක්තද, හෙවත් ශ්‍රද්ධාවන්ත අලොභීතැනැත්තේ දීමෙහි අදහස් ඇතිවූ බැවින් කිලිටුවූ හස්ත නැතිවෙයි, එහෙයින් පයතපාණීවේ, පිත්වත්නි අපට ආහරපාන වස්ත්‍රාභරණාදිය දෙව යනාදීන් ඉල්ලූවිට යාචකයින්ට කැමතිදෙය දීමෙහි යෙදෙන්නේද, සකස්කොට දන්දෙන්නේද, සිව්පස බෙදීම්වසයෙන් විභාගකරන්නේද, මෙසේ මසුරුමලින් වෙන්වූ සිතින් යුත්තව ගිහිගෙයි වසන්නේද, ගෘහපතිය මෝ තොමෝ චාගසම්පදාවයයි කියනු ලැබේ— මෙහි දක්වනලද චාගසම්පදා සංඛ්‍යාත දීමනම් කවරහයත්?

දානංසීලංච නෙක්ඛම්මං පඤ්ඤාවිරියෙන පඤ්චමං
ඛන්තිසච්ච මධිට්ඨානං මෙත්තුපෙක්ඛා ඉමෙදස.

මෙකී දසපාරමිතාවෙන් අලොභයෙන් දීම පළමු වෙනි දානපාරමිතාව වන්නේය.—

දානං සීලංච භාවනා පත්තිපත්තානුමෝදනා
වෙය්‍යාවච්චා පචායංච දෙසනා සුති දිට්ඨිජු.

මෙකී දශපුණ්‍ය ක්‍රියාවෙනුදු පළමුවෙනි පුණ්‍යක්‍රියා වස්තුව වන්නේය.

දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං
අක්කොධො අවිහිංසාච ඛන්තිච අවිරොධතා.

මෙකී දසරාජ ධර්මයෙනුදු පළමුවෙනි රාජධර්මය වන්නේය.

දාන, ප්‍රියවචන, අර්ථචරියා, සමානාත්මතා, යන සතර සංග්‍රහවස්තූන් කෙරෙනුදු පළමුවෙනි සංග්‍රහවස්තුව වන්නේය- මේ ආදී වසයෙන් දක්වනලද්දේ ආමිසදානනම් වේ.— මෙම ආමිසදානයට වඩා නිස්සරණාධ්‍යාසයෙන් පවත්වනලද ධර්මදානය මහාදානනම්වේ, එබැවින් බණකීමද කියවීමද ඇසීමද ඇස්සවීමද මහත්ඵල මහානිසංසය, එබව සක්දෙව්රජහට මෙසේ වදාළසේක.

සබ්බ දානං ධම්ම දානං ජිනාති
සබ්බං රසං ධම්ම රසො ජිනාති
සබ්බං රතිං ධම්ම රති ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති' යි

එබැවින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන්විසින් මෙහි දක්වනලද චාගසම්පදාවෙහි පිහිටා ධර්මදාන ආමිසදානාදි කුසල්කොට සගමොක් සිරිසැප අත්පත් කටයුතු.
මේ තුන්වෙනි චාගසම්පදාවයි.

## ප්‍රාප්තකර්ම සූත්‍රයේ-4-කාණ්ඩය.

එවං ගෘහපතිය පඤ්ඤාසම්පදා තෙම කවරේද, මේලොකයෙහි යම් ආර්ය්‍ය ශ්‍රාවකයෙක් තෙම අභිධ්‍යා සංඛ්‍යාත විෂම ලොභයෙන් මැඩුනාවූ සිතින්යුක්තව වාසය කරන්නේද, ඔහු නොකොටයුතුදෙය කරන්නේය, කටයුතුදෙය නොකරන්නේය, මෙසේ නොකටයුතුදෙය කිරීමෙනුදු, කටයුතුදෙය නොකිරීමෙනුදු, තැන තැන ගුණකථා කීර්තිවසයෙන් පැවති යසසිනුදු, මෙලෝ පරලෝ සැපතිනුදු-ඔහු පිරිහෙන්

නේය — මෙම විෂමලොභයෙහි ආදීනව කවරයත් — ලො
භී පුද්ගලතෙම වැඩ අවැඩ නොහඳුනන්නේය, ධර්‍මා ධර්‍ම
යන් නොදක්නේය, ලොභසහගතවූ යම් මනුෂ්‍යයෙක් ඈ
ද්ද, ඔහු එකල්හි ගණඳුරෙහි උන් අන්ධයෙක්මෙන් කිසිවක්
නොදන්නේය — තවද ලොභයෙන් මැඩුනු මොහට ඉහා
ත්මයෙහිම වධබන්ධනාදී නොයෙක් දුක්පැමිණ එමලොභ
යම හෙතුකොටගෙණ ප්‍රාණඝාතාදී අපමණ අකුශලධර්‍මද
උපදින්නේය.

එහෙයින් වදාළහ — "ඉතිඝසමෙ ලොභජා ලොභසමුද
යා ලොභපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සං
භවන්ති" යි — තවද මේලොකයෙහි සත්වයො සවිඤ්ඤාණ
ක අවිඤ්ඤාණක වස්තුවෙහි ලොභවශයෙන් මිය තිරිසන්
යොනියෙහි උපදනාහුය, කිසේයයත් පෙර බරණැස්නුවර
එකතරා සිටානකෙනෙක් ගංතෙර සතළිස්කෙළක් ධන නි
දන්කොටතබා ධනලොභයෙන් මිය එමවස්තු සමීපයෙහි
සජීව උපන්නේය — එසේම අනික් සිටානකෙනෙක්ද නි
ස්කෙළක්වස්තු නිදන්කොටතබා ධනලොභයෙන් මිය මූසි
කව උපන්නේය — එබැවින් දෙලෝවැඩකැමති සාධුජනය
න්විසින් මෙහි ආදීනව වශයෙන් දැක්වූ විෂමලොභාදිය දු
රුකොට ත්‍යාගසම්පදාවෙන් යුක්තව දානමානාදී කුශලධර්‍ම
යෙහි යෙදී සගමොක් සිරිසැප අත්පත් කටයුත්තේය —

තවද ගෘහපතිය චිත්තයාගේ ප්‍රකෘති ස්වභාව නසන්නා
වූ ක්‍රොධසහගත චෙතනාවෙන් මැඩුනුසිතින් යුක්තව ය
මෙක් වාසය කරන්නේද, ඔහුද නොකටයුතු දෙය කරන්
නේය, කටයුතුදෙය නොකරන්නේය, මෙසේ නොකටයුතු
දෑ කිරීමෙන්ද, කටයුතුදෑ නොකිරීමෙන්ද, ඒ ඒ තැන ගුණකීර්
තිශයෙන් පැවති යසසින්ද, මෙලෝපරලෝ ලැබියයුතු සැප
තින්ද පිරිහෙන්නේය — මෙහි දක්වනලද ක්‍රොධයෙහි ආ
දීනව කවරයත් — යම්සේ කාෂ්ටමථනයෙන් ගිනිහටගත්
කල්හි එමගින්නෙන් එමකාෂ්ටය පළමුව දවන්නේද, එප
රිදෙන් ධර්‍මයෙන් දත් මනුබුඩිවූ අඥාන පුරුෂයාහට අරමුණු
[illegible] තමත්ගේ ප්‍රිය මනාප දූදරු ආදීන්ට
[illegible] කළායයි යනාදීන් කල්පනාකොට
නව අඝාත වස්තුව සිතට අරමුණුවීමෙන් ක්‍රොධය උපදින්
නේය, පළමුකොට එම ක්‍රොධනැමැති ගින්නෙන් ඔහුගේ
[illegible], මෙසේ උපන් ක්‍රොධය තෘණ පරඬ
ලා [illegible] වැඩෙන ගින්න මෙන් යමෙකුගේ සිතෙහි

වැඩේද, ඔහුටධනධාන්‍යාදීන් පැමිණ තිබෙණ යසස කෘෂ්ණ පක්‍ෂයෙහි සඳමෙන් දිනෙන්දිනට පිරිහෙන්නේය—තවද, මෙසේ කිපෙන ක්‍ෂුද්‍ර ඒ පුද්ගලතෙම දුර්වර්ණ දෙගඳ ඇතිවන්නේය, නපුරු ස්වප්න පෙණීමෙන් දුකසේ සයනයද කරන්නේය, මේඅනර්ථයයි කියාතමහට වැඩපිණිස යමක්ගත්තේද නොහොත් කල්පනාකළේද, ඒ දෙය තමහට අවැඩපිණිස පැමිණෙන්නේය—

කොධනොදුබ්බණ්ණොහොති අථොදුක්ඛංපි සෙතිසො
අථොඅත්ථං ගහෙත්වාන අනත්ථමධිගච්ඡති' යි

තවද ක්‍රොධයෙන් මැඬෙනලද ඒ පුද්ගලතෙම කාය වාචාදීන් මිනීමැරීම් ආදිවසයෙන් නොයෙක් රාජ ද්‍රොහිකම් කොට ඉහාත්මයෙහිම වස්තුපිරිහීමට යන්නේය—

සඛො කායෙනවාචාය වධංකත්වාන කොධනො
කොධාභිභූතො පුරිසො ධනජානිං නිගච්ඡති.

තවද ක්‍රොධයෙන්මත් පුද්ගලතෙම මෙලොවදීම අයස බවට පැමිණෙයි, ඒ ක්‍රොධියා ඥාතිමිත්‍ර සහොදරාදී හුද ආශ්‍රයනොකොට හැරපියත්—

කොධසම්මද සම්මත්තොආයසක්‍යං නිගච්ඡති
ඤාතිමිත්තා සුහජ්ජා ච පරිවජ්ජෙන්ති කොධනං.

තවද ක්‍රොධයෙන් මුළාව කිපියාවූ පුරුෂතෙම ස්වකීය මව්පියන්ද නසන්නේය, රහතන්ද නසන්නේය, අවශෙෂ පෘථජ්ජන සිල්වතුන්ද නසන්නේය—

කුද්ධොහි පිතරං හන්ති කුද්ධො හන්ති සමාතරං
කුද්ධොහි බ්‍රාහ්මණං හන්ති හන්තිකුද්ධො පුථුජ්ජනං

මෙසේ දක්වනලද මහත්අනර්ථ දායකවූමේ ක්‍රොධයෙන් හා උපනාහ සංඛ්‍යාතබැද පවතින වෛරයෙන්ද සමන්විත පුද්ගලතෙම මෙලෝ සියලුසැපතින්ද පිරිහී මරණින්මතු අතඇල්වා ගෙණගොස් සිටෙව්වාක්මෙන් නාරකයෙහිද උපදින්නේය—

එසේ හෙයින් වදාළහ.

“ඒහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ කතමෙහි ඒහි කොධෙනච උපනා

ගෙනව"—මේ ආදී වශයෙන් දෙලෙව්හිම මහත් අනර්ථයි දුවන ක්‍රොධය දුරුකොට දෙලෙව්හි මහත් ගුණානිසංස දැයකවූ මෛත්‍රීසිත, වෛර අවෛර සියලුම සතුන් කෙරෙහි වැඩියයුතු—තවද ගෘහපතිය සිත අලසවීමෙන් නිදන සවභාවූ නොහොත් කාය චිත්ත දෙදෙනාගේ කම්මැලි සවභාව කරනනාවූ ථීනම්ඪයෙනුද, ධ්‍යාන විදර්ශනාව සමයෙන් නොසංසිඳුනු සිතයයි කියනලද උද්ධච්ච කුක්කුච්චයෙනුද, බුද්ධාදී අටතන්හි සංසය සවභාවකොට ඇති විචිකිච්ඡාවෙනුද, යනමේ අකුසල චෙතනා තුනෙන් යමකින් මැඩුනාවූ සිත්ඇතිව යමෙක් වාසයකරන්නේද, ඔහුද නොකටයුතුදෑ කරන්නේය, කටයුතුදෑ නොකරන්නේය, මෙසේ නොකටයුතුදෙය කිරීමෙනුද, කටයුතුදෙය නොකිරීමෙනුද තැන තැන ගුණකීම් වශයෙන් පැවති යසසින්හා දෙලොව විඳියුතු සැපතිනුද ඔහු පිරිහෙන්නේයයි වදාළසේක—මෙසේ දක්වනලද අභිධ්‍යා සංඛ්‍යාත විෂම ලොභයද, ක්‍රොධ සහගත ව්‍යාපාදයද, කාය චිත්තය ගිලන්කරනනාවූ ථීනම්ඪයද, සිත නොසංසිඳෙනනාවූ උද්ධච්ච කුක්කුච්චයද, බුද්ධාදී අටතන්හි සැක කරනනාවූ විචිකිච්ඡාවද, යනමේ පඤ්චධර්මයෝ සිත කිලිටුකරනනාවූ සිතෙහි බැඳ පවත්නා සංකිලෙසිකයෝයයි දැන හැඳින එසේ සිත කිලිටු කරනනාවූ ඒ පඤ්චධර්මයන්ම සිතින් පහකරන්නේ වේද—

මෙසේ ගෘහපතිය ආර්ය්‍ය ශ්‍රාවකයා විසින් ලොභාදී මේ පඤ්චවිධ අකුසල සිත්හුම සිත කිලිටුකරණ කාරණයෝයයි දැන මේ පඤ්චවිධ අකුසල සිත්වලින් විශෙෂයෙන් වෙන්වූයේද, ගෘහපතිය මෝ තොමෝ ප්‍රඥසම්පන්නයයි කියනුලැබේ—මේ සතරවෙනි ප්‍රඥා සම්පදාවයි.

## ප්‍රාප්තකර්මසූත්‍රයේ-5-කාණ්ඩය.

තවද ගෘහපතිය අනිෂ්ටදෙය වලක්වනහෙයින් ඉෂ්ටවූ සිතට ප්‍රියවසයෙන් පැමිණෙන හෙයින් කාන්තවූ සිත් පිණවීම් වශයෙන් වැඩෙනහෙයින් මනාපවූ, ලොකයෙහි අතිසයින්ම දුර්ලභවූ රජ ඇමති තනතුරු සහිත භොග සම්පත්තියද, මව්පිය ඥාතිමිත්‍රාදීන් සමග තමන්ගේ කීර්ති ප්‍රශංසාදිය වැඩීමද, බොහෝ කාලයක් මුලුලෙලෙහි දීර්ඝායුෂ්කව දිවිරැකුමද, මරණින්මතු සවර්ගයෙහි ඉපදීමද, යනමේ සතර ධර්මයන්ගේ ලැබීමපිණිස, සද්ධාසම්පදා, සීලසම්පදා, චාගසම්පදා, පඤ්ඤාසම්පදා, යනමේ සතර සම්පදාතොමෝ පැවැත්

විය යුතුයයි වදාළසේක — මෙසේ වදාරා නැවත එම ආර්‍ය්‍ය ශ්‍රාවකයාවිසින් ධනදිය සෙල්වීම් වශයෙන් දැහැමින් උපදවනලද වස්තුවෙන් ගතයුතු ප්‍රයොජනවත් කාරණා සතරක් වදාරනනාවූ සර්‍වඥයන් වහන්සේ, “සඛොසොගහපති අරියසාවකො” යනාදී පාළිය වදාළසේක — එඹා ගෘහපතිය ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම උට්ඨාන සංඛ්‍යාත වීර්‍ය්‍යයෙන් උපදවන ලද්දාවූ, හස්තබලය කාරණකොටගෙණ රැස්කරණ ලද්දාවූ, ධනදිය වැගිරීමෙන් යුක්තව ව්‍යායාමෙන් උපදවනලද්දාවූ, අසකුසල ධර්‍මය නොපිරිහෙලා එසිත්ම ලැබුවාවූ, භොගයන් කරණකොටගෙණ තමහට එමවස්තුවෙන් පමුනුවාගතයුතුවූ සතර කාරණයක් කරන්නේවේද — ඒ යුතුවූ ක්‍රියා සතරකවුරුදයත්, ගෘහපතිය මේ ලොකයෙහි යමෙක් තෙම කියනලද ප්‍රකාර ධාර්‍මිකවස්තූන් කරණකොටගෙණ යහපත්ව කෑ බී ඇඳ පොරව තමන්ගේ ආත්මය සුවපත්කරන්නේද, කායික චෛතසිකවූද දුක්හැරපියා යාන වාහනාදීන් ආත්මය පිණවන්නේද, මව් පිය දෙදෙනාද සුවපත් කරන්නේද පිණවීම් වසයෙන් කායබල සම්පූර්ණ කරවන්නේද, යහපත්ව සතුටුද එළවමින් පොෂ්‍යය කරන්නේද, මෙයි මව්පියන් පොෂ්‍යය කිරීමෙහි විභාග කවරහයත් —

මව්පියන්ට උපස්ථාන කරණ දරුවන්විසින් දාසි දාසාදීන් ලවා අත්පා මෙහෙ නොකරවා තමන් විසින්ම දෙමව්පියන්ගේ අතපය ආදිය උලා නැහැවීමෙන්ද, අනර්ඝ වස්ත්‍ර පිළි ආදිය ඇන්දවීමෙන්ද, කැමතිලෙස කෑද බත් ආදිය සම්පාදනය කරදීමෙන්ද, සුවද තෙල් ආදිය හස්තපාදාදියෙහි ගැල්වීමෙන්ද, ගමන් පිණිස සැප වාහන සලස්වා දීමෙන්ද, සැප එළවන සෙනසුන් ආදියෙහි හිඳුවා දවස තුන්විට වැඳීමෙන්දැයි, යනාදී වසයෙන් දිවිඇති තෙක්ම මව්පියන්ට මෙසේ කරණලද උපකාරය ආමිස උපකාර නම්වේ.

තවද මව්පියන් කළ උපකාරයට සම උපකාර කරමහයි සිතා ගුණ සලකන පුත්‍රයෙක් විසින් දස දහසක් යොදුන් සියලුම දඹදිව්තලය බෙර තලක්මෙන් සමකොට හිණපමණ සත්රුවන් එහි පුරවා මව්පියන් සතරදිවයිනට නායකකොට සක්විති රාජ්‍යය සහිත ඒ වස්තුදුන්නේ වීනමුත් මව්පියන් කළ උපකාරයට සම උපකාරයක් නොවන්නේමය, ඊට කාරණා කිමයත්, මව්පියෝ දරුවන්ගේ දිවිදුන් බැවින්ද, දරු සෙනහයෙන් හෘදයෙහි ලේ කිරිබවට පෙරළා එම ලේ

පොවා අන්පා සඹාහනාදිය කිරීමෙන් වැඩි වර්ධනය කොට මෙලොව ඉෂ්ටා නිෂ්ටාදි සියලුදෙය පෙන්වූ බැවින්ද, මහාබ්‍රහ්මවනබැවින්ද, පූර්වදෙවතා වනබැවින්ද, පූර්වාචාරී වනබැවින්ද, ආහුනෙය්‍ය වනබැවින්ද, කරණලද ආමිස උපකාරාදිය නොසම වන්නේය—වදාළමැනෝ.

“බ්‍රහ්මාති ඛො භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං පුබ්බදෙවාතිඛො භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධි වචනං පුබ්බාචරියාතිඛො භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං ආහුනෙය්‍යාතිඛො භික්ඛවෙ මාතාපිතුන්නං එතංඅධිවචනං’’

මෙහි මව්පියන් දරුවන්ට බ්‍රහ්මවන පරිදි කිසේදයත්, යම්සේ මහා බ්‍රහ්මතෙම සියලුම සත්වයන්කෙරෙහි, මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ෂා, යනමේ සතර බ්‍රහ්ම විහරණය නොහැර පවත්වාද, එපරිද්දෙන් මව්පිය දෙදෙනද තමන්ගේ දරුවන් නිදුක් නිරොගිව සැපසේ වැඩෙවයි යනාදිවසයෙන්, මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ෂා, යනමේ සතර භාවනාව දරුවන් කෙරෙහි උපදවන බැවින් දරුවන්ට තමන්ගේ දෙමව්පියෝ මහාබ්‍රහ්මනම්වෙත්—තවද සියලුම ඉෂ්ටදෙවතාවන් අතුරෙන් මව්පියන් ප්‍රථම ඉෂ්ටදෙවතා වනබැවින් දරුවන්ට පූර්වදෙවතාවෝ වෙත්මය—තවද දරුවන්ට මෙසේ හිඳුව මෙසේ සිටුව මෙසේ කථාකරව යනාදිවසයෙන් මව්පියන් විසින් බොහෝදෙය පළමුවෙන් උගන්වා ඉන්පසු හස්ති ශිල්පාදි අවශෙෂ ශිල්පයන් ඉගැන්වීමපිණිස අන්‍යයන්ට භාරදෙන හෙයින් මව්පියෝ දරුවන්ට පූර්වාචාරි වෙත්මය—තවද චීවරාදි සිව් පසයලගට ගෙණවුත් දිය යුතුබැවින් සංඝරත්නය ආහුනෙය්‍යවන්නේද, එමෙන් මව්පියන්ගේ ගුණ සලකන දරුවන් විසින් ආහරපාන වස්ත්‍රාදී නොයෙක්දෑ දෙමව්පියන් හුන්තැනට ගෙණවුත් දියයුතු බැවින් දරුවන්ට මව්පියෝ ආහුනෙය්‍යනම් වෙත්—මේ ආදි නොයෙක් ලෙසින්ම දරුවන්ට මව්පිය දෙදෙන අති උතුම්වූ පුද්ගලයෝ බැවින් ඔවුන්ට සම උපකාර කරණු කැමති දරුවන් විසින් අශ්‍රද්ධාවනත මව්පියන් ශ්‍රද්ධාසම්පත්තියෙහිද, දුස්සීලයන් සීල සම්පත්ති යෙහිද, මසුරන් ත්‍යාග සම්පත්තියෙහිද, අඥනයන් ප්‍රඥසම්පත්තියෙහිද. යොදවා ගෙණ ඉහතකී ප්‍රකාර ආහරපානාදිය දෙමින් කරණලද උපස්ථානය මව්පියන් කළ උපකාරයට සමවූ උපකාර වන්නේමයයි දතයුතු—මේ ක්‍රමයෙන් මව් පියන්ට උපස්ථාන කිරීමෙහි, පුත්‍රදාර දාසකම්කරු පුරුෂයන්ට කටයුතු දෙයෙ

හී සහයවීමෙන්ද, අමාත්‍යයන් හා මිත්‍රයන්ද යනාදී ආදීන් සැපතට පැමිණවීමෙන්ද, පිණවීම් වසයෙන් ශරීරබල උපදින දෙය කිරීමෙන්ද, යහපත්ව ඒ ඒ අයට ආහාරපානාදිය දීමෙන්ද, මෙසේ තමන්ගේ භවභොගාදි වස්තුව වියදම්කරණ ආර්‍ය ශ්‍රාවකයාගේ භොග ස්කන්ධය පැමිණවියයුතු දෙයට පමුනුවා කාරණාවසයෙන් තමන් විසින්ම පරිභොග කළානම් වන්නේය—

මේ පළමුවෙනි ප්‍රාප්තකර්මයයි.

නැවතද ගෘහපතිය යම් ආර්‍ය ශ්‍රාවකයෙක් තෙම ඉහත දක්වනලද ක්‍රමයෙන් උපදවාගත් ධාර්මික භොගය කරණ කොටගෙණ ගින්නෙන්හෝ දියෙන්හෝ රජුන්ගෙන්හෝ සොරුන්ගෙන් හෝ තමහට අප්‍රිය අමනාපයන්ගෙන් හෝ යම් අපදාවක් පැමිණිකල්හි නොහොත් ගිනිගත් ගෙවල් නිවීම්ආදිය පිණිස වස්තු වියදම්කොට ඒ විපත්ති මාර්ගයන් වසා තමහට නිරුපද්‍රභාවය කරගණීද, මෙසේ භවභොගාදි වස්තුව අපදාවක් පැමිණිවිට වියදම්කරණ ආර්‍ය ශ්‍රාවකයාගේ භොග ස්කන්ධයද දෙවෙනිව පැමිණවියයුතු දෙයට පමුනුවා කාරණාවසයෙන් තමන් විසින්ම පරිභොගකළානම් වන්නේය.

මේ දෙවෙනි ප්‍රාප්ත කර්මයයි.

නැවතද ගෘහපතිය යම් ආර්‍ය ශ්‍රාවකයෙක් තෙම ඉහත දක්වනලද ක්‍රමයෙන් උපදවාගත් ධාර්මික භොග කරණ කොටගෙණ මව්පිය දෙපක්ෂයෙහි නෑයන් වෙනුවෙන් ඒ ඒ කාලයෙහි වස්තු වියදම් කිරීමෙන් දියයුතු ඥාති බලියද, තමන් ගෙදොරට පැමිණි ආගන්තුකයන්ට කටයුතු සත්කාරාදිය කිරීම්වසයෙන් කරණ අථිතිබලියද, පරලෝගිය නෑයන් උදෙසා මතක බත්දීම් වසයෙන් කරණ පූර්ව ප්‍රේතබලියද, රජුන්ට සුංකත්වසයෙන් දියයුතු රාජබලියද, කුල ප්‍රවෙණියෙන් පැවැතඑන ආරක්ෂක දෙවියන්ට, කැඳ, බත්, සුවඳ, දුම්, මල්, පහන්, ආදි වසයෙන් දියයුතු දෙවතාබලියද, යනාදී පඤ්චවිධ බලි කර්මය කරන්නේවේද, මෙසේද භවභොගාදි වස්තු වියදන්කරණ ඒ ආර්‍ය ශ්‍රාවකයාගේ භොග ස්කන්ධය තුන්වෙනිව පැමිණ වියයුතු දෙයට පමුනුවා කාරණාවසයෙන් තමන් විසින්ම පරිභොග කළානම් වන්නේය—

මේ තුන්වෙනි ප්‍රාප්තකර්මයයි.

නැවතද ගෘහපතිය, යම් ආර්‍ය ශ්‍රාවකයෙක් ඉහත දක්

වනලද ක්‍රමයෙන් දැහැමින් උපදවාගත් භොගය කාරණ
කොටගෙණ යෞවන මදාදී ත්‍රිවිධ මදයෙන් විශෙෂයෙන්
වැලකුනාවූද, ඉවසීම් සංඛ්‍යාත මොංලොක් බවෙහි පිහිටි
යාවූද, ඉන්ද්‍රිය සංවරවසයෙන් සමහර අකුසල සිතක් දම
නය කළාවූද, සමහර අකුසල සිතක් කෙලශූපසමණයෙන්
සංසිඳෙව්වාවූද, සමහර අකුසල සිතක් කෙලශ නිර්වාපණ
යෙන් නිව්වාවූද, මෙවෙනි ස්වරූපවූ මහණ බමුණන් කෙරෙ
හි, මතු ඵලදෙනනාවූ, ස්වර්ගෝත්පත්තිය වනනාවූ, උපනූ
පත්තන්නි සැපදෙනනාවූ දක්ෂිණාව සංඛ්‍යාත චීවර පිණ්ඩ
පාතාදිය දෙන්නේද, මෙසේද භවභොග වස්තුව වියදත්
කරණ ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ භොග ස්කන්ධය සතරවෙනි
ව පැමිණ වියයුතු දෙයට පමුනුවා කාරණාවසයෙන් තමන්
විසින්ම පරිභොග කළානම් වන්නේය—

මේ සතරවෙනි ප්‍රාප්ත කර්මයයි.

මෙසේ ආර්‍ය්‍ය ශ්‍රාවකයාවිසින් උට්ඨාන සංඛ්‍යාත වීර්‍ය්‍යයෙන්
උපදවනලද භොගයන් කාරණකොට ගෙණ මෙහි දැක්වූ
මේ චතුර්විධ ප්‍රාප්ත කර්මයම කටයුතුබව වදාර, නැවත යම්
කිසිවෙක්හු විසින් මෙසේ දූකසේ සපයනලද වස්තුව
මේ සතර කාරණයහැර අක්ෂධූර්ති, සුරාධූර්ති, ස්ත්‍රීධූර්තාදී, සෙ
සුනොකටයුතු නොයෙක් නොපණත් දෙය කිරීමෙන් ක්ෂ
යභාවයට ගියේනම් ඒ භොගයෝ නොපැමිණ වියයුතු අ
යුක්තස්ථානයට පැමිණියාහුයයි වදාරනාංවූ සර්වඥයන්වහ
න්සේ, "යස්ස කස්සචි ගහපති අක්ඛුත්‍ර ඉමෙහි චතූහි ප
ත්තකම්මෙහි" යනාදි පාළිය වදාළසේක— එබා ගෘහපති
ය යම් කිසිවක්හුගේ මෙකී වස්තුව වියදම්කළයුතු මේ ස
තර කාරණයහැර, සූදුක්‍රීඩා, සුරාපානාදි නොනිසිදෙය කි
රීමෙන් වියදම්වූයේද ඔහුගේ ඒ වස්තුව, අයුතුවූ නොනි
සිදෙයට පැමිණියාහුය, තමන් අතට නොපමිණියාහුය, නි
ෂ්කාරණයේ වියදම්කරණ ලද්දාහුයයි කියනුලැබෙත්—

ගෘහපතිය මෙසේ නොව යමක්හුගේ වස්තුව මෙහි දැක්වූ
වියදම්කළයුතු සතර කාරණය කාරණකොටගෙණ ක්ෂය
භාවයට ගියේද, ඔහුගේ භොගවස්තූහු ස්ථානගතවූවාහුය
තමහට අතට පැමිණියාහුය, කාරණාවසයෙන් වියදත්කර
ණ ලද්දාහුයයි වදාළසේක.

භුත්තා භොගා භතා භච්චා විතිණ්ණා ආපදාසුමෙ
උද්ධග්ගා දක්ඛිණා දින්නා අථොපඤ්ච බලීකතා.

උපට්ඨිතා සීලවන්තො සඤ්ඤතා බ්‍රහ්මචාරයො,
යදත්ථං භොගං ඉච්ඡෙය්‍ය පණ්ඩිතො ඝරමාවසං.
සොමෙ අත්ථො අනුප්පත්තො කතං අනනු තාපියං,
එතං අනුස්සරං මච්චො අරියධම්මෙ ඨිතො නරො,
ඉධචෙව නං පසංසන්ති පෙච්චසග්ගෙ පමොදතීති.

යනුහෙයින් මාවිසින් උට්ඨානසංඛ්‍යාත වීර්‍ය්‍යයෙන් දැහැමින් උපදවාගත් භොගයෝ සුතුලෙස අනුභවකරණ ලද්දාහුය, පොෂ්‍යය කළයුතු මව්පිය දූ දරු ආදීහුද පොෂ්‍යයකරණ ලද්දාහුය, රජුන්, සොරුන් ආදීන්ගෙන් අපදාවක් පැමිණි කල්හි එය දුරුකිරීම පිණිස විශෙෂයෙන්ම වස්තුව වියදම්කරණ ලද්දේය, මතු ඵල විපාක දායකවූ දක්ෂිණා තොමො දෙනලද්දීය, නැවතද එම වස්තුවෙන් පඤ්ච බලිකර්මයෝද කරණලද්දාහුය, කායවාක් සංයම සහිතවූ සිල්වතුන්ට චිවරාදි සිව්පසයෙන් උපස්ථානද කරණලද්දාහුය, එසේ හෙයින් ගිහිගෙයි වැසි ප්‍රඥවන්ත පුද්ගල තෙම දෙලෝ වැඩපිණිස භවභොගාදි වස්තුව උත්සාහවත්ව සපයන්නේද, එයින් ගතයුතු අර්ථයතෙම මට පැමුණුනේය, වස්තු හානිවූ විටකද ඊට පසුතැවිලි නොකරණලද්දේය, මාවිසින් අවශෙෂ කුසල්ද කරණලද්දේයයි මේ මේ කාරණයන් සිහිකරන්නාවූ සත්වතෙම ආර්‍ය්‍ය ධර්ම සංඛ්‍යාත නිත්‍ය පඤ්ච සීලයෙහි හා පොහොය අෂ්ටාඞ්ග සීලයෙහි පිහිටියේද, එසේ පිහිටියාවූ ඔහු පණ්ඩිතයන්ගෙන් මෙලොවද ප්‍රශංසා ලබන්නේය, පරලෙව්හිද පස්කම් සැපතින් අග්‍රහෙයින් ස්වර්ගයයි නම්ලද දෙව්ලෝ ඉපිද සැපතින් ආඪ්‍යව සතුටුවන්නේය, නැවත සොවාන් ආදි මාර්ගඵල ලැබීමෙන් අමෘතම හා නිර්වාණ සම්පත්ති ප්‍රතිලාභයටද පැමිණෙන්නේයයි වදාළසේක — මෙතෙකින් ගිහිජනයන් එයින් දෙලෝ වැඩ සඳහා පිළිපැදියුතු ප්‍රාපතකම්සූත්‍රය කියා නිමවනලදී.

---

## පාපමිත්‍ර සෙවනයෙහි-1-කාණ්ඩය.

ඉධ භික්ඛවෙ බාලො දුච්චින්තිත චින්තීහොති
දුබ්භාසිත භාසීචහොති දුක්කත කම්මකාරීචහොති.

යනාදීන්, මහණෙනි මේ ලොකයෙහි අසත් පුරුෂවූ බාලතෙම නපුරු සිතිවිලිලක්ම සිතන්නේවේ, නොහොත් අභිධ්‍යායයි කියනලද අන්සතු දෙයෙහිහෝ තමන් සතුදෙයෙ

ගිහෝ තෘෂ්ණා සහගතව පවත්නා ලොභසිතද, ව්‍යාපාදය යි කියනලද අනුන් නසම් නසවම් යනාදීන් ප්‍රකෘතිය පෙරලී පවත්නා ක්‍රොධසහගත නපුරුසිතද, දුන්දෙනෙහි ඵල විපාක නැතයනාදීන් ඇත්තක් නැතතවසයෙන් හෝ නැත්තක් ඇතතවසයෙන් හෝ ගන්නා විපරිත ලක්‍ෂණවූ බුඩාගමෙන් පිටත් මිථ්‍යාදෘෂ්ටි සිතද, යනමේ ත්‍රිවිධ චෙතනාවෝම නපුරු සිතිවිලිනම් වෙත්. තවද තමන් නිසාවත් අනුන් නිසාවත් කෙත්වත් ධනධාන්‍යාදි මොනයම් වස්තුවක් නිසාවත් ඇත්තවසා පෙරලා කියන නොසැබෑවූ මුසාවාදයද, මිත්‍රයන් අමිත්‍ර වීම පිණිසහෝ අමිත්‍රයන් මිත්‍රුරුවීම පිණිසහෝ ප්‍රියභාවය නැතිකොට සැබෑ නොසැබෑ වචන ගැළපීමෙන් කියන පෛශුන්‍යයයි නම්ලද කේලාම්කීමද, අසන්නාවූන්ට ඉතා අමිහිරිවූ මොලොක් ගුණ නැතිකරන්නාවූ ලයෙහි ඇනි ශූලක් වැනිවූ කර්කශවූ ඵරුසවචන කීමද, සුරාධූර්තාදීන් මෙන් වැඩ අවැඩ නොසලකා තමහටද පරහටද වැඩපිණිස නොවූ යහපත් පැවත්ම සිඳින්නාවූ සම්ප්‍රලාප වචන කීමද, යන මේ සතර වැදෑරුම් වචනයෝම නපුරු වචනනම්වෙත්—තවද ප්‍රාණයලත් කිසියම් සත්වයෙක් තමන්ගේ ලොභ ද්වෙෂාදිය නිසා තෙමේ මරන්නේ හෝ වේද අනුන්ලවා මරවන්නේහෝ වේද යනමෙකී ප්‍රාණඝාතයයි නම්ලත් සතුන් මැරීමද, අන්සතු දෙයක් තමා සතු නොවනබැව් දැන දැනම වස්තු ස්වාමියාහට නොදෙමි යන සොරසිතින් තෙමේ ගන්නේ හෝ අනුන් ලවා ගත්වන්නේහෝ වේද යන මෙකී අදත්තා දානයයි නම්ලත් සොරකමද, මව්පියාදීන් විසින් රක්‍ෂාකරණලද අන්සතු ස්ත්‍රීන්කරා පැමිණ සොරසිතින් අනාචාරයෙහි හැසිරෙන්නේද යනමෙකී කාම මිථ්‍යාචාරයයි නම්ලත් පරස්ත්‍රී සෙවනයද, යනමේ ක්‍රියාතුනම නපුරු ක්‍රියානම්වෙත්—මෙසේ දක්වනලද ත්‍රිවිධ මනොකර්මයෙනුද චතුර්විධ වාක්කර්මයෙනුද ත්‍රිවිධ කායකර්මයෙනුද යමෙක් යුක්තනම් ඔහු අඥාන බාල අසත්පුරුෂයාබව දතයුතු.

වාරිපූරෙ යථාසොබ්භෙ නෙවනෙතා විසමංසමං
පඤ්ඤායතෙවං සාධුස්ස භාවං මනසි සම්භවං.

යම්සේ මහත් වලක ජලය පිරිගියකල එහිතුළ කණු කටුගල් පහණාදි සමවිෂමත්වයක් නොපෙණේද එසේම මෙකී අසත්පුරුෂයාගේ සිත්හි පැවති ස්වභාවද දැනගත්ට දුෂ්කර වන්නේමය—ගේ කුමක්හෙයිනුදයත් ?

භාසන්ති මුඛතොඑකං චින්තෙන්ති මනසාපරං
කායෙනෙකං කරොන්තෙවං පකතාය මසාධුනං.

අසත්පුරුෂයෝ වනාහි මුඛයෙන් එකක් කියත්, සිතින් අනිකක් සිතත්, කයින් අනිකක් කෙරෙත්, මෙසේ මේ තමන්ගේම ත්‍රිවිධ ද්වාරයට ප්‍රතිවිරුද්ධව ක්‍රියා පැවැත්වීම අසත්පුරුෂයන්ගේ ප්‍රකෘති ස්වභාවවේ.

හිරිනොත්තරන්තං විජිගුච්ඡමානං
සඛාහමස්මි ඉතිභාසමානං,
සය්හානිකම්මානි අසාදියන්තං
නෙසොමමන්ති ඉතිනං විජඤ්ඤා.

උත්තමයන් විසින් විශේෂයෙන්ම පිළිකුල් කටයුතුවූ පාපයෙහි භය ලජ්ජා නැතිව තිරිසනෙක් සමානව හැසිරෙන්නාවූ යමෙක් වනාහි. මම තොපගේ ප්‍රාණසමාන මිත්‍රයයි වචනයෙන් කියා නැවත කරන්ට හැකිදෙයක් පැමිණි විට නොකරන්නාවූ නොඉවසන්නාවූ ඒ අසත්පුරුෂයා මොහු මාගේ මිත්‍රයෙක් නොවෙයි පණ්ඩිතයා දැනගන්නේයයි වදාළසේක — එසේහෙයින් උභය ලොකයෙහි වැඩකැමති සාධුජනයන් විසින් මෙබඳු අසත්පුරුෂ බාලයන් සෙවන භජන පයිරුපාසනාදිය නොකොට දුරිම්ම දුරුකට යුත්තේමය — කුමක් හෙයිනැයත්;

යාදිසං කුරුතෙ මිත්තං යාදිසං උපසෙවති
සොපිතාදි සකොහොති සහවා සොපිතාදිසො.

යම්බඳුකෙනෙක් සමඟ මිත්‍රව වාසයකෙරේද යම්බඳුකෙනෙක් සෙවනයකෙරේද ඔහුද එබඳුවෙයි ඔහුසමඟ එකතුව විසීමද එබඳුවෙයි —

පූතිමච්ඡං කුසග්ගෙන යොනරො උප නය්හති
කුසාපි පූති වායන්ති එවං බාලූප සෙවනා.

යම් මනුෂ්‍යයෙක්තෙම කුණු මාංසයක් කුසසංඛ්‍යාත තෘණයෙන් වෙළා බඳිද ඒ බැඳිම ගෙනකොටගෙණද එකී තෘණයෙහු කුණුගඳ වහනවෙත් එමෙන්ම යහපත් මනුෂ්‍යයෙක් තෙම අසත්පුරුෂ බාලයකු සෙවනයකෙළේනම් ඔහුද අසත්පුරුෂයෙක් වන්නේමැයි යනාදීන් වදාළහෙයින් අසත්පුරුෂ සෙවනය නොකට යුත්තේමය —

තවද පෙරඑක් ප්‍රත්‍යන්තයක වාසී මනුෂ්‍යයෙක් නුවරකට පැමිණියේ තමන් මිත්‍රයෙක් සිරගෙයි වැටී විලංගු ලන ලදුව ඔහු විඳි තද දුක් දැක කාරුණ්‍ය පෙරදැරිව හැඬී වයනුය සෝද

ස්නානයකොට කා බී සම්පූර්ණව එනතුරු ඔහු පාතුබූ විලංගුව ප්‍රත්‍යන්ත වැසියා තමන් පාදයෙහි ලාගෙණ ඔහුමුද, හැරියේය, ඒ අකෘතඥ අසත්පුරුෂයා නැවත සිරගේ දිසාවත් නොබැලීය, ප්‍රත්‍යන්ත වැසි ඔහු දෙලොස් අවුරුද්දක් මුලුලෙලහි එනි තද දුක්විඳ සිරගෙන් නිදහස්වී යනකල්හි ආහර කලානතය අධිකබැවින් මධ්‍යම රාත්‍රියෙහි අමුසොහොනකට ගොස් අළුතදැමූ මිනියකින් මස්කපා මිනී හිස්කබලකබහා මිනිහිස් තුනකිමම ලිපබැඳ ඊපිටතබා සොහොන් නිවීමට ගෙණවුත් ඉතිරිව තුබූ පැන් වත්කොට සොහොන් පෙනෙලෙලන් ගිනිදල්වා කොල අතු කඩා හැඳ තමා හැඳි කිලිටුවස්ත්‍රය සුලංමුවාකොට බැඳ මිනීඇටිමම මස්අලලමින් පිසනකල්හි ඒ දුටු එක් රුක්දෙවියෙක් ඔහුසමීපයට පැමිණ මෙසේ විචාලේය—

නිවත්ථසාටො ගිරිසංවරාය
පිලොතිකංතඤ්ච පසාරයන්තො,
කාරෙසිවාතා වරණඤ්චසම්ම
කිමඤ්ඤමෙතංවදපුච්ජිතොමෙ’ති.

එඹා යහළුව තෙපිදූත් කොල අතු හැඳ පළමුහැඳි කිලිටු රෙදි කඩ වටබඳිමින් වාතාවරණය කෙළෙහිය, ඊට කාරණා නොපඅතින් විචාරන්නාවූ මට එ නොවළහා කියවයි කීහ, එකල්හි ඊට කාරණා කියන පුරුෂතෙම—

සුභාසුභාමිස්සිත සීතවාතො
සයං අවිනෙතාව අචින්තනභාවා,
දෙහංජුසිත්වාන අසාධුකස්ස
අකතඤ්ඤුනොමිත්තපධංසකස්ස.

සමාවහන්තො යදිමෙසරීරෙ
ජුසාතිසාසං ගතිමජ්ජදානි,
දුක්ඛංදදාතීති විසංවතමෙහා
පරිවජ්ජිතාබධම්මං කුචෙලනති.

එඹා පින්වත් දිව්‍යපුත්‍රය මේ ලොකයෙහි සුභාසුභ දෙකින් මිශ්‍රව බැසඑන සිහිල්වාතයතෙම සිත් පිත් නැත්තේමය, තමා සිත් නැති බැවින් කෙළෙහි ගුණ නොදන්නා මිත්‍රද්‍රොහි අසත්පුරුෂයාගේ ශරීරයෙහිද සත්පුරුෂයාගේ ශරීරයෙහිද වදිමින් සමව පවත්නේය, එහෙයින් අසත්පුරුෂයාගේ ශරීරයෙහි වැදඑන සුලඟ ඉදින් මාගේ ශරීරයෙහි වැදුනේ නම් ඒ වාතය තෙම දැන් මාගේ ශරීරයට ආවේ

ෂව කාය චිත්ත දෙකට දුක් දෙන්නේයයි ඒ අසත්පුරුෂයාගේ ශරීරයෙහි වැද එනනාවූ ශූලංපවා දිවිනසන උග්‍ර තද විෂයක් මෙනැයිද සිතා එය දුරුකරණුපිණිස මේ කිලිවූ කඩ බැහැඳුම්යි කීහ, දිව්‍යපුත්‍රතෙම මෙසේ කියනුයේ—

කිම්කාසිහො සො කතනාසකොතෙ
ධනංච ධඤ්ඤං තවනාසයීච,
මාතා පිතා බන්ධවො ඛෙත්ත වත්ථු
විනාසිතා තෙන වදෙහි කිංතෙ,ති.

එබා පින්වත, ඒ අසත්පුරුෂතෙම කුමක් කෙළේද තාගේ කුමක්නැසීද ධනධාන්‍යයන් නැසීද, මව්පිය නෑ සහොදරාදීන් හා කෙත් වත් ආදිය විනාස කරණලද්දේද, ඒ අසත්පුරුෂයා විසින් තට කවර විනාසයක් කරණ ලද්දේද, ඒ මට නොව ළහ කියවයිකීහ— ඒ පුරුෂතෙම කියනුයේ.

යංරාජතොහොති භයාමහන්තං
සබ්බස්ව හරණාදි වධාදිකංච,
අකතඤ්ඤුනා සප්පුරිසෙන හොති
ආරාවසො හො පරිවජ්ජනීයො.

මේලොකයෙහි රජ යුවරජ ආදීන්ගෙන් වන්නාවූ යම්මහත් භයෙක්වේද මනුෂ්‍යයන්ගේ මුතුමැණික්ආදී රත්නයන්හා සෙසු සියලුසම්පත් පැහැරගැණීම් ආදිවසයෙන්වූද, බැඳීම්තැළීම් ආදී අධිකවූ වධයෙක්වේද, ඒසියල්ලද, කෙළෙහිගුණ නොදත් අසත්පුරුෂයා කරණකොට ගෙණම වන්නේය, එසේහෙයින් පින්වත ඒ අසත්පුරුෂතෙම දුරින් දුරුකට යුත්තේමය—

යමත්ථිචොරා රිහයංහි ලොකෙ
අථොදකෙනා පිචපාවකෙන,
අකතඤ්ඤුනාතං කලහම්පිහොති
ආරාවසොහො පරිවජ්ජනීයො.

ලොකයෙහි යම් සොරසතුරුභයෙක්ඇද්ද, ඉක්බිති දියෙන් ගිනෙනත් වනනාවූ යම් කිසි භයෙක්ඇද්ද, එසේම කලහ විග්‍රහවසයෙන් වනනාවූ යම් භයෙක්ඇද්ද, ඒ සියල්ලම කෙළෙහිගුණ නොදත් අසත්පුරුෂයා කරණකොටගෙණම වන්නේය, එසේහෙයින් පින්වත ඒ අසත්පුරුෂ තෙම දුරින් දුරුකට යුත්තේමය—

පණාතිපාතම්පිඅදින්නාදානං
පරසසදාරූපගමංමුසාච,
මජ්ජස්සපානංකලහංචපෙසුනං
සම්ඵංගිරාංධුත්තපජෙනගියොගං.

සබ්බංඅනත්ථංඅසිවංඅනිට්ඨං
අපායිකංදුක්ඛමනන්තමක්ඛං,
අකතඤ්ඤුනාසප්පුරිසෙනහොති
ආරාවසොහොපරිවජ්ජනීයො.

ප්‍රාණවධ කිරීමද, අන්සන්තක වස්තු සොරාගැන්මද, අන්ස්ත්‍රීන්කරා පැමිණීමද, අන්හට අනර්ථ එළවන නොසැබෑබස් බිණීමද, සුරා පානය කිරීමද, අඬදබර කොලාහල කිරීමද, ඔවුනොවුන් බිඳවීම පිණිස කෙලාම්බස් බිණීමද, තමහටද පරහටද වැඩනැති සම්ඵප්‍රලාප බස්බිණීමද, හස්තපාද ග්‍රීවාභරණාදිය උකස්කොට දූකෙළින ධූර්තජනයන් සමග යෙදීමද, යනමේ සියලුම අවැඩට හෙතුවූ නොසැපවූ අනිෂ්ටදෙයද, නරකාදී සිව් අපාදුකද අනිකුදු අපමණ කායික චෛතසික දුකද, කෙලෙහිගුණ නොදත් අසත්පුරුෂයා හෙතුකොට ගෙණම වන්නේය, එසේහෙයින් පින්වත ඒ අසත්පුරුෂතෙම දුරින්ම දුරුකට යුත්තේය — මේආදී වසයෙන් කෙලෙහි ගුණදත් සත්පුරුෂවූ ප්‍රත්‍යන්තවාසී ඒ මනුෂ්‍යයාපවා පාපමිත්‍ර සෙවනයෙහි ආදීනව බොහොසෙයින් පණ්ඩිත ගොචරලෙසිත්ම ප්‍රකාශ කළබව යහපත් නුවණින් දැන හැඳින මෙකී ආදීනව ඇති පාප මිත්‍ර සෙවනයෙන් හාත්පසින්ම වෙන්ව පණ්ඩිත සත්පුරුෂවූ කල්‍යාණ මිත්‍රයන්ම සෙවන භජන පයිරුපාසනාදිය කිරීමෙන් දෙලෝවැඩසාද ගතයුතුබව මෙයින් දතයුතු —

පාපමිත්‍ර සෙවනයෙහි-2-කාණ්ඩය.

තවද එක්සමයෙක්හි අපමහ බෝසතානන් වහන්සේ අකිත්තිපණ්ඩිතව ඉපිද ධ්‍යානසැපන්ත් උයනෙහි වාසයකරණකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයෝ උන්වහන්සේකරා පැමිණ ගුණ විමසා සතුටුව උන්වහන්සේට කැමතිවරයක් දෙනුකැමතිව මෙසේ කීහ — කාශ්‍යප ගොත්‍රයෙහි උපන් අකිත්තිපණ්ඩිතයෙනි, තොපට වරදෙම්සිතා ආම් යම්වරයක් ගන්නා කැමතිනම් ඒ වරයදෙම් ගනුවයි කීහ — වරගන්නාවූ මහබෝධිසත්වතෙම.

වරං චෙමෙ අදෙසක්ක සබ්බභූතානමිස්සර,
යෙන පුත්තෙච දාරෙච ධනධඤ්ඤම්පි යානිච,
ලද්ධානරාන තප්පන්ති සොලොභොනමසීවසෙති.

සියලුභූතින්ට ප්‍රධානවූ ශක්‍රදෙවෙන්ද්‍රය, ඉදින් මට වරදෙනුකැමතිනම් යම් ලොභයක් හෙතුකොටගෙණ පුත්‍රදාර

වත්ද ධනධාන්‍යද අනිකුදු ප්‍රිය මනාප වස්තූද ලත් මනුෂ්‍යයෝ පවා එයින් තෘප්තියකට නොපමිණෙත්ද, නැවතත් පුත්‍රදාරාදීන්ම ප්‍රාර්ථනාකරන්නාහුමය, ඒ ලොභයතෙම මාගේ සිත්හි නොවැසේවයි නූපදීවයි මේ නපුරු ලොභය නූපදනාවරය ගන්නා කැමැත්තෙමි කිහ—ඊටත් සතුටුවූ සක් දෙව්රජ නැවතත් කැමතිවරයක් ගනමැනවැයි කී කල්හි, මහබොධි සත්වතෙම කියනුයේ.

> වරංචෙමෙ අදෙසක්ක සබ්බභූතා නම්ස්සර,
> බෙනනවතුංගිරඤ්ඤංච ගවාස්සං දාසපොරිසං,
> යෙනජ්ජතෙන ජීයන්ති සොදෙ සොනම්පිවසෙති.

යමක් කරණකොටගෙණ කිපියාවූ මනුෂ්‍යයෝ නොයෙක් රාජ අපරාධකොට රජුන් විසින් තැළීම් ආදී වසයෙන් කරණලද වධයට පැමිණෙත් හෝ විෂ අනුභව කිරීමය ගස් ගල් ආදීන් පැනීමය බොටුව වැලලා ගැණීමය යනාදි වසයෙන් තෙමේම මැරීමෙන් හෝ කෙත්වත් රාරුවන් ඇතුන් අසුන් ගවයන් ආදී සියලු සැපතිම්ම පිරිහෙද්ද එබඳු ක්‍රොධයෙක් මා සිත්හි නොවෙසේවයි නූපදීවයි මේ නපුරු ක්‍රොධය නූපදිනා වරයගන්නා කැමැත්තෙමි කිහ. ඊටත් සතුටුවූ ශක්‍රදෙවෙන්ද්‍රයෝ නැවතත් නුඹවහන්සේට කැමති වරයක් ගත මැනවැයි යාඥකළහ—එවිටත් බොධිසත්වතෙම මෙසේ කියනුයේ.

> වරංචෙමෙ අදෙසක්ක සබ්බභූතා නම්ස්සර,
> බාලංනපස්සෙ නසුණෙ නචබාලෙන සංවසෙ,
> බාලෙන අල්ලාප සල්ලාපං නකරෙනචරොචයෙ.

ඉඳින් ශක්‍රදෙවෙන්ද්‍රයෙනි, තොපි මට වරදෙනු කැමතිනම් යටකියනලද කායදුශ්චරිතාදි දසඅකුසලයෙන් යුක්තවූ අසත්පුරුෂ බාලයකු, මාගේ ඇසින් නොදකිම්වයි කියාද, අසවල්තැන ඒ අසත්පුරුෂයා වාසය කෙරෙයි යනවචනයක් මාගේ කණින් නොඅසම්වයි කියාද, එබඳු අසත්පුරුෂ බාලයහා එකතුව නොවසම්වයි කියාද, ඉදිරි පසු කථාවක් නොකරම්වයි කියාද, එබඳු අසත්පුරුෂ බාලයාගේ වචනයට මම ප්‍රිය නොවෙම්වයි කියාද, යන මෙකී වර ගන්නා කැමතෙතමි කිහ—එබස්අසා ශක්‍රදෙවෙන්ද්‍රයෝ කියන්නාහු.

> කින්නුතෙඅකරංබාලො වදකස්සපකාරණං,
> කෙනකස්සපබාලස්ස දස්සනංනාභිකංඛසි.

පණ්ඩිතයෙනි ඒ අසත්පුරුෂයා තොපගේ මව්පියන් මැරුයේද, තොපට අන්කිසි අනර්ථයක් කෙළේද, කුමක් නිසා අසත්පුරුෂ බාලයාගේ දැකීම නොකැමතිද, ඊට කාරණ කියවයි කීහ, එබස් ඇසූ පණ්ඩිතතෙම කියන්නේ—

අනයංනයති දුම්මෙධො අධුරායං නියුඤ්ජති,
දුන්නයොසෙය්‍යසො සොහොති සම්මාවුත්තොප කුප්පති,
විනයංසොන ජානාති සාධුතස්ස අදස්සනන්ති.

ශක්‍රදෙවේන්‍ද්‍රයෙනි, අසත්පුරුෂ බාල තෙම අකාරණය කාරණයයි ගෙණ ප්‍රාණඝාතාදි පව් කම්කොට ජීවත් වෙයි, තමා සෙවනය කරන්නොත් ඊට එකග කරගණිති, ශ්‍රද්ධා ප්‍රඥාදි සීලධුරයෙහි නොයෙදී අකාරණයෙහිම යොදන්නේය, ප්‍රාණඝාතාදි පඤ්ච දුස්සීලයෙන් යුක්තව විසීමම ශ්‍රෙෂ්ඨයයි සිතන්නේය, හිතවැඩ පිණිස හෙතුවූ පඤ්චසීල අෂ්ටාඞ්ග සීලාදි සිල් රකින්ට නොහැකිවූ නපුරු දෙයක්කොට සිතන්නේය, අනුන්ටද සිතවන්නේය මෙසේ ඉඳුව සිටුව යනාදින් වැඩටනිසි යහපත් අවවාදයක් කීකලද කිපෙන්නේය, කිසිත් ශික්ෂිතයුතු ආචාර විනයක්ද ඔහු නොදන්නේමය, එහෙයින් ඒ අසත්පුරුෂ බාලයාගේ නොදැක්ම සියලු ලෝවාසීන්ටම යහපත් වන්නේයයි කීහ— මෙසේ තමන්වහන්සේ අතීතයෙහි පණ්ඩිතව උපන් කාලයෙහි පවා අසත්පුරුෂ බාලයා දකින්ට පමණවත් නොකැමතිවූ බව බුදුව වැඩහිඳ සියල්ලන් විසින්ම මෙකී පාප මිත්‍ර සෙවනයෙන් වැලකීම පිණිස සිව් පිරිස්මැද දෙසනා කර වදාළසේක— තවද,— "අසෙවනාචබාලානං" යනුවෙන් අසත්පුරුෂ බාලයන් සෙවනය නොකිරීම උතුම් මඞ්ගල්‍යයැයි වදාළෙත් යටකියනලද දොෂයන් තන්වූ පරිදෙන් දැක වදාළ හෙයින්මය— තවද, "අසන්තස්සපියොහොති" යනාදින් තමන්ගේද අනුන්ගේද දෙලෝ වැඩ නසනනාවූ අසත්පුරුෂයන්ට යමෙක් ප්‍රියමනාපව මිත්‍රව වෙසේද, දෙලෝ වැඩසාදා දෙන යහපත් සත්පුරුෂයන්ට අප්‍රියව අමිත්‍රව වෙසේද, අශ්‍රද්ධා දුශ්සීලාදි ලාමක අසත්පුරුෂ ධර්මයටම සතුටුවේද, ශ්‍රද්ධාසීලාදි ශොභනවූ සත්පුරුෂ ධර්මයට නොසතුටුවේද, ගේවනාහි දෙලොවින්ම පිරිහීමට හෙතුවූ ප්‍රධාන කාරණයක්යයි පරාභව සූත්‍රයෙහිද වදාළබැවින් කායාදිද්වාරත්‍රයෙන් දසඅකුසල්කරණ කෙලෙහි ගුණ නොදත් යටකී අසත්පුරුෂ බාලයන් දිවිහිමියෙන්ම සෙවන භජන පයිරුපාසනාදිය නොකොට දස කුසලයෙහි යෙදෙනලද යහ

පත් සත්පුරුෂ පණ්ඩිතයන්ම සෙවන භජනාදිය කිරීමෙන් මෙලොවදීත් අපමණ යසඉසුරු විඳ පරලොවත් දෙව්මිනිස් සැපහා කෙළවර නිවණ් සැපද අත්පත්කරන්ට උත්සාහ කටයුතු.

ස්ත්‍රී ලක්ෂණයෙහි-1-කාණ්ඩය.

එක් සමයෙක්හි ත්‍රිභුවන තිලකවූ අප භාග්‍යවතුන්වහන්සේ අනේපිඩුමහ සිටානන්ගේ යෙහෙළිවූ සුජාතාවන්ට වදාරණසේක්.

1 පදුට්ඨ චිත්තා අහිතානුකම්පිනී
අඤ්ඤෙසු රත්තා අතිමඤ්ඤතෙ පතිං,
ධනෙන කීතස්ස වධායඋස්සුකා
යාඑවරූපා පුරිසස්සභරියා
වධකාච භරියා තිචසාපවුච්චති.

යම් ස්ත්‍රියෙක්තොමෝ ස්වාමියා කෙරෙහි හැමවේලේම දුෂ්ටවූ අදහස් ඇත්තීද, ප්‍රේම ඇතනියක්මෙන් හඟවත්තීද, ස්වාමියාකෙරෙහි ඇලුම්නැතිව පරපුරුෂයන් කෙරෙහි ඇලි ඉන්නීද, තමන් ස්වාමියා දූප්පත්වූවත් මේ මේ දෙය ගෙණෙවයිකියා හිංසාකරත්තීද, ස්වාමියා දැක්කදී උස් අසුන් ආදියෙහි ඉඳිමින් ආක්‍රොශ පරිභව බිණීමෙන් අනාදර කරන්නීද, මෙසේවූ ස්ත්‍රීතොමෝ දෙවඟනක්වැනි රූ ඇතිවූවත් උතුම් ජාතිවූවත් අපමණ ධනයාද සම්පත්හා දාසිදාස් පරිවාර ජනයන් ඇත්තී වීනමුත් ඈතොමෝ ඕහට භාර්‍ය්‍යානොවන්නීය, ඔහුගේ පෙර අකුසල්නැමැති වධකයා විසින් ඕහට වධපිණිස මවාලූ උර චක්‍ර මාලාවක් වැන්න, වධකාපූබයක් වැන්න, ගිසෙනි ඇති කඩු මූවහතක්ද වැන්න, මේ ආදිකාරණයෙන් ඕතොමෝ වධක භාර්‍ය්‍යානම් වන්නීය.

2 යංඉත්ථියා විඥතිසාමි කොධනං
සිප්පංවනිජ්ජංච කසිං අධිට්ඨ හං,
අප්පම්පිතස්මා අපහාතුම්වඡ ති
යාඑවරූපා පුරිසස්ස භරියා
චොරීචභරියා තිච සාපවුච්චති

යම් ස්ත්‍රියෙක් තොමෝ තමා සිත්ලෙස වසනු කැමැත්තෙන් ස්වාමියා ඇසිලලකුත් ගෙසීරදා ඉන්ට නොදී නොයෙක් කර්මාන්තයෙහි යොදා ඒඒ තැන යවන්නීද, ඔහුගෙණ ගෙණ

සම්පත් සඟවත්නීද, ඔහුට නොපහදීද, ඔහු ගේ රහස් තමන්ගේ විශ්වාස පර පුරුෂයන්ට කියන්නීද, තමාට ස්වාමියා විසින් දුන් සැපතෙහි සරු නොකොට තුච්ඡ සැපතක්ම එළවන්නීද, ස්වාමියාගේ බන්ධු මිත්‍රාදීන්ට සඞ්ග්‍රහ නොකරන්නීද, ඇගේ බන්ධු මිත්‍රාදීන්ටම සඞ්ග්‍රහ කරන්නීද, සත්පුරුෂ ශ්‍රමණ බමුණන්ට සඞ්ග්‍රහ කිරීමෙහි ආදර නැත්තීද, මෙසේවූ ස්ත්‍රීතොමෝ පුරුෂයාහට භාර්‍ය්‍යානම් නොවන්නීය, ඔහුගේ ඇඟ නැඟිනඩපොළක් වැන්න, අසාධ්‍යවූ ව්‍යාධියක් වැන්න, ඔහුගේ පෙරඅකුසල් නැමැති යමදූතයා විසින් ඔහු කෙරෙහි පිහිටවාලූ චෞර ස්ත්‍රියක්ම වැන්න, මේආදිකාරණයෙන් ඕ තොමෝ චෞරි භාර්‍ය්‍යානම් වන්නීය—

3 අනත්ථ කාමා අලසා මහග්ඝසා
චණ්ඩීච ඵරුසාච දුරුත්තවාදිනී
උට්ඨායිකානං අභිභුය්‍ය වත්තති,
යා එව රූපා පුරිසස්ස භරියා
අය්‍යාච භරියාති ච සාපවුච්චති

යම් ස්ත්‍රියෙක් තොමෝ ස්වාමියාහට අනර්ථයක්ම කැමතිවන්නීද, අර්ථයක් නොකමැති වන්නීද, හැමවේලෙහිම ගේ ගැර ඒ ඒ තැන ඇවිදිමින් පරපුරුෂ සෙවනාදිත්‍යුක්තව ගෙයි කළමනා කටයුතුදෙයෙහි අලසව වසන්නීද, බොහෝකොට අනුභව කරන්නීද, තමා උපන්ජාතියට නොතරම්වූ සම්පත් පතන්නීද, තමන් බඩසායමුත් අනුන්සාය නොසලකන්නීද, ස්වාමියාහට අනාදරකොට තමන් ස්වාමියෙකු මෙන් පවත්නීද, ස්වාමියාහට ඉතාචණ්ඩවූ ලාමකවූ රූක්ෂ වචන කියන්නීද, මැතොමෝ ඔහුට භාර්‍ය්‍යා නොවන්නීය, ඔහු පෙරකළ අකුසල්බලයෙන් යම රජ විසින් ඔහට නිග්‍රහපිණිස එවාලූ යමදූතියක් වැන්නීය, මේ ආදී කාරණයෙන් ඕ තොමෝ ස්වාමි භාර්‍ය්‍යානම් වන්නීය—

ස්ත්‍රීලක්ෂණයෙහි-2-කාණ්ඩය.

4 යා සබ්බදා හොති හිතානුකම්පිනී
මාතාව පුත්තං අනුරක්ඛතෙ පතිං,
තතො ධනං සම්භත මස්ස රක්ඛති
යා එවරූපා පුරිසස්ස භරියා
මාතාච භරියා තිච සා පවුච්චති.

යම් ස්ත්‍රියෙක් තොමෝ තමා රක්ෂාකරණ ස්වාමියාකෙරෙහි හැම වේලෙහිම මවකබඳු අනුකම්පා ඇත්තීද, දයාද

සම්පත්රකිණ මවෙක්සේ ස්වාමිහු රැස්කළ ධනය ප්‍රවෙශම් කෙරේද, නොවරදවා පුරුෂයා කවන්හීද, පොවන්හිද, ඇඟ උලන්හීද, නහවන්හීද, හැමවේලෙහිම පුරුෂයාගේ සුවදුක්හිම යෙදී වෙසේද, ස්වාමිහු පාපයක් කරණ වේලෙහිද, අනුන්හා විවාදකරණ වේලෙහිද, සොරකම් ආදී නොකටයුත්තකට නික්මුණු කල්හිද, මේ මේ නොකටයුතුදෑ කෙරේනම් නොපගේ ගෙයි නොවසමහ, අපි අපගේ කුලගෙටම යමහයි, යනාදීන් තදින් මොලොකින් නොයෙක් තෙපුල් කීමෙන් ඒ ඒ පාපයෙන් ස්වාමියා නවත්වාද, කෘෂිවණික් ආදී නිරවද්‍ය කර්මාන්තකරව රජුන්ට පක්ෂපාතව වසව පොහොය පෙහෙවස්ද නිතර පන්සිල්ද රකුව බණඇසූව මැනව, දානාදී කුසල්කරවයි, යනාදීන් අවවාදදී ස්වාමියා කුසල් කිරීමෙහි යොදවාද මෙසේවූ ස්ත්‍රීනම් ඒ පුරුෂයාගේ පෙර කුසල් නැමැති දෙවියන් විසින් තමහට අරක්ගෙණ සිටුවාලූ මවෙක් වැන්නිය, දෙවතාදූවක්වැන්නිය, ඔවුන්ට ශ්‍රීගෙණදෙන දිව්‍යමන්ත්‍රයක්වැන්නිය, ඔහුගේ අකුසල් නැමැති ව්‍යාධි සංහිඳුවාදෙන දිව්‍ය ඖෂධයක් වැන්නිය, ඔවුන්ට සැපදෙන කල්පලතාවක් වැන්නිය, මේ ආදී කාරණයෙන් ඔතොමෝ මාතු භාර්‍ය්‍යානම් වන්නිය

5 යථාපිජෙට්ඨා භගිණීකනිට්ඨා
සගාරවාහොති සකම්හිසාමිකෙ,
හිරිමතාභත්තු වසානුවත්තනි නී
යාඑවරූපා පුරිසස්ස භරියා
භගිණීච භරියා තිච සා පවුච්චති.

යම් ස්ත්‍රියෙක්තොමෝ තමන් රක්නා ස්වාමියා මහලු බෑයෙක්කොටසිතා නගුන් බුහුනන්සේ මහත් බයෙන් ලජ්ජාවෙන් හැකිලි හැකිළී උදාරවූ ගෞරවසහිත ආදරයෙන් වසන්නීද රජ තනතුරු ආදී ඉසුරු සම්පත් මාගේ පුරුෂයාටම සැපපිණිස වේවයි සිතන්නීද පතන්නීද අන්පුරුෂයන් කෙරෙහි ලොභනොකරන්නීද, ස්වකීය පුරුෂයාකෙරෙහිම ඇලුම් කරන්නීද, මෙසේවූ ස්ත්‍රීනම් පුරුෂයාගේ පෙර පින් බෙලෙන් දෙවියන්විසින් ඔහුකරා එවාලූ නගුන් බුහුනන් වැන්නීය, මේ ආදී කාරණයෙන් ඔතොමෝ භගිණිභාර්‍ය්‍යා නම් වන්නීය

6. යාචීධදිස්වාන පතිංසමොදති
සඛීසඛාරංව චිරස්සආගතං,
කොලෙය්‍යකාසී ලවතිපතිබ්බතා
යාඑවරූපා පුරිසස්සභරියා
සඛීචභරියාතිච සාපවුච්චති.

යම් ස්ත්‍රියෙක් තොමෝ තමාගේ ස්වාමියා ගෙයින් බැහැ
ර ගියකල්හිද එක්වන් සිහිකොට ඉඳින්නීද, හැමවේලෙ
හිම ඔහු පති දෙවතාකොට බුහුමන් කරන්නීද, තමා කුල
සොභණවූ ප්‍රිය සිළිව වසන්නීද, ස්වාමියාගේ සතුරන් මිත්‍ර
රුකොට නොවසන්නීද, මිතුරන් සතුරුකොට නොවසන්
නීද, තමන් විසින් ස්වාමියාගේ අගුණයක් ඇසූකල අගුණ
සඟවා ගුණයෙහිම පිහිටවන්නීද, ස්වාමියාහට ආක්‍රොශ කර
න්නවුන් වලක්වන්නීද, ගුණ කියන්නන්ට ප්‍රශංසා කරන්
නීද, ස්වාමියාගේ ගුණහා බල වික්‍රම කියපුත්තන්ට කියන්
නීද, තමන් ඇසූ රහස් ස්වාමියාහට නොසඟවා කියන්
නීද, ස්වාමියා කී රහස් නිධානයක්සේ රක්ෂා කරන්නීද
උතුම් භොජනයක් ලත්විට ස්වාමියා සිහිකොට අනුභවක
රන්නීද, ඔහුටත් මේ ලැබේවයි සිතන්නීද, මෙසේවූ ස්ත්‍රී
නම්, ස්වාමියාගේ පෙර කුසල් නැමැති දෙවියන් විසින් පා
වාදුන් යහළුවූ යෙහෙළිනියක් වැන්නීය, මේ ආදී කාරණ
යෙන් ඕ තොමෝ මිත්‍ර භාය්‍යානම් වන්නීය—

7 අක්කුද්ධ සන්තා වධදණ්ඩ තජ්ජිතා
අදුට්ඨචිත්තා පතිනොති තිකඛති,
අක්කොධනාභත්තු වසානුවත්තිනී
යාඑවරූපා පුරිසස්ස භරියා
දාසීචභරියාති ච සාපවුච්චති.

යම් ස්ත්‍රියෙක් තොමෝ තමන්ගේ ස්වාමියා විසින් කො
තෙක් නිග්‍රහකළත් වධ දණ්ඩනාදී පීඩා කළත් ස්වාමියා කෙ
රෙහි වෛෂ නොවන්නීද, ක්‍රොධයෙන් ඔහු දිසාව නොබ
ලන්නීද, සියලු කර්මාන්තාදියෙහි නොකම්මැලිව අප්‍රමාදව
වසන්නීද, අනාචාරාදී පාපයෙන් දුරුව වසන්නීද, තමන්
ස්වාමියා පළමු කවා පොවා පරිවාර ජනය නුදු සන්හිඳුවා
තමා පසුව අනුභව කිරීමෙන් සුචි පවිත්‍ර කර්මාන්ත කිරීමෙ
න් ස්වාමියාගේ ගුණ පිරිවර ජනයාට කීමෙන් නොයෙක්
ගුණයෙන් යුක්තවන්නීද, නොහොත් යම් ස්ත්‍රියක්තොමෝ
ස්වාමියා කෙරෙහි අනුකම්පාවෙන් සයනයෙන් පළමු නැ
ගිට පිරිවර ජනයන් කර්මාන්තාදියෙහි යොදවාද, ගේදොර

හමන්නවාද, කිරිදෙවීම් ආදිය කරවාද, යමකින් ස්වාමියා සතුටුවේද එලෙස පිළිපදින්නීද, ප්‍රියවචනයෙන් ස්වාමියා විචාරා නාගන පැන්ආදිය සම්පාදනය කරන්නීද, සවස ගෙයි අනුභවකරණ සියල්ලත් වලඳවා නොලත්බොජුන් ඇතිඅයට භොජන සම්පාදනකර තිබා ගාල්වලට ආ නා ගවයන්ද සොයා දොරකොටු ආදියෙහි රැකවල්ද තබ්බවා යතුරු මුදු ගෙන්වාගෙණ අප්‍රවෙශම් තැන්වල තිබූබඩු ප්‍රවෙශම් තැන්වලද තබ්බවා පසුදින උදෑසන මෙනම් මෙනම් දෙය කටයුතුයයි කම්කරුවන්ට විධානකොට තමත් පසුව සයනය කරන්නීද, මෙසේවූ ස්ත්‍රීනම් ස්වාමියාගේ පෙර කළ පින් බෙලෙන් පහළවූ දාසියක් වැන්නීය, මේ ආදි කාරණයෙන් ඕ තොමෝ දාසිභාර්‍ය්‍යානම් වන්නීය—

8 යාචීධභාරියා වධකාතිවුච්චති
චොරීචඅය්‍යා තිච්සාපවුච්චති,
දුස්සීලරූපා ඵරුසා අනාදරා
කායස්සභෙදා නිරයංවජන්තිතා.

මෙහි දක්වනලද වධකභාර්‍ය්‍යාය, චොරිභාර්‍ය්‍යාය, සාමිභාර්‍ය්‍යායයි කියනලද මේ තුන්දෙන දුස්සීල ස්වරූපව, ස්වාමියාහට හිත් වෙදනා වියයුතු ඵරුසබස් කියමින් අනාදරව වසන්නාහුද, ඕ තුමූ ඒ අකුසල බලයෙන් මිය නරකයෙහි ඉපිද බොහෝ කලක් දුක්විඳින්නාහුය, එසේ හෙයින් දෙලෝ වැඩකැමති සත්පුරුෂ ස්ත්‍රීන්විසින් වධක භාර්‍ය්‍යා ආදිවසයෙන් දුස්සීල භාවයට නොපැමිණ ස්වාමියා පතිදෙවතාවෙක්මෙන් සිතා ඔහු කෙරෙහි හිතෙසීව විසියයුතු—

9 යාචීධමාතා භගිණීසඛීච
දාසීචභරියා තිවසාපවුච්චති,
සීලෙසිතතතා චිරරත්තා සංවුතා
කායස්සභෙදා සුගතිංච ජන්තිතාති.

මෙහි දක්වනලද මාතුභාර්‍ය්‍යා, නැගණීභාර්‍ය්‍යා, මිත්‍රභාර්‍ය්‍යා, දාසිභාර්‍ය්‍යා, යන ස්ත්‍රීන් සතරදෙනම ස්වාමි පුරුෂයන් කෙරෙහි පිහිටියයුතු ආචාර සමාචාරාදි සීලගුණයෙහි පිහිටිබැවින් මරණින් මතු දෙව්ලොව ඉපිද දිව්‍යමය රූපයෙන් හා යසසින්ද අගපත්ව බොහෝකල් දිවසැප විඳින්නාහුයයි වදාළසේක— මෙසේ වදාළපසු සුජාතාව කියන්නී ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස, අදපටන් මම ස්වාමියාහට දාසිසමාන භාර්‍ය්‍යාවක් බව දැන වදාළමැනවැයි කියා දාසිභාර්‍ය්‍යා වූයේය— තවද, මෙසේ යහපත් සීලගුණයෙන් යුක්තවූ

සත්පුරුෂ පණ්ඩිත ස්ත්‍රීහු පාදපරිචාරි කාවයට ලැබූ පුරුෂ තෙමෙ මෙලොවදීත් කිසිම කායචිත්ත පීඩාවකට නොපැමිණ මරණින්මතුත් ඒ දෙමහල්ලෝම අපමණ දෙව්මිනිස් සැපවිඳ නැවත සෝවාන් ආදී අධිගම ලැබීමෙන් අති උතුම් නිවණ් සැපත් ලබණ බැවින් ස්ත්‍රීන් විසින් යහපත් සත්පුරුෂ ස්වාමි පුරුෂයකු, පුරුෂයන් විසින් යහපත් සත්පුරුෂ ස්ත්‍රීන්ද, දැන හැඳින සෙවන භජන පයිරුපාසනාදිය කටයුත්තේය.

## පසුතැවිලි ධර්මයෙහි-1-කාණ්ඩය.

එක් සමයෙක්හි අපමහ බෝසතානන් වහන්සේ ජනසන්ධව රජව ඉපිද මුළු නුවරවාසීන් රැස්කරවා කර වදාළ අවවාදයන් නැවතත් බුදුව වැඩහිඳ සිව් පිරිස් මැදදී මෙසේ වදාළසේක.

1 අලද්ධාවිත්තං තපති පුබ්බෙ අසමුදානිතං,
නපුබ්බෙ ධනමෙසිස්සං ඉතිපච්ඡානු තප්පති.

මෙහි අභිප්‍රායනම්, යම් මනුෂ්‍යයෙක් තෙමෙ තරුණකාලයෙහි ගෝවාකම්න්හෝ වෙළඳාම් ආදීන්හෝ වස්තු උපයාගෙණ වයෝවෘද්ධ අවස්ථාවෙහි රැකෙත්වයයි යමක් ප්‍රවේශම්කොට නොතිබා ඒ ඒ කාලයෙහි පැමිණිපැමිණිදෙයට වස්තුව වියදම්කෙළේනම් ඔහු වනාහි සම්පත් සොයා තබාගෙණ වයස්ගත කල්හිද සැපසේ රැකෙනනාවූයමක්නු දැක මහලුඅවස්ථාවෙහි කිසි සම්පතක් නැතිව දුක්විඳිමින් සිට මමද මේනියාවට සැපවිඳිම පිණිස තරුණකාලයෙහි සැපයූවස්තුව ප්‍රවේශම්කොට නොතිබුයෙම්යි සිතා පශ්චාත්තාපයට පැමිණෙත්තේය.

2 සක්‍යරූපං පුරෙසන්තං මයාසිප්පං නසික්ඛිතං,
කිච්ඡාවුත්තිං අසිප්පස්ස ඉති පච්ඡානුතප්පති.

තවද, යම් කෙනෙක් බාලඅවස්ථාවෙහි උගතමනා ශාස්ත්‍ර ඉගෙණ ඒ තමන් උගත් ශාස්ත්‍ර බලයෙන් සැපතට පැමිණ කීර්ති ප්‍රශංසාදිය ලැබීමෙන් වෙසෙත්නම්, ශාස්ත්‍ර නූගත් තෙක් ශාස්ත්‍රඋගතුන් විඳින සැප බලා මමද තරුණකාල යෙහි ශාස්ත්‍ර උගත්තෙම්නම් මූන්සේම ශාස්ත්‍ර පැලා රැකෙත්තෙන් නොවෙම්දැයි පසුතැවිලියට පැමිණෙන්නේය.

3 කූටංවෙදි පුරෙආසිං පිසුනොපිට්ඨිමංසිකො,
චණ්ඩොච ඵරුසොචාසිං ඉතිපච්ඡානු තප්පති.

තවද යමෙක්තෙම පෙර තුලාකූට මානකූට කංසකූටාදි වූ සොරකම් කෙළේද, බොරුහා කේලාම්ද කියා අල්ලස් ගැණීමෙන් මනුෂ්‍යයිත්ට තදඵරුසව වාසයකළේද, ගෙතෙම මරණාසන්න කාලයෙහි අනේ මම බොහෝ සොරකම් කොට බොරුකියා අලලස්ගෙණ තද ඵරුස වචන කියා වාසය කෙළෙම් පරලොව කුමක් වේදෝහොයි සිතා පසුතැවිලියට පැමිණෙත්තේය.

4 පාණාතිපාතී පුරෙආසිං ලුද්දොචාසිං අනාරියො,
භූතානං නාවදායිස්සං ඉතිපච්ඡානු තප්පති.

තවද යමෙක්තෙම පෙර ප්‍රාණඝාත කෙළේද ගෙලලනෝමරාදින් සතුන්ට ඇනීම් වසයෙන් ලාමකවූ රෞද්‍ර ක්‍රියා කෙළේද ක්‍ෂාන්ති මෛත්‍රී කරුණාදිවසයෙන් යටහත් පැවතුම් නැත්තේවීද ගෙතෙම මරණාසන්න කාලයෙහි අනේ මම බොහෝවූ ප්‍රාණඝාතාදි පව්කම් කෙළෙම්, පරලොව කුමක් වේදෝහොයි සිතා පසුතැවිලියට පැමිණෙන්නේය.

5 බහුස්සුවත සන්තාසු අනපාදාසු ඉත්ථිසු,
පරදාරං අසෙවිස්සං ඉතිපච්ඡානු තප්පති.

තවද යමෙක්තෙම බොහෝ ස්වාමීන් ඇති වෙසඟුන් ඉඳුදී අනූන් අයිති ස්ත්‍රීන්කරාපැමිණ ලාමකා ධර්මයෙන් සෙවනයකෙළේනම්, එසේවූ පුරුෂයත් මරණාසන්න කාලයෙහි මම බොහෝ සෙයින් පරස්ත්‍රී සෙවනය කෙළෙම් පරලොව කුමක් වේදෝහොයි සිතා පසුතැවිලියට පැමිණෙන්නේය.

6 බහුම්හිවත සන්තම්හි අන්නපානෙ උපට්ඨිතෙ,
නාපුබ්බෙ අදදංදානං ඉතිපච්ඡානු තප්පති.

තවද යමෙක්තෙම දන්පින් කරන්ට බොහෝ සම්පත් ඇතුව තිබියදීත් පරලොවට පිහිටක් උව මැනවැයි සිතා දනක් පිණක් නොකෙළේනම්, එසේවූ පුරුෂතෙම මරණාසන්න කාලයෙහි මම බොහො සම්පත් ඇතිව තිබියදීත් පරලෝ පිහිට පිණිස දන්පින් නොකෙළෙම් පරලොව කුමක්වේදෝහොයි සිතා පසුතැවිලියට පැමිණෙන්නේය.

7 මාතරං පිතරංචාපි ජිණ්ණකෙගත යොබ්බනෙ,
පහූසන්තොන පොසිස්සං ඉතිපච්ඡානු තප්පති.

තවද යමෙක්තෙම තමන්ගේ දිරුණු ගත යොවුන් මව් පියන්ට අත්පා මෙහෙවරාදීත් පොෂ්‍යය නොකෙළේ නම් තමන් මරණාසන්න කාලයෙහි මාගේ දෙමව්පියන්ට කිසිත් අත්පා මෙහෙවරක් නොකෙළෙමි, පරලොව කුමක් වේදෝහොයි සිතා එසේවූ පුරුෂතෙමෙත් පසුතැවිලියට පැමිණෙන්නේය.

8 ආචරිය මනු සත්‍ථාරං සබ්බ කාම රසාහරං,
පිතරං අච්චමඤ්ඤිස්සං ඉතිපච්ඡානු තප්පති.

තවද යමෙක් තෙම මේද කටයුතුය මේද නොකටයුතුයයි කියා උගන්වන හෙයින් ගුරුන් සමානවූද, උන් කැමති ආහර පානාදිය දෙන හෙයින් ඉෂ්ට දෙවතාවෙකු සමානවූද, පිය කෙනෙකුන් කීවා නොගිවිස උන්ට ආක්‍රොශ පරිභව බිණීනම් එසේවූ පුරුෂයාද මරණාසන්න කාලයෙහි මාගේ දෙවියකුසමාන මට හිතවූ පියානන්ගේ වචන නොපිළිගෙණ උන්ට නොයෙක් ආක්‍රොශබිණීමි පරලොව කුමක්වේදෝහොයි සිතා පසුතැවිලියට පැමිණෙන්නේය.

පසුතැවිලි ධර්මයෙහි-2-කාණ්ඩය.

9 සමණෙ බ්‍රාහ්මණෙ චාපි සීලවන්තෙ බහුස්සුතෙ,
න පුබ්බෙ පයිරු පාසිස්සං ඉති පච්ඡානු තප්පති.

තවද යමෙක්තෙම සිල්වත් ඇසූ පිරූ තැන් ඇති මහණ බමුණන්ට ආක්‍රොශ පරිභවබෙණෙමින් ඔවුන් ආශ්‍රය නොකෙළේද, එසේවූ පුරුෂතෙමේ මරණාසන්න කාලයෙහි උතුම්වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ආශ්‍රය කොට දන් පිණ් නොකෙළෙමි ආක්‍රොශ පරිභවබිණීමියිකියා පරලොව කුමක්වේදෝහොයි සිතා පසුතැවිලියට පැමිණෙන්නේය.

10 සාධුහොති තපොච්නෙනා සන්තොච පයිරුපාසිතො.
නච පුබ්බෙ තපොච්නෙනොඉති පච්ඡානු තප්පති.

තවද යමෙක්තෙම සිල්වත් ගුණවත් තැන්කරා පැමිණ තමන්ට ප්‍රතිෂ්ඨාපිණිස ස්වාමිනි මාවිසින් කළමනාකිම්දැයි පරලොව ගැලවෙන නියායෙන් කිසි අවවාදයක් මටකියමැනවැයි නොකියා මොහයෙන් වාසයකෙළේනම් එසේවූ පුරුෂයාද, මරණාසන්න කාලයෙහි සිල්වත් ගුණවත් තැනකින් කිසි අවවාදයක් අසා හික්මී ඔවුන් ආශ්‍රයකොට ඉගෙණගත නුහුනුයෙමි පරලොව කුමක් වේදෝහොයි සිතා පසුතැවිලියට පැමිණෙන්නේය.

11 යොච එතානි ඨානානි යොනි සොපටිපජ්ජති,
කරං පුරිස කිච්චානි සොපච්ඡා නානු තප්පති.

තවද යමෙක් තෙම පසුතැවිලි වියයුතු මෙකී දස කාරණයන් විශෙෂයෙන්ම හැරපියා නුවණින් පිළිපැද දෙලොව වැඩසඳහා කළයුතු පුරුෂකෘත්‍යයන් ඒ ඒ කාලවලදී නොපසුබැස වීර්‍ය්‍යාධිකව කෙළේද, එකී පුරුෂතෙම මරණාසන්න කාලයෙහිද පසුතැවිලි නොව මාවිසින් සපයා තිබියයුතු වස්තුවද සපයා තිබූයෙමි, උගතමනා ශාස්ත්‍රයන්ද උගත්තෙමි, වඤ්චාවෙන් ලොකයාගෙන් අල්ලස්ද නොගත්තෙමි, සත්වයින්ට හිංසාකිරීම් ආදිවසයෙන් සත්වඝාතනයද නොකළෙමි, අන්සතු ස්ත්‍රීසෙවනයද නොකළෙමි, පරලොව සැප ලැබියයුතු දන් පිණ් ආදියද සිත්ලෙස කෙළෙමි, මව්පියන්ට කළයුතු උපස්ථානාදියද කෙළෙමි, ඉෂ්ටදෙවතාවූ පියානන්ට අනිෂ්ටවූ නොකියා ප්‍රිය මනවඩන බස්ම කියෙමි, සිල්වත් මහණබමුණන්ට ආක්‍රොශනොකොට ප්‍රියවචනම කියෙමි, සිල්වත් ගුණවත් නැත්කරාපැමිණ අවවාදඅසා ඊටහික්මී විසූයෙමි, යනමේ කාරණා දසය තමන් විසින් නොපිරිහෙලූ බැවින් ඒ පුරුෂතෙම මරණාසන්නකාලයෙහි පසුතැවිලිනොව සිහියෙන්යුත්තව කාලක්‍රියා කොට මරණින් මතු පරලොව දෙව්මිනිස් සැපවිඳ කෙළවර අතිඋතුම් නිවණ් සැපත් අත්පත් කරන්නේය.

## දෙවෙනි භාගයයි.

මෙසේ සියලු ලොකයාවිසින් දැන ගතයුතුවූ නොයෙක් ධර්මයන්ගෙන් උපලක්ෂිතවූ මේ 'ශ්‍රෙයාපීදීපනිය' නම් පවුරුණ සද්ධර්මයෙහි අපරිචිත මන්ද බුද්ධීන්විසින් සුවසේබලා දැන ඉගෙණ ලොකයා විසින් ගැලවුන්කාරයෝ යයි ව්‍යවහාරකරණ ඒ ඒ සියලු ශාස්තෘවරුන්ටම වඩා ගෞතම ගොත්‍රොද්භූත අපහාග්‍යවත් සර්වඥයන්වහන්සේම රාගාදි කෙලෙස් සතුරන්ගෙන් වෙන්ව රූපකාය ධර්මකාය දෙකෙන් සමන්විතව සියලුලෙව්වැසි දෙව්බඹුන් ආදීන්ගෙන් අපමණ ගෞරව ලැබූ දෙවාතිදෙවවූ බ්‍රහ්මාතිබ්‍රහ්මවූ අති උත්තමයන් වහන්සේකෙනෙක්මැයි ආදර ගෞරවයෙන් උන්වහන්සේ කෙරෙහිම අචඩක භක්තිය පිහිටුවාගෙණ පාප මිත්‍ර

සෙවනාදිත් මිථ්‍යාදෘෂ්ටි නොගෙණ සීලාදි ගුණයෙන් සො භණවූ යහපත් පිළිවෙත් පුර සගමොක් සිරිසැප අත්පත් කරන්ට උත්සාහ කටයුතු

---

ශ්‍රෙයාත්‍රිදිපතිනාම මුනින්ද ගුණවණ්ණනං
කාරෙණෙනනම්යාදෘති යංපත්තං කුසලං බහුං.
තස්සානුභාවතොහිත්වා සම්පරායෙච දුග්ගතිං
සම්මාදිට්ඨි මුජුංකත්වා පාපුණෙය්‍යං සිවං සුභං.

සි ද්ධි හී ව ත්‍ථු.

---

# ශුද්ධිපත්‍රය.

| පිටේ. | පෙලේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 8 | බැලියුතු | බැලියයුතු |
| ,, | 29 | කටයුතු-ත්‍රිවිධ | කටයුතුවූත්‍රිවිධ |
| 3 | 22 | යමකප්‍රතිහාර්‍ය්‍ය | යමකප්‍රාතිහාර්‍ය්‍ය |
| 5 | 7 | ගෘතගතො | ගෘඨගතො |
| ,, | 35 | ඒය | එය |
| 6 | 13 | කිළුටු | කිලිටු |
| ,, | 16 | සැරීරයෙහි | ශරීරයෙහි |
| 7 | 25 | නිරුපද්‍ර | නිරුපද්‍රව |
| ,, | 28 | කුසල්සමාන | කුසල්නැමැති |
| 8 | 2 | ජාතිඅනුස්සතිං | ජාතිඅනුස්සති |
| 9 | 27 | යර්වඥ | සර්වඥ |
| 18 | 32 | කුජ | කිවි |
| 33 | 13 | සත්වනදින | පස්වනමස |
| 36 | 18 | රාගුලොජාතො | රාගුජාතො |
| 37 | 11 | කිලුටු | කිලිටු |
| ,, | 36 | වෙසෙත් | වෙසේ |
| 39 | 21 | සත්වෙනිදිනයෙහි | පස්වෙනිමස |
| 48 | 16 | ( ) මේලකුණ වැඩිවී වැටිතිබේ | |
| ,, | 29 | අභිප්‍රාව | අභිප්‍රාය |
| 57 | 4 | දෙශමත්‍රයක් | දෙශමාත්‍රයක් |
| 68 | 31 | සම්ප්‍රාතප | සම්ප්‍රාපත |
| 70 | 17 | අනන්තලාක්ෂණ | අනන්තලක්ෂණ |
| 72 | 27 | ඝම්පයෙත් | සම්පයෙත් |
| 80 | 31 | යමෙක්විසිත් | යමෙක් |
| 95 | 15 | නිරුපද්‍ර | නිරුපද්‍රව |
| ,, | 21 | ගෘහපතිය | ගෘහපතිය |
| 100 | 3 | දිසාවත් | දිසාවවත් |
| 104 | 10 | කරගණිති | කරගණී |
| 112 | 27 | තපොවිනෙතා | තපොවිනෙතා |

මෙහි සමහරතැන අකුරු ඇමිනීමේදී ණ න, ල ළ; ශ ෂ ස, යන අක්ෂර වෙනස්ව යොදාතිබෙණ බවද ඕනෑනැති සමහර තැන්වල තිත් යොදාතිබෙණබවද දතයුතු.

තවද මින්පසු මේ පොත අච්චුගැස්වීමෙ අයිතිවාසිකම දෙඩන්දූවේ ශෛලබිම්බාරාමාත්‍ය ගත ලොකාර්‍ත්‍ථ සාධක සමාගමටම බව දතයුතු.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු